So, these are facts that we have to go into in detail. Standing Order No. 21 talks about "strangers" in the House and though it can be raised and we can ask the Hon. Members who are "strangers" to withdraw, we are not going to go that far. We will await the determination of the Select Committee once it is appointed.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay. I will look into that. දැන් අපි මෙය අවසන් කරමු.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න. ඉන් පසුව අපි මෙය අවසන් කරමු. Then, we will move on to the Business of the Day.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩායමට පසුව වැඩිම මන්ත්‍රී කණ්ඩායම සිටින පාර්ලිමේන්තු කණ්ඩායම "එක්සත් ජනතා නිදහස් සන්ධානය" බව ඔබතුමා විසින් මීට මොහොතකට කලින් ප්‍රකාශයට පත් කළා. අතිමහත් බහුතරය සිටින එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ගරු මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා විරුද්ධ පක්ෂයේ නායකයා හැටියට නම් කළ බවත් ඔබතුමා ප්‍රකාශයට පත් කළා. එය අපි ඉතාම ගෞරවයෙන් සඳහන් කරන්න ඕනෑ.

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අයකු ජනාධිපතිවරයා ලෙස සිටින නිසා, එක්සත් ජනතා නිදහස් සන්ධානයට පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ධුරය හිමි වන්නේ නැහැ කියලා සුමන්තිරන් මන්ත්‍රීතුමා ඉතාම බොළඳ තර්කයක් ඉදිරිපත් කළා. චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජනාධිපති හැටියට ඉන්නකොට මේ අග්‍රාමාත්‍යතුමාමයි එතුමිය යටතේ අගමැති ධුරයේ හිටියේ. එදා විපක්ෂ නායක හැටියට මහින්ද රාජපක්ෂ මැතිතුමාව මේ පාර්ලිමේන්තුව පිළිගත්තා කියන එක, මම පාර්ලිමේන්තු ඉතිහාස වාර්තාවෙන් සඳහන් කරන්න ඕනෑ.

මම මීට වඩා ඒ ගැන කියන්නේ නැහැ.

දෙවන කාරණාව මෙයයි. සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා සඳහන් කළා, ඔබතුමා පාර්ලිමේන්තුවට කලින් දී තිබෙන තීරණ අනුව යමින්, පාර්ලිමේන්තුවට පත් වන්නේ කුමන දේශපාලන පක්ෂයකින්ද, ඒ දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් කරන දැන්වීම මතයි ඔබතුමා විරුද්ධ පක්ෂයේ නායකවරයා පත් කරන්නේ කියලා. ඔබතුමා විසින් පාර්ලිමේන්තුවට ප්‍රකාශකොට තිබෙනවා, සංඛ්‍යාව නොවෙයි බලපාන්නේ, ඒ පක්ෂයේ ලේකම්වරයායි පාර්ලිමේන්තුවට දැනුම් දෙන්නේ කියලා. මහින්ද අමරවීර ලේකම්තුමා ඒ බව දැනුම් දීලා ඉවරයි. ජාත්‍යන්තරයටත්, IPU එකටත්, CPU එකටත් ඔබතුමා යවපු පිළිතුරත් ඒකමයි. ඒ නිසා ගරු මන්ත්‍රීවරුන් හා විරුද්ධ පක්ෂයේ නායක ධුරය තවදුරටත් මෙලෙස බාල්දුවට ලක් කරන බොළඳ විරෝධතාවන් සලකන්නේ නැතුව අපි පාර්ලිමේන්තු කටයුතු ඉදිරියට ගෙන යමුයි කියා යෝජනා කරනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, Hon. Leader of the House?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය කැබිනට් අමාත්‍ය ධුරයක් දැරුවේ නැහැ. [ඝෝෂා කිරීම්] එතුමිය දැරුවේ ජනාධිපති ධුරය විතරයි. [ඝෝෂා කිරීම්] එතුමිය කැබිනට් අමාත්‍ය ධුරයක් දැරුවේ නැහැ. [ඝෝෂා කිරීම්] හොඳට බලන්නකෝ. [ඝෝෂා කිරීම්]

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මැතිතුමා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට මමත්, ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මන්ත්‍රීතුමාත්, ගරු ඉන්දික බණ්ඩාරනායක මන්ත්‍රීතුමාත් අද මේ රජයට සහාය ලබා දීම සඳහා එකතුවෙලා තිබෙනවා.

අපි එසේ එකතු වීමට බලපෑ කරුණු රාශියක් තිබෙනවා, ගරු කථානායකතුමනි. විශේෂයෙන්ම මේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසය ගැන, ඒ වාගේම මේ රටේ දේශපාලන ඉතිහාසය ගැන මම කථා කරන්න කැමැතියි. පාර්ලිමේන්තුව අක්‍රිය වෙලා, විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය කියන අංශ තුනම එකිනෙකට අසමාන කාරණා මත ගැටෙමින් පාර්ලිමේන්තුවේ සිදු වූ සිදුවීම් මාලාවම මේ රටේ ජනතාව දන්නවා, ගරු කථානායකතුමනි. ඒ වාගේම රටේ ඇති වුණු දේශපාලන

අස්ථාවරයත් සියලුදෙනාම දන්නවා. මේ රටේ සෑම පැල්පතකම, සෑම මන්දිරයකම සිටින සෑම මිනිසෙකුටම ඒ දේශපාලන අස්ථාවරය දැනුණා. ගරු කථානායකතුමනි, ඒ දැනුණු දේශපාලන අස්ථාවරය, එහි බර, දුප්පත් ජනතාව පරිභෝජනය කරන භාණ්ඩ හරහා බදු වශයෙන් ඔවුන්ටද, අනෙකුත් බදු ගෙවන්නන්නට බදු වශයෙන්ද ඔවුන්ගේ කර මත, ඇඟ මත පතිත වෙලා හමාරයි. ගරු කථානායකතුමනි, මේ රටේ වග කිව යුතු දේශපාලන පක්ෂයක් හැටියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට, ඒ වාගේම මේ පාර්ලිමේන්තුවට ගරු කරන, පාර්ලිමේන්තු සම්ප්‍රදායට ගරු කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කරන බවට දිවුරා පොරොන්දු වූ කාරණා පිළිබඳව අපට ලොකු වග කීමක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ වග කීමේදී කුඩා වුවත් සමහර දේශපාලන පක්ෂ හැසිරුණු ආකාරය සහ ඔවුන්ගේ දේශපාලන විඥාණය පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. ඒ සඳහා අපේ ගරුත්වයක් තිබිය යුතුයි, ගරු කථානායකතුමනි. ඒ සඳහා අපි අගයක් එකතු කළ යුතුයි, ගරු කථානායකතුමනි.

විශේෂයෙන්ම අපේ පක්ෂයේ සභාපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සමඟ, අපේ පක්ෂයේ අනුශාසක මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ කටයුතු කිරීමේ කිසිම බාධාවක් ඇති වෙන්නේ නැහැ.

හැබැයි, දැන් නම් මා දන්නේ නැහැ, එතුමා වෙනත් පක්ෂයක සාමාජිකයෙක් වෙලා කියලා තමයි මාධ්‍යයෙන් දැක්කේ. නමුත්, එතුමා තවමත් අපේ ගරු අනුශාසකවරයා කියා මා අදත් කල්පනා කරනවා.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැටියට අපට ලොකු වගකීමක් තිබෙනවා, අතිගරු ජනාධිපතිතුමාත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, අපේ පාක්ෂිකයනුත් ආරක්ෂා කිරීමට. ගරු කථානායකතුමනි, අපි හරියට අර බාඳුරා මලට වැටුණු කෝඳුරුවන් වාගෙයි. අද බාඳුරා මල වැහිලා. කෝඳුරුවන්ට එන්න විධියක් නැහැ. ඒකට සුළිසුළඟක් එන්න ඕනෑ; එහෙම නැත්නම් බාඳුරා මලේ පෙති කැඩිලා විසිරිලා යන්න ඕනෑ, ගරු කථානායකතුමනි. ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන් හැටියට අපි ඒ තරමටම අන්ත අසරණභාවයකට පත් වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] මොනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
ගරු කථානායකතුමනි, මේ අයට මේ පක්ෂය ගැන- මේ, මැදින් පීදිච්ච අය. ගරු කථානායකතුමනි, මම උපතින්ම ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෙක්. මගේ පියා අවිස්සාවේල්ලේ සංවිධායක. මේ අයට ඒවා මතක නැහැ ගරු කථානායකතුමනි. 1979 වසරේ අපේක්ෂකයෝ නැති කාලයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අවිස්සාවේල්ල නගර සභාවට ඉල්ලුවේ තාත්තයි, මමයි. ගරු කථානායකතුමනි, 1989 වසරේ මොනරාගල දිස්ත්‍රික්කයේ ඡන්ද මධ්‍යස්ථාන 48ක් පවත්වන්නේ නැතිව, පොකුරු ඡන්ද මධ්‍යස්ථාන පැවැත්වූ, ඡන්ද මධ්‍යස්ථාන නියෝජිතයන් හත්දෙනෙක් මරපු කාලයේ- [බාධා කිරීම්]

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මැතිවරණයට ඒ දිස්ත්‍රික්කයෙන් අපේක්ෂකයකු හැටියට ඉදිරිපත් වුණේ මමයි. ගරු කථානායකතුමනි, එදා අපට ඡන්දය දෙන්න කියලා කිසිම නායකයෙක් කිව්වේ නැහැ. ගරු කථානායකතුමනි, කිසිම නායකයෙක් අපේ දිස්ත්‍රික්කවලට ඇවිත් අපට ඡන්දය දෙන්න කියලා කිව්වේ නැහැ. අපි තනියම ඒ දිස්ත්‍රික්කවලට ගිහින් තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිල් පාට කොඩිය ජය ගත්තේ. අපි රාජ්‍ය නීතියටත්, කැලෑ නීතියටත් එරෙහිව නිල් පාට කොඩිය අරගෙන ප්‍රජා අයිතිය නැති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අගමැතිනිය කරන්න දායකත්වය දුන්නා, ගරු කථානායකතුමනි.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ජනාධිපතිනිය කරන්න අපි ලබා දුන් දායකත්වය ගැන මේ මංගල සමරවීර මැතිතුමා දන්නවා; එස්.බී. දිසානායක මැතිතුමා දන්නවා. මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ තරුණ සංවිධානයේ හිටියා. කොළඹ දිස්ත්‍රික්කයේ, අංක 2, ස්ටැන්ලි තිලකරත්න මහත්මයාගේ බල මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් මමයි, තාත්තායි දෙදෙනාම හිටියා. එදා පාර්ලිමේන්තුවට කොළඹ දිස්ත්‍රික්කයෙන් මගේ තාත්තා ඡන්දය ඉල්ලුවා. ගරු කථානායකතුමනි, අපේ පවුලේ නෑයෝ අපේ අම්මාට ඇවිත් කිව්වා, "තාත්තායි, පුතයි දෙන්නාම මේ වේලාවේ ඡන්දයට දමන්නේ මොකද, ඔබට කවුරුවත් නැති වෙනවා නේද?" කියලා. එහෙම කියද්දී මගේ අම්මාගේ වචනයේ ධෛර්යයෙන් කිව්වා, "මගේ පුතා පාර්ලිමේන්තුවට යනවා." කියලා. ගරු කථානායකතුමනි, අපි ජීවිතය පරදුවට තියලා මේ පක්ෂයට, ප්‍රජා අයිතිය නැති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට සහයෝගය දුන්නා. ඒ වාගේම, මේ පක්ෂයෙන් දුව යනකොට, පුතා යනකොට, බෑනා යනකොට අපි අඩියක්වත් සෙලෙව්වේ නැහැ: අපි අවුරුදු 17ක් විපක්ෂයේ හිටියා.

ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා මෙතැන ඉන්නවා. එතුමායි, මායි නයයි-පොළඟයි වාගේයි. එතුමායි, මායි ගහගෙන - රණ්ඩු වෙලා- මගේ පස්දෙනෙක් දැනටමත් එල්ලුම් ගස්.

තව 17ක් පෝලිමේ යන්න ඉන්නවා. හතර දෙනෙක් මගේ පුතා බේරා ගත්තා. මේවා ඉඩම් නඩු නොවෙයි. මේවා "ගේම්" ගහලා, "ඩීල්"ගහලා නොවෙයි. මතක තියා ගන්න, මේවා දේශපාලන අරගල. අද මේ නයාටයි, පොළඟටයි එකට වාඩි වෙන්න සිද්ධ වුණා.

ගරු කථානායකතුමනි, මේ ගලපු ගංවතුරේ එක කෙහෙල් කොටේ අපට නඟින්නට සිද්ධ වුණා. එහෙම සිද්ධ වුණේ ඇයි? අපේ පක්ෂය සංවිධායකවරු සියයක් විතර මට කථා කළා. අපේ වැඩ බිම්වල ඉන්න සහෝදරයෝ කථා කළා. වෘත්තීය සමිති නායකයෝ කථා කළා. ගරු කථානායකතුමනි, අපි අද වැටට තියලා අමුඩය ගහලා තිබෙන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපට ඉස්සරහට යන්නත් බැහැ; පස්සට යන්නත් බැහැ. ගරු කථානායකතුමනි, එක්කෝ අමුඩය ගලවන්නට ඕනෑ; නැත්නම් වැට කපන්න ඕනෑ. දෙකෙන් එකක් කරන්න ඕනෑ. කරන්න දෙයක් නැහැ. එක්කෝ වැට කපන්න ඕනෑ, එක්කෝ අමුඩය ගලවන්න ඕනෑ. දෙකෙන් එකක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, 2001 මැතිවරණයේ දී හම්බන්තොට පරදිනකොට; අත්තනගල්ල පරදිනකොට, මමයි, අපේ සුමේධා මැතිනියයි, - සුමේධා මැතිනිය මේ අවස්ථාවේ මෙහි ඉන්නවාද දන්නේ නැහැ. - පුෂ්පකුමාරයි, අපි තුන්දෙනා නියෝජනය කළ මොනරාගල දිස්ත්‍රික්කයේ විතරයි "නිල් බැජ්" එක තිබ්බේ. මොනරාගල දිස්ත්‍රික්කය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජයග්‍රහණය කළා. එහෙව් අපට කරපු දේවල් මම මෙතැන කියන්න යන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, මොනවා වුණත් අපේ හිටපු ජනාධිපතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. එතුමා මට කැබිනට් ඇමතිකමක් දුන්නා. ඒකට මම එතුමාට ගරු කරනවා. හැබැයි එතුමාට ගරු කළත්, එතුමා වටේ ඉන්න වෘකයන් සහ සුනඛයන් එක්ක මේ ගමන යන්න බැහැ.

[ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා]

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට මා ගරු කරනවා. එතුමා මට අතපය දිගහැරලා වැඩ කරන්න ඇමතිකම් දුන්නා. ගරු කථානායකතුමනි, 1817 - 1818 සිදු වූ ඌව වෙල්ලස්ස කැරැල්ලට අවුරුදු 200ක් පිරෙනවා. සුද්දා කඩපු පිට කොන්ද කෙළින් කරන්න, අපට දුන්න ඇමතිකම් මොනවාද? මට කැලේ ඇමති. පුෂ්පෙට පොල් ඇමති. සුමේධට කිහිළිකරු ඇමති. තේරුණාද? ගරු කථානායකතුමනි, අපට ඇමතිකම් ලැබුණේ එහෙමයි. මම වල් ඇමති. පුෂ්පෙ පොල් ඇමති. [බාධා කිරීම්] "වල්" කියන්නේ කැලේ. [බාධා කිරීම්] වල් කියන්නේ කැලේ. තේරුණාද? සිංහල භාෂාවේ වචන දැනගන්න, ඉංග්‍රීසි ඉගෙන ගන්න කලින්. ඊළඟට, කිහිළිකරු ඇමති-

ගරු කථානායකතුමනි, අපි බලාපොරොත්තු වෙන්නේ මෙච්චරයි. අද මේ රටේ ජනතාවට ඕනෑ, පක්ෂ, පාට නොවෙයි. මේ රටේ ජනතාව හැම කෙනෙකුවම රජ කෙරෙව්වා. ගරු කථානායකතුමනි, මේ රටේ ජනතාව අරයා අගමැති කළා; මෙයා ජනාධිපති කළා. පවුල් පවුරවල් බැන්දා; බලකොටු බැන්දා. ඡන්ද ලක්ෂ ගණන් ගොඩගසා ගත්තා; ගෝණි ගණන් ගොඩගසා ගත්තා. ගරු කථානායකතුමනි, අහිංසක මිනිසුන් රජ වුණේ නැහැ. වෙල්ලස්සේ සුද්දා කඩපු පිටකොන්ද කෙළින් කරන්න යම් කිසි දායකත්වයක් ලබා දෙන්න මට පුළුවන්කම ලැබුණා, පසුගිය රජය යටතේ. ඒ පිළිබඳව මගේ ගෞරවයක් තිබෙනවා. අපේ ආණ්ඩු කාලයේ මම වැඩ කරනකොට මට වැඩ කරන්න දුන්නේ නැහැ. මට රංජිත් මද්දුමබණ්ඩාරවත්, ආනන්ද කුමාරසිරිවත් එරෙහි වුණේ නැහැ. අපි වැව් 200ක් හැදුවා. පසුගිය ආණ්ඩුව වැඩ කළේ නැහැ කියලා කිව්වාට, අපි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් වැව් 200ක් හදන්න ආරම්භ කළා. ඒකෙන් වැව් 100ක් හදලා ඉවරයි.

අපට තිබෙන සුන්දරම නගරය බණ්ඩාරවෙලයි. ඒක අපේ අධ්‍යාපන නගරයයි. St. Thomas', St. Joseph's, Army School එක වාගේම ගුරු විද්‍යාලයත් තිබෙන මේ මහා සංචාරක නගරය ගිල්වලා, වතුර ටික හම්බන්තොටට ගෙන යන්න හැදුවා. ගරු කථානායකතුමනි, අපි -දින සියයේ ආණ්ඩුවෙන්- ඒක නැවැත්තුවා. අලිකොටආර වැව අක්කර අඩි 9,000ක් හදලා ඉවරයි. හඳපානගල ව්‍යාපාරය අක්කර අඩි 5,000 සිට 15,000 දක්වා වැඩි කර අවසානයි. ඊළඟට, බලහරුව කුඩාඔය ජලාශයේ සිට සිංහලයාගම හරහා කිලෝමීටර 38ක ඇළක් කපලා අක්කර අඩි 25,000ක මහා ජලාශයක් නිර්මාණය කර අවසානයි. ඒ මහ වැව් තුන ආශ්‍රයෙන් කුඩා වැව් 100ක් අපි ආරම්භ කරලා ඉවරයි.

ගරු කථානායකතුමනි, අපට ඕනෑ අපේ දිස්ත්‍රික්කයේ ජනතාවට වැඩ කරන්නයි. මට ඇමතිකම් තිබුණත් එකයි නැතත් එකයි. මේ කවුද කියපු කථාවක් මට දැන් ඇහුණා. මම යූඑන්පී එකට ආවාය කියා ඔය ගොල්ලෝ හිතන්න එපා. තේරුණාද? දේශපාලන ස්ථාවරභාවය ඇති කරන්න මම රජයට උදව් කරනවා. මම තව කාරණයක් කියන්න ඕනෑ. එදා යූඑන්පී එකෙන් ආණ්ඩුව ගන්න චන්ද්‍රිකා මැතිනියට මම එදා ලක්ෂ 100ක් ගෙනැත් දුන්නා. අර්ජුන රණතුංග මැතිතුමා ඒ බව දන්නවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒකට සාක්ෂි දරනවා. ඒ පෙළපාළිවලට අපි අපේ ධනය, ශ්‍රමය, කාලය වැය කළා. මගේ පියාගේ කාලයේ ඉඳලා අපි ගොඩනඟපු, වියදම් කළ පක්ෂය මේක, ගරු කථානායකතුමනි. අපේ පාක්ෂිකයන් සහ පක්ෂය ආරක්ෂා කරන්න දැවැන්ත පෙරමුණකට, ජයග්‍රාහී පෙරමුණකට අපි අද සම්බන්ධ වෙලා තිබෙනවාය කියන කාරණය මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! මම කලින් සඳහන් කළ පරිදි අද වැදගත් සාකච්ඡා කිහිපයක් තිබෙන නිසා දැන් අපි ප්‍රධාන කටයුතුවලට යමු.

## විගණකාධිපතිවරයාගේ වාර්ෂික වාර්තාව
## கணக்காய்வாளர் தலைமையதிபதியின் ஆண்டறிக்கை
## AUDITOR-GENERAL'S ANNUAL REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2017 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්ෂික වාර්තාව සහ 2019 වර්ෂය සඳහා ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික කාර්ය වැඩසටහන මම ඉදිරිපත් කරමි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "එකී වාර්තාව මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.*
*அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Report be printed.*

## සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
## எல்லை நிர்ணய ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
## PERFORMANCE REPORT OF THE DELIMITATION COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ. (6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 වර්ෂයේ දෙවැනි කාර්තුව (2018.04.01 - 2018.06.30) සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

## ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව
## தேசிய பெறுகை ஆணைக்குழுவின் முன்னேற்ற அறிக்கை
## PROGRESS REPORT OF THE NATIONAL PROCUREMENT COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ. (6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 වර්ෂයේ පළමුවැනි කාර්තුව සඳහා (2018.01.01- 2018.03.31) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ප්‍රගති වාර්තාව මම ඉදිරිපත් කරමි.

## ජාතික පොලිස් කොමිෂන් සභාවේ වාර්තාව
## தேசிய பொலிஸ் ஆணைக்குழுவின் அறிக்கை
## REPORT OF THE NATIONAL POLICE COMMISSION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ (6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 වර්ෂයේ පළමුවැනි කාර්තුව සඳහා (2018.01.01 - 2018.03.31) සහ දෙවන කාර්තුව (2018.04.01 - 2018.06.30) සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ වාර්තා මම ඉදිරිපත් කරමි.

ගරු සභානායකතුමනි, අද සභාවේ වැඩ කටයුතු කොයි තරම් කාලයක් ගෙන යාමට බලාපොරොත්තු වෙනවාද? සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවක් තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අදයි, හෙටයි දින දෙකේම මේ විවාදය පවත්වනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. දැන් සභාව කල්තැබීම.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල්තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

## විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම
## நிறைவேற்று ஜனாதிபதி பதவியை இல்லாதொழித்தல்
## ABOLITION OF THE EXECUTIVE PRESIDENCY

[අ. භා. 1.39]
**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1978දී හඳුන්වා දුන් විධායක ජනාධිපති ධුරය විසින් පසුගිය වසර 40 පුරාම රටට සිදු කළ හානිය විශාලය. 1988 සිට පැවැති සෑම ජනාධිපතිවරණයකදීම විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම ප්‍රධාන මැතිවරණ පොරොන්දුවක් වූ අතර, නිශ්චිතවම 1994, 2005 සහ 2015 ජනාධිපතිවරණවලදී එම මතය ජයග්‍රහණය කරනු ලැබීය. විධායක ජනාධිපති ධුරයේ පවතින අත්තනෝමතිකභාවය හා ප්‍රජාතන්ත්‍ර විරෝධීභාවය අන් කවරදාකටත් වඩා මෙම අවස්ථාවේදී පැහැදිලිව පෙනෙන බැවින්, විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා වන ක්‍රියාවලිය කඩිනම් කිරීමට මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු කථානායකතුමනි, පසුගිය දිනවල සිදුවූ දේශපාලන කලබගෑනියෙන් අනතුරුව, මම හිතන විධියට පාර්ලිමේන්තුව හැටියට අපි ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් ගත යුතු ඉතාම කඩිනම් සහ ශක්තිමත් පියවරක් තමයි, මේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම. පසුගිය අවුරුදු 40 පුරාම අපේ රට මේ විධායක ජනාධිපති ධුරයේ ආදීනව අත්දැක තිබෙනවා; අත්විඳ තිබෙනවා. ඒ නිසා තමයි මෙවැනි බලසම්පන්න ඒකාධිපති ධුරයක් අහෝසි කළ යුතුය යන මතය ඉදිරිපත් වුණේ; සියලු ජනාධිපතිවරණවලදී එය ප්‍රධාන සටන් පාඨයක් බවට පත් වුණේ. ඒ නිසා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන, මේ රටේ දේශපාලන ශිෂ්ටත්වයක් අපේක්ෂා කරන, දේශපාලන සදාචාරයක් අපේක්ෂා කරන රටේ සාතිශය බහුතර ජනතාවගේ පැතුම බවට පත් වෙලා තිබෙන්නේ, මේ අත්තනෝමතික, ඒකාධිපති විධායක ජනාධිපති ධුරය අහෝසි කළ යුතුය යන්නයි.

ගරු කථානායකතුමනි, 1978දී මේ තනතුර හඳුන්වා දුන් අවස්ථාවේ සිටම, විශේෂයෙන් අපේ රටේ වමේ ව්‍යාපාරය පැත්තෙන්, අපේ රටේ ප්‍රගතිශීලී ව්‍යාපාරය පැත්තෙන් ඒකට බරපතළ විරෝධයක් එන්න පටන් ගත්තා. ඔබතුමාට මතක ඇති, 1982දී පැවැති පළමුවැනි ජනාධිපතිවරණයේ සිටම මේ සඳහා යම් උත්සාහයන් තිබුණු බව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා තමන්ගේ අසුන්වල ඉඳගන්න. නැත්නම් මේ විවාදයට බාධා පැමිණෙනවා.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ආණ්ඩුව හදා ගත්තාට පස්සේ දැන් ඉතින් අර කලින් කියපු දේශපාලන ශිෂ්ටත්වය, සදාචාරය කියන මොකක්වත් ඕනෑ නැහැ. ආණ්ඩුව හදා ගන්නතුරු තමයි ඒ සියල්ලම තිබෙන්නේ. ආණ්ඩුව හදා ගන්නතුරු මීයෝ වාගේ ඉන්නවා. එතකොට කථානායකතුමා කිව්වාම වාඩි වෙලා හොඳට ඉන්නවා. "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම" කියන මෙවැනි හොඳ යෝජනාවකට ඇහුම්කන් දෙන්න මේ අය සූදානම් නැහැ, ගරු කථානායකතුමනි. - [ඝෝෂා කිරීම්]-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, නිශ්ශබ්ද වෙලා වාඩි වෙන්න.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
බොහොම ස්තුතියි. ගරු කථානායකතුමනි.

1982දී පැවැති ජනාධිපතිවරණයේ ඉඳලාම අපේ රටේ දේශපාලන ව්‍යාපාර මේ සඳහා විවිධ උත්සාහයන් ගත්තා. 1988දී පැවැති ජනාධිපතිවරණයේදී ප්‍රජාතන්ත්‍රවාදී ජනතා බලවේගය

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

හැටියට ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අංක 2 යටතේ සඳහන් වුණු කාරණය මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි. එහි සඳහන්ව තිබුණේ, "විධායක ජනාධිපති ධුරය අහෝසි කොට, විධායක බලය පාර්ලිමේන්තුව හා කැබිනට් මණ්ඩලය සතු කිරීම" කියන කාරණයයි. අපේ ගරු විජිත් විජයමුණි ද සොයිසා මන්ත්‍රීතුමා අද ඉතාම ආවේගයෙන් යුතුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉතිහාසය ගැන මතක් කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් දර දිය ඇදපු, ඒ වෙනුවෙන් තමන්ගේ කාලය, ශ්‍රමය, ධනය කැප කළ ඇත්ත ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ගේ පැතුම බවට පත් වෙලා තිබුණේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 1988 ජනාධිපතිවරණයේදී මේ රට හමුවේ තබපු ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඒ කාරණා ඉෂ්ට වේවායි කියන එකයි. අත්‍යන්තයෙන්ම, සද්භාවයෙන්ම විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා වන ක්‍රියාවලියක එතුමිය නිරත වෙලා හිටියා. ඊළඟට 1994දී පැවැති ජනාධිපතිවරණයේදීත්, එම අවුරුද්දේ පවත්වන ලද මහ මැතිවරණයේදීත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත්, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියත් පොදුජන එක්සත් පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනය එළිදක්වන කොට බොහොම පැහැදිලිව කිව්වා, "විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම අපේ වැඩසටහනේ ඉතාම ප්‍රමුඛ තැනක් ගැනෙයි" කියා.

ගරු කථානායකතුමනි, 1995 ජූලි 15වන දාට කලින් මේ අත්තනෝමතික, විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවාය කියා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජාතිය ගලවා ගැනීමේ මේ පෙරමුණ හරහා රටට පණිවුඩයක් දුන්නා. ඇය ඒක ලිඛිතව ලබා දුන්නා. අපේ නිහාල් ගලප්පත්ති සහෝදරයා ජනාධිපති අපේක්ෂක ධුරය සඳහා තරග කරනකොට, එතුමා ඉන් ඉවත් වීමට බලපෑවේ එතුමිය ජනතාවට දුන් ඒ ලිඛිත පොරොන්දුවයි. එතුමිය අවුරුදු 6ක් මේ රට පාලනය කරලා, 1999 ජනාධිපතිවරණයෙන් පස්සේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කරන්න යෝජනා සාකච්ඡා කර තිබුණා. විධායක ජනාධිපති ධුරය අහෝසි කරලා, පාර්ලිමේන්තුවට වග කියන ආණ්ඩු ක්‍රමයක් පිළිබඳව ඒ සාකච්ඡාව ඇතුළෙත් කථා වුණා.

ඊළඟට, 2005දී තවත් ජනාධිපතිවරණයක් තිබුණා. එම ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කළ, "මහින්ද චින්තන - අලුත් ඉරක් යට අලුත් රටක් උදෙසා" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මෙසේ සඳහන් වුණා:

"විධායක ජනාධිපති ධුරය අහෝසි කෙරෙන්නා වූ හා රටේ සෙසු ප්‍රශ්න වලට ද විසඳුම් ලබා දෙන්නා වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සියල්ලන්ගේ සම්මුතියෙන් ඉදිරිපත් කිරීම."

ඒ නිසා 2005 ජනාධිපතිවරණයේ ප්‍රධාන සටන් පාඨයක්, විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම. ඊළඟට, 2010 "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" මැතිවරණ ප්‍රකාශයේත් විධායක ජනාධිපති ධුරය මුළුමනින්ම අහෝසි කරනවා කියා ඍජුව කිව්වේ නැති වුණාට, එය පාර්ලිමේන්තුවට වග කියන භාරකාර ධුරයක් බවට පත් කරන බවට තමයි එවකට මහින්ද රාජපක්ෂ මහත්තයා පොරොන්දු වුණේ. මම හිතන්නේ, විධායක ජනාධිපති ධුරය සම්බන්ධයෙන් යම් කිසි මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයක විස්තර සහිතව ලියවුණා නම්, ඒ ලියවුණේ 2010 "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" මැතිවරණ ප්‍රකාශයේයි. මම කැමැතියි, එතුමන්ලාට අහගන්නත් එක්ක එය කියවන්න. එහි මෙන්න මෙහෙම කියනවා:

"අතීතයේදී විධායක ජනාධිපති ධුරය යොදා ගන්නා ලද්දේ මැතිවරණ කල් දැමීමට, මැතිවරණවලින් පත් වූ ආණ්ඩු පෙරළා දැමීමට, අධිකරණයට බාධා කිරීමට, පක්ෂ තහනම් කිරීමට, උද්ඝෝෂණ මර්දනය කර ඝාතන සංස්කෘතියකට රට ගෙන යාමට, රාජ්‍ය ආයතන කුණු කොල්ලයට විකුණා දැමීමට, අපරාධකරුවන් රැකීමට සහ ජාවාරම්කරුවන්ට සහන ලබා දීමටය. රට පාවා දෙන ගිවිසුම් ඇති කර ගත්තේද විධායක ජනාධිපති ධුරය යොදාගෙනය."

විධායක ජනාධිපති ධුරය විසින් රටට කරන ලද අතිමහත් හානිය පිළිබඳව විස්තර සහිතව, කරුණු සහිතව ඉදිරිපත් කළේ, 2010 "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේයි. ඊළඟට, 2015 ජනාධිපතිවරණය ආවා. තමුන්නාන්සේලා දන්නවා, ඒ ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහත්තයාගේ අවුරුදු 10ක පාලනය පිළිබඳව, විධායක ජනාධිපති ධුරය භාවිත කිරීම පිළිබඳව බරපතළ විරෝධයක් පැන නැඟුණු බව. ඒ විරෝධයේ ප්‍රතිඵලයක් හැටියට විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා වන සමාජ ව්‍යාපාරයන්, දේශපාලන ව්‍යාපාරයන් නිර්මාණය වුණා. මාදුළුවාවේ සෝභිත හාමුදුරුවන් ප්‍රමුඛ සාධාරණ සමාජයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය පිළිබඳ විස්තර ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා. එවැනි සමාජ ව්‍යාපාරයන්, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු තවත් පක්ෂ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා වන ක්‍රියාවලියට අවතීර්ණ වුණා. 2014 නොවැම්බර් මාසයේ මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් එළියට එන්නේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ පොදු අපේක්ෂකයා හැටියටයි. එතුමා ආණ්ඩුවෙන් එළියට ඇවිල්ලා, 2014 නොවැම්බර් 21වැනි දා නව නගර ශාලාවේ පවත්වන පළමුවැනි මාධ්‍ය හමුවේදී කියන්නේ, "දින 100 ඇතුළත විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවා." කියා.

දින 100ක් ඇතුළත අහෝසි කරන්න පුළුවන්. ජනතාව ඉදිරියේ ජනමත විචාරණයකට ගිහිල්ලා දින 100ක් ඇතුළත අහෝසි කරන්න හැකියාව තිබුණා. එතුමා පොරොන්දු වෙන්නේ දින 100ක් ඇතුළත විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කියා. එළියට ඇවිල්ලා කරන පළමුවැනි ප්‍රකාශය විතරක් නොවෙයි, මැතිවරණය ව්‍යාපාරය ඇතුළත එතුමා කියන්නේ මෙන්න මෙහෙමයි. මතුගම රැස්වීමකදී කරපු කථාව 2014 දෙසැම්බර් 12 "ලංකාදීප" පුවත් පතේ මෙසේ පළ වෙනවා:

"දූෂිත විධායක ක්‍රමය අවසන් කිරීමට එක්වන්න මා ආරාධනා කරනවා. විධායක ක්‍රමය ආරම්භ කළ දවසෙ සිට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එයට විරුද්ධයි. කලින් ජනාධිපතිවරුන් මැතිවරණ ප්‍රකාශනයට පමණක් විධායකය අහෝසි කරනවා යැයි පැවසුවා. නමුත් මා සම්මුතියකට එකඟතාවකට පැමිණ සිටින බව, අනිවාර්යයෙන්ම විධායක ජනාධිපති ක්‍රමය මා අහෝසි කරනවා. පක්ෂ ගණනාවක් එකතුව නායකයින් 47 දෙනෙකු එකඟතා සම්මුතියට අත්සන් තැබුවා. මීට කලින් කිසිම කෙනෙකු නොකළ දේ සම්මුතියට අනුව මම කරන බව සියලු දෙනාට සිහිපත් කරනවා."

ඒ මැතිවරණ ව්‍යාපාරය ඇතුළේ මෛත්‍රීපාල සිරිසේන කියන අපේක්ෂකයා වැඩි පුරම කියපු දේ තමයි, "විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවා" කියන කාරණය. එතුමා ජනාධිපති ධුරයට පත් වුණාට පස්සේ, මේ ව්‍යාපාරයේ මුල් පෙළේ හිටපු මාදුළුවාවේ සෝභිත හාමුදුරුවන්ගේ ආදාහන උත්සවයේදී -ඒ චිතකය ඉදිරිපිටදී, උන්වහන්සේගේ මෘත දේහය ඉදිරිපිටදී- ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මෙහෙම පොරොන්දුවක් දෙනවා:

"සෝභිත හිමි පැතූ පරිදිම විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට කළ හැකි සියල්ල කරනවා."

මේ රටේ ජනාධිපතිවරණ ගණනාවකදී මේ පොරොන්දුව ප්‍රධානම මැතිවරණ පොරොන්දුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ගරු කථානායකතුමනි, 2015 ජනාධිපතිවරණයේදී එක පැත්තකින් විධායක ජනාධිපති ධුරය අහෝසි කරන පොදු අපේක්ෂකයෙක් ඉදිරියට එනකොට ඊට ප්‍රතිපක්ෂව ආපු අපේක්ෂකයාටත් විධායකය රකිනවා කියලා හරි,

විධායක බලතල තවත් වැඩි කරනවා කියලා හරි කියන්න බැහැ. ඒක නිසා අඩු ගණනේ ප්‍රතිපත්ති ප්‍රකාශයටවත් ඔහුට දමන්න සිදු වුණා, "විධායක ජනාධිපති ක්‍රමය ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ තීරණය අනුව සුදුසු පරිදි සංශෝධනය කරමි." කියා. එහෙම තමයි, මේ ක්‍රියාවලිය අවුරුදු 40ක් තිස්සේ දියත් වුණේ.

"විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම" 1982 ඉඳලා ජනාධිපතිවරුන්ගේ ප්‍රධාන සටන් පාඨයක් වුණා වාගේම නිශ්චිතවම ගත්තොත් 1994, 2005 සහ 2015 වර්ෂවල පැවැති මැතිවරණවලදී මේ රටේ බහුතර ජනතාවක් ඡන්දය දීලා ඒ සඳහා තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. එම නිසා මේක අපි නැවත නැවත සාකච්ඡා කළ යුතු මාතෘකාවක් නොවෙයි. අපි ක්‍රියාකාරිව, විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා කටයුතු කළ යුතුව තිබෙනවා.

ගරු කථානායකතුමනි, වර්තමාන ජනාධිපතිවරයාගේ ප්‍රධාන මැතිවරණ පොරොන්දුවත්, ඒ වාගේම ඔහු බලයට පත් කළ කාරණයත් බවට පත් වුණේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමයි. විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා අවුරුදු පහක් යන ගමනේ පළමු දින සියය ඇතුළත තමයි විධායකයේ යම් බලතල ප්‍රමාණයක් කප්පාදු කිරීමට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ. විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්නට ආපු කෙනා දැන් කථා කරනවා විධායකයේ යම් බලතල ප්‍රමාණයක් අඩු කළ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කප්පාදු කරන්නට, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අයින් කර ගන්නට. දැන් එතුමා කල්පනා කරන්නේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය එතුමාට "ඇණයක්" කියා. විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවා කියපු ඒවා දැන් මතක නැහැ.

ඇත්තටම අපි මැතිවරණවලදී විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්නට ජනතාව ඉස්සරහා කළ කතිකාවටත් වඩා ජනතාව දැන් අත් දැකීමෙන් විධායක ජනාධිපති ධුරයේ ආදීනව තේරුම් අරගෙන ඉන්නවා ගරු කථානායකතුමනි. ඒකට වෙන මොනවත් අවශ්‍ය නැහැ, පසුගිය දින පණහ ප්‍රමාණවත්. අපි මීට මාස කිහිපයකට කලින් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු වෙලාවේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එරෙහි වුණු, විධායක ජනාධිපති ධුරය ආරක්ෂා කර ගන්නට ඕනෑයි කියපු අය එක එක රූපවාහිනී සංවාදවලදී අපට කිව්වා, "හරි, කියන්න බලන්න, විධායක ජනාධිපති ධුරයෙන් රටට කළ හානි පහක්" කියා. අපට ඒවාට උත්තර දෙන්නට ඕනෑ නැහැ. පසුගිය දින පණහ ඇතුළතදී මෛත්‍රීපාල සිරිසේන මහතා හැසිරුණු ආකාරය ප්‍රමාණවත් විධායක ජනාධිපති ධුරය කියන්නේ මොකක්ද කියන එක තේරුම් කරවන්නට. විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා යන ගමනේදී සපුරා ගත යුතු නිර්ණායක කිහිපයක් අපට තිබුණා. විධායක ජනාධිපති ලෙස පත් වෙන කෙනාට පාර්ලිමේන්තුවේ බහුතරයක් තිබෙනවා නම්, ඔහුට පක්ෂයේ බලයක් තිබෙනවා නම්, -ඒ පත් වෙන කෙනා මොන පොරොන්දු දුන්නත්- ඔහු විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්නේ නැහැ කියා පරණ අත් දැකීම් අපට තිබුණා. දැන් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට පක්ෂයක බලයත් නැහැ, පාර්ලිමේන්තුවේ බහුතරයත් නැහැ. එහෙම තියාගෙනත් මේ විධියට තමයි ඔහු අත්තනෝමතිකව හැසිරුණේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හිල් සොයන්නට පටන් ගත්තා, අපි ඉදිරිපත් කළ විශ්වාස භංග යෝජනාවල කරුණු සොයන්නට පටන් ගත්තා, අත්සන් 'චෙක්' කරන්නට පටන් ගත්තා, ටිපෙක්ස් කරපුවා බලන්න පටන් ගත්තා, දින බලන්නට පටන් ගත්තා. ඔන්න බලන්න, විධායක ජනාධිපතිවරයෙක් හැසිරුණු ආකාරය!

අපි අහන්නට කැමැතියි, පසුගිය කාලයේ විධායක ජනාධිපති ධුරය ආරක්ෂා කර ගන්නට කථා කළ අය දැනුත් ඒ මතයේ ඉන්නවාද කියා. අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු වෙලාවේ සමහර අය කියන්නට පටන් ගත්තා විධායක ජනාධිපති ධුරය ආරක්ෂා කර ගන්නට ඕනෑ, එහෙම නැත්නම් රට බේරා ගන්නට බැහැයි කියා. අපි අහන්නේ මේ දින පණහ ඇතුළතදී මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට, ශිෂ්ටත්වයට, දේශපාලන සදාචාරයට විධායක ජනාධිපති ධුරය විසින් කරන ලද හානිය දිහා බලලා, ඒ හානි විඳවලා, ඒකෙන් රටට අත් වුණු අපකීර්තිය ඇස් පනාපිට දැක දැක තවත් දවසක් හෝ විධායක ජනාධිපති ධුරය ඉදිරියට ගෙන යන්න තමුන්නාන්සේලා අත ඔසවනවාද කියායි.

ගරු කථානායකතුමනි, මේ දින පණහ ඇතුළතදී විධායක ජනාධිපති ධුරයෙන් රටට කළ හානි මොනවාද කියා අහපු ප්‍රශ්නයට උත්තරයක් ලැබුණා වාගේම මීට අවුරුදු 40කට කලින් ගරු එන්.එම්. පෙරේරා මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයකටත් මේ රටේ ජනතාවට උත්තරයක් හම්බ වුණා. විධායක ජනාධිපති ධුරය රටට හඳුන්වා දෙනකොට එන්.එම්. පෙරේරා මැතිතුමා ඇහුවාලු, "හදිසියෙන්වත් මේ පුටුවේ පිස්සෙක් වාඩි වුණොත් මොකද වෙන්නේ?" කියා. අපට අවුරුදු 40ක් ගියා එතුමාගේ ප්‍රශ්නයට උත්තරයක් සොයා ගන්නට, ඒකට ප්‍රත්‍යක්ෂ කාරණා එකතු කරන්නට, මේ පුටුවේ පිස්සෙක් වාඩි වුණොත් මොකද වෙන්නේ කියා ඇස් පනාපිට දැක ගන්න.

අද මේ රටේ ජනතාවට වුවමනාවටත් වඩා හොඳින් ඔප්පු කර තිබෙනවා, එවැනි කෙනෙක් මේ පුටුවේ වාඩි වුණාට පසුව කුමන ආකාරයට හැසිරෙනවාද කියා. ඒ නිසා ගරු කථානායකතුමනි, මේ අවස්ථාව පැහැර හරින්නට අපට කිසිදු සදාචාරාත්මක අයිතියක් නැහැ. එක පැත්තකින් පාර්ලිමේන්තුව, ඒ විධායකයේ තිබෙන අත්තනෝමතිකත්වය යම් ආකාරයකට පාලනය කර තිබියදී, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් එයට තීන්දු ලැබී තිබියදී, ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩ කළා කියා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියා තිබියදී, තවදුරටත් අපි මෙය පවත්වා ගෙන යනවාද?

මම අගය කරනවා, අද කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා “ද අයිලන්ඩ්” පත්‍රයේ මුල් පිටුවේ කර තිබෙන ප්‍රකාශය. එතුමා කියනවා, "මේ ව්‍යවස්ථාව කඩපු ජනාධිපතිවරයා, ව්‍යවස්ථා විරෝධීව හැසිරුණු ජනාධිපතිවරයා තවදුරටත් මේ ධුරයේ නොසිටිය යුතුයි." කියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයාට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයෙක් කියනවා, "ව්‍යවස්ථාව කඩපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන තවදුරටත් මේ පුටුවේ නොසිටිය යුතුයි." කියා. ඒක තමයි මෙහි ඇත්ත කාරණය. තවදුරටත් අපි විධායක ජනාධිපති ධුරය පවත්වා ගෙන ගියොත් ගරු කථානායකතුමනි,- ලෝකයේ සමහර රටවල් තිබෙනවා, විධායක ජනාධිපති ධුරය පවත්වා ගෙන යන.- මේ පුටුවේ වාඩි වෙන අය හැසිරෙන්නේ මේ විධියට නම්, ඉදිරියේදී අපට විධායක ජනාධිපතිකම නොවෙයි, ජනාධිපතිකමවත් මේ රටේ තියාගන්න හම්බ වෙන්නේ නැහැ. ඒ මොකද, මේ පුටුවේ සිටින කෙනාගේ මෙවැනි හැසිරීම නිසා විධායක ජනාධිපති ධුරයට නොවෙයි, ජනාධිපති ධුරයටත් මේ රටේ ජනතාව බරපතළ විරෝධයක් ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු වෙලාවේ සමහර කුඩා කණ්ඩායම්,- ඒ ගොල්ලන්ට ලොකු පක්ෂයක එල්ලෙන්නේ නැතිව පාර්ලිමේන්තුවට එන්න බැහැ, පාර්ලිමේන්තුවට නොව ප්‍රාදේශීය සභාවකටවත් එන්න බැහැ. ඒ නිසා ඒ කණ්ඩායම් කල්පනා කරනවා, බල්ලාගේ ඇඟේ වහන මැක්කෝ වාගේ, කොහොම හරි මේකේ එල්ලිලා එන්න. එවැනි අය ලොක්කෙකුගේ ඇඟේ එල්ලෙන්න, හාමු කෙනෙක් වටේ එල්ලෙන්න ඔවැනි තනතුරු තියාගන්නට උත්සාහ කරනවා.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

ගරු කථානායකතුමනි, අපි දන්නවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කිරීමේදී, විධායක ජනාධිපති ධුරය වැනි බරපතළ ව්‍යවස්ථා සංශෝධනයක් කිරීමේදී අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකකින් සම්මත කරගන්න සිදුවන බව. ඒ වාගේම, ජනමත විචාරණයකට යන්න වෙනවා. අපි කියනවා, ජනමත විචාරණයකට යන්න ඕනෑය කියා. අද අපි අනුගමනය කරන 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දහනව වතාවක් සංශෝධනය වෙලා තිබෙනවා. කවදාවත් එය ජනතාව ඉදිරියට ගිහිල්ලා නැහැ, ජනමත විචාරණයකින් අනුමත වෙලා නැහැ. ඒ නිසා අපි ජනමත විචාරණයකට යන්න ඕනෑ, ජනතාවට අවස්ථාවක් දෙන්න ඕනෑ. මම අහන්න කැමැතියි මම කිව්ව පුංචි පුංචි කණ්ඩායම්, මේ පැත්තේ ඉන්න අර මැක්කෝ වාගේ කට්ටිය ගැන. ඒ අයගේ විරෝධතාව පැත්තක තියමු.

පසුගිය කාලයේ මෙහෙම කථාවක් කිව්වා. ඒ තමයි, "රටේ ලක්ෂ 159ක් වූ ඡන්ද දායකයන්ට තමයි පරමාධිපත්‍ය තිබෙන්නේ" කියන එක. ඇත්ත, පරමාධිපත්‍ය තිබෙන්නේ ජනතාව ළඟයි. ඒ වාගේම කිව්වා, "මේ රටේ මොකක්ද වෙන්න ඕනෑ කියන එක තීන්දු කරන්න ඕනෑ ඒ අයයි. ඒ නිසා ඒ ලක්ෂ 159ට අප ඉඩ දෙන්න ඕනෑ"යි කියලා. ඔව්, ඒක ඇත්ත. මම දැක්කා, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා කියනවා, "මේ රටේ මොකක්ද වෙන්න ඕනෑ කියන එක තීන්දු කරන්න ඕනෑ, මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225 දෙනා හෝ ශ්‍රේෂ්ඨාධිකරණය හා අනෙකුත් අධිකරණවල ඉන්න විනිසුරුවරුන් 365 දෙනා හෝ කථානායකතුමා හෝ ජනාධිපතිතුමා නොවෙයි; ලක්ෂ 159ක් වන ඡන්ද දායකයිනුයි" කියලා. ඒක හොඳයි. ඡන්ද දායකයාට එය තීන්දු කරන්න අපි අවස්ථාව දෙමු. ඡන්ද දායකයාට තීන්දු කරන්න අවස්ථාව දෙන්න නම් විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ යෝජනාවට පාර්ලිමේන්තුවෙන් බාධා නොකළ යුතුයි. පාර්ලිමේන්තුව ඒ යෝජනාව අත්හිටුවීම නොකළ යුතුයි. ජනතාවට අවස්ථාව දෙන්න ඕනෑ. ඒ නිසා කරුණාකර, විධායක ජනාධිපති ධුරය සම්බන්ධයෙන් අපේ තිබෙන මතය එසේම තිබියදී, අර කිව්වා වාගේ විධායක ජනාධිපති ධුරය තව දුරටත් පවත්වා ගෙන යා යුතුද, නැද්ද කියන එක තීන්දු කරන්න අපි මේ රටේ ජනතාවට අවස්ථාවක් දෙමු. විධායකය හොඳයි කියලා ජනතාව තීන්දු කරනවා නම් අපි ඒක පිළිගනිමු. හැබැයි, ඒක මෙතැනින් block කරන්න එපා; මේ 150කින් block කරන්න එපා. ඒ අවස්ථාව ජනතාවට දෙන්න.

පසුගිය ජනාධිපතිවරණය වෙලාවේ එක්සත් ජාතික පක්ෂයේ අයත් මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ මැතිවරණ වේදිකාවේදී විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සම්බන්ධයෙන් බොහෝ දේවල් කිව්වා. නමුත්, මම අහගෙන හිටියා, ඊයේ අගමැති රනිල් වික්‍රමසිංහ මහත්මයා කියනවා, ඊළඟ මහ මැතිවරණයෙන් තුනෙන් දෙකක බලයක් ඒ ගොල්ලන්ට දෙන්න, එතකොට විධායකය අහෝසි කරන්නම් කියලා. "නොකෙරෙන වෙදකමට කෝඳුරු තෙල් හත් පට්ටයකුත් තව පොඩ්ඩකුත් ඕනෑ" යි කියන එකටනේ, ඔය යන්න හදන්නේ. "තුනෙන් දෙකේ බලය අපට දෙන්න, අපි මේක වෙනස් කරන්නම්" කියලයි කියන්නේ. තුනෙන් දෙකක බලය ගත්ත එක පාර්ලිමේන්තුවක්වත් ඒක වෙනස් කළේ නැහැ. මහින්ද රාජපක්ෂ මහත්මයා 2010 පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් අරගෙන නොවෙයි, තුනෙන් දෙකක බලයක් හදාගෙන කරපු එකම දේ මොකක්ද? ඒ, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරලා, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා විධායකයේ බලය තවදුරටත් වැඩි කරගත්ත එකයි. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා අඩු තරමින් මේ අත්තනෝමතික විධායක ජනාධිපති ධුරය වාර දෙකකට සීමා කර තිබුණා. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ ඒ සීමාවත් අයින් කර දැම්මා, තුනෙන් දෙකක් හදාගෙන. ඒ නිසා තුනෙන් දෙකක බලයක් ගත්ත කිසිම නායකයකු, පක්ෂයක බලයක් ගත්ත නායකයකු, පාර්ලිමේන්තුවේ සරල බහුතරයක් නොවෙයි, තුනෙන් දෙකේ බලයක් තිබෙන නායකයකු කිසි දවසක ඔය විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්නේ නැහැ. අහෝසි කරනවා නම් මේක තමයි අවස්ථාව. ඒ, කාටවත් සරල බහුතරයක්වත් හදා ගන්න බැරි මේ අවස්ථාව.

මේ අවස්ථාවේදී අපි සියල්ලෝම එකතු වෙමු. අඩු තරමින් ඒ කුමන්ත්‍රණය පරාජය කරන්න පසුගිය දින 50 ඇතුළත එකතු වුණු සියලුදෙනාටම අපි කියනවා, මේ වෙලාවේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, දේශපාලන සදාචාරය සහ ශිෂ්ටත්වය වෙනුවෙන් එක පෙළට සිටගෙන විධායක ජනාධිපති ධුරය අහෝසි කරලා අපි මේ පාර්ලිමේන්තුව පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් දක්වා ගමන් කරවමු කියලා. අපි මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කණ්ඩායමටත් එය කියනවා. මේ විධායක ජනාධිපති ධුරයෙන් ඔබ ඕනෑ තරම් බැට කෑවා. 2010දීත් පැහැදිලිව එය කියලා තිබෙනවා. 2010 අමතක කරන්න. මේ දවස් 50 තුළ 'මහින්ද රාජපක්ෂ' කියන චරිතය සහ ප්‍රතිරූපය බිඳ වැට්ටුවේ, පහළ අඩියට ඇද දැම්මේ, සවුත්තු කළේ වෙන මොකකින්වත් නොවෙයි; විධායක ජනාධිපති ධුරයේ බලතල පාවිච්චි කරලායි. මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ප්‍රතිරූපයටත් බැරි වුණා, විධායකයෙන් තමන්ට එල්ල වන ඒ අවමානයෙන් වළකින්නට. ඒ නිසා එතුමාටත් අයිතියක් සහ අවස්ථාවක් තිබෙනවා, තමන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ 1988 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත් එක්ක, 1994 දී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියත් එක්ක, 1999 දී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියත් එක්ක ඉන්න කාලයේදී මෙන්ම, 2005 දී තමන්ම, 2010 දී තමන්ම, 2015 දී කෙළින් නැතිව වක්‍රව හරි තමන්ම ඉදිරිපත් කරපු දේශපාලන ලියවිල්ල අනුව කටයුතු කරන්න. කොහොමටත් මේ ව්‍යවස්ථාව තිබෙන තෙක් එතුමාට ආයෙත් ජනාධිපතිවරණයකට ඉදිරිපත් වන්න බැහැ. දැන් වටේ ඉන්න කට්ටිය කියනවා ඇති, "නැහැ, නැහැ, මේකෙත් කොහේ හරි ඇති, ඉදිරිපත් වන්න පුළුවන් කියලා" කියා. ඒ කියන්නේ ආයෙත් උස්සා පොළොවේ ගසන්න. එම නිසා අපි ඔබතුමාටත් කියන්නේ ඔබතුමාගේ කණ්ඩායම මෙහෙයවා ගන්න; ඔබතුමාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙහෙයවා ගන්න; ඔය වටේ ඉන්න, ඔබතුමාගේ සාටකයේ එල්ලී පාර්ලිමේන්තුවට රිංගන්න දඟලන, අර කවුද කිව්වා වාගේ උසාවියේ පඩි පෙළේ ඉඳගෙන voice-cut දෙන ගොඩ පෙරකදෝරුවන්ගේ අදහස් නොවෙයි; ඔබතුමාගේ වටේ ඉන්න ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ගේ අදහස් අහන්න. අර විජිත් විජයමුණි සොයිසා වාගේ එදා ඉඳන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් දර දිය ඇදපු, කුමාර වෙල්ගම වාගේ එදා ඉඳන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බර ඇදපු ඒ මිනිසුන්ගෙන් අහන්න, මේකේ ඇත්ත කථාව මොකක්ද කියලා. අන්න එදාට ඔබතුමාටත් හෘදය සාක්ෂිය අනුව තීන්දුවක් ගන්න පුළුවන් වෙයි, විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා තමන්ගේ මතය, ස්ථාවරය ප්‍රකාශයට පත් කරන්න. ඒ සඳහා අපි සියල්ලෝම එකතු වෙමු. අපි ලෑස්තියි, කාටත් ඒ ගෞරවය දෙන්න. ජාතික වැදගත්කමක් තිබෙන දෙයක් හැටියට සලකා හැමදෙනාම මේකට කර ගහනවා නම්, මේ මල් වට්ටියට අත ගහනවා නම්, ඒකේ පින හැමෝටම දෙන්න, පින් අනුමෝදන් කරන්න අපි සූදානම්. ජනතා විමුක්ති පෙරමුණ විසින් මේ සංශෝධනය ගෙනා නිසා කුහකකමින් මේකට විරුද්ධ වන්න එපා. මේ කටයුත්ත මේ පාර්ලිමේන්තුව කරපු ඓතිහාසික වැඩක් බවට අපි පත් කර ගනිමු. කොහොම වුණත්, 2015 දී ලක්ෂ 62ක ජනතාවක් ඡන්දය දීලා පත් කර ගත් ජනාධිපතිවරයාගේ සියලු පව් හෝදා දාන්න පුළුවන්, මේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ කටයුත්තට මුල පුරනවා නම්.

දැන් ඔය එක එක ගේම් ගහලා ආයෙත් ජනාධිපති වෙන්න හෝ එක එක් කෙනාගේ කර උඩින් රිංගා හෝ නැවතත් ජනාධිපති පුටුවේ වාඩිවෙන්න තිබෙන සිහින එකක්වත් ඉෂ්ට වන ඒවා නොවෙයි. විනාශ වන, එහෙම නැත්නම් නිවෙන්න හදන බල්බයක් නැවත පත්තු කරන්න බැහැ. ජනාධිපතිතුමනි, ඒ විධියට ඔබතුමා මෙය තේරුම් ගෙන මේ අවුරුදු පහ අවසන් වනකොට විධායක ජනාධිපති ධුරය අහෝසි කරලා පාර්ලිමේන්තුවට බලය පවරා යන ජනාධිපති බවට පත්වන්න ඔබතුමාට පුළුවන්. ඒ වාගේම මේ පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ට ඒ ඓතිහාසික අවස්ථාවට උර දෙන්න, කර දෙන්න පුළුවන්කම තිබෙනවා. එම නිසා තව දුරටත් ප්‍රමාද නොකර අපි ඉදිරිපත් කර තිබෙන විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකකින් අනුමත කරලා අපි ජනතාව ඉස්සරහට ගිහිල්ලා ජනතාවගේ අනුමැතිය අරගෙන මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ශක්තිමත් පදනමක් දැමීම -හොඳ අත්තිවාරමක් දැමීම,- සඳහා මේ මහඟු කටයුත්තට අපි හැමදෙනාම එක සේ දායක වෙමු කියන ඉල්ලීම කරමින් මම නතර වෙන්නම්. ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එම යෝජනාව ස්ථිර කිරීම, ගරු විජිත හේරත් මැතිතුමා. ඒ වාගේම අද ගරු සභාවේ වැඩ කටයුතු පස්වරු 4.30 දක්වා කරගෙන යන්න අපි බලාපොරොත්තු වනවා.

[අ.භා.2.03]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු කථානායකතුමනි, නලින්ද ජයතිස්ස මන්ත්‍රීවරයා ඉදිරිපත් කරපු යෝජනාව මා ස්ථිර කරමින් වචන කීපයක් ඉදිරිපත් කරන්න ඔබතුමාගෙන් අවසර ඉල්ලනවා.

අද දවස මේ රටේ පාර්ලිමේන්තු ඉතිහාසයේ ඓතිහාසික දවසක්. දින 50ක් රට හෙල්ලූ ඒ කාලය අවසන් කරලා, පාර්ලිමේන්තුවත්, රටත් යථා තත්ත්වයට පත් කරන ආරම්භක දවස අදයි. මේ අර්බුදකාරී තත්ත්වය නිර්මාණය කළේ අත්තනෝමතික බලයක් සහිත විධායක ජනාධිපති ක්‍රමය බව අපි වාගේම මුළු රටම ඉතා පැහැදිලිව දැක්කා. ඕනෑම රටකට නායකත්වයක් අවශ්‍යයි. හැබැයි, නායකත්වයක් ඇති කරනවා කියලා ඒ නායකයා වෙනුවට මුල් පුටුවට පිස්සෙක් පත් කළොත් රටකට අත් වන ඉරණම මොකක්ද කියන එක අපි අද අත් දකිනවා. ඒ නිසා නායකයෙක් උන්මත්තකයෙක් හෝ පිස්සෙක් වෙන්න බැහැ. නීතියක්, සදාචාරයක් කඩලා වැඩ කරන්න කිසිදු නායකයෙකුට අයිතියක් නැහැ. ඒක මේ දින 50 මෙහෙයුම ඇතුළේ මුළු රටම අත් දැක්කා. එදා 2015 ජනවාරි 08 වැනි දා අපේ රටේ දේශපාලන වෙනසක් ඇති වුණා. ඒ වෙනස ඇති වෙන්න බලපාපු ප්‍රධාන සාධකය තමයි, ඊට පෙර පැවති ඒකාධිපති විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම කියන කාරණය. ඒ නිසා තමයි "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම" මෛත්‍රීපාල සිරිසේන අපේක්ෂකතුමාගේ ප්‍රධාන ඡන්ද පොරොන්දුව බවට පත් වුණේ. එතුමා ජනතාවගෙන් ජන වරම ඉල්ලුවේ, "මට දින 100ක් දෙන්න. ඒ දින 100 ඇතුළත මම මේ ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න සූදානම්" කියායි. එතුමා ඒ කටයුත්ත කරයි කියලා මුළු රටම බලාපොරොත්තු වුණා. හැටදෙලක්ෂයක් ජනතාව එතුමාට ඡන්දය දුන්නා. නමුත් එතුමාගේ ඒ පොරොන්දුව අමු-අමුවේ මහ දවාලේ කඩ කරනවා; උල්ලංඝනය කරනවා අපි දැක්කා. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා වෙනුවට එහි බලතල කප්පාදු කරන තැනට අපට එදා යන්න සිදු වුණා. ඒ, එදා මේ පාර්ලිමේන්තුවේ තිබුණු සංයුතියේ යථාර්ථය නිසයි. එදා එක්සත් ජනතා නිදහස් සන්ධානයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ අනිකුත් පක්ෂ එකතුව මන්ත්‍රීවරුන් 162ක් හිටියා. එක්සත් ජාතික පක්ෂයට මන්ත්‍රී ධුර 42යි, ජනතා විමුක්ති පෙරමුණේ අපට තිබුණේ මන්ත්‍රී ධුර 3යි, ගරු කථානායකතුමනි. හැබැයි, අපි සියල්ලෝම එදා එකතු වුණා. මේ ඒකාධිපති විධායක බලතල පාර්ලිමේන්තුවට පුළුවන් ප්‍රමාණයෙන් කප්පාදු කළ යුතුයි කියන එක කාටත් තේරුණා. ඒ නිසා තමයි, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් තැබූ ඉදිරි පියවරක් විධියට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ. ඒ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඡන්දය දුන්නේ මේ පාර්ලිමේන්තුවේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු 42යි. වැඩිපුරම ඡන්දය දුන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මන්ත්‍රීවරු. "එහි වැරැදි අඩුපාඩු තිබෙනවා. කොමාවේ ප්‍රශ්න, ඉස්පිලි පාපිලි ප්‍රශ්න, 33(2) ප්‍රශ්නය, 70(1) ප්‍රශ්න" කියමින් අද එක එක නීති තර්ක දාපු ඔය සියල්ලෝම එදා ඒවාට අත් දෙක ඉස්සුවා. බහුතරයක් ඡන්දය දුන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන්. ජවිපෙ අපි දුන්නේ ඡන්ද තුනයි. හැබැයි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කියන්නේ ඉදිරි පියවරක් කියලා අපි ඉතා පැහැදිලිව දැක්කා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අඩුපාඩු තිබෙනවා කියලා බොහෝ අය කිව්වා. හැබැයි, ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කරන ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉතා පැහැදිලි, ඓතිහාසික තීන්දුවක් ලබා දුන්නා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඔය මතු කරන ආකාරයේ කිසිදු වැරැද්දක් නැහැ කියලා. මතු කරපු නීති තර්ක සියල්ලම වැරැදියි, ඒ සියල්ලම හිතලුවක් කියලා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉතාම වැදගත් විධියට තීන්දුවක් ලබා දුන්නා.

ගරු කථානායකතුමනි, ඒ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව මොකක්ද? ඒ තීන්දුවේ කිසි තැනක ඡන්ද එපා කියලා නැහැ. දැන් වැරැදි මතයක් හදනවා. මහින්ද රාජපක්ෂ මහත්මා ඉල්ලා අස් වන අවස්ථාවේදී කියනවා මම දැක්කා, "ශ්‍රේෂ්ඨාධිකරණය ඡන්ද එපා කියනවා" කියලා. ඊළඟට, ජනාධිපතිතුමා ප්‍රකාශය සිදු කරන වෙලාවේදී කිව්වා, "අධිකරණයෙන් ඡන්ද එපා කියලා තිබෙනවා" කියලා. අධිකරණය කිසිම තැනකදී ඡන්ද එපා කියලා නැහැ. පිටු 88ක් තිබෙන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවේ කිසි තැනක ඡන්ද එපා කියලා නැහැ.

ගරු කථානායකතුමනි, මේ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් ඉතා පැහැදිලිව මේ රටේ සියලු පුරවැසියන්ගේ ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම තමයි කරලා තිබෙන්නේ. ඉතා පැහැදිලිව එහි වගන්තිවලින්ම සඳහන් කරලා තිබෙනවා, ජනතාව සතු ඡන්ද අයිතිය උල්ලංඝනය කරන්න කිසි කෙනෙකුට බැහැයි කියලා.

මේ ඓතිහාසික නඩු තීන්දුවේ ප්‍රධාන වැදගත් කරුණු දෙකක් තිබෙනවා. පළමු කරුණ මෙයයි. "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, මූලික අයිතිවාසිකම් යටතේ ඇති සියලු පුරවැසියන් සමාන ලෙස සැලකිය යුතුයි කියන 12.(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇත". පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයා දුන් තීන්දුවෙන්, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12.(1) ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇත". ඒ කියන්නේ, සියලු පුරවැසියන් සමාන සේ සැලකීම කියන ව්‍යවස්ථාව උල්ලංඝනය වී ඇත කියන එකයි.

දෙවැනි කරුණ, "මේ රටේ ජනතාවගේ ඡන්ද අයිතිය උල්ලංඝනය කර ඇත". ඉතා පැහැදිලිව තිබෙන්නේ ඒක. කිසි කෙනෙකුට ඡන්ද අයිතිය උල්ලංඝනය කරන්න බැහැ. ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු 225දෙනා තෝරා පත් කර ගත්තේ 2015 අගෝස්තු මාසයේ පැවැති

[ගරු විජිත හේරත් මහතා]

මැතිවරණයෙන් බව අපි කවුරුත් දන්නවා. ජනතාව තමයි අපට ඒ ඡන්දය දුන්නේ. ජනතාව අපට ඡන්දය දුන්නේ, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත වුණාටත් පස්සේ. ඊට පෙරාතුව නොවෙයි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඉතා පැහැදිලිව තිබෙනවා, "අවුරුදු පහක කාල සීමාවක් සඳහා මේ පාර්ලිමේන්තුවේ ධුර කාලය පවතිනවා" කියලා. ජනතාව මන්ත්‍රීවරුන්ට ඡන්දය දෙන්නේ, අවුරුදු පහක කාලයක් තමන් වෙනුවෙන් තීන්දු - තීරණ ගන්න, ප්‍රතිපත්ති හදන්න හා මූල්‍ය පාලනය පිළිබඳ වගකීම දරන්න. ජනතා නියෝජිතයෝ පත් කරලා එව්වේ ඒකට. ඒක තමයි නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ ක්‍රමවේදය. එතකොට දැන් මේ සිද්ධ වුණේ මොකක්ද? ජනතාව විසින් මහජන නියෝජිතයින්ව තෝරා පත් කර එව්වා. කොහේද ඉන්න පුද්ගලයෙක්, -මෛත්‍රීපාල සිරිසේන නැමැති පුද්ගලයෙක්- මේ රටේ ජනතාව දීපු ඒ ඡන්ද වරම පැහැර ගත්තා. තනි පුද්ගලයෙකුට එහෙම බලයක් කොහේද දීලා තිබෙන්නේ? ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් එහෙම බලයක් දීලා නැහැ. විධායක ජනාධිපති බලය තිබෙනවා කිව්වාට ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් දීපු ඡන්දය තනි පුද්ගලයෙකුට පැහැර ගන්න බලයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ -රටේ මූලික නීතියේ- කොහේවත් සඳහන් කරලා නැහැ. ඒ නිසා ශ්‍රේෂ්ඨාධිකරණය ඉතා පැහැදිලිව කිව්වේ, "කොහේවත් ඉන්න කෙනෙකුට -ජනාධිපතිට හෝ කවර හෝ පුද්ගලයෙකුට.- ජනතාවගේ ඡන්ද අයිතිය පැහැර ගන්න අයිතියක් නැහැ. ඒක වැරදියි. හිතුමතේට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් සිද්ධ වුණේ, ජනතාවගේ ඡන්ද අයිතිය උල්ලංඝනය කිරීමක්" කියලා. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව, "ඡන්දය එපා" කියලා දීපු තීන්දුවක් නොවෙයි. මේ දෙන්නේ, වැරදි අර්ථ කථන. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව දීලා තිබෙන්නේ, ඡන්දය ආරක්ෂා කරන්න; ඡන්ද අයිතිය ආරක්ෂා කරන්න. ඒක උල්ලංඝනය කරන්න බැහැ. සියලු පුරවැසියෝ එක හා සමානයි. මෛත්‍රීපාල සිරිසේන මහතාත් මේ රටේ පුරවැසියෙක්. ඒ හැමෝම මේ රටේ පුරවැසියෝ. පුරවැසියන්ට තිබෙන්නේ සමාන වූ අයිතියක්. ඒක කාටවත් පැහැර ගන්න බැහැ කියලායි තීන්දුව දීලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, ඒ ඓතිහාසික නඩු තීන්දුවේ 87වන පිටුවේ තිබෙන වැදගත් වාක්‍ය කොටස මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න මම කැමැතියි.

> "....if this Court were to deny relief merely on the basis that the Petitioners have failed to establish 'unequal treatment', we would in fact be inviting the State to 'equally violate the law.' It is blasphemous and would strike at the very heart of Article 4 (d) which mandates every organ of the State to "*respect, secure and advance the fundamental rights recognized by the Constitution*". Rule of Law dictates that every act that is not sanctioned by the law and every act that violates the law be struck down as illegal. It does not require positive discrimination or unequal treatment. An act that is prohibited by the law receives no legitimacy merely because it does not discriminate between people."

ගරු කථානායකතුමනි, මෙහිදී ඉතා පැහැදිලිව කියනවා, "equally violate the law" කියා; සමානව නීතිය උල්ලංඝනය කරන්න බලයක් දුන්නාය කියලා. නීතිය ආරක්ෂා කරන්න නොවෙයි, සමානව නීතිය උල්ලංඝනය කරන්න බලයක් දෙනවා. එහෙම බලයක් දෙන්න බැහැ. පාර්ලිමේන්තුව විසුරුවා හැරීම පිළිගත්තොත්, සමානව නීතිය කඩන්න, නීතිය උල්ලංඝනය කරන්න බලයක් පැවරෙනවාය කියලා තමයි තිබෙන්නේ. ඒ නිසා ඒක දෙන්න බැහැ. ඒක වැරැදියි. ඒක තමයි ඉතා පැහැදිලිව මේ නඩු තීන්දුවෙන් කියා තිබෙන්නේ. මේ නඩු තීන්දුවෙන් ආරක්ෂා කරලා තිබෙන්නේ, මේ රටේ ජනතාව සතු පරමාධිපත්‍ය බලය, පාලන බලතල සහ ඡන්ද බලයයි. ඒ නිසා වැරැදි අර්ථ කථන ඕනෑ නැහැ, ගරු කථානායකතුමනි. විධායක ජනාධිපතිවරයා සතුව තිබුණු අත්තනෝමතිකව පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය අපි එදා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් කප්පාදු කරනු ලැබුවා. එය ඓතිහාසික පියවරක්; ප්‍රගතිශීලී පියවරක්. ඒක එහෙම නොවුණා නම්, අද අපට මේ විධියට මේ පාර්ලිමේන්තුව රැස්වෙන්න සිද්ධ වෙන්නේ නැහැ; මේ රටේ ජනතාවගේ ආර්ථික, සමාජයීය ප්‍රශ්න නිරාකරණය කර ගන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ.

දෙවන කරුණ මෙයයි, ගරු කථානායකතුමනි. මේ නඩු තීන්දුවේ ඉතා පැහැදිලිව කියනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12.(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්න බැහැයි කියලා. මේ නඩුවේදී ඉදිරිපත් කරපු කරුණු අනුව මෙසේ ඉතා පැහැදිලිව සඳහන් කරනවා:

> "The Proclamation marked "P1" has been issued outside legal limits and has resulted in a violation of Petitioner's rights both in his capacity as a parliamentarian legitimately elected to represent the People and in the capacity of a citizen who is entitled to be protected from any arbitrary exercise of power.
>
> For the reasons set out above, I hold that the Petitioners' rights guaranteed under Article 12 (1) of the Constitution have been violated by the issue of the Proclamation filed with the petition in SC FR 351/2018 marked "P1" and make order quashing the said Proclamation and declaring the said Proclamation marked "P1" null, *void ab initio* and without force or effect in law."

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12.(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කරන්න කිසිසේත්ම ඉඩ දෙන්න බැහැ. ඒ ව්‍යවස්ථාව සියලු පුරවැසියන් සමානව සලකන ව්‍යවස්ථාවක්. එය ඉතාම වැදගත් ව්‍යවස්ථාවක්" කියලා මේ නඩු තීන්දුවේ සඳහන් වෙනවා. ගරු කථානායකතුමනි, මේ නඩු තීන්දුව ඉතා වැදගත් ඓතිහාසික නඩු තීන්දුවක් නිසා මේ නඩු තීන්දුව හැන්සාඩ්ගත කරන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිමින් මෙය **සභාගත*** කරනවා.

මොකද, මේ නඩු තීන්දුව තමයි විධායක ජනාධිපතිවරයා සතුව තිබුණු, තිබෙනවාය කියා පාවිච්චි කරන්න හදපු අත්තනෝමතික බලයක් නැහැයි කියලා ලංකා ඉතිහාසයේ පළමුවන වතාවට තීන්දු කරපු, මේ රටේ ජනතාවගේ ඡන්ද අයිතිය ආරක්ෂා කරපු, ඒ වාගේම සියලු පුරවැසියන් සමානව සැලකිය යුතුයි කියන එක නැවත තහවුරු කරපු ඓතිහාසික නඩු තීන්දුව.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි. මේ දින 50 තුළ අපි දැකපු බොහෝ දේවල් තිබෙනවා. ඒ සිදු වීම් ගැන නැවත-නැවත පෙරළා කථා කරන්න අවශ්‍ය නැහැ. නමුත් මේ දින 50 තුළ තමයි මේ රටේ සියලු පුරවැසියන් තේරුම් ගත්තේ විධායක ජනාධිපති ක්‍රමය කියන එක මොන තරම් අවුල් සහගත එකක්ද කියලා. මොන තරම් ඛේදවාචකයන් මේ රටට -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *took the Chair.*

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ජනතාවට පොත් ගණනාවකින් -කෘති ගණනාවකින්- ඉගෙන ගන්න බැරි දේවල් එම දින 50 තුළ අත්දැකීම් තුළින් ඉගෙන ගන්න ඉතාම අනඟි අවස්ථාවක් ලැබුණා. ඒ අතින් ගත්තාම මේ අර්බුදය ඇති වුණු එක රටේ ජනතාව දේශපාලන වශයෙන් සවිඥානක වෙන්න වැදගත් පියවරක් වුණා. නමුත්, එම අර්බුදය රටට අනතුරුදායකයි. ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන්, දේශපාලන වශයෙන් අනතුරුදායක වුණා. හැබැයි, ජනතාව පාඩම් ඉගෙන ගන්න පැත්තෙන් බැලුවාම, පොත් ගණනාවකින් ඉගෙන ගන්න බැරි දේවල් අත්දැකීම්වලින් ඉගෙන ගන්න මේ දින 50 වාසියක් වුණා.

එදා රවුෆ් හකීම් මැතිතුමාගේ පක්ෂය -මුස්ලිම් කොංග්‍රසය- රිසාඩ් බදියුදීන් මැතිතුමාගේ පක්ෂය, ඒ වාගේම කඳුරට නියෝජනය කරන දෙමළ දේශපාලන පක්ෂ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සම්බන්ධයෙන් යම් යම් සැකසංකා පහළ කරලා තිබුණා. එතුමන්ලා කිව්වා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළොත් සුළු ජාතිකයන්ට අසාධාරණයක් වෙනවා කියලා. එතුමන්ලා හිතුවේ, දෙමළ ජනතාවගේ සහ මුස්ලිම් ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන එකම ගැලවුම්කාරයා විධායක ජනාධිපතිවරයා කියායි. හැබැයි, එතුමන්ලාට අත්දැකීමෙන් තේරුම් ගන්න පුළුවන් වුණා, "නැහැ, ඒක එහෙම නොවෙයි, විධායක ජනාධිපති ක්‍රමය මඟින් වතුකරයේ සිටින දෙමළ ජනතාව ඇතුළු සියලු දෙමළ ජනතාවගේ සහ මුස්ලිම් ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදු කරනවාය" කියන කාරණය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12. (1) සහ 12. (2) ව්‍යවස්ථාවලින් කියන්නේ, සියලු පුරවැසියන් සමානව සලකන්න කියන එකයි. එතකොට දෙමළද, මුස්ලිම්ද කියලා භේදයක් නැහැ. ජනාධිපතිවරයා උල්ලංඝනය කළේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12. (1) සහ12. (2) ව්‍යවස්ථා; නැති කළේ ඒ සැලකීම. සියලු ජනතාවගේ සමාන මූලික අයිතිවාසිකම් තමයි විධායක ජනාධිපතිවරයා විසින් අමු අමුවේම නැති කළේ. දෙමළ ජනතාවගේ සහ මුස්ලිම් ජනතාවගේ අයිතිවාසිකම් තමයි ඒ උදුරා ගත්තේ. එම නිසා විධායක ජනාධිපති ධුරය දෙමළ ජනතාවගේ සහ මුස්ලිම් ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනවාය කියා ඔවුන් තව දුරටත් මිථ්‍යා මතයක ඉන්න එක වැරැදියි; එහෙම මිථ්‍යා මතයක ඉන්න එපා. එහෙම කරන්නේ නැහැ කියන එක අපි දැක්කා. උතුරේ, නැඟෙනහිර, ඒ වාගේම කඳුකරයේ, රටේ සෑම තැනම සිටින මුස්ලිම් සහ දෙමළ සියලු ජනතාවගේ අයිතිවාසිකම් ඒ මඟින් කප්පාදු වුණා. සිංහල, දෙමළ සහ මුස්ලිම් යන සියලු ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදු වුණා. එම නිසා "අපි තව දුරටත් මහ ජාතිය නොවෙයි, අපි සුළු ජාතිය, අපේ ගැලවුම්කාරයා විධායක ජනාධිපතිවරයා"ය කියන මිථ්‍යාවේ ඉන්න එපා. ඒ මතය වැරැදියි කියන එක මේ අත්දැකීම් සහිතවම අපට ඉතාම පැහැදිලි පාඩමක් ඉගැන්වූවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම, මේ විධායක ජනාධිපති ක්‍රමය සම්බන්ධයෙන් තවත් ප්‍රශ්නයක් මතු කරනවා, "මේකෙන් තමයි රට බෙදෙන්නේ නැතුව තිබෙන්නේ, විධායක ජනාධිපති ක්‍රමය නැත්නම් රට ෆෙඩරල් වෙනවා, රට කෑලි නවයකට කැඩෙනවා, රට අස්ථාවර වෙනවා, රට අරාජික වෙනවා" කියලා. කවුද රට අස්ථාවර කළේ? කවුද රට අරාජික කළේ? ඒක කළේ මේ විධායක ජනාධිපති ක්‍රමයනේ. පසුගිය දින පනහේ රට අස්ථාවර කළේ, රට අරාජික කළේ වෙන කවුරුවත් නොවෙයි, විධායක ජනාධිපති ධුරය. ඒ ධුරයේ වාඩි වෙන්නේ මහින්ද රාජපක්ෂද, ජේ.ආර්. ජයවර්ධනද, ආර්. ප්‍රේමදාසද, මෛත්‍රීපාල සිරිසේනද කියන එක අදාළ නැහැ. බොහෝ අය හිතුවේ, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මෙහෙම දැඩි තීන්දු ගන්න එකක් නැහැ කියලා. ඒ නිසා තමයි සමහර අය කිව්වේ, "පතෝල වාගේ ජනාධිපති" කියලා. ඒ විධියේ එක එක ජාතියේ කථා කිව්වා නේ. "පණ නැහැ" කිව්වා නේ. අන්තිමට පණ ගත්තා නේ. පණ ගත්තේ, ව්‍යවස්ථාවේත් නැති විධියට. පණ නහ ගන්න වැඩ කළේ. ඒ නිසා මේ ධුරයේ තමයි ප්‍රශ්නය තිබෙන්නේ; පුද්ගලයාගේ නොවෙයි. ඇත්තටම ගත්තොත් මේ ධුරය පිළිබඳව තමයි අපේ විවේචනය තිබෙන්නේ. අපට තිබෙන්නේ පුද්ගලයා පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. හෙට රනිල් වික්‍රමසිංහ මහත්මයා මේ පුටුවේ වාඩි වුණත් සිද්ධ වෙන්න පුළුවන්, මේ දේ. ඒ නිසා මේ ධුරය නැත්නම් රට කැඩෙනවා, රට බෙදෙනවා කියලා එකක් කිසිසේත්ම නැහැ. මේ දේශපාලන බල උවමනාවෙන් කෑ ගහන සමහර දේශපාලුවන්ගේ වැරදි කථා අහලා අපේ ගෞරවනීය හාමුදුරුවන් වහන්සේලා හිතනවා, විධායක ජනාධිපති ක්‍රමය නැති කළොත් රට බෙදෙනවා, රට කැඩෙනවා කියලා. අපේ හාමුදුරුවනේ, ඉතා ගෞරවයෙන් ඔබවහන්සේලාට අපි කියන්නේ මේකයි. ඉතිහාසයේ අපේ -ජනතා විමුක්ති පෙරමුණේ- භාවිතාව දිහා බලන්න. කිසි මොහොතකදී මේ රට කඩන්න, බෙදන්න අපි ඉඩ දීලා නැහැ. එදා උතුරෙන් නැඟෙනහිර වෙන් කරන්න අවශ්‍ය වූ ඒ ඓතිහාසික තීන්දුව ගත්තේ ජනතා විමුක්ති පෙරමුණේ අපි. එදා රට කඩන වැරදි මත හදමින්, ජන සංයුතියේ ව්‍යාප්තියේ වැරදි ප්‍රතිශත පෙන්වන්න හදපු අවස්ථාවේ ඒකාබද්ධ කරපු උතුරු -නැඟෙනහිර වෙන් කරන්න ඕනෑය කියන ස්ථාවරයට මැදිහත් වුණේ ජනතා විමුක්ති පෙරමුණ. නැවත ඒවා එකතු කරන කථාවක් නැහැ. රට බෙදන්න අපි කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ. ජීවිත පරිත්‍යාගයෙන් අපි මේ රට තනි රටක් විධියට ආරක්ෂා කර ගන්න මැදිහත් වෙලා තිබෙනවා. 60,000ක් අපේ සාමාජිකයන් ජීවිත පරිත්‍යාග කළා රට බේරා ගන්න; රට ආරක්ෂා කර ගන්න. ඒ නිසා අපි මේ රට බෙදන්න දෙන්නේ නැහැ. අපි ඉදිරිපත් කරලා තිබෙන විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළ එක වාක්‍යයක්, එක වචනයක්, එක ඉස්පිල්ලක්, පාපිල්ලක් රට බෙදන, රට කඩන පැත්තට නැහැ. අපි අභියෝග කරනවා, අපි අභියෝග කළා, රට බෙදන, රට කඩන එක වගන්තියක් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙනවා කියලා පුළුවන් නම් පෙන්වන්න කියලා. අඩුම ගණනේ පළාත් සභා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා සතුව තිබෙන බලයටවත් -ඒ කිසිවකටත්- අපි අත තියලා නැහැ. පළාත්වල ආණ්ඩුකාරවරුන් පත් කිරීමේ බලය ජනාධිපතිවරයාට එලෙසම තිබෙනවා; ආණ්ඩුකාරවරුන් ඉවත් කිරීමේ බලය එලෙසම තිබෙනවා.

යම් කිසි පළාතක් හෝ පළාත් කිහිපයක් වෙනම රාජ්‍යයක් ලෙස ප්‍රකාශයට පත් කළහොත්, ඒ ක්ෂණයෙන් එය විසුරුවා හැරීමේ බලය ජනාධිපතිවරයා සතුව තිබෙනවා. එයට විධායක බලතලම අවශ්‍ය නැහැ. එයට අත්තනෝමතික විධායක බලයම ඕනෑ නැහැ. ඒ බලයට අපි මේ සංශෝධනයේදී අත තියලාවත් නැහැ. එම නිසා මෙතැන රට බෙදන, රට කඩන කථාවක් නැහැ. බොරු බියක් ඇති කරලා, ජනතාව කුලප්පු කරලා ඒ හරහා පටු දේශපාලන වාසිය ගන්න හදනවා. ජාතික සමඟිය පැත්තට යන්න ඕනෑ අවස්ථාවකයි අපි ඉන්නේ. ජනතා විමුක්ති පෙරමුණ ඉතිහාසයේ සිට ජාතීන් අතර සමඟිය ඇති කිරීම වෙනුවෙන් විශාල කැප කිරීම් කර තිබෙන පක්ෂයක්. අදත් අපි ඒ වෙනුවෙන්

[ගරු විජිත හේරත් මහතා]

නිර්භීතව ඉන්නවා. ජාතික සමඟිය ඇති කිරීමට අපි එක රටක් විධියට ජීවත් වෙන්න ඕනෑ. සිංහල වේවා, දෙමළ වේවා, මුස්ලිම් වේවා, මැලේ වේවා, බර්ගර් වේවා මොන ජාතිකත්වයට අයිති වුණත් අපි එක රටක මිනිස්සු. අපි හැමෝගෙම ඇඟේ තිබෙන්නේ රතු පාට ලේ. සිංහල ලේවල එක පාටක්, දෙමළ ලේවල වෙන පාටක් නැහැ. ඒ සමඟිය ආරක්ෂා කරන්න නම්, අපි අපේ අයිතිවාසිකම් සුරකින්න ඕනෑ. අපේ නිදහස ආරක්ෂා කරන්න ඕනෑ. දෙමළ ජනතාවගේ, මුස්ලිම් ජනතාවගේ නිදහස සාක්ෂාත් වෙන්නේ කොතැනද, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වෙන්නේ කොතැනද, ඒ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා වෙනවා. ඒ වාගේම, තමයි සිංහල ජනතාවගේත්. සිංහල ජනතාවගේ, දෙමළ ජනතාවගේ, මුස්ලිම් ජනතාවගේ නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වෙන්නේ කොයි ප්‍රමාණයකින්ද, ඒ ප්‍රමාණයෙන්ම ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගන්න පුළුවන්. ඒ කාරණා තමයි අපි ශක්තිමත් කරන්න ඕනෑ. එහෙම නැතිව කොහේවත් ඉන්න තනි පුද්ගලයෙකුට බලය පවරන එක නොවෙයි අපි කළ යුත්තේ. අත්තනෝමතික විධියට බලය අතට අරගෙන, ඒ බලය හොරකම, නාස්තිය, වංචාව වෙනුවෙන් පාවිච්චි කරන එක, ඇමතිකම් දීලා තමන්ගේ බලය හදා ගන්න පාවිච්චි කරන එක වෙනුවට මේ රටේ ඇත්ත ජාතික සමඟිය හදන පැත්තට අපි මේ ව්‍යවස්ථාව වෙනස් කරමු. ඒක කරන්න පුළුවන් වන්නේ මහජන නියෝජිතයන් සතුව තිබෙන බලය, පාර්ලිමේන්තුව සතු බලයක් බවට පත් කළොත් පමණයි. විධායක ජනාධිපති ධුරය අහෝසි වුණාම තමන්ට අසාධාරණයක් වෙනවා, තමන්ගේ අයිතිය නැති වෙනවා කියා දෙමළ සහ මුස්ලිම් ජනතාව සිතීම එක කාරණයක්. ඒක වැරැදි මිථ්‍යා මතයක්. ඒක අපි ඉවත් කර ගනිමු. දෙවැනි කාරණය, වැඩිමනත් වශයෙන් සිංහල-බෞද්ධ ජනතාව අතර - සිංහල-කතෝලික ජනතාව අතර නොවෙයි- විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළාම රට බෙදෙනවා, රට කැඩෙනවා කියලා මතයක් ඇති කරලා තිබෙනවා. ඒකත් මිථ්‍යා මතයක්. ඒ කිසි දෙයක් වන්නේ නැහැ. වැඩියෙන්ම ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා වෙන්නේ නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම තුළින් පමණයි.

අද විධායක ජනාධිපතිවරයා 12. (1) ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා තිබෙන්නේ. සියලු පුරවැසියන්ට සමානව සැලකීම කියන එක විධායක ජනාධිපතිවරයා උල්ලංඝනය කරලා තිබෙන්නේ .

සියලු පුරවැසියන්ට එක හා සමානව සැලකීම සාක්ෂාත් කරන්න පුළුවන් වන්නේ මේ අත්තනෝමතික විධායක ක්‍රමය අහෝසි කිරීමෙන් පමණයි. අපි ඉන්නේ ඒ ස්ථාවරයේ. විධායක ජනාධිපති ක්‍රමය ගැන ඉතිහාසයේ අත්දැකීම් අපට ඕනෑ තරම් තිබෙනවා. ජේ.ආර්. ජයවර්ධන පාලන කාලයේ සිට, ප්‍රේමදාස පාලන කාලයේ, චන්ද්‍රිකාගේ පාලන කාලයේ, මහින්ද රාජපක්ෂගේ පාලන කාලයේ ඒ ඉතිහාසය පුනරුච්ඡාරණය කිරීමෙන් දැන් වැඩක් නැහැ. දැන් අපි ඉස්සරහට යමු. දැන් මේ තිබෙන යථාර්ථය ඇතුළේ මේ සංශෝධනය සම්මත කර ගන්නේ කොහොමද කියලා අපි සාකච්ඡා කරමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ අය කියනවා, අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසි වන සංශෝධනය ගෙන එන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයාට බලය පවරන්නයි කියලා. "රනිල් වික්‍රමසිංහ මහත්මයාට ඡන්දය ඉල්ලා දිනන්න බැහැ. ජනාධිපතිවරණයෙන් දිනන්න බැහැ. ඒ නිසා තමයි ජේවීපී එක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසි වන සංශෝධනය ගෙනැල්ලා එතුමාට පාරක් කපන්නේ" කියනවා. හොඳට විග්‍රහ කර බලන්න. රනිල් වික්‍රමසිංහ මහත්මයාටද මේකෙන් චාන්ස් එක එන්නේ, එහෙම නැත්නම් මහින්ද රාජපක්ෂ මහත්මයාටද? ඔය කෑ ගහන, කයිවාරු ගහන කට්ටිය හොඳට ඒක විග්‍රහ කරලා බලන්න. දැනට තිබෙන ව්‍යවස්ථාව අනුව මහින්ද රාජපක්ෂ මහත්මයාට නැවත ජනාධිපති අපේක්ෂකයකු විධියට ඉදිරිපත් වන්න බැහැ. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසි වන සංශෝධනය සම්මත කළොත්, මහින්ද රාජපක්ෂ මහත්මයාටත් සවුත්තු නොවී, පීචං නොවී, හොර අගමැතිකම් ගන්නේ නැතිව, අනා ගන්නේ නැතිව, නා ගන්නේ නැතිව, සෙල්ලම් කැබිනට් හදන්නේ නැතිව නිල ක්‍රමයට අපේක්ෂකයකු හැටියට මැතිවරණයට ඉදිරිපත් වෙලා, ජනතාව කැමති නම් ජනතාවගේ ඡන්දයෙන් අගමැතිකම ගන්න පුළුවන්. අගමැති වුණාට පස්සේ ජනාධිපති වෙන්නත් පුළුවන්, ප්‍රශ්නයක් නැහැ. බලයක් නැති ජනාධිපති. එහෙම වෙන්නත් පුළුවන්. ඒකට බාධාවක් නැහැ. ඒ නිසා නැවත අගමැති අපේක්ෂකයකු විධියට එතුමාට මැතිවරණයට එන්න පුළුවන් හැකියාව ලැබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ විසි වන සංශෝධනය සම්මත කළොත් පමණයි; මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර ගත්තොත් පමණයි. නමුත් පොහොට්ටුවේ සාමාජිකත්වය අරගෙන මන්ත්‍රීකමත් නැති කර ගත්තොත්, අන්තිමට මොකක්වත් නැති වෙනවා. ගන්න ගියේ අගමැතිකම. අගමැතිකමත් නැති වුණා. අන්තිමට විපක්ෂ නායකකම ලැබුණා. ඒකත් දැන් නැති වෙන්නයි යන්නේ. ඒකත් නැතිවෙලා අන්තිමට මන්ත්‍රීකමත් නැති වෙයි. එහෙම වෙන්න ඕනෑ නැහැ; සවුත්තු වෙන්න ඕනෑ නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විසිවන සංශෝධනය සම්මත කර ගත්තොත් ඕනෑ නම් අගමැති අපේක්ෂකයා ලෙස මැතිවරණයට ඇවිත්, ජනතාව කැමති නම් ජනතාවගේ ඡන්දයෙන් ඒ අවස්ථාව ගන්න පුළුවන්. ඒකට ඉඩ තිබෙනවා. ඒ නිසා මේ සංශෝධනයේ වාසිය තිබෙන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයාට නොවෙයි. මේ වාසිය තිබෙන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයාට. ඉතින්, ඒ තත්ත්වය ඇති කර ගන්න. එහෙම නැතිව සවුත්තු වෙන්න එපා. මම හිතන හැටියට එතුමා හරියට කල්පනා කරනවා නම්, මේ වෙච්ච සිදුවීම් ටික හොඳටම ප්‍රමාණවත් ඉදිරියේදීවත් මේ ගැන තීන්දු ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැක්කා නේ සිද්ධ වෙච්ච දේවල්. කෙනෙක් වාඩි වෙලා සිටිද්දි වැටුණොත්, එච්චර ගණනක් නැහැ. රිදෙන්නේ නැහැ; වැඩිය දැනෙන්නේ නැහැ. පොඩ්ඩක් නිකම් ඇලවුණා වාගේ තේරෙනවා. කෙනෙක් හිටගෙන ඉන්දෙද්දි වැටුණොත් ටිකක් රිදෙනවා, තැලෙනවා, පොඩ්ඩක් තුවාල වෙන්නත් පුළුවන්. හැබැයි, කෙනෙක්ව උස්සලා පොළොවේ ගැහුවොත් හතර හන්දි කැඩෙනවා; මාරාන්තිකයි. දැන් මේ සිදු වුණේ ඒක නේ. ඉඳගෙන ඉඳලා වැටුණා නම් එච්චර ගණනක් නැහැ. හිටගෙන ඉඳලා වැටුණාම පොඩ්ඩක් රිදෙනවා. උස්සලා පොළොවේ ගැහුවොත් මාරාන්තිකයි, හතර හන්දි කැඩෙනවා. දැන් මේ වෙලා තිබෙන්නේ, උස්සලා පොළොවේ ගහලා ඉවරයි. ඒ විධියට උස්සලා පොළොවේ ගැහුවේ කවුද? විධායක ජනාධිපතිවරයා. ආයේ දෙකක් නැහැ. මෛත්‍රීපාල සිරිසේන මහත්මයා, මහින්ද රාජපක්ෂ මහත්මයාව උස්සලා පොළොවේ ගැහුවා. ඒක නේ සත්‍ය කථාව. ඒක කවුරුත් දන්නවා. දේශපාලන වශයෙන් උස්සලා පොළොවේ ගැහුවා. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාට මහින්ද රාජපක්ෂ මහත්මයාව භෞතිකව උස්සා ගන්නට බැරිවෙයි. ටිකක් බරයි නේ. මොකද, මෛත්‍රීපාල මහත්මයාගේ ඇඟත් එක්ක ගත්තාම මහින්ද රාජපක්ෂ මහත්මයාව එහෙම උස්සා ගන්න බැරි වෙයි. හැබැයි, දේශපාලන වශයෙන් උස්සලා පොළොවේ ගැහුවා. [බාධා කිරීමක්] මොකක්ද, ඒ හඬ? ඒ මාලිගාවත්තේ ලී මෝලේ හඬද? මාලිගාවත්තේ නොවෙයි, අනුරාධපුරයේ. අනුරාධපුරයේ ලී මෝලක්ද? [බාධා කිරීමක්] හොඳයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමන්ගේ ඇඟට දැනුනාම, රිදුණාම දැන්වත් පාඩම් ඉගෙන ගන්නවා නම් හොඳයි. සේමසිංහ මන්ත්‍රීතුමා, ඔබතුමා අලුත් මන්ත්‍රීවරයෙක්. ඔබතුමන්ලාගේ නායකයා ගැනයි මේ කියන්නේ. වරදක් නොවෙයි කිව්වේ. හොඳ දෙයක් මේ කිව්වේ. [බාධා කිරීමක්] ඔබතුමන්ලාගේ නායකයාට පොට්ට chance එකක් හරි පාදා ගන්න පුළුවන්, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරගත්තොත්. ඉතින් ඒක කර ගන්න දැන් අපි කවුරුත් එකඟ වෙමු. ඒකට අපි ජනතාවට ඉඩ දෙමු. ඒක පාර්ලිමේන්තුවෙන් block කරන්න එපා. පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකෙන් සම්මත වුණාම, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව අනුව අනිවාර්යෙන්ම ජනමත විචාරණයකට යා යුතුයි. අපි සූදානම් ජනමත විචාරණයකට යන්න. එදාටත් වඩා ජනතාව දැන් මේකට සහයෝගය දෙන්න සූදානම්. හිතමු කෝ, පොහොට්ටුවේ අයට මහින්ද රාජපක්ෂම ඕනෑ කියලා. එහෙම හිතුවත් දැන් ජනතාව මේකට කැමතියි නේ. මේකේ තිබෙන ව්‍යවස්ථා කරුණු පැත්තකින් තියන්න කෝ. පොහොට්ටුවේ අයට මහින්ද රාජපක්ෂ මහත්මයාව ආයෙත් අගමැති අපේක්ෂකයා විධියට ගෙනෙන්න ඕනෑ නම්, ඒකට ඉඩක් තිබෙන්නෙත් මේකෙන්ම තමයි. ඒ නිසා දැන්වත් හරියට තේරුම් ගන්න. උදය ගම්මන්පිල මන්ත්‍රීතුමන්ලාගේ ලණු කන්න එපා. සේමසිංහ මන්ත්‍රීතුමා, එතුමන්ලාගේ ලණු කාලා ආපහු අමාරුවේ වැටෙන්න එපා. ඔබතුමන්ලාගේ පක්ෂය පොහොට්ටුව නේ. ඒ පක්ෂයෙන් ඔය කියන අපේක්ෂකයාට එන්න chance එක හදා ගන්න. සද්භාවයෙන් මෙය කියන්නේ. සද්භාවයෙන් කියන මේ දේ තේරුම් අරගෙන අපි මේක සම්මත කරගනිමු. අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පතක් හැටියට ඉදිරිපත් කරලා තිබෙනවා. මගේ දැනීමේ හැටියට පාර්ලිමේන්තුව කල් තැබුවා කියලා ඒක අවලංගු වෙලා නැහැ. ඒක වලංගුයි.

ඒ නිසා හැකි ඉක්මනින් ආණ්ඩුවේ ස්ථාවරය මේ පාර්ලිමේන්තුවට දැනුම් දෙන්න ආණ්ඩුවට පුළුවන්. අපි ඉදිරිපත් කරපු සංශෝධනයේ අඩුපාඩු තිබෙනවා නම්, වෙනස්කම් කරන්න ඕනෑ නම්; සංශෝධනය කරන්න ඕනෑ නම්, අපි ඒවා කරමු. අපි ඉදිරිපත් කරපු එකම සම්මත කරන්න ඕනෑ කියලා එකක් නැහැ. අපට තිබෙන එකම වුවමනාව වන්නේ මෙහි තිබෙන හරය, මේ අත්තනෝමතික බලය ඉවත් කරන එකයි. ඒ නිසා අපි ඉදිරිපත් කරපු සංශෝධනයේ වාක්‍යවල අඩුපාඩුකම් තිබෙනවා නම්, ඕනෑම එකක් අලුතෙන් ඇතුළත් කරලා, පාර්ලිමේන්තුවේ පනතක් විධියට මේ සියලු දෙනාගේම කැමැත්ත මත අපි එම පනත් කෙටුම්පත සම්මත කර ගනිමු. එහෙම සම්මත කර ගත්තොත්, මේ රටට විනාශයක් ගෙනාපු ඒකාධිපති බලතල සහිත විධායක ක්‍රමය අහෝසි කරගෙන රට වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී පැත්තට යන්න පුළුවන්. ශිෂ්ටත්වයට යන්න පුළුවන්. මේ අශිෂ්ට දින 50 කලබැගෑනි නැවත අනාගතයේ සිදු නොවෙන්න වගබලා ගන්න පුළුවන්, එවැනි තත්ත්වයකදී පමණයි. ඒ නිසා එයට ඉඩ ප්‍රස්ථාව සලස්වන්න මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට ඥානය පහළ වේවා! බුද්ධිය පහළ වේවා! දේශපාලන ශක්තිය ලැබේවා! යි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[2.31p.m.]

**ගරු මලික් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)

Hon. Deputy Speaker, I would like to start by reminding ourselves that abolishing the Executive Presidency was a cornerstone of the Yahapalana Government's plan, guided by the late Ven. Maduluwawe Sobhitha Thero and it is now time to recommit to that goal. It is safe to say that it has never been clearer why we need to abolish the system of Executive Presidency.

The events of the last 51 days in our country should leave us in no doubt that the concentration of power in one office is a recipe for disaster. After having seen the ill effects of this, we cannot turn a blind eye - we have to act now. We have seen how this august House, the Parliamentary branch of Government, functioned to uphold democracy and the due process despite the heinous act of the Executive. We have seen how the Hon. Speaker courageously upheld due process amidst an onslaught from the Executive as well as from some Members of this very House. We have seen how the Judiciary upheld the supreme law of the land - our Constitution - amidst an attack on it from the Executive.

Our country's democratic institutions will only be strong if we have a meaningful distribution of power between the three branches - Presidency, Parliament and the Judiciary. It is about making sure that one person does not wield all the authority and hold the country hostage, as we saw over the last 51 days. The Executive Presidency must go.

The argument that has been put forward for a while is that a strong State requires a strong Executive President. But look at the last 51 days. What kept this State strong was the strong Legislature, its Speaker and the strong and independent Judiciary; not the Presidency. In fact, the actions of the Presidency weakened our State and did not strengthen it. That weakened the State economically and weakened it in the international community.

We need to bust some myths today. The Executive Presidency does not lead to a stronger State. The Executive Presidency does not strengthen the unitary status of our country. The Executive Presidency does not lead to a more stable government. We must bring primacy to this Parliament, the elected Representatives of the people from all corners of our country, all ethnicities and all religions. It is clearly apparent from this crisis that the Executive Presidency is posing a serious threat towards strengthening of Legislature and all of us, as Members of this Legislature, need to double down and commit to abolishing the Executive Presidency.

We commenced on this path through the Nineteenth Amendment to the Constitution which reined in the absolute powers of the Executive and brought more of it to Parliament. And for the last 51 days you could see how vital this Amendment was.

Now it is time to complete the job to abolish the Executive Presidency. It has never been clearer the dangers of concentrating so much power in the hands of one office rather than distributing more power to the Parliament or people's representatives. We should not let go this renewed opportunity, this renewed rationale.

I call upon all Members of this House to vote for this Motion and campaign in the country when a Referendum is brought in to abolish the Executive Presidency.

Thank you very much.

[අ.භා.2.36]

**ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳ ප්‍රශ්නය ශ්‍රී ලංකාවේ මුලින්ම මතු වුණේ එක්දහස්නවසිය හත්තෑදෙකේ ව්‍යවස්ථාවට පෙර, එම ව්‍යවස්ථාව හැදූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේදීයි. එවකට විපක්ෂ නායක සහ එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකව සිටි ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, "ශ්‍රී ලංකාවට විධායක ජනාධිපති ක්‍රමයක් හඳුන්වා දිය යුතුයි" කියා එහිදී යෝජනා කළා. එයට තදින්ම විරුද්ධ වුයේ එම පක්ෂයේම නායක ඩඩ්ලි සේනානායක මැතිතුමායි. එම යෝජනාව ඉදිරිපත් කරන්න එතුමා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට අවසර දුන්නා. නමුත් පක්ෂයක් හැටියට සහ පුද්ගලයෙක් වශයෙන් එතුමා ඒ ගැන ඉතාම හොඳ කථාවක් කළා. "ඇමෙරිකාවේ විධායක ජනාධිපති ක්‍රමය සාර්ථක වුණා වෙන්න පුළුවන්; ප්‍රංශයේ එය සාර්ථක වුණා වෙන්න පුළුවන්, එහෙත් ලංකාව වැනි රටවලට මෙය සුදුසු නැහැ, ලංකාව වැනි රටවලට සුදුසු වන්නේ පාර්ලිමේන්තු ක්‍රමයක්" කියා එහිදී එතුමා කිව්වා. එවකට අපේ රටේ අගමැති ධුරය දැරුවේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියයි. එතුමියට ඉතාම පහසුවෙන් පුළුවන්කම තිබුණා, ඒ තිබුණු විශාල වැඩි ඡන්ද සංඛ්‍යාව පාවිච්චි කරලා විධායක ජනාධිපති වෙන්න. නමුත් එතුමිය එය ප්‍රතික්ෂේප කළා. පාර්ලිමේන්තු ක්‍රමය රැක ගන්නට එතුමිය ඉදිරිපත් වුණා. එම නිසා, අපි දන්නා තරමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද හැම දාම හිටියේ විධායක ජනාධිපති ක්‍රමය වෙනුවෙන් නොවෙයි, පාර්ලිමේන්තු ක්‍රමය ශක්තිමත් කිරීම වෙනුවෙනුයි. "රාජ්‍යයේ ශීර්ෂයේ බලකේන්ද්‍ර දෙකක් හදන්න එපා, එක පැත්තකින් ජනතාවගේ ඍජු ඡන්දයෙන් පත්වන ජනාධිපතිවරයෙක් සමග අනෙක් පැත්තෙන් පාර්ලිමේන්තුව තුළින් තේරී පත්වන අගමැතිවරයෙක් counterpose කරන්න එපා, එයින් රාජ්‍යයේ විශාල ප්‍රශ්න ඇති වෙනවා" කියා එවකට ව්‍යවස්ථා කටයුතු පිළිබඳ ඇමතිවරයා ලෙස කටයුතු කළ ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමා එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේදී කිව්වා. අපි අද ඒවා අත්දකිනවා. 1977දී පැවැති ඡන්දයෙන් ජේ.ආර්. ජයවර්ධන මහත්මයාට බලය ලබා ගන්න පුළුවන් වුණා. ඉන් පසුව එතුමා 1972 ව්‍යවස්ථාවට සංශෝධනයක් ගෙනැත් විධායක ජනාධිපති ක්‍රමය එයට ඇතුළත් කරලා, 1978දී ලෝකයේ තිබෙන ශක්තිමත්ම විධායක ජනාධිපති පාලන ක්‍රමයක් ශ්‍රී ලංකාවේ ඇති කළා. එදා ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා ලෙඩ ඇඳේ ඉඳගෙන කුඩා පොත් පිංචක් ලිව්වා. එතුමා "The Nation" පත්‍රයට ලිපි ගණනාවක් ලියලා, පසුව ඒ ලිපි කුඩා පොත් පිංචක් හැටියට පළ කළා.

එතුමා "Daily News" පත්තරයටත් ලිව්වා; "The Nation" පත්තරයටත් ලිව්වා. එතුමා ඒ ගැන අනතුරු අඟවා සිටියා. මම ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. මොකද, මේ දවස්වල විධායක ජනාධිපති ක්‍රමය ගැන කථා කරනකොට වැඩිපුරම උපුටා දක්වන්නේ ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මැතිතුමාගේ එම ප්‍රකාශයි. එදා, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ජාතික රාජ්‍ය සභාවේ කියා සිටියා, "මේ කරන්න හදන්නේ ව්‍යවස්ථාවට ඉහළින්, ජනතාවට ඉහළින්, අධිකරණයට ඉහළින් විධායක ජනාධිපති ක්‍රමයක් ඇති කිරීමයි" කියා. එතුමිය ඒ පිළිබඳව අනතුරු අඟවා සිටියා. ඉන් පසු හැම මැතිවරණයකදීම විරුද්ධ පක්ෂයෙන් ඉදිරිපත් කළ ප්‍රධාන සටන් පාඨය වුයේ, "විධායක ජනාධිපති ක්‍රමය නැති කිරීම" යන්නයි.

1994දී එය කරගන්න පුළුවන් වෙයි කියා අපි හිතුවා. නමුත් අවාසනාවකට වාගේ, 1994න් පටන් ගත් ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රියාවලිය 2000 වර්ෂය වනතුරු ඇදි-ඇදී ගියා. 2000 වනතුරු එය ඇදී ගියාට පසුව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එක්සත් ජාතික පක්ෂයත් මැතිවරණ දිහා බැලූ නිසා ඔවුන් දෙගොල්ලන්ටම ඒ ව්‍යවස්ථාව පිළිබඳව එකඟ වෙන්න බැරි වුණා. එම නිසා ඒ අවස්ථාවද අපට නැති වී ගියා. ඉන් පසුව, 2001 අවුරුද්දේදී දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් එම විධායක ජනාධිපති ධුරයේ යම් බලතල ඉවත් කරන්න අපට පුළුවන් වුණා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය ජනාධිපති ධුරය දරන විට එතුමියගේ ආණ්ඩුවේ ස්ථාවරභාවය පිළිබඳව ප්‍රශ්නයක් මතු වුණු වෙලාවේ, ජනතා විමුක්ති පෙරමුණ කොන්දේසියක් හැටියට ඉදිරිපත් කර කිව්වා, "දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න" කියා. ඒ අවස්ථාවේ පුරවැසි සංවිධාන -විශේෂයෙන්ම වෘත්තිකයන්ගේ සංවිධාන- කෙටුම්පතක් හදා තිබුණා. එම කෙටුම්පත පාදක කරගෙන දහහත්වන සංශෝධනය ගෙනැත්, එම සංශෝධනය තුළින් විධායක ජනාධිපති ක්‍රමයේ සමහර බලතල ඉවත් කළා. ඒ තුළින් පළමු වරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් - Constitutional Council - ඇති කළා. සිවිල් පුද්ගලයන් -සාමාන්‍ය පුරවැසියන්- හත්දෙනෙකු සහ දේශපාලනඥයන් -කථානායක, විපක්ෂ නායක සහ අගමැති- තුන්දෙනෙකුගෙන් යුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් හදලා, එම සභාව විසින් වැදගත් පත්වීම් -ශ්‍රේෂ්ඨාධිකරණයට සහ අභියාචනාධිකරණයට කරන පත්වීම් ආදිය- අනුමත කරන්න ඕනෑ, ඒ වාගේම එම සභාව විසින් ස්වාධීන කොමිෂන් සභාවලට පුද්ගලයන් නම් කරන්න ඕනෑ. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැත්, මේ රටේ තිබුණු විධායක ජනාධිපති ක්‍රමයේ ඒ බලතල යම් දුරකට අඩු කරලා වඩා ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් ඇති කරන්න අපට පුළුවන් වුණා. ඒ පැත්තෙන් අපට කුඩා ප්‍රමාණයක හෝ දියුණුවක් ලබා ගන්න පුළුවන් වුණා. එහෙත්, 2009දී ගෙන එන ලද දහඅටවන සංශෝධනය මඟින් ඒ සියල්ල නිෂේධනය කෙරුණා. ඒ සියල්ල නිෂේධනය කරලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නැති කළා. ඒ වෙනුවට කිසිම තේරුමක් නැති පාර්ලිමේන්තු කමිටුවක් පත් කළා. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා විධායක ජනාධිපති ක්‍රමයට සීමා එකක් දෙකක් දමා තිබුණා. ධුර කාලය පිළිබඳ සීමාව ඉන් එකක්. ඒ සීමාවත් අයින් කළා. එහෙම කරලා, ලෝකයේ විධායක ජනාධිපති ක්‍රම තිබෙන රටවලින් වඩාත්ම ශක්තිමත් ක්‍රමය තිබෙන රට බවට අපි පත් වුණාය කිව්වොත්, මම හිතන විධියට ඒක නිවැරදියි.

නරකම කාලය ඉන් පසුව තමයි උදා වුණේ. 2009 සිට 2014 දක්වා කාලය තුළ අප එය අත්දැක්කා. ඒ පිළිබඳව තවදුරටත් විස්තර කියන්න අවශ්‍ය නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවලට විරුද්ධව,- ඒ ක්‍රමය, ඒ යොදා ගත් ක්‍රමය වැරදියි කියා ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය කියන ඒ උසාවි දෙකම කියා සිටියා. එය නොතකා -අග්‍ර විනිශ්චයකාරතුමිය ඉවත් කළා. ඉන් පසුව අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ආවා. මොකද, 2015 ජනවාරි 08වන දායින් කෙළවර වුණු ඒ මැතිවරණ කාලය තුළ අපි ගමින් ගමට ගිහින් ඒ ජනතාවට මොනවාද කිව්වේ? වර්තමාන ජනාධිපතිතුමා අපේ පොදු අපේක්ෂකයා හැටියට රැස්වීමෙන්, රැස්වීමට ගිහිල්ලා මොනවාද කිව්වේ? "මේක තමයි අවසාන ජනාධිපතිවරණය, අපි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා" කියා තමයි අපි කිව්වේ. ජනමත විචාරණයකින් තොරව ඒක කරන්න අපි එකඟ වුණා. එම නිසා අපට සීමාවක් තිබුණා. අපි ඒ බව දැනගෙන සිටියා. එතුමා සමඟ මන්ත්‍රීවරු 31දෙනෙකු මේ පැත්තට එනවාය කියා බලාපොරොත්තු වුණා. නමුත් ආවේ හය-හත් දෙනායි. එමනිසා තුනෙන් දෙකක බලයක් තබා, සරල බහුතරයක්වත් නැති පාර්ලිමේන්තුවක අපි කොහොමද මේ කටයුතු කරන්නේ කියන ප්‍රශ්නයත් ඇති වුණු නිසා, ඒ යථාර්ථයට මුහුණ දීලා ජනමත විචාරණයකින් තොරව දහනව වන සංශෝධනය සම්මත කරන්න අපි එකඟ වුණා. එම නිසාම අපට සීමා වැටුණා.

කෙසේ වෙතත් අපට යම් ජයග්‍රහණ ලැබුණා. අපට සෑහෙන ප්‍රමාණයකට විධායක ජනාධිපති ධුරයේ බලතල ඉවත් කරන්න පුළුවන් වුණා. ස්වාධීන කොමිෂන් සභා නැවත ඇති කෙරුවා. ස්වාධීන කොමිෂන් සභා සංඛ්‍යාව වැඩි කෙරුවා. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගත්තා. ඒ වාගේම, National Procurement Commission එක ඇති කෙරුවා. Audit Service Commission එක ඇති කෙරුවා. ඒ කොමිෂන් සභා සියල්ලටම කරන පත්වීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්, ඔවුන්ගේ නිර්දේශ මත පත් කළ යුතුයි කියලා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් කියැවෙනවා. ඊළඟට, උපරිමාධිකරණවලට කරන පත්වීම් එම සභාව විසින් අනුමත කළ යුතුයි. එහෙත්, අපට ඕනෑ විධියට එම සභාවේ සංයුතිය එහෙම වෙනස් කරන්න බැරි වුණා. අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී කෙටුම්පතේ යෝජනා කෙරුවේ දේශපාලනඥයන් තුන්දෙනෙක් සහ දේශපාලනඥයන් නොවන හත්දෙනෙක්. නමුත්, මෙම සභාව තුළ කාරක සභා අවස්ථාවේදී දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සාකච්ඡාවට ගන්නකොට එදා විපක්ෂය විසින් කොන්දේසි ඉදිරිපත් කෙරුවා. තුනෙන් දෙකක ඡන්දය ලබා ගත්තේ එහෙමයි. ඔවුන් ඉදිරිපත් කරපු එක කොන්දේසියක් තමයි, පුරවැසියන් තුන්දෙනෙක් සහ දේශපාලනඥයන් හත්දෙනෙක්. හතට තුන තිබුණු එක, තුනට හත ලෙස යෝජනා කෙරුවා. එදා අපට කරන්න දෙයක් තිබුණේ නැහැ. එම නිසා අකමැත්තෙන් වුවත් අපට එකඟ වෙන්න වුණා.

මට හොඳට මතකයි, මම ඒ කාලයේ මන්ත්‍රීවරයෙක් නොවෙයි. නමුත්, මම එම කටයුත්තට සහභාගී වුණා. රනිල් වික්‍රමසිංහ මහත්මයා මටත්, වැලිඅමුණ මහත්මයාටත් අඬගහලා කිව්වා, "කොහොමද මම සෝභිත හාමුදුරුවන්ට මුහුණ දෙන්නේ? මේ සංයුතිය 3:7 අනුපාතයට වෙනස් කරලා මම කොහොමද උන්වහන්සේට මුහුණ දෙන්නේ?" කියලා. මම ඒ වෙලාවේම සෝභිත හාමුදුරුවන්ට දුරකථනයෙන් කථා කරලා මේ ගැන කිව්වාට පස්සේ උන්වහන්සේ කියා සිටියා, "නැහැ, කමක් නැහැ. ඒ දුර්වලකම් එක්ක අපට සම්පූර්ණයෙන් කරගන්න බැරි වුණත් කමක් නැහැ, ඕකට එකඟ වෙන්න. ඒකට මගේ අකමැත්තක් නැහැ." කියලා. ඉන්පසුව අපි එම කටයුත්ත යම්කිසි ප්‍රමාණයකට ඉටු කර ගත්තා. නමුත්, ඉතිරි ටික ඉවර කරන්නට අපි පොරොන්දු වුණු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයක් හැදුවා. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්නට අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයක් පත් කළා. එහි සාකච්ඡා යන අතරතුර ජනාධිපතිතුමා සෝභිත හාමුදුරුවන්ගේ අවමඟුල් පූජෝත්සවයේදී කලින් කියපු දේ නැවතත් සපථ කර හිටියා. වේදිකාවෙන් වේදිකාවට, ගමෙන් ගමට කියපු දේ සපථ කරලා එතුමා කියා සිටියා, "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවාමයි." කියලා. මෙහෙයුම් කමිටුවට පැමිණි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජිතයෝ ඒ ගැන කියපුවා වාර්තා වෙලා තිබෙනවා. ඔවුනුත් කියා තිබෙනවා, "ඔව්, අපේ ස්ථාවරය විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම තමයි." කියලා. එය මෙහෙයුම් කමිටු වාර්තාවේ සටහන් වෙලා තිබෙනවා. එහෙත්, වැඩි කල් යන්නට ඉස්සෙල්ලා අපි සියලු දෙනාම දුර්මුඛ කරමින් ඔවුන් එම ස්ථාවරය වෙනස් කරලා, "නැහැ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නේ නැහැ. යම් යම් බලතල විතරක් අඩු කරනවා." කියලා කිව්වා. එම නිසා තමයි එම ක්‍රියාවලිය බලාපොරොත්තු වුණු තරම් ඉක්මනින් අපට අරගෙන යන්න බැරි වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අඩු කෙරුවාට, මේ ආණ්ඩුවේ කොටස්කාරයෙක් වන මම ඇතුළු මේ ආණ්ඩුවම වග කියන්න ඕනෑ තවත් දෙයක් තිබෙනවා. මොකද, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කෙරුවාට පස්සේත්, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පෙර බලතල ඇති ජනාධිපතිවරයෙක් වාගේ කටයුතු කරන්නට අපි ඉඩ දුන්නා. කැබිනට් මණ්ඩලය තුළත් එසේ කටයුතු කිරීමට ඉඩ ඇරියා. එක දවසක් ගන්න තීන්දුවක් පසුවදාට වෙනස් කරනවා. පත්තරේ මොකක් හරි වැටිලා කවුරු හරි විරුද්ධ වුණාම, ජනාධිපතිතුමා කැබිනට් මණ්ඩලයේ තීන්දු වෙනස් කරනවා. ඒ තත්ත්වය ඇති වුණා. ඒක පුරුද්දකට ගියා. ඒක පුරුද්දකට ගිහිල්ලා අවසානයේදී කෙළවර වුණේ පසුගිය ඔක්තෝබර් මාසයේ 26වැනි දා ඇති වුණු සිද්ධියෙන්. ඔක්තෝබර් මාසයේ 25වැනි දා මෙම ගරු සභාව ආණ්ඩුවේ පනත් කෙටුම්පත් සම්මත කෙරුවා. මුදල් පනත් කෙටුම්පතකුත් -Finance Bill එකක්- සම්මත කෙරුවා. ඔක්තෝබර් මාසයේ 26වැනි දා Resolution එකක් සම්මත කෙරුවා. ඊට මාස කීපයකට ඉස්සෙල්ලා ආණ්ඩුවට විරුද්ධව ගෙනාපු විශ්වාස භංග යෝජනාව පැහැදිලි බහුතරයකින්, වැඩි ඡන්ද 46කින් පරාජය කෙරුවා. පැහැදිලි බහුතරයක් ආණ්ඩුවට තියෙද්දී, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට පැහැදිලි බහුතරයක් තියෙද්දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අමු අමුවේ උල්ලංඝනය කරලා එතුමා අගමැති ධුරයෙන් ඉවත් කෙරුවා. ඉන්පසු මෙම පාර්ලිමේන්තුව තුළ සරල බහුතරයක්වත් නැති රාජපක්ෂ මහත්මයාව අගමැති කළා.

ඉන් පසු අපි දැක්කා, ඒ දවස් 50 තුළ දිගටම එකින් එකට, එකින් එකට පසුව හය පාරක් එතුමා පරාජය වුණ බව. එතුමාට තමන්ගේ බහුතරය පෙන්වන්නට බැරි වුණා. ඉන් පසු පාර්ලිමේන්තුව කල් දැම්මා. බලපෑම් එනකොට පාර්ලිමේන්තුව කල් දාලා ආපසු ඉස්සරහට ගත්තා. ඊට පසුව විසුරුවා හැරියා. ගරු ජනාධිපතිතුමා ඊයේ - පෙරේදා කියලා තිබුණා, "විසුරුවා හැරීම සම්බන්ධව මට හොඳම නීතිඥ උපදෙස් ලැබුණා." කියා. "ජනාධිපති නීතිඥයන්ගෙන් උපදෙස් ලැබුණා. ජනාධිපති නීති උපදේශකයන්, නීති විශාරදයන් කියන අයගේ උපදෙස් ලැබුණා." කියලා එතුමා කියලා තිබුණා. අපි අහන්නේ නැහැ, ඒ කවුද කියලා.

තමන්ට අවශ්‍ය ඕනෑම කෙනෙකුගෙන් නීති උපදෙස් ගැනීමට එතුමාට අයිතියක් තිබෙනවා. කෙසේ වෙතත් මේ කාරණය ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරු තිදෙනෙක් අතුරු තහනම් නියෝගයක් දීලා, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම අත්හිටෙව්වා. ඉන් පසුව විනිශ්චයකාරවරු තුනක් මදිය කියලා විනිශ්චයකාරවරුන් හත් දෙනෙක් ඉල්ලුවා. හත් දෙනෙක් පත් කෙරුවා. ඒ හත් දෙනාම ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කරනු ලැබුවේ, ජනාධිපති හැටියට එක්කෝ, මහින්ද රාජපක්ෂ මහත්තයා විසින්; එක්කෝ, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා විසින්. අපි දහනව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ඇති කරපු ප්‍රජාතන්ත්‍රවාදී වාතාවරණය තුළින් ප්‍රජාතන්ත්‍රවාදී අවකාශය ඇති වුණා. ඒ අවකාශය තුළ අධිකරණයට ලැබුණු ස්වාධීනත්වය පෙන්නුම් කරමින් ඒකමතික තීන්දුවක් දුන්නා.

බොහෝ අය අපිට ඔච්චම් කෙරුවා, "දහනව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අර "කොමා" එක නැහැ. අර full stop එක නැහැ." කියා. ඔව්. සමහර තැන්වල යම් යම් අනනුකූලතාවන් තිබුණා, නැත්තේ නැහැ. එහෙත් ව්‍යවස්ථාවක් අර්ථ නිරූපණය කරනකොට ඒ ව්‍යවස්ථාවේ ඒකාග්‍රතාව, constitutional unity එක අවශ්‍යයි කියන අපේ තර්කය ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගත්තා. මේ දවස්වල හැම දෙනාම කථා කරනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 (2) (ඌ) ව්‍යවස්ථාව, 33 (2) (ඇ) ව්‍යවස්ථාව ගැන. ඒ පිළිබඳව තර්ක කෙරුවා. නමුත් අවසාන වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ඒකමතික තීන්දුවක් දුන්නා. එසේ පුළුවන් වුණේ මොකද? ඒ ඇති කරපු නිදහස් වාතාවරණය නිසා. අභියාචනාධිකරණයෙන් "*quo warranto*" ආඥාවක් සඳහා ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කෙරුවාම, අගමැති ධුරයේ කටයුතු කරමින් සිටි රාජපක්ෂ මහත්තයාට

[ගරු ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා]

තහනම් නියෝගයක් නිකුත් කෙරුවා; අනෙකුත් අයට තහනම් නියෝග නිකුත් කෙරුවා.

ඊට විරුද්ධව, "මම නොවෙයි කියන්නේ, අනෙක් අය කියන්නේ" කියලා විවේචනය කෙරුවා. "යම් කිසි නිකායක මහානායක ස්වාමීන් වහන්සේ දෙන්න ඕනෑ තීන්දු විහාරාධිපතිවරුන් දෙනවා" කියලා අනියම් ආකාරයකට අධිකරණයට එක්තරා විධියක බලපෑම් කෙරුවා; ඔච්චම් කෙරුවා. ඒ ගැන ඉතාමත්ම කනගාටුයි. කෙසේ වෙතත් අවසානයේදී ශ්‍රේෂ්ඨාධිකරණය මේ පිළිබඳව තීන්දුවක් දීලා දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අවුරුදු හතරහමාරක් යන තුරු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට බැරි බව ප්‍රකාශ කෙරුවා විතරක් නොවෙයි එසේ කිරීම මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් ලෙස තීරණය කරනු ලැබුවා. ඒ අනුව පැහැදිලි ලෙසම අපට පෙනෙනවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව චේතනාන්විතව උල්ලංඝනය කිරීමක් මෙතැනදී සිදු වෙලා තිබෙන බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් අපි ජනාධිපතිවරයාට තිබුණු මුක්තිය සීමා කෙරුවා. මූලික අයිතිවාසිකම් පිළිබඳව නඩු දමන්නට ඉඩ තියලා අපි කිව්වා, "ජනාධිපතිවරයා නිල වශයෙන් -offical capacity එකෙන්- කටයුතු කරන ඕනෑම කටයුත්තකට විරුද්ධව මූලික අයිතිවාසිකම් නඩු දමන්න පුළුවන්." කියා. ඒක අභියෝගයට ලක් කළා. කනගාටුයි කියන්න. මේ රටේ නීතිපතිවරයා උසාවියට ගිහිල්ලා මොකක්ද කිව්වේ? ඒක ඇත්ත. එතුමා පෙනී සිටින සේවාදායකයාගේ උපදෙස් අනුව කටයුතු කෙරුවා වෙන්න පුළුවන්. ඒ වාගේම ඔහු නීතිපති. ඔහු කිව්වා, "නැහැ, ජනාධිපතිවරයාගේ කාර්යයන් විධායක හෝ පරිපාලන කාර්යයක් නොවෙයි." කියලා. එයද ප්‍රතික්ෂේප කරනු ලැබුවා. ඒ අනුව මේ රටේ ජනතාවට විශාල ජයග්‍රහණයක් ලැබුණා. අද අපට දවස් 50ක අත්දැකීම් සම්භාරයක් තිබෙනවා.

ඇත්ත වශයෙන්ම කනගාටුයි, නරක අත් දැකීම් අපට තිබෙන්නේ. දැන් ඒ පිළිබඳව අපි අලුතින් අත් දැකලා තිබෙනවා, මෙය කොතරම් භයානක විය හැකිද කියලා. එම නිසා අද අවශ්‍ය වෙලා තිබෙනවා, මේ විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කිරීමට. ඒ කියන්නේ ජනාධිපතිවරයාගේ සියලු බලතල ඉවත් කරන්නට නොවෙයි. විශේෂයෙන්ම පළාත් සභා පිළිබඳ කේන්ද්‍රීය බලතල ජනාධිපතිවරයාම ක්‍රියාත්මක කරපුදෙන්. නමුත්, ප්‍රශ්නය තිබෙන්නේ කොහොමද ජනාධිපතිවරයා තෝරන්නේ කියන එකයි. ජනාධිපතිවරයා තෝරන්නේ ජනතාවගේ සෘජු ඡන්දයෙන් නම් ප්‍රශ්න ඇති වෙනවා. සුප්‍රසිද්ධ දේශපාලන විශේෂඥයකු වන නෙදර්ලන්ත ජාතික අරෙන්ඩ් ලයිෆාට් විසින් බහුවාර්ගික සමාජයන් පිළිබඳව විශේෂයෙන්ම කියලා තිබෙනවා. එතුමා කියා තිබෙනවා, බහුවාර්ගික සමාජයකට වඩා උචිත සාමූහිකව තීන්දු ගන්නා පාර්ලිමේන්තු ක්‍රමයක් කියලා. එතුමා තවදුරටත් කියා තිබෙනවා, කවදාවත් ජනාධිපතිවරයා සෘජුව පත් කරන්නට එපා, සෘජුව පත් කළාම වෙන්නේ අර්බුදකාරී අවස්ථාවකදී ජනාධිපතිවරයාට බලතල තිබුණේ නැතත් "අගමැතිතුමා ඔබ ඇවිල්ලා තිබෙන්නේ එක ආසනයක් දිනලා. මම මුළු රටම දිනලායි ඇවිල්ලා තිබෙන්නේ" කියලා, ක්‍රමය අර්ධ විධායක ජනාධිපති ක්‍රමයක් බවට හැරවීමයි කියලා.

විධායක ජනාධිපති ක්‍රමය තිබිය යුතුයි කියලා විවිධ අය විවිධ හේතුන් මත තර්ක කරනවා. ධනපති සංවර්ධනයට අධිකාරිවාදී පාලනයක් අවශ්‍යයි කියලා හිතපු සමහර අය ඉන්නවා. මම සතුටු වෙනවා, එක්සත් ජාතික පක්ෂය අද අවුරුදු තිස් ගණනකට පසුව තම ස්ථාවරය වෙනස් කරලා තිබීම ගැන. මලික් සමරවික්‍රම මහත්මයා අද ඉතාමත්ම පැහැදිලිව ප්‍රකාශයක් කළා, එතුමාගේ පක්ෂයේ ස්ථාවරය පිළිබඳව. නමුත් එදා සිට විධායක ජනාධිපති ක්‍රමයට හැමදාම විරුද්ධ වුණු කොටස්, -කනගාටුයි කියන්නට,- අද පෙනී සිටිනවා, විධායක ජනාධිපති ක්‍රමය ආරක්ෂා කිරීමට. එය තියා ගන්නට ඕනෑයි කියලා අවංකවම කියන්නේ අන්තවාදී සිංහල ජාතිවාදීන්. හැබැයි, මට ඔවුන් ගැන ගෞරවයක් තිබෙනවා. මොකද, ඔවුන් තමයි කියන්නේ, "මේක අපට ඕනෑ, අපේ අධිකාරිය තියා ගන්නට. සිංහල - බෞද්ධ ජන කොටසට මේ රටේ රාජ්‍ය අයිති විය යුතුයි. ඒ අධිකාරිය අපට තිබිය යුතුයි. ඒ අධිකාරිය තියා ගත හැකි එක ක්‍රමයක් තමයි විධායක ජනාධිපති ක්‍රමය" කියලා. මම ඇත්තටම ඔවුන්ව පසසනවා, ඔවුන් එය කෙළින්ම කීම ගැන.

මේ පිළිබඳව මගේ මිත්‍ර ජනාධිපති නීතිඥවරයෙක්, -එතුමා මේ සභාවේ නැති නිසා මම එතුමාගේ නම කියන එක හරි නැහැ.- 2005දී හෝ 2006දී තිබුණු සම්මන්ත්‍රණයකදී කිව්වා, -පැහැදිලි අන්තවාදය ඒ ප්‍රකාශයෙන් කියැවෙනවා,- "මොනවාද දෙමළ මිනිස්සුන්ට තිබෙන ප්‍රශ්න? අපි යන්නේ එකම බස් එකේ. අපි බෙදා ගන්නේ එකම තේ පෝච්චිය" කියලා. "What problems do the Tamils have? We go in the same bus, we share the same teapot" කියායි කිව්වේ. මගේ වාරය ආවාම මම කිව්වා, " That is the problem. You are prepared to share the teapot but you are not prepared to share State power" එනම් ඔබලා තේ පෝච්චිය බෙදා ගන්නට කැමැතියි, නමුත් රාජ්‍ය බලය බෙදා ගන්නට කැමැති නැහැ කියලා. විධායක ජනාධිපති ක්‍රමය ඔවුන් දකින්නේ මේ රටේ සිංහල - බෞද්ධ ජන කොට්ඨාසයට මේ රටේ රාජ්‍යයේ අධිකාරිය තියාගන්නට පුළුවන් එක ක්‍රමයක් හැටියට. සමහරු විරුද්ධ පක්ෂයේ ඉන්න විට විධායක ජනාධිපති ක්‍රමයට විරුද්ධයි, ආණ්ඩු පක්ෂයට ගියාම ඒක තියා ගන්නට ඕනෑ කියලා කියනවා. අපි 2015 ජනවාරිවලින් පසු ඒක දැක්කා. තව සමහරුන්ගේ පෞද්ගලික අභිලාෂයන් තිබෙනවා, ජනාධිපති වෙන්නට. ජනාධිපති වෙන්න අකැමැති බොහොම ටික දෙනායි ඉන්නේ, හැමකෙනාටම ජනාධිපති වෙන්නට ඕනෑ. පෞද්ගලික අභිලාෂයන් තිබෙන අයත් කියනවා, "නැහැ, විධායක ජනාධිපති ක්‍රමය තියාගන්නට ඕනෑ"යි කියලා.

කුඩා ජනවාර්ගික කණ්ඩායම්වල මෑතක් වෙනකම් අදහසක් තිබුණා, "මේකෙන් අපට වාසියක් තිබෙනවා" කියලා. මම හිතනවා, විශේෂයෙන්ම මේ දවස් පනහේ අත් දැකීමෙන් පසුව ඔවුන් ඒ අදහස වෙනස් කරලා ඇති කියලා. 1982 අග පැවති ජනාධිපතිවරණයේදී කුඩා ජනවාර්ගික කණ්ඩායම් අතිවිශාල වශයෙන් ජේ.ආර්. ජයවර්ධන මහත්මයාට ඡන්දය දුන්නා. නමුත් 1983 ජූලි මාසයේ කලබල ඇතිවෙන කොට ඒ කුඩා ජනවාර්ගික කණ්ඩායම්වල ඡන්දය ගත්ත ජේ.ආර්. ජයවර්ධන මහත්මයාටත් දවස් ගණනාවක් ගියා, ඇඳිරි නීතිය දාලා, හදිසි නීතිය පාවිච්චි කරලා ඒක මැඩලන්නට. ඇයි ඒ? අන්තවාදීන්ගේ බලපෑම් නිසා. 2015 ජනවාරි 08වෙනි දා මේ කුඩා ජනවාර්ගික කණ්ඩායම් විශාල වශයෙන් ඡන්දය දුන්නා, පොදු අපේක්ෂකයාට.

ඔවුන්ගේ අත් දැකීම මොකක්ද? ඇත්ත, අද ජන වාර්ගික සාමය වෙනදාට වඩා හොඳයි. සාමය ඇති වෙලා තිබෙනවා; සංහිඳියාව දියුණු වෙලා තිබෙනවා. ඔව්, හොඳයි! නමුත් ඔවුන්ගේ බලාපොරොත්තු ඉෂ්ට වෙලා තිබෙනවාද? එම නිසා, විශේෂයෙන්ම කුඩා ජන වාර්ගික කණ්ඩායම් මේ තත්ත්වය නැවත සලකා බලයි කියා මම හිතනවා. පසුගිය දින පනහේ තිබුණේ, හැමදෙනාම අපට අනතුරු අඟවපු තත්ත්වයක්. මේ රාජ්‍යයේ ශීර්ෂය මත, මේ බල කේන්ද්‍ර දෙක -two centres of power at the apex of the State- තිබුණා. එම නිසා එය වෙනස් කළ යුතුව තිබෙනවා.

මම, විධායක ජනාධිපති ක්‍රමයට හැමදාම විරුද්ධ වුණු, ලංකා සමසමාජ පක්ෂයේ සාමාජිකයෙක්. අද මම එහි බහුතර කණ්ඩායමේත්, එක්සත් වාමාංශික පෙරමුණේත් සාමාජිකයෙක්. ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් කර තිබෙන විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපි සහයෝගය දෙනවා. අපි පෙනී සිටින්නේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහායි. සම්පූර්ණ, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්, නව පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයක්, නව මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයක්, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම්වලට සීමා නොවී, සමාජ ආර්ථික අයිතිවාසිකම්, සංස්කෘතික අයිතිවාසිකම්, කාන්තා සහ ළමා අයිතිවාසිකම්, ආබාධිතයන්ගේ අයිතිවාසිකම්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අයිතිවාසිකම්, පරිසරය පිළිබඳ පුරවැසියන්ගේ අයිතිවාසිකම් ඇතුළත් කළ අලුත් පරිච්ඡේදයක් තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහා; ජන වාර්ගික ගැටලුවට දීර්ඝ කාලීන විසඳුමක් දෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සඳහායි පෙනී සිටින්නේ. නමුත්, එය කෙරෙන්නේ නැත්නම්, එය ප්‍රමාද වෙනවා නම්, අද තිබෙන ඒ ප්‍රශ්නයට අතුරු විසඳුමක් හැටියට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට ඉදිරිපත් කරන මේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අපි සහයෝගය දෙනවා. ඒ වාගේම කියා සිටිනවා, එතැනින් නවතින්නේ නැතිව, සම්පූර්ණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට යන්න ඕනෑය කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳව අපේ අත් දැකීම් ඉතාමත්ම නරකයි. පසුගිය දින පනහ තුළ සාමාන්‍ය ජනතාවට පවා; ඒ පිළිබඳව දැනුමක් නොතිබුණු ජනතාවට පවා අත් දැකීම් ලැබී තිබෙනවා. ඔවුන්ගේ ඒ අත් දැකීම් අනුව, ජනාධිපති ක්‍රමය වෙනස් කළ යුතුයි කියා අද අතිවිශාල බහුතරයක් අතර එකඟත්වයක් තිබෙනවා. මේ පිළිබඳව කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

[3.02p.m.]

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Thank you, Hon. Deputy Speaker, for the opportunity to say a few words on the Adjournment Motion moved by the Janatha Vimukthi Peramuna. This issue of abolition of Executive Presidency, as all the speakers before me have adverted to, has been there for quite some time. It has not just been there but it has had the endorsement of our people at every Presidential Election. So the mandate of the people to abolish Executive Presidency has been with us for quite some time.

In fact, in 2015, when the Presidential Election was held we thought that the Executive Presidency as a system of government will be abolished very soon. But unfortunately through the Nineteenth Amendment to the Constitution we were able to do only a part of what needed to be done and if one remembers the day the Nineteenth Amendment was passed, repeatedly this House was assured that through a new Constitution whatever that could not be accomplished in the Nineteenth Amendment would be addressed and accomplished. Executive Presidency - or rather the abolition of the Executive Presidency - is an important element of that. This has dragged for some time. Although in the process that we have to draft a new Constitution for the country, we have in the Interim Report suggested that the Executive Presidency be abolished. In arriving at the Interim Report, in the committee discussions, there was a point at which all parties actually agreed to the abolition. However, subsequently when political parties made their positions known on various issues some of the political parties namely, Sri Lanka Muslim Congress, All Ceylon Makkal Congress and the Tamil Progressive Alliance made certain reservations with regard to the abolition of Executive Presidency.

The very recent incidents that have happened in this country, I am sure, have now caused those Parties also to reconsider their position with regard to Executive Presidency. In fact, they have said so. We should now, without any further delay, abolish the Executive Presidency. But, it is not only the abolition of the Executive Presidency, the new Constitution that has been promised must also be brought. That is a promise to the people and as an integral part of that, the abolition of the Executive Presidency also must happen.

While the process to enact a new Constitution was being delayed, we saw various other events overtaking us and the conduct of the Executive President himself is an important part of that. So, we are here today after almost two months of a constitutional crisis that was triggered off by the Executive President. The Executive President who purported to exercise powers which he did not have - perhaps labouring under misconception, under wrong advice or the habit that had been formed by the Constitution as it obtained prior to the Nineteenth Amendment - made certain moves.

On the 26th of October, first, he purported to remove the Prime Minister in office and appoint another in his place. That power that the President had prior to the Nineteenth Amendment was specifically removed from the Constitution through the Nineteenth Amendment. Article 47 enumerated as *(a), (b) (c)* -three ways in which a sitting Prime Minister lost that post. Article 47. *(a)* was, if the President removed the Prime Minister from office. So, the President was empowered to remove the Prime Minister from office. That Article 47. *(a)* or rather Article 47 now finds place in the Constitution, after the Nineteenth Amendment, as 46. (2) and in Article 46. (2), there are only two situations that are listed instead of the three that were there prior to that, and the one that had been taken out or removed is the power of the President to remove a Prime Minister.

So, in the Nineteenth Amendment, quite clearly, the President's power to remove a Prime Minister at will was repealed, was taken out, and the President no longer has that power. Nevertheless, that act was done. This House, subsequently on the 14th of November, declared that act to be unconstitutional and illegal.

Thereafter, His Excellency prorogued Parliament. He first announced 16th of November as the date on which Parliament was to convene subsequent to prorogation. However, subsequently, he advanced that date to 14th November. But, in the meantime, on the 09th of November, he issued certain Proclamations. By a

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

Proclamation, he purported to dissolve Parliament. Again, that was a power that His Excellency the President had prior to the Nineteenth Amendment. After the expiration of one year, if the previous Parliament had not been sooner dissolved, the President could dissolve Parliament. But in the Nineteenth Amendment, that situation changed drastically and the power of the President to dissolve Parliament at will was circumscribed, was limited, was restricted and he could not dissolve Parliament for a period of four-and-a-half years from the first Sitting of a Parliament unless Parliament itself, by a Resolution adopted by two-thirds, requested the President to do so. These are all very clearly spelt out in black and white.

Unfortunately though, disregarding these clear and specific provisions that had been brought in by the Nineteenth Amendment, His Excellency purported to dissolve Parliament and several Members of this House and other citizens challenged such act of the President in the Supreme Court. That, again, was made possible because in the Nineteenth Amendment, the blanket immunity that the President had previously had been relaxed and a citizen could invoke the jurisdiction of the Supreme Court by a Fundamental Rights petition against the official acts of the President. Those were the applications that were heard by the Supreme Court eventually by a Bench of seven Judges and the unanimous conclusion of those seven Judges is that the President had violated the Constitution when he purported to dissolve Parliament before the expiration of a period of four-and-a -half years from the date of first Sitting of this Parliament.

During this process, many people made comments about the Nineteenth Amendment to the Constitution saying it was hurriedly brought, ill-conceived, badly drafted et cetera. But, if one reads the Judgments of the Supreme Court, one can rest assured that there is no such thing and the Nineteenth Amendment is lucid, clear, unambiguous and had made deep inroads into the powers of the Executive President, as promised to the people before His Excellency Maithripala Sirisena contested the 2015 Presidential Election.

In point of fact, in November, 2014, when the Hon. Maithripala Sirisena addressed a press conference and declared himself to be the Joint Opposition Candidate, the first time he made that declaration, he made three promises to the country. The first of those promises was that he would abolish the Executive Presidency. The second promise was that he would reform the Parliamentary Election System and the third was that he would appoint the Hon. Ranil Wickremesinghe as Prime Minister. Those were the three promises that candidate Maithripala Sirisena gave the people of this country in November, 2014.

Through the Nineteenth Amendment, although we did make serious strides in the direction of abolishing the Executive Presidency, in my opinion, Sir, what we have today can hardly be called “Executive Presidency”, if you compare it with what we had prior to the Nineteenth Amendment. But, unfortunately, no one quite appreciated what had been done through the Nineteenth Amendment. There is very little that the President can do by himself after the Nineteenth Amendment. Even with regard to governance, even with regard to his role in Cabinet, his role with regard to appointment of Ministers, assignment of subjects and functions, there is very little that he can do unilaterally or, as he pleases. The Nineteenth Amendment has brought a situation where the President and the Prime Minister must work together and if they do not, we would have a situation of standoff as we had.

So, the Nineteenth Amendment was only a stopgap, was only an initiative - it could only be something temporary until you did it in full. So, if abolition of the Executive Presidency is a programme, we have done half way or, maybe a little further than half way, but it must be done in full. You cannot continue with the Nineteenth Amendment being part of our Constitution for too long. We will face situations like we faced in the last month or so.

So, this must change. As the Hon. (Dr.) Jayampathy Wickramaratne pointed out, there cannot be two centres of power. Now we have that under the Nineteenth Amendment and that must be rectified. In rectifying that, we must give effect to the mandate that the people of this country had given this Parliament, not only to this Parliament, they have been giving this mandate for quite some time, for two decades. But at least in this Parliament that must be accomplished, that must be honoured, and the abolition of Executive Presidency must necessarily form an important part of the new Constitution that we enact in this Parliament or, through a process of this Parliament and a Referendum. That too is a promise and that must be accomplished.

Many people think that the time has run out, the opportunity has been missed that it is now not possible to enact a new Constitution. I do not think so. I think the lessons that we learnt in the last 50 odd days will be useful in Members of this House and the citizens of this country - the voters of this country - deciding on the enactment of a new Constitution. The experience of this country over the last month or so should not be wasted, should not be in vain. There have been some sideshows also and I am sure the citizenry has watched those sideshows also. The sideshows are that in this whole process anybody who does not belong to the majority community has no place or no role to play in the national life of this country. That is a not so subtle message that keeps getting communicated to the country. So, for instance, if I, Sumanthiran, plays a role with regard to these matters, that is a message that is given. Hidden behind that is the message, “How dare he, a Tamil, play a role in the national life of our country”. That is the question, most often unarticulated question, but some articulated it also. These sideshows have also been watched by our people. When I say "our people", I particularly mean the majority community of this country. They detest that kind of communalism that is being spewed out venomously by certain politicians.

We have had not just the last two months experience; we have had the experience of three-decade-long bloody

war in this country. No one wants to return to those days. If that is to be achieved, then one must realize that every citizen of this country, whatever be his ethnicity, his language, where he lives, he has an equal stake in the affairs of this country. There is no second-class citizen of this country. "All are equal" is a proposition that I think our people have embraced and they know the value of that and that is why I say when in these sideshows these attempts are made to whip up base communal feelings, our people will reject them and reject they must.

When a new Constitution is presented, as amongst other things, a solution to the Tamil national question that has plagued this country for seven long decades, we will have a verdict from our people, not just from people who are numerically the minority in this country, but from the majority community itself, rejecting these tribal, communal notions and endorsing that everyone in this country is equal and they must have due place and the facility to participate as an equal citizen in this country in all its affairs. You cannot be said to be disabled, if you are a Tamil or a Muslim or a Christian or a Hindu, somehow inferior. Numbers do not give you status, numbers do not give anyone any higher status, it is the commitment of a person to that country that gives him status.

Our people have repeatedly, through democratic elections, informed the country that we are willing to live within a united, undivided, maybe even indivisible country and that therefore, the others must acknowledge that readiness, must clasp the hand that has been stretched out by us. But if you do not do that, if anybody tells me that I have no place to play a role in the national affairs of this country, that person cannot tell me that I must remain in this country. If I am not an equal citizen of this country, I cannot be held by force to be a citizen of this country. I would have every right to demand that I go my separate way. So, the choice is of the majority community. We have said very clearly what our position is, and by our acts and deeds even in the last few days, we have shown that we are willing to participate and live as full citizens of this country. The choice is with those who do not want to accept that offer. They are the ones who will be responsible if the country does not progress, if it regresses.

So, on this opportunity when we discuss the very important issue of abolition of the Executive Presidency, Mr. Deputy Speaker, I want to bring to the attention of the House and the country that that must be a necessary part of the new Constitution that we make, because a Constitution is a social contract between the peoples who live in this country. So far, we have not had a social contract to which all the peoples of this country have consented to and we still have that opportunity.

Time may be short, but quite sufficient for us to do that and I appeal to all that we do not squander that opportunity, that we use that opportunity, that we abolish the Executive Presidency and make a new Constitution for the country, where all the people will be equal and share power in an equal way.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Rauff Hakeem. Before he starts, the Hon. Deputy Chairman of Committees will take the Chair.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

[பி.ப. 3.29]

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று ஜே.வி.பீ. கட்சியினர் முன்மொழிந்து, வழிமொழிந்திருக்கின்ற இந்தப் பிரேரணை குறித்து, தாங்கள் சபாநாயகர் ஆசனத்திலே வீற்றிருக்கின்ற சமயத்திலே ஒருசில வார்த்தைகள் பேசச் சந்தர்ப்பம் கிடைத்ததையிட்டு நான் மகிழ்வுறுகின்றேன். இந்த நாட்டின் அரசியலிலே ஒரு கொந்தளிப்பு நிலையை உருவாக்கி, 51 நாட்கள் எங்களையெல்லாம் அல்லோலகல்லோலப் படுத்திவிட்டு, இன்று பாராளுமன்றம் அமைதியாகக் கூடுகின்ற ஒரு சூழலும் மீண்டும் அரசாங்கமொன்றை முன்னெடுத்துச் செல்லுகின்ற வாய்ப்பும் ஏற்பட்டிருக்கின்றது. இந்தப் போராட்டத்தில் எங்களோடு இணைந்துகொண்ட சகல கட்சிகளுக்கும் சிவில் சமூக அமைப்புக்களுக்கும் இந்த நாட்டின் ஜனநாயகத்தைப் பாதுகாக்க வேண்டுமென்று போராடிய சகல பொதுமக்களுக்கும் எங்களுடைய மனமார்ந்த நன்றியறிதலை முதற்கண் நான் சமர்ப்பிக்க விரும்புகின்றேன்.

Mr. Deputy Chairman of Committees, today we are discussing this Motion that pertains to the question of the abolition of the Executive Presidency. Since 1982, successive presidential candidates have campaigned for a mandate to abolish the Executive Presidency. Every one of them have also succeeded in breaching that mandate, attempting to contest a subsequent Presidential Election. One President quite recently brought about the Eighteenth Amendment to perpetually remain the President of this country. So, the lure, the greed to retain power, particularly Executive power, is such that everyone who promised to abolish the Presidency succeeded in not abolishing it, but doing the reverse by attempting to retain it, contest it once again as well as attempting to be in office perpetually. So, that is the history of the abolition of the Executive Presidency in this country.

More particularly on two occasions, directly the Executive President could not control Parliament and a different party came to power in Parliament, which resulted in serious duality in power. There had been two centres of power. We experienced this between 2001 and

[ගරු රවුෆ් හකීම් මහතා]

2004, where Her Excellency Chandrika Bandaranaike Kumaratunga, who was elected to her second term, had to survive with a hostile Parliament, of which the current Prime Minister had control. I was a central figure in that drama since she lost power in Parliament because she expelled me from Cabinet and I had to cross the Floor of this House and within five months of my going to the Opposition, the Government lost its majority and she had to dissolve Parliament.

In the subsequent election, we joined the United National Party as a constituent party of the then United National Front Coalition, defeated Her Excellency the President's Party - the People's Alliance - and formed the administration. So, during that period between 2001 to 2004, there was an attempt to survive as a Cohabitation Government. That experience resulted in serious policy differences between the two sections: particularly, the Executive President's Party and those who represented her in Parliament as well as the Party which had the majority in Parliament, that of the Hon. Ranil Wickremesinghe, who had to be sent out of power in the Election in 2004. So, this experiment of cohabitation between two centres of power when they are from different political parties is something that we are experiencing now. Once again, I am, in this whole drama, another central figure by being on the side of the Hon. Ranil Wickremesinghe whereas we elected His Excellency Maithripala Sirisena on a common platform with a variety of different partners, both directly and indirectly.

The Janatha Vimukthi Peramuna also joined in the struggle to unseat His Excellency Mahinda Rajapaksa for the very reason that he wanted to perpetuate his power by bringing in the Eighteenth Amendment to the Constitution and arrogate to himself all executive power in one single office which became a serious threat to Parliamentary democracy in the country. His Excellency Maithripala Sirisena contested the election on a platform of totally abolishing the Executive Presidency and with a promise not to seek office once again. However, his actions for the past one year or more has convinced all of us that he is seeking to renege the promise he made to the people and whether directly or indirectly he is attempting to seek power again by wishing at least to become a candidate in the next election.

Yesterday we had a massive rally in the Galle Face Green, perhaps one of the largest rallies that this country ever saw. People turned up to celebrate the restoration of democracy in the country, since they saw the attempt by the purported Government that was installed wrongfully and unconstitutionally by His Excellency the President in the October 26th swearing-in ceremony. So we have seen quite interestingly the swearing-in ceremonies of Prime Ministers being done in secret without media being present twice, one to install Mahinda Rajapaksa as the Prime Minister and the other to swear in Ranil Wickremesinghe as the Prime Minister.

Be that as it may, today we are grappling with the situation of whether we should continue with this dual centres of power and that it is totally unsuitable for the country's democracy, but little forgetting that the electoral system in the country too plays a role in this. That is why we, minority parties, were quite keen that we should address the issue of the electoral system as well together with the abolishing of the Executive Presidency. Yesterday, the Prime Minister was seen to suggest that he wants a two-thirds majority to abolish the Executive Presidency and install a Parliamentary System of Governance after removing the Executive Presidential System whereas his Deputy Leader, Sajith Premadasa very openly said that we must contest and carry on this Government up to next September or October - the full term of His Excellency the President - and conduct the next Presidential Election and then attempt to win that election. So the United National Party itself appears to be having two points of view and this is a question of some confusion for some of us who are in this coalition. So it is important for us to address that issue.

Sir, we need to resolve serious political questions about the electoral system. None of us are in favour of abolishing the current electoral system for the reason that we have experienced the worst in the Local Government Election as well as in the attempt to change the electoral system of the Provincial Councils. In six Provincial Councils, no elections have been held and the Delimitation Committee's Report has been rejected by this Parliament even by the Minister who brought the system voting against it. That was the comedy of errors that we saw being staged in Parliament.

Therefore, there is a dilemma here. Of course, the Janatha Vimukuthi Peramuna wants the Executive Presidency abolished for the right reasons. But we cannot divorce it from the entire Constitution and the need to change the other things. What about the devolution aspect? We must also remember that abolishing of the Executive Presidency cannot be done without a Referendum because there are entrenched Articles that needs to be changed and that will certainly attract a Referendum and the Supreme Court will no doubt rule that this question cannot be decided by this Parliament alone by a two-thirds majority. It has to be subjected to a Referendum. So, if a Referendum is to be won, all sections of the country have got to be convinced that we do not want such a system. So, people are not interested in piecemeal tinkering with the Constitution. What we want is an overall Constitutional reform which will replace the Constitution with a new system by addressing every issue of contention.

That is why we appointed a Steering Committee and that Steering Committee's Report has been finalized and we have tabled it in Parliament. We were to debate it. We have perhaps come to some understanding with the Tamil National Alliance that by February we will introduce it to Parliament to attempt to see whether we can have an endorsement of that with a two-thirds majority in this House. But there are different points of view. -[*Interruption*.] No, we need to look at whether we can introduce changes to the Constitution with an agreement by all parties because now the JVP does not want the Executive Presidential System; some of you

want to change the electoral system; some have issues pertaining to the devolution aspects of the Constitution and His Excellency the President seems to be having serious reservations about the appointment of judges through the Constitutional Council. Having voted for it ; having approved it, he is now beginning to complain that the senior-most judges do not get appointed since the Constitutional Council is not looking at seniority. This is one of those complaints that he sought to make when we were summoned to meet with him when the Prime Minister was sworn in. Everybody listened to what he said.

Now there is an issue concerning three political leaders in the country. One is Maithripala Sirisena, the other is Ranil Wickremesinghe and the next one is, Mahinda Rajapaksa.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, நீங்கள் இன்னும் ஐந்து நிமிடங்களை எடுத்துக் கொள்ளலாம்.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Thank you.

These three political leaders are looking at their political future. So, the abolition of the Executive Presidency or reintroducing the Westminster System cannot be designed for the whims and fancies of these three individuals. The Constitution of the country is not the property of Ranil Wickremesinghe or Maithripala Sirisena or Mahinda Rajapaksa. That is an eternal document. That is the sacred book upon which this entire country's governance is conducted.

Now, what is the problem? The Hon. Mahinda Rajapaksa wishes to abolish the Executive Presidency because he cannot contest the next Executive Presidency. It is an issue for him. The Hon. Ranil Wickremesinghe is a leader who does not believe in emotional, sentimental propaganda or irrational campaign to mislead the masses. He himself has not contested the last two Presidential Elections, but he feels that since he is a political leader who appeals to the intelligentsia of the country, he cannot conduct an emotional, sentimental or irrational campaign. So, he has always opted to let others contest for the Presidential Election. He has an interest in restoring Parliamentary democracy so that he can get himself re-elected to Parliament and then control Executive power through Parliament without an Executive Presidency as a different centre of power. His Excellency Maithripala Sirisena, having promised the country that he is going to abolish the Executive Presidency, now wants perhaps to look at a "second bite at the cherry" as we call it, to try and contest the Executive Presidency once again having promised the country that he will not seek re-election. So, this question cannot be decided on the whim and fancy of individual political leaders, but we have got to look at how the governance has been impacted by having dual centres of power, whether we are able to have proper separation of powers in the context of the Executive Presidential System.

Certainly, we saw that during the last 51 days, the experience of this country was such that an irrational, emotional and sentimental President, who is hell-bent on trying to interpret the Constitution to his own convenience, can seriously jeopardize governance in the country. That is what we experienced. Seven Judges of the Supreme Court of this country unanimously held that the constitutional provisions had been violated in dissolving Parliament. The question of installing a Prime Minister went before the Court of Appeal. The Supreme Court, in a unanimous verdict, held that the dissolution of Parliament was unconstitutional. With that, at least indirectly, the issue pertaining to the majority of Parliament deciding the fate of Prime Minister was put to rest. So, all these complications arise out of this particular issue.

පසුගිය දවස් 50ක අරගලයේ ප්‍රධාන නළුවා හැටියට අපේ ජනාධිපතිතුමා ගත් උත්සාහය ඇත්තවශයෙන් "නටපු තොවිලයකුත් නැහැ, බෙරේ පළුවකුත් නැහැ"යි කියන තත්ත්වයකට වැටුණාය කියන එකයි අපි දැක්කේ. එබැවින් අපට සිදු වෙනවා, - [බාධා කිරීමක්] ඒකයි. දැන් ඉතින් මෙහෙම නේ.

Now, it is a sour grapes story. You tried to grab power through the back door. Now, at least through the front door, you have come and taken the position of the Leader of the Opposition. Never try it through the back door. You tried to grab power of the Prime Ministerial Office through the back door. Now, you have come through the front door taking the- [*Interruption.*]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Out of your advice, the former President, I hope, will not become a former Member of Parliament. I mentioned this morning, there is a serious issue. Let alone being the Leader of the Opposition, whether he is a Member of Parliament has to be decided by a Select Committee of this House ultimately. I am not being personal here. I have my deepest respect for the former President. I asked him when I met him after this crisis why he was in such a haste. Some of you have pushed him into a serious political debacle. A man who was riding in the high wave of popularity has compromised his popularity unnecessarily trying to grab power through the back door to satisfy a few of you who had misled him. That is his fate. I hope he would see some saner counsel soon and resign to his fate as the Leader of the Opposition in the coming years to come.

Thank you.

[අ.භා. 3. 52]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය අර්බුද සමයේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමන්ලා අපට කිව්වේ, මේ අර්බුදය අවසන් වුණු වහාම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ යෝජනාවක් එතුමන්ලා මේ ගරු සභාවට ඉදිරිපත් කරනවාය කියායි. හැබැයි ඒ කිව්ව දේ වෙනුවට විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පිළිබඳ මේ යෝජනාව අද දින පාර්ලිමේන්තුවට ගෙන ඒමෙන් පෙනෙන්නේ, මහින්ද රාජපක්ෂ මැතිතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒමට තිබුණු උනන්දුව, ඒ දුන්නු පොරොන්දුව ඉටු කරන්නේ නැති බවයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ විධායක ජනාධිපති ක්‍රමය පිළිබඳව පසුගිය කාලය පුරාවට අපි ඇති තරම් කථා කළා, ඇති තරම් ලිව්වා, ඇති තරම් වාද විවාද කළා. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට තිබෙන්නා වූ හදිසියේ යටි අරමුණු මොනවාද කියන එක ගැන මේ ගරු සභාවේ අවධානය යොමු කරන්න මා කැමැතියි. අපි දැක්කා, මේ ආණ්ඩුවට තිබෙන ලොකුම භය තමයි මහ ජනතාවට මුහුණ දීමේ භය කියලා. බල්ලාට ජලභීතිකාව හැදෙනවා වාගේ එක්සත් ජාතික පක්ෂයට ජනභීතිකා රෝගය හැදිලායි තිබෙන්නේ. ජලභීතිකාව හැදුණු බල්ලා ජලය දැක්කාම භය වෙනවා වාගේම ජනභීතිකාව හැදුණු එක්සත් ජාතික පක්ෂය ජනතාව ඉදිරියට යන්න හරි භයයි. මුලින්ම විධායක බලය පාවිච්චි කරලා සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාවකට මුවාවෙලා පළාත් පාලන මැතිවරණය වසර තුනකින් කල් දමා ගත්තා. ඊළඟට ව්‍යවස්ථාදායක බලයට මුවාවෙලා පාර්ලිමේන්තුවේදී පළාත් සභා මැතිවරණ පනත සංශෝධනය කරලා පළාත් සභා මැතිවරණය දින නියමයකින් තොරව කල් දමා ගත්තා. ඊළඟට, අධිකරණ බලයට මුවාවෙලා අධිකරණයට පෙත්සම් ගහලා අප ලබා දුන්නු පාර්ලිමේන්තු මැතිවරණයත් අහෝසි කර ගත්තා. මේ සියල්ල කර ගත්තත් අහෝසි කර ගන්න බැරි මැතිවරණයක් තිබෙනවා. ඒ තමයි 2019 ඔක්තෝබර් මාසයේදී ප්‍රකාශ කිරීමට නියමිත ජනාධිපතිවරණය. සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව මත පුංචි ඡන්දය කල් දැම්මාට, සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව මත පළාත් සභා මැතිවරණය කල් දැම්මාට, සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව පෙන්වා, පාර්ලිමේන්තු මැතිවරණය කල් දමන්න ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් හදලා ඉදිරිපත් කළාට, සීමා නිර්ණය කිරීමේ කමිටු වාර්තාව මත ජනාධිපතිවරණයක් කල් දමන්න බැහැ. ඇයි? ජනාධිපතිවරණයේදී සමස්ත ශ්‍රී ලංකාවම එකම මැතිවරණ කොට්ඨාසයක් වන නිසා ඒක ඇතුළේ සීමා නිර්ණයන් නැහැ. ඒ නිසා තමයි ජනාධිපතිවරණය කල් දමා ගන්න බැරි නම් ජනාධිපතිවරණය අහෝසි කර හෝ ජනතාව ඉදිරියට යැමට තිබෙන අවස්ථාව මග හරවා ගැනීම සඳහා වර්තමාන ආණ්ඩුව ජනතා විමුක්ති පෙරමුණේ සහයෝගයෙන් මේ කූට වැයමක යෙදිලා ඉන්නේ කියන එක අපි මේ රටේ ජනතාවට සිහිපත් කරන්න ඕනෑ.

අපේ ගරු සභානායක ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා නිරන්තරයෙන් කිව්ව කාරණයක් තමයි, "2025 වන තුරු අපි තමයි බලයේ ඉන්නේ." කියන එක. මැතිවරණ පවත්වා ඒ මැතිවරණ ජයග්‍රහණය කරලා 2025 වන තුරු නොවෙයි, 2055 වන තුරු බලයේ සිටියාට අපට කිසි ප්‍රශ්නයක් නැහැ. ඒ ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට අපි ගරු කරනවා. මැතිවරණ කල් දමා, මැතිවරණ නැති කරලා තමයි බලයේ ඉන්නේ. හැබැයි, එයට තිබෙන ලොකුම බාධාව තමයි ජනාධිපතිවරණය. ඒ නිසා ජනාධිපතිවරණය අහෝසි කර ගැනීමේ වුවමනාවක් එක්සත් ජාතික පක්ෂයට තිබෙනවා. මෙයට ජනතා විමුක්ති පෙරමුණ කර ගහන්නේ ඇයි? ජනතා විමුක්ති පෙරමුණටත් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණට දේශපාලන ඉතිහාසයේ තිබෙන ලොකුම ඇණය තමයි ජනාධිපතිවරණය. පුංචි ඡන්දයේදී හොඳ ඡන්ද සංඛ්‍යාවක් ගන්නවා. පළාත් සභා මැතිවරණයේදී ඒ ඡන්ද සංඛ්‍යාව වර්ධනය කර ගන්නවා. ඊළඟට, පාර්ලිමේන්තු මැතිවරණයේදී ඒ ප්‍රමාණය තවදුරටත් වර්ධනය කරගෙන පාර්ලිමේන්තුවේ දූරස්ථ පාලකය වීමේ සිහිනය ජනතා විමුක්ති පෙරමුණ වැලඳගන්නවා. හැබැයි පළාත් සභා මැතිවරණයයි, පාර්ලිමේන්තු මැතිවරණයයි අතර මැදට පනිනවා, හෙනහුරා. කවුද? ජනාධිපතිවරණය. ජනාධිපතිවරණය කියන්නේ ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනකු අතර තිබෙන තරගයක්. මෙහිදී තුන්වන පාර්ශ්වයට ඡන්ද ලබා ගැනීම දුෂ්කරයි. ජනතා විමුක්ති පෙරමුණ පළාත් සභා මැතිවරණවලදී ලබා ගන්නා ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 50ක් පමණ තමයි ජනාධිපතිවරණයේදී ලබා ගන්නේ.

ඒ නිසා, ජනාධිපතිවරණය කියන්නේ ජවිපෙට තිබෙන ලොකුම ඇණය; මුහුණ දෙන්න බැරි දුෂ්කරතම අවස්ථාව. ජවිපෙ නිර්මාතෘ රෝහණ විජේවීර මැතිතුමා 1982 දී ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණා, දෙලක්ෂ හැත්තෑතුන්දාහයි ඡන්ද ගත්තේ. ඊළඟට, ජේවීපී එක 1988 ජනාධිපතිවරණය වර්ජනය කළා; 1994 චන්ද්‍රිකා මැතිනියට සහාය දුන්නා; 1999 ආපහු තරග කළා, ඡන්ද තුන්ලක්ෂ පනස්දහසක් වැනි ප්‍රමාණයකුයි ගන්න පුළුවන් වුණේ. ජේවීපී එක ආයේ නම් මැතිවරණවලට තරග කළේ නැහැ. 2005 මහින්ද රාජපක්ෂ මැතිතුමාට, 2010 සරත් ෆොන්සේකා මැතිතුමාට, 2015 මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට සහාය දිදී ඔවුන් හිටියා. සහාය දෙන්න ගිහිල්ලා වෙච්ච දේවල් දිහා බැලුවාම, ජනතා විමුක්ති පෙරමුණට ජනාධිපතිවරණයේදී ප්‍රධාන අපේක්ෂකයෙකුට සහාය දෙන්න බැහැ. දැන් අලි අමාරුවක වැටිලායි තිබෙන්නේ. වර්ජනය කරන්නත් බැහැ, තරග කරන්නත් බැහැ, සහාය දෙන්නත් බැහැ, කරන්න විකල්ප ඉතිරි වෙලාත් නැහැ. එහෙනම් ජනතා විමුක්ති පෙරමුණට අද ජනාධිපතිවරණය සම්බන්ධයෙන් ගත හැකි එකම විකල්පය වෙලා තිබෙන්නේ, මේ මල ඇණය අහෝසි කරගැනීම පමණයි. එහෙමනම්, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරලා මොකක්ද ගෙනෙන්න හදන්නේ? "පාර්ලිමේන්තු ක්‍රමය" කියන, - හැම රටේම පාර්ලිමේන්තුව තිබෙනවා නේ.-"වෙස්ට්මින්ස්ටර් ක්‍රමය" කියන, ව්‍යවස්ථාදායකය ඇතුළෙන් විධායකය බිහි කරගැනීමේ ක්‍රමය තමයි මේ ගෙනෙන්න හදන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1215 දී "මැග්න කාර්ටා" කියන ගිවිසුම එංගලන්තයේ ඇතිවීමෙන් තමයි මේ පාර්ලිමේන්තු ක්‍රමයේ පළමුවන වස්තු බීජය ඇති වෙන්නේ. එතැන ඉඳලා එංගලන්තයේ ප්‍රභූවරු රජතුමාත් එක්ක කළ නිරන්තර බල අරගළයේ ප්‍රතිඵලයක් විධියට, රජතුමාගේ බලය ක්‍රමානුකූලව අගමැතිවරයා ප්‍රමුඛ ඇමති මණ්ඩලයට ගියා. අවසානයේදී, රජතුමා නාමික චරිතයක් බවට පත් වුණා; අගමැති ප්‍රමුඛ ඇමති මණ්ඩලයට සම්පූර්ණ විධායක බලය ලැබුණා.

ලෝකය පුරා තවමත් රජවරු සිටින පෘතුගාලය, ස්පාඤ්ඤය, ජපානය, තායිලන්තය කියන මේ හැම රටකම ක්‍රියාත්මක වෙන්නේ මේ වෙස්ට්මින්ස්ටර් ක්‍රමයයි. බ්‍රිතාන්‍යය තම යටත් විජිතවලට නිදහස ලබා දෙද්දී තමන්ගේ වෙස්ට්මින්ස්ටර් ක්‍රමය ඒ රටවලට හඳුන්වා දුන්නා. අපිත් යටත් විජිත මානසිකත්වය නිසා අන්ධානුකාරයෙන් මේ ක්‍රමය පිටුපසින් ගමන් කරනවා. මේක ලෝකයේ තිබෙන නොදියුණුම ක්‍රමයක්. මෙය එංගලන්තයේ රජාව තමන්ගේ ව්‍යවස්ථා ආකෘතිය තුළ ඔබා ගැනීමට හදා ගත්ත ක්‍රමයක් මිස ජනතාවාදී ක්‍රමයක් නොවෙයි. අද ලෝකයේ තිබෙන ජනප්‍රියතම රාජ්‍ය ව්‍යූහ ක්‍රමය වන්නේ විධායක ජනාධිපති ක්‍රමය මිස අන් කිසිවක් නොවෙයි. විධායක ජනාධිපති ක්‍රමය ලෝකයේ

රටවල් 95ක තිබියදී, වෙස්ට්මින්ස්ටර් ක්‍රමය තිබෙන්නේ රටවල් 44ක පමණයි. ඒ වාගේම ලෝකයේ ප්‍රවණතාව වෙලා තිබෙන්නේ වෙස්ට්මින්ස්ටර් ක්‍රමය අත්හරිමින් විධායක ජනාධිපති ක්‍රමයට අනුගත වීමයි. ලෝකයේ ජනප්‍රියම ක්‍රමය විධායක ජනාධිපති ක්‍රමය නම්, ලෝකයේ රැල්ල තිබෙන්නේ විධායක ජනාධිපති ක්‍රමය වැලඳගැනීමට නම් ඇයි ලංකාවේ විතරක්-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප.ව. 4.00ට කථාව පටන් ගත්තොත් මට විනාඩි 10ක් තිබෙනවායි කිව්වා. නමුත්, ප.ව. 4.00ට විනාඩි 05කට කලින්නුයි මම කථාව පටන් ගත්තේ. මට තව විනාඩි තුනක් දෙන්න. මම ඉක්මනින් කථාව ඉවර කරන්නම්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා අහන්නේ, ලෝකය පුරාම ජනප්‍රිය මේ ක්‍රමය ලංකාවේ විතරක් එපා කියන්නේ ඇයි කියන එකයි. "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනු!" කියන සටන් පාඨය සමස්ත ලෝකයෙන්ම ලංකාවේ විතරක් තිබෙන්නේ ඇයි? විධායක ජනාධිපති ක්‍රමය පීඩාකාරී නම්, මර්දනකාරී නම් එයින් වඩාත්ම පීඩාවට පත්ව තිබිය යුත්තේ ඇමෙරිකාවයි. ඇමෙරිකාවේ විධායක ජනාධිපති ක්‍රමය මේ වන විට වසර 230ක් තිස්සේ ක්‍රියාත්මකයි. ඇමෙරිකාවේ "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනු!" කියලා උද්ඝෝෂණයක් තබා කෙඳිරිල්ලක්වත් නැහැ. ඇයි ඒ? අපේ රටේ තිබෙන ප්‍රශ්නය වන්නේ, විධායක ජනාධිපති ක්‍රමය ක්‍රියාත්මක කර තිබෙන ආකාරයේ වැරැද්දක් මිසක විධායක ජනාධිපති ධුරයේ වැරැද්දක් නොවෙයි. අපේ ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මැතිතුමා මතක් කළා, ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමාගේ "1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ විවේචනාත්මක විශ්ලේෂණයක්" කියන පොත් පිංච ගැන. ඒ පොතේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විවේචනය කර තිබෙනවා. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විධායක ජනාධිපති ක්‍රමයේ විකෘතියක් කියලා අපිත් පිළිගන්නවා. අපි කියන්නේ, ඒ නිසා සැබෑ විධායක ජනාධිපති ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිසි අයුරින් සංශෝධනය කරන්න ඕනෑය කියන එකයි. අපේ රටේ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වග කියන්නේ නැහැ. ඇමෙරිකාවේ ජනාධිපතිවරයා සෙනෙට් කමිටුවට කැඳවා ප්‍රශ්න කරන්න පුළුවන්. ඒ නිසා ඇමෙරිකාවේ ජනාධිපතිතුමා දන්නවා, "මම ගන්නා තීරණයක් සෙනෙට් කමිටුව මඟින් ප්‍රශ්න කරන්න ඉඩ තිබෙනවා. මම තාර්කික තීන්දුවලට, සාක්ෂි සහිත නිගමනවලට එළැඹෙන්න ඕනෑ. ප්‍රශ්න කළොත් මට උත්තර දෙන්න පුළුවන් වෙන්න ඕනෑ" කියන එක. ඒ වාගේම ඇමෙරිකාවේ ජනාධිපතිවරයා අධිකරණයට ගෙනයන්න පුළුවන්. මෑත කාලයේ අපි දැක්කා, බිල් ක්ලින්ටන් මැතිතුමා ජනාධිපති ධුරයේ ඉන්න කාලයේ මොනිකා ලෙවින්ස්කිට සහ පෝලා ජෝන්ස්ට ලිංගික හිරිහැර කළාය කියලා නඩු පැවරීම තුළ, එතුමා අධිකරණයට ගෙන ගොස් ප්‍රශ්න කළ බව. එවැනි ක්‍රමයකට අපේ රටේ ඉඩ නැහැ. මෙතුමන්ලා දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ජනාධිපතිවරයාට ලබා දී තිබෙන මුක්තිය ඉවත් කරනවා කිව්වාට ඒක සිද්ධ වුණේ නැහැ.

ඒ වාගේම ජනාධිපති ධුරයේ යම් යම් අත්තනෝමතික බලතල තිබෙනවා. ඒවා වෙනස් කරන්න ඕනෑ. ඒ නිසා අපේ මතය වන්නේ, විධායක ජනාධිපති ක්‍රමය මේ රටට අවශ්‍යයි, එය රැක ගත යුතුයි, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන අඩු පාඩු සංශෝධනය කරලා විධායක ජනාධිපති ක්‍රමය ප්‍රතිසංස්කරණයකට ලක් කිරීම සිද්ධ විය යුතු බවයි. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ 2010 මැතිවරණ ප්‍රකාශනයේ, 2015 ජනවාරි ජනාධිපතිවරණ ප්‍රකාශනයේදී, 2015 අගෝස්තු පාර්ලිමේන්තු මැතිවරණ ප්‍රකාශනයෙහි යන මේ සියල්ලේම තිබෙන්නේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න කියලා නොවෙයි; විධායක ජනාධිපති ක්‍රමය සුදුසු පරිදි සංශෝධනයට ලක් කළ යුතුය කියන කාරණයයි. අපි එදාත් හිටියේ ඒ ස්ථාවරයේ; අද ඉන්නේත් ඒ ස්ථාවරයේ. අපි ඒ ස්ථාවරය කිසි මොහොතක වෙනස් කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට වෙන් වූ කාලය අවසන් නිසා තව කාරණයක් පිළිබඳව කෙටියෙන් කියන්නම්. ඒ තමයි විධායක ජනාධිපති ක්‍රමය ජනප්‍රිය වෙලා තිබෙන්නේ ඇයි කියන කාරණය. "බලය වෙන් කිරීම" කියන න්‍යාය එනම් "the doctrine of separation of powers" අනුව, විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය වෙන වෙනම ස්වාධීන ආයතන තුනක් වෙන්න ඕනෑ.

ඇමෙරිකාව වාගේ රටවල පූර්ණ ජනාධිපති ක්‍රමය ක්‍රියාත්මක වෙද්දී විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය සැබැවින්ම වෙන් කරලා තිබෙනවා. අපේ රටේ විධායක ජනාධිපතිවරයා ස්වාධීනව පත්වන නිසා පාර්ලිමේන්තුව පාලනය කිරීමේ හැකියාවක් තිබෙනවා. එය පාලනය කිරීම අවශ්‍යයි. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ජනාධිපතිවරයාට ලබා දීලා තිබෙන්නේ ජනතාව විසිනුයි. පාර්ලිමේන්තුව දේශ ද්‍රෝහී වනවා නම්; ජන වරමට පටහැනිව ක්‍රියාත්මක වනවා නම්, පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ජනාධිපතිතුමාට තිබෙන්න ඕනෑ. පාර්ලිමේන්තුව විසුරුවා හැරියාම මන්ත්‍රීවරු ආපහු එන්නේ ජනතාව ළඟටයි. ජනාධිපතිතුමා ගත් තීන්දුව වැරදියි නම්, ආණ්ඩුව කර ගෙන ගියේ ජනතාවට වුවමනා දේ නම්, ආණ්ඩුව කර ගෙන ගිය වැඩ පිළිවෙළ පිළිබඳව ජනතාව සතුටුයි නම්, ජනතාව මොකද කරන්නේ? හිටපු අගමැතිතුමා ඇතුළු ආණ්ඩුවට තිබුණාටත් වඩා ලොකු ජන වරමක් දීලා නැවත ඔවුන්ව පත් කරලා එවනවා. මේ රටේ ජනාධිපතිවරු ඒ විධියට දෙවරක් පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. චන්ද්‍රිකා මැතිනිය 2000දී සන්ධාන ආණ්ඩුව විසුරුවා හැරියා. ජනතාව තීරණය කළා, "ඔව්, හරි, මේ ආණ්ඩුව ගෙදර යා යුතුයි" කියලා. ඉන් පසුව ජනතාව එක්සත් ජාතික පක්ෂයට බලය ලබා දුන්නා. චන්ද්‍රිකා මැතිනිය නැවත වතාවක් 2004දී පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. ජනතාව සිතුවා, "මේ තීන්දුව හරි, අපිටත් ආණ්ඩුව එපා වෙලායි හිටියේ" කියලා. ඉන් පසුව ජනතාව ඒ ආණ්ඩුව ගෙදර යවා එක්සත් ජනතා නිදහස් සන්ධානයට බලය දුන්නා. එම නිසා ජනාධිපතිවරු මේ බලය පාවිච්චි කරපු සෑම අවස්ථාවක්ම ජනතාව විසින් අනුමත කරලා ජනාධිපතිවරයාට තිබිය යුතු, නිවැරදිව තීන්දු ගන්නා බලයක් විධියටයි එය ඓතිහාසිකවත් ඔප්පු කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මන්ත්‍රී ධුර 97ක් තිබෙන මේ රටේ ප්‍රධාන විපක්ෂයට කථා කරන්න වෙන් කර තිබෙන්නේ සමස්ත පැය තුනක විවාදයෙන් විනාඩි 10ක්. ඒ වාගේම මගේ සහෝදර මන්ත්‍රීතුමාගේ විනාඩි 5ට විනාඩි 15ක් දීම ගැන අපේ අතිශය කනගාටුවත්, කලකිරීමත් ප්‍රකාශයට පත් කරමින්, විධායක ජනාධිපති ක්‍රමය සංශෝධනය කර පවත්වා ගැනීම ජාතික අවශ්‍යතාවක්ය කියන එක සිහිපත් කරමින් මම නිහඬවනවා.

[අ.භා.4.06]

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තිබුණු බුද්ධ ශාසන ඇමතිකම උදුරා ගත් උදය ගම්මන්පිල මගේ මිත්‍රයාට මම බොහොම ආදරෙයි. එතුමා කළ කථාවේ කොටසකට මම උත්තර

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

දෙනවා. ඔබතුමා දැන් මෙතැනදී කිව්වා, "විධායක ජනාධිපති ක්‍රමය හොඳයි" කියලා. විධායක ජනාධිපති ක්‍රමය ඇති කළේ අපි. එනම්, එක්සත් ජාතික පක්ෂය. මමත් ඒ පාර්ලිමේන්තුවේ සිටි කෙනෙක්. ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමා කිව්වේ, ගැහැනියෙකු මිනිහෙකු කරන්නත්, මිනිහෙකු ගැහැනියෙකු කරන්නත් විතරයි ඕකෙන් බැරි කියායි. උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමනි, ඔබතුමා පොඩ්ඩක් ඉන්න කෝ. මගේ යාළුවා නේ. බුද්ධ ශාසන ඇමතිවරු එහෙම දුවන්නේ නැහැ. ටිකක් ඉන්න කෝ. ඇයි, පනින්නේ? අනේ! ලජ්ජයි නේ? මම සිවුරක් දෙනවා. ටිකක් ඉන්න කෝ. මගේ මිත්‍රයා. මම ඔබතුමාට ආදරෙයි නේ. මගේ මිත්‍රයා. මම ඔබතුමාට ආදරෙයි. ඔබතුමා පොඩ්ඩක් ඇවිල්ලා වාඩි වෙන්න කෝ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මෙතුමාට ගරු කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2004දී චන්ද්‍රිකා මැතිනිය පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. එදා ගිවිසුමක් ගැහුවා, ප්‍රභාකරන් එක්ක. ඒ ගිවිසුම මොකක්ද? ඒක මම දන්නවා. මහජන නියෝජිතයෙකු විධියට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාටත් එය මතක ඇති. එදා මැතිවරණයට පැය 24කට ඉස්සෙල්ලා ප්‍රභාකරන් උතුරේ දෙමළ ජනතාවට කිව්වා, "රනිල් කපටියා, රනිල් භයානක මිනිහා, ඡන්දය දෙන්න එපා" කියලා. සිංහල ජනතාව දෙමළ ජනතාවට කිව්වා, "රනිල්ට ඡන්දය දෙන්න එපා" කියලා. ඡන්දය දැම්මා කියලා එක් කෙනෙකුගේ ඇඟිල්ලක් කැපුවා. මතක ඇති. ඒ, ප්‍රභාකරන්. ඒ මැතිවරණයේදී ඒ අයට මිලියන 800ක් දුන්නා. අලස්ලාගේ ඒ නඩුව අධිකරණයේ යනවා. ඒ සම්බන්ධයෙන් මම කථා කරන්නේ නැහැ. අන්න එහෙමයි එදා මහින්ද රාජපක්ෂ දිනුවේ. එහෙම නැතිව ඒ මැතිවරණය නිකම්ම දිනුවා නොවෙයි. එහිදී කපටිකමක්, වංචාවක් කළේ.

අපි දැක්කා, පසුගිය දින පනහ තුළදී අපේ රටේ ආර්ථිකය අවුරුදු එක හමාරකින් පසුබසින ලද ආකාරය. ජාත්‍යන්තර සංචාරක සංවිධානවලින් කිව්වා, හිම කාලය වන නොවැම්බර් - දෙසැම්බර් කාලයේ ලෝකයේ යන්න හොඳම රට ලංකාව කියලා. නමුත්, ඒ තත්ත්වය විනාශ වුණා. එම නිසා අපට ලැබෙන්න තිබුණු බිලියන ගණනක ආදායමක් නැති වුණා. ගමේ පොළේ මිනිසුන්ට දේව ශාපයක් වුණා වාගෙයි. කඩේ සල්ලි ටික නැතිව ගියා. මිනිසුන්ගේ සාක්කුවේ සල්ලි නැහැ. පුදුම ශාපයක් වෙලා මිනිසුන් අන්දුන්කුන්දුන් වෙලා බලාගෙන සිටියා. විධායක ජනාධිපති ක්‍රමයට සීමාවන් ඇති කළ යුතුයි කියන එක මම මේ වෙලාවේ පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මීට කලින් කථා කළ අපේ ගරු මන්ත්‍රීතුමා අධිකරණය ගැන කිව්වා. ඔව්, Impeachment එකකින් President Richard Nixonගේ ජනාධිපතිකම ඉවත් කළා. ඒ telephones tap කළා කියලායි.

ඒ, ඇමෙරිකාවේ තිබෙන ක්‍රමය. අද අපේ රටේ ජනාධිපතිවරු යුද අධිකරණයට ගෙනි යන්න බැහැ. ඇත්ත. නමුත් අපේ ගරු මන්ත්‍රීතුමෙක් පෙන්නුවා වාගේ මහින්ද රාජපක්ෂ මැතිතුමා හා වර්තමාන ජනාධිපතිතුමා සම්බන්ධ කාරණයේදී අධිකරණ විනිසුරුවරුන් හත් දෙනෙක්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් කටයුතු කළා. අපි අධිකරණයට ගරු කරනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය නොගෙනාවා නම් මොකද වෙන්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? ශිරානි බණ්ඩාරනායක මැතිනිය එදා අග්‍රවිනිශ්චයකාර තනතුරෙන් ඉවත් කළා. ඒ, ඇයි? දිවි නැගුම පනත අනුමත කළේ නැහැ කියලා. බැසිල් රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කළ පනත ප්‍රතික්ෂේප කළා කියලා අන්තිමට එතුමිය අග්‍රවිනිශ්චයකාර තනතුරෙන් ඉවත් කළා. එදා එතුමිය පාර්ලිමේන්තුවට ගෙනැල්ලා අධිකරණ පද්ධතියට කරපු නිගරුව සම්බන්ධයෙන් මට බොහොම කනගාටු හිතුණා. අපේ අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමාව සභාපති කරලා, ඒකපාක්ෂික කමිටුවක් හැදිලා, එළි වනතුරු ඒ කමිටුව ක්‍රියාත්මක වෙලා එදා එතුමියගේ අග්‍රවිනිශ්චයකාර තනතුර නැති කළා.

දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පින් සිදු වෙන්න තමයි ස්වාධීන කොමිෂන් සභා ඇති වුණේ. ඒ ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීමට පින් සිදු වෙන්න මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ අපේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා පත් කළ විනිශ්චයකාරතුමන්ලා ස්වාධීන විධියට, නීත්‍යනුකූලව, පාර්ලිමේන්තු බලතල තුළ තීන්දු ලබා දුන්නා. පාර්ලිමේන්තුව අතිඋත්තරීතර තැනක් විධියට වාගේම ව්‍යවස්ථාදායකය විධියට අද අපි සහායක් ලබා දෙන්නේ ඇයි? ජනතා විමුක්ති පෙරමුණ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න ඕනෑය කියලා කියනවා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්න නම් අපි ඔක්කොම එක්කහු වෙලා යම් යම් සංශෝධන හදන්න ඕනෑ. ඒ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනෙන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි. යුගයෙන් යුගය විධායක ජනාධිපති ක්‍රමය තුළ මේ රටේ සමහරු පිස්සෝ වාගේ හැසිරුණු ආකාරය අපි දැක්කා. පිස්සෝ විධියට වැඩ කරලා, මේ රට විනාශකාරි තත්ත්වයකට පත් කළා. අයථා ලෙස මුදල් හම්බ කරමින්, මේ රටේ දූෂණ, වංචා වහගෙන කටයුතු කරගෙන ගිය ආකාරයත් අපි දැක්කා. මේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන ඒම තුළින් මේ රටේ දූෂණ, වංචා නවතින්න කියලා මම ප්‍රාර්ථනා කරනවා. මම එහෙම කියන්නේ ඇයි?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉන්දියාව ලංකාව වාගේ 50 ගුණයක් ලොකුයි. ඉන්දියාව 1947 අවුරුද්දේ තමයි නිදහස ලැබුවේ. අපි නිදහස ලැබුවේ 1948 අවුරුද්දේ. දරුණු විධියේ කුලහීන තත්ත්වයක් ඉන්දියාවේ තිබෙනවා. අම්බෙක්කාර් මැතිතුමා Oxford University එකේ ඉගෙන ගත් කෙනෙක්. Oxford University එකෙන් අධ්‍යාපනය ලැබූ එතුමා කුලහීන ප්‍රශ්නයකින් සමාජයේ කොන් වෙලා හිටි ඉන්දියාවේ ප්‍රාන්ත නායකයා. ජවහර්ලාල් නේරු මැතිතුමා ඉන්දියාවේ පළමුවැනි අගමැතිතුමායි. එතුමා කෙළින්ම අම්බෙක්කාර් මැතිතුමාව අධිකරණ ඇමති විධියට පත් කළා. 1947 ඉඳලා අද වනතුරු ඉන්දියාවේ එක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි තිබෙන්නේ. අපි විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් ගෙනෙනවා. මේ කුඩා දූපතේ දේශපාලකයන් විධියට තමන්ගේ මතයට අනුව කටයුතු කරන මේ විහිළුව නවත්වන්න ඕනෑ. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්වත් මේ විහිළුව නැවතිලා, රටක් විධියට හිතලා, මේ පාර්ලිමේන්තුවේ උත්තරීතරකම සදා කල් රැක ගන්න පුළුවන් වෙන්න කියලා මම ප්‍රාර්ථනා කරනවා. මම පැහැදිලිව මේ කාරණය කියලා තිබෙනවා. පාර්ලිමේන්තුවක උත්තරීතරකම තිබෙන්නේ ඇඳුමෙන් නොවන බව මම මේ ගරු සභාවේදී නැවතත් කියනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අහිංසක ජනතාව පත් කරලා එවන මේ අය මහජන නියෝජිතයන්; මහජන සේවකයන්. ඔවුන් පාලකයෝ නොවෙයි. අපි සේවකයෝ. අපේ පක්ෂය -එක්සත් ජාතික පක්ෂය- වෙන්න පුළුවන්; මෛත්‍රීපාල උන්නැහේගේ පක්ෂය වෙන්න පුළුවන්; පොහොට්ටුව වෙන්න පුළුවන්; JVP එක වෙන්න පුළුවන්; TNA එක වෙන්න පුළුවන්. දූෂණ, වංචා කරලා තිබෙනවා නම් මේ ඔක්කොම අධිකරණයට ගෙනෙන්න ඕනෑ. එදා සියයට 62ක් ඡන්දය ලබා දීලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාව ජනාධිපතිවරයා ලෙස පත් කරද්දි අපි ජනතාවට පොරොන්දුවක් ලබා දුන්නා. නියම අධිකරණයෙන් එහා වෙනත් ක්‍රමයක් -දෛනික අධිකරණ ක්‍රමයක්- ගෙනෙන්න අවුරුදු තුන හමාර ඇතුළත අපිට බැරි වුණා. එවකට අධිකරණ ඇමති විධියට හිටියේ විජයදාස රාජපක්ෂ මැතිතුමායි. ඒ කාරණය සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා වුණා. මම ඒ ගැන

කථා කරන්නේ නැහැ. ඒ වෙලාවේ මම තමයි ඒ ප්‍රශ්නය ඇඳලා ගත්තේ. ඊට පස්සේ තලතා අතුකෝරල මැතිතුමිය අධිකරණ ඇමතිනිය විධියට පත් කළා. තලතා අතුකෝරල මැතිතුමිය අධිකරණ ඇමතිනිය විධියට පත් කළාට පස්සේ දැන් දෛනික අධිකරණ ක්‍රමයක් පටන් අරගෙන තිබෙනවා. එහෙම නම් මම එකක් කියනවා. අපිට රජයක් විධියට ඒ සම්බන්ධයෙන් තෘප්තිමත් වෙන්න බැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තුවේදී ගරු කථානායකතුමාට පහර දෙද්දී එතුමා ව්‍යවස්ථාවට අනුව, නීත්‍යනුකූලව, එඩිතරව තීරණ ගත්තා. එදා මිරිස් කුඩුවලින් ගැහුවා. මම මෙතැන දෙවැනි පුටුවේ සිටියේ. ඊට මෙහා පුටුවේ සිටියේ මංගල සමරවීර මන්ත්‍රීතුමා. ගරු කථානායකතුමාට මූලාසනයට එන්න විධියක් නැහැ. එතුමාගේ පුටුවේ වෙන අය වාඩිවෙලා. එතුමාට ගහපු පහරවල් ඔක්කෝම වැදුණේ පොලිස් නිලධාරින්ට. ඒත් එතුමන්ලා ඒ ආරක්ෂක වළල්ල කඩන්නේ නැතුව ගරු කථානායකතුමා ආරක්ෂා කරමින් ක්‍රියා කරපු ආකාරය- [බාධා කිරීමක්]

ඔව්. මෙතුමන්ලා ඔක්කෝම එදා මෙතැන සිටියා. අපේ මිත්‍ර මහින්ද රාජපක්ෂ මැතිතුමා මෙතැන සිටියා; පුතාත් බලාගෙන සිටියා. මම දැක්කා සේවක මහත්වරුන්ට කියලා කෝප්පවලින් වතුර ගෙන්වා ගන්නවා. ඊළඟට, රතු පාට ඩයි වාගේ වතුරකින් පොලිසියේ රාළහාමිලාට ගැහුවා. ඒ රතු පාට වතුර, මම හිතුවේ ඩයි කියලා. මම දෙවැනි පුටුවේ සිටියේ. මට ඉන්න බය හිතුණා. මට තේරුණා, ගහන පහරවල් වැදේවි කියලා. අපේ විජිත හේරත් මන්ත්‍රීතුමයි, අනුර දිසානායක මන්ත්‍රීතුමායි මෙතැන හිටියා. මේක බලාගෙන ඉන්දැද්දි මට පහරක් වැදුණා. මට ගැහුවේ, ඉස්ලාම් භක්තිකයන්ගේ, මුහම්මද්තුමාගේ පොතෙන්; ඉස්ලාම් ජනතාවගේ කුරාන් පොතෙන් මට ගැහුවේ. ඒක මගේ බඩට වැදුණේ. ඒ එක්කම ආවා වතුරක්. ඒ ගැහුවේ මොනවායෙන්ද? මිරිස් කුඩු වතුර. ජරාස් ගාලා වැදුණා. මම දන්නේ නැහැ. ඇස් දෙක අන්ධ වුණා වාගේ, මට වේදනාවක් දැනුණා. දැන් මගේ ඇස්වලට පොඩි ඔපරේෂන් එකකුත් කරන්න වෙලා තිබෙනවා. ඒකත් මට කරන්න වෙලා තිබෙනවා. ඒ ගැහුවේ මිරිස් කුඩු වතුර. ඒ නින්දිත, නීච වැඩේ ගැන දැන් පරීක්ෂණ කෙරෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු කථානායක කරු ජයසූරිය මැතිතුමා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී සිටියා. ඒ නිසා එතුමාට මගේ උපහාරය පුද කරනවා. එදා වෙච්ච ඒ ඔක්කෝම කැමරා ගත වුණ වීඩියෝ තිබෙනවා. දැන් ඒ පරීක්ෂණ කෙරෙනවා. අනාගතයේ පත් වන මන්ත්‍රීවරු හොඳ, පිරිසිදු මන්ත්‍රීවරු විධියට මේ ගරු සභාවේ හැසිරෙන්න සහ හැදෙන්න ඕනෑ. [බාධා කිරීමක්] ඒවා ඔක්කෝම එයි. මා තුළ කා ගැනවත් වෛරයක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි අද මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඉන්නේ පෙන්ෂන් එක ගන්න නොවෙයි. මට පුළුවන් ඕනෑ කෙනෙකුට ඇඟිල්ල දික් කරලා කථා කරන්න. හැබැයි, මේ සභාවේ වෙන කාටවත් එහෙම කරන්න බැහැ. ඇයි ඒ? මම 77 මැතිවරණයෙන් පස්සේ කුරුණෑගල දිසා ඇමති වෙලා, 88 ඉන්දු-ලංකා ගිවිසුමෙන් පස්සේ වයඹ පළාතේ ප්‍රධාන ඇමති වෙච්ච කෙනෙක්. මම වයඹ පළාත් සභාවට ගියේ ඇයි? ඒ වෙලාවේ දකුණේ භීෂණයක් තිබුණා. මම දිසා ඇමති අත්දැකීම් තුළින් පළාත් සභා ක්‍රමය කියන අලුත් සංකල්පය හරහා වයඹ බැබළෙව්වා.

චන්ද්‍රිකා රජය අනුඅටේ පළාත් සභා ඡන්දෙදි කාන්තාවන් නිර්වස්ත්‍ර කළා; ඡන්ද පෙට්ටි පිරෙව්වා. මම පක්ෂය වෙනුවෙන් තමයි එදා ඒ මැතිවරණයට ඉදිරිපත් වුණේ. රනිල් වික්‍රමසිංහ, දිවංගත ගාමිණී අතුකෝරළ ඇතුළු අපේ පක්ෂයේ ඔක්කෝම මගෙන් ඉල්ලුවා, "යූඑන්පීය දිනවන්න වයඹ මැතිවරණයට ඉදිරිපත් වෙන්න" කියලා. ඒ ඡන්දයෙන් පස්සේ මම අවුරුදු දෙකක් ගෙදර හිටියා. ඇයි ගෙදර හිටියේ? ඡන්දදායකයාගේ ඡන්දය උදුර ගත්ත නිසා. එහෙම නම් මේ සභාවේ මට තිබෙනවා අයිතියක්. මට මේ සභාවේ ඕනෑ කෙනෙකුට ඇඟිල්ල දික් කරලා කථා කළ හැකියි. හැබැයි, කාටවත් බැහැ ඇඟිල්ල දික් කරලා මට චෝදනා කරන්න. අපි මේ සභාවේ උත්තරීතරකම තියා ගන්න ඕනෑ.

අපේ පක්ෂයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා දැන් මේ රටේ, මේ රජයේ නායකයා වෙලා ඉන්නවා. දැවැන්ත එක්සත් ජාතික පෙරමුණක් අපි හදනවා.

මහ බැංකුවේ වෙච්ච වංචාවක් ගැන කථා කරනවා. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රාජපක්ෂ යුගයේ -2007 ඉඳලා- නිවාඩ් කබ්රාල් මහ බැංකු අධිපති කාලයේ කළ ග්‍රීක බැඳුම්කරවල ආයෝජනයේ පාඩුව බිලියන 1,000කට වැඩි වෙලා තිබෙනවා. මේ ඔක්කෝම වංචා පිළිබඳ පරීක්ෂා කරන්න විශේෂිත අධිකරණ තව දෙක-තුනක් ඇති කරනවා කියලා පොරොන්දු වුණා. ඒවා කෙරෙන්න ඕනෑ. මම ඒ ස්ථාවරයේ තමයි ඉන්නේ. සරත් අමුණුගම මැතිතුමා ඒ වෙලාවේ අපෙන් අත්සන් ගත්තා. මොකටද? වෙනම-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
විනාඩි දෙකක් නොවෙයි, විනාඩි පහක්. ඔරලෝසුව වේගයෙන් යන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
නැහැ, නැහැ.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
එදා සරත් අමුණුගම මැතිතුමා අපෙන් අත්සන් ගත්තා නඩු අහන්න විශේෂිත අධිකරණ හදන්න.

නීතිපතිතුමා කිව්වා, දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව එහෙම බැහැ කියලා. අධිකරණය තුළම දෛනිකව නඩු අහලා අවසන් කරන්න පුළුවන් කිව්වා. නමුත් අවුරුදු තුනහමාරක් යන කල් ඒක කරන්න බැරි වුණා. අන්න එතැනදීයි මම ඒ ගැන ඇහුවේ. මා එහෙම කළේ විජයදාස රාජපක්ෂ මැතිතුමා එක්ක තිබුණු තරහකට නොවෙයි. මම ඇහුවා, "මොකක්ද මේකට හේතුව? ඇයි මේ නඩු අහන්නේ නැත්තේ?" කියලා. විජයදාස රාජපක්ෂ මැතිතුමා කෙළින්ම කිව්වා, "ජනාධිපතිතුමනි, නීතිපති දෙපාර්තමේන්තුවේ-AG's Department - සිවිල් නඩු 18,000ක් ගොඩ ගැහිලා තිබෙනවා. ඒවා අහන්නේ නැතිව මේ නඩු අහන්න කියලාද කියන්නේ?" කියලා. ඒ වෙලාවේ ජනාධිපතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයේ ඔක්කෝම නිශ්ශබ්දව සිටියා. ඊළඟ සතියේ මම කැබිනට් මණ්ඩලයේදී ඒ ගැන ආයෙත් ඇහුවා. එදා කැබිනට් මණ්ඩලයේ රැස්වීමේ න්‍යාය පත්‍රයේ වැඩ ඉවර වෙලා නැඟිටින්න හදන විට, "ජනාධිපතිතුමනි, පොඩ්ඩක් වාඩි වෙන්න." කියලා මම කාරණාව කිව්වා. මට කියන්න තිබෙන දේ මම හැම දාම කෙළින් කියනවා. මට වහන්න දෙයක් නැහැ. නැමෙන්න වුවමනාවකුත් නැහැ. මම එතුමාට කිව්වා, "එදා මගේ මිත්‍ර විජයදාස රාජපක්ෂ මැතිතුමා කිව්වා, සිවිල් නඩු 18,500ක් ද කොහේදෝ නීතිපති දෙපාර්තමේන්තුවේ ගොඩ ගැසී තිබෙනවා

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා]

කියලා. එහෙම තියෙද්දී වංචා, දූෂණ, අල්ලස්වලට අදාළ අනෙක් නඩු අහන්නේ කොහොමද කියලා එතුමා ඇහුවා." කියලා. මම කිව්වා, "ඔබතුමාට ඡන්දදායකයන්ගෙන් සියයට 62ක් ඡන්දය දුන්නා" කියලා. එතුමාටත් මේකෙන් නිදහස් වෙන්න බැහැ. "ඇයි, සියයට 62ක් ඡන්දය දුන්නේ? අපට එසේ ඡන්දය දුන්නේ, වංචා, දූෂණ ආදි ඔක්කෝම නැති කරන්නයි. එවැනි අධිකරණ ඇති කරන්න බැරි නම් මම කැබිනට් මණ්ඩලයෙන් අද අස් වෙනවා." කියලා මම කිව්වා. මා එදා කියපු වචනයමයි මේ කියන්නේ. මම කිව්වා, "ඒ ගැන තීරණයක් ගන්න ඕනෑ. මා මෙය කියන්නේ විජයදාස රාජපක්ෂ මැතිතුමා එක්ක තරහකට නොවෙයි." කියලා. ජනාධිපතිතුමා ටික වේලාවක් බිම බලාගෙන සිටියා. කැබිනට් මණ්ඩලයේ ඔක්කෝම එතැන සිටියා. "හරි, මට තේරෙනවා" කියලා එතුමා නැඟිට්ටා. සතියකින්, මාව බුද්ධ ශාසන ඇමති කළා, තලතා අතුකෝරල ඇමතිතුමිය අධිකරණ ඇමතිතුමිය කළා. එහෙම කරලා තමයි ඒ විශේෂ අධිකරණ හැදුවේ. එහෙම නම්, අපේ යුතුකම අපි දැන් ඉටු කරන්න ඕනෑ. රට විකුණපු, රට කාපු හැම කෙනෙකුම නීතිය ඉදිරියට ගෙනෙන්න නම් ඒ අධිකරණ මඟින් අපි අද-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවත් විනාඩියකින් මම කතාව අවසන් කරනවා. මේ ක්‍රමය ගෙනෙන්න නම් අප මොකක්ද කරන්න ඕනෑ? විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ- [බාධා කිරීමක්] අප හැම දාම ලංකාවේ දේශපාලනයේ ජෝකර්ලා වෙන්න හොඳ නැහැ. මම ඉල්ලීමක් කරනවා. එක එක පාලකයන් එන එන වතාවට තීරණ වෙනස් කරන එක නවත්වන්න ඕනෑ. අපි එක ස්ථාවරයකට එන්න ඕනෑ. අපි නීතියට ගරු කරන්න ඕනෑ. පාර්ලිමේන්තුව නීතියට ගරු කරන්න ඕනෑ. අධිකරණයත් එය පෙන්නුවා. කථානායකතුමාත් එය පෙන්නුවා. මෙය පිරිසිදු වෙන්න ඕනෑ; ශුද්ධ භූමියක් වෙන්න ඕනෑ. මා මේ කියන දේ ලියා තියාගන්න. ස්වභාව ධර්මය එක එක දඬුවම් කරගෙනයි මේ එන්නේ. එහෙම වෙලා මාර්තු වන කොට අපි අලුත් යුගයකට එනවා. මේ අවස්ථාව ඉතා වැදගත්. අප ඔක්කෝම පෙළ ගැහෙන්නේ ස්වභාව ධර්මයෙන් ඇති කළ ක්‍රමය තුළයි. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ සිදු වන්නේ කුමක්ද? රටක ඒකීයභාවය ඇති වෙන්න ඕනෑ. මේ රටේ එක්සත්භාවය, ඒකීයභාවය තිබෙන්න ඕනෑ; බුද්ධාගමට මුල් තැන දෙන්න ඕනෑ. අපි ඒක ප්‍රකාශ කරනවා. මා ගන්නේ තවත් විනාඩියයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Please wind up.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මා මේ කාරණයත් කියා කතාව නවත්වනවා. 1958 දී සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කරද්දී මම නාලන්දා විද්‍යාලයේ ඉගෙනුම ලබන පොඩි කොල්ලෙක්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
එදා එක පාරටම සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කරපු හැටියේ උතුරේ අයට සිංහල කතා කරන්න දුන්නේත් නැහැ; දකුණේ අයට දෙමළ ඉගැන්නුවේත් නැහැ. ඉංග්‍රීසි භාෂාව අපෙන් ඈත් කළා. අද ඒ දුක අපි විඳිනවා. ඒ නිසා තමයි ත්‍රස්තවාදය පවා ඇති වුණේ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, බොහොම ස්තුතියි.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
අපේ Central Collegesවලින් ආ රජයේ සේවකයෝ ඉන්නවා, ඉංග්‍රීසි කතා කරන්න බැරි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
සභාවේ කටයුතු අවසන් කරන්නත් ඕනෑ, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා**
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
හොඳමයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි රටේ ඒකීයභාවයත් ආරක්ෂා කරගෙන කටයුතු කරන්න ඕනෑ. මම එදා ප්‍රධාන ඇමති විධියට ගියේ පළාත් සභාවේ බලතල ශක්තිමත් කරන්නයි. ඒකත් කළ යුතුයි. බොහොම ස්තුතියි.

[අ.භා.4.23]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බොහොම ස්තුතියි. ඉතාම කෙටි කාලයක් මට තිබෙන්නේ. විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සම්බන්ධයෙන් අද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගෙන එනවා. අපි විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණට මතක් කරන්න කැමැතියි, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කිසිසේත්ම අපේ රටේ යහපත සඳහා සිදු වන සංශෝධනයක් නොවන බව. මේ සිදු වන්නේ මොකක්ද? මෙයින් බලාපොරොත්තු වන්නේ, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට කවදාවත් මේ රටේ මැතිවරණයකින් ජයග්‍රහණය කරන්න බැරි හින්දා ජනතා විමුක්ති පෙරමුණ ලවා විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරවලා කෙටි මාර්ගයෙන් එතුමාට ජනාධිපතිවරයා වෙන්න පුළුවන්ද කියන කාරණාවයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අනෙක් අතට, මේ කාරණාව කොතරම් අසාධාරණද කියා බලන්න. ආණ්ඩු පක්ෂයත්, එදා පැවැති ආණ්ඩු පක්ෂයේම විපක්ෂය වූ ජනතා විමුක්ති පෙරමුණත් මේ යෝජනා කරන්නේ මොකක්ද? ඒ තමයි, මන්ත්‍රීවරුන් 113 දෙනකුගේ එකඟතාව අනුව රටේ ජනාධිපතිවරයෙකු පත් කරන්න කියන එක. දැන් මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් කීදෙනකු දැන් එහාට මෙහාට පනිනවාද? අදත් උදේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කණ්ඩායම් රැස්වීමට සම්බන්ධ වූ මන්ත්‍රීවරු කීපදෙනෙක් පාර්ලිමේන්තුව රැස් වුණාම ගිහින් එහා පැත්තේ වාඩි වුණා. [බාධා කිරීමක්] අහගන්න කෝ ඇමතිතුමා.

එහා පැත්තේ අය ඇවිත් මේ පැත්තේ වාඩි වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙහි මූලික කාරණාව වෙලා තිබෙන්නේ මේකයි. මේ පාර්ලිමේන්තුව කරන්න යන්නේ මන්ත්‍රීවරුන් 113දෙනකුගේ කැමැත්ත මත මේ රටේ ජනාධිපතිවරයා පත් කිරීම නම්, මේ රටට කරන්න පුළුවන් ලොකුම විනාශය තමයි ඒ කරන්න යන්නේ. "යූඑන්පී" එක හීන දැක්කි, "ජේවීපී" එක හරහා රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ රටේ ජනාධිපති වනවා දකින්න. හැබැයි අපි ආණ්ඩුවට මතක් කරන්න කැමැතියි, මේ රටේ ජනතාව ඉල්ලන්නේ ඡන්දයක් කියන එක. ඔබතුමන්ලා ඡන්දයකට බයයි. මන්ත්‍රීවරුන් 122ක් අධිකරණයට ගියේ මේ රටේ ලක්ෂ 150ක් වූ ඡන්දදායකයන්ගේ අයිතිය සුරක්ෂිත කරන්නද කියා අපි ආණ්ඩුවෙන් අහනවා. මේ සිටින කණ්ඩායම -ආණ්ඩුව නියෝජනය කරන අයත්, දෙමළ ජාතික සන්ධානයත්, ජනතා විමුක්ති පෙරමුණත් කියන මේ සියලු දෙනා- මැතිවරණවලට බයයි. අපි කියන්නේ, තමන් බය නැත්නම් ඡන්දයකට යන්න සූදානම් වෙන්න කියලායි. අපි අද බලාපොරොත්තු වන්නේ එයයි. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ කණ්ඩායම කිව්වේත්, එතුමා නැවත වාරයක් අගමැති වූ වහාම ඡන්දයකට යන්න සූදානම් කියලායි. එතුමා බලහත්කාරයෙන් දවස් 50ක් අරලියගහ මන්දිරයේ රැඳී සිටියා. අපි අද පාර්ලිමේන්තුවට එද්දී බලාපොරොත්තු වුණේ, මේ පාර්ලිමේන්තුව විසුරුවා හැර පාර්ලිමේන්තු මැතිවරණයක් තියන්න ජනාධිපතිතුමා වෙත කරන යෝජනාව තුනෙන් දෙකේ අනුමැතිය ගැනීම සඳහා අද ආණ්ඩුව හරහා ගෙන ඒවි කියායි. මොන පිස්සුද! මේ මොනවා ගැනද මෙතුමන්ලා කතා කරන්නේ. මෙතුමන්ලා කතා කරන්නේ, 2025 වන කල් මේ රටේ ඡන්ද පවත්වන්නේ නැතිව පාලනයක් කරගෙන යන්නයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි ඔබතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ අගමැති ධුරය අහිමි වුණාම, ජනාධිපතිතුමා විසින් මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ අගමැතිවරයා බවට පත් කරනු ලැබුවාම, මේ ගැලරියට පැමිණ මාධ්‍ය ආයතන නියෝජනය කරමින් මාධ්‍ය ආවරණය ලබා දෙන්න සියලු කණ්ඩායම්වලට අවසරය දෙන්න කථානායකතුමා ක්‍රියා මාර්ග ගන්නවා අපි දැක්කා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ අගමැති ධුරය අහිමි වෙලා මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැති වුණාම මාධ්‍ය ආවරණ කටයුතු සඳහා මාධ්‍ය ආයතනවලට අවසර දුන්නා වාගේම, මේ පාර්ලිමේන්තුව රැස් වන හැම දාකටම ඒ අවසරය දෙන්න කියලා ඉල්ලනවා. දවස් හයකට හතකට පමණක් එය සීමා කරන්නේ ඇයි? අවශ්‍ය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය නම්; මේ පාර්ලිමේන්තුවේ සිදු වන සියලු ක්‍රියාකාරකම් රටට පෙන්වන්න අවශ්‍ය නම්, රනිල් වික්‍රමසිංහ මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කරපු අවධියේ දී වාගේම කරුණාකර දැනුත් මාධ්‍ය ආවරණය සඳහා සියලු මාධ්‍ය ආයතනවලට අවසර දෙන්න වහාම කටයුතු කරන්න කියලා අපි ඉතාම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ගරු කථානායකතුමා එම කටයුත්ත කළේ ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් නම්, එම සියලු මාධ්‍ය ආයතනවලට යළිත් එම අවසරය ලබා දෙන්න එතුමා කටයුතු කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණත්, එක්සත් ජාතික පක්ෂයත් පසු ගිය දවස් 50ක ආණ්ඩුව ගැන කතා කරනවා අපි දැක්කා. හැබැයි, අපි මේ කාරණයත් මතක් කරන්න කැමැතියි. දවස් 50ක ආණ්ඩුවක් ගැන කතා කරන ඒ අය දවස් 1,460ක් මේ රට පාලනය කර තිබෙනවා. දවස් 50ක් තුළ මහින්ද රාජපක්ෂ අගමැතිවරයා දැකපු, ජනතාව මත තිබූ දැඩි පීඩනයට සහන දෙන්න ඒ අයට බැරි වුණේ ඇයි කියලා අපි අහනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා වහාම තෙල් මිල අඩු කළා; බදු අඩු කළා; අත්‍යවශ්‍ය බඩුවල මිල ගණන් අඩු කළා. ඒ වාගේම පොහොර සහනාධාරය දෙන්න කටයුතු කළා. පොහොර මිටිය රුපියල් 500ට දෙන්න නැවත කටයුතු කළා. ඒ නිසා ගතවූ දවස් 50 තුළ, පුරන් වූ හැම කුඹුරක්ම අස් වද්දා තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. හැම කුඹුරක්ම අස්වද්දා තිබෙනවා. ඒ, මේ රටේ ගොවි ජනතාවගේ ඉල්ලීම, ගොවි ජනතාවගේ අවශ්‍යතා එතුමා ඉටු කළ නිසායි. ඒවා ගැන කතා කරන්නේ නැහැ.

විපක්ෂ නායක ධුරය අහිමි වීම, විපක්ෂයේ සංවිධායක ධුරය අහිමි වීම සම්බන්ධයෙන් ආණ්ඩුවේ පාර්ශ්වයන්ට කලකිරීමක් ඇති; හිත් වේදනාවක් ඇති. හැබැයි අද රටේ ප්‍රශ්නය ඒක නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුවට මේ විධියට යන්න බැහැ. මේ පාර්ලිමේන්තුව පවත්වන හැම දවසකම රටේ ජනතාවට අපා කරන්නේ අසාධාරණයක්. වියදම් කරන හැම සතයක් තුළින්ම සිදු වන්නේ ජනතාවට අසාධාරණයක්. ඒ නිසා අපි ජනතා විමුක්ති පෙරමුණෙන් ඉල්ලීමක් කරනවා. අවසාන වශයෙන් රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති කරන්න අවශ්‍ය කර්තව්‍යය ඔබතුමන්ලා කළා. ඒ නිසා ඔබතුමන්ලාට අවශ්‍ය වූ දේ දැන් ඉටු වෙලා තිබෙනවා. අපි දැන් විපක්ෂයක් හැටියට වැඩ කරමු. අපි දෙමළ ජාතික සන්ධානයටත් එය කියනවා. ඔවුන් රනිල් වික්‍රමසිංහ අගමැති කිරීමේ සටන ජය ගත්තා. දැන් අපි සියලුදෙනා විපක්ෂයක් හැටියට එකතු වෙලා කටයුතු කරමු.

අපේ මූලික පරමාර්ථය විය යුත්තේ, මේ අස්ථාවර පාර්ලිමේන්තුව විසුරුවා හැරලා නැවත අලුත් පාලන තන්ත්‍රයක් ඇති කිරීම සඳහා මේ රටේ ජනතාවට අයිතිය ලබා දීමයි. ජනතාවගේ අයිතිය බලහත්කාරයෙන් උදුරාගෙන පාර්ලිමේන්තුවක් පවත්වාගෙන යෑමේ අරමුණ මොකක්ද? ජනතාව නොවෙයිද ඒකෙන් තැලෙන්නේ? ජනතාවගේ ප්‍රශ්න නොවෙයිද, පාර්ලිමේන්තුව තුළින් විසඳන්න බලාපොරොත්තු වෙන්නේ? එම නිසා අපි නැවත වතාවක් මේ කාරණය ආණ්ඩු පක්ෂයට මතක් කරනවා. රටට ආදරෙයි නම්, ඡන්දවලට භය නැත්නම්, ගෝල්ෆේස් පිටියට සෙනඟ ගෙනාවා කියලා හිතෙනවා නම්, හැකි ඉක්මනින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ යෝජනාව ගෙන එන්න. හෙට පාර්ලිමේන්තුව රැස් වෙනවා, සිකුරාදා දිනයේත් පාර්ලිමේන්තුව රැස්වෙනවා කියලා අපට ආරංචියි. එක්සත් ජනතා නිදහස් සන්ධානය හැටියට අපි ඕනෑම මොහොතක ඒ සඳහා සහයෝගය දක්වලා තුනෙන් දෙකක අනුමැතිය ගන්න අවශ්‍ය කටයුතු කරනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තූතියි. මෙම විවාදය හෙට දිනට කල් තබනවා.

***එකල්හි වේලාව අ.භා. 4.30 වුයෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2018 දෙසැම්බර් මස 19 වන බදාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப.4.30 மணியாகிவிடவே மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், 2018 டிசம்பர் 19, புதன்கிழமை பி.ப 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*It being 4.30 p.m.,* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly until 1.00 p.m. on Wednesday, 19th December, 2018.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

265 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 265 - இல. 2
Volume 265 - No. 2

2018 දෙසැම්බර් 19වන බදාදා
2018 டிசம்பர் 19, புதன்கிழமை
Wednesday, 19th December, 2018

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතාගේ ප්‍රකාශය**

**කල් තැබීමේ යෝජනාව:**
විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම

---

# பிரதான உள்ளடக்கம்

**மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் அவர்களின் கூற்று**

**ஒத்திவைப்புப் பிரேரணை:**
நிறைவேற்று ஜனாதிபதி பதவியை இல்லாதொழித்தல்

---

# PRINCIPAL CONTENTS

STATEMENT BY HON. RAJAVAROTHIAM SAMPANTHAN

ADJOURNMENT MOTION:
Abolition of the Executive Presidency

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2018 දෙසැම්බර් 19වන බදාදා***
*2018 டிசம்பர் 19, புதன்கிழமை*
*Wednesday, 19th December, 2018*

**අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] in the Chair.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු රාජවරෝදියම් සම්පන්දන් මැතිතුමාගේ ප්‍රකාශය.

## ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතාගේ ප්‍රකාශය
## மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் அவர்களின் கூற்று
## STATEMENT BY HON. RAJAVAROTHIAM SAMPANTHAN

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

Hon. Deputy Speaker, I seek your indulgence to make a Statement pertaining to the post of the Leader of the Opposition in the current Parliament.

The Speaker recognized me as the Leader of the Opposition being the Leader of the Illankai Tamil Arasu Kachchi, the second largest party in Opposition in the Sri Lankan Parliament in September, 2015 when Parliament was convened after the General Elections in 2015.

After questions were raised in Parliament by some other Opposition Members, the Speaker once again recognized me as the Leader of the Opposition, being the Leader of the Illankai Tamil Arasu Kachchi, the second largest party in Parliament in August, 2018. In the course of the Order the Hon. Speaker made, he stated that that was the final decision.

Yesterday, on the 18th of December, 2018, the Hon. Speaker made an Announcement in Parliament that he recognized the Hon. Mahinda Rajapaksa as the Leader of the Opposition consequent to a request made by the United Peoples' Freedom Alliance that he be appointed as the Leader of the Opposition. The Hon. Speaker made the said Announcement without removing me from the post of the Leader of the Opposition to which position he himself had appointed me twice over and consequently it would seem that there are two persons now holding the position of the Leader of the Opposition in the current Parliament. The question arises as to whether the Hon. Speaker lacked the conviction to remove me from the post of the Leader of the Opposition.

That the United Peoples Freedom Alliance had many more seats in Parliament than the ITAK has never been questioned. I was recognized as the Leader of the Opposition consequent to your accepting me as the Parliamentary Group Leader of the ITAK, the second largest party in Parliament. This was for the reason that a section of the UPFA, including His Excellency President Maithripala Sirisena, the Leader of the United People's Freedom Alliance and the Sri Lanka Freedom Party were part and parcel of the Government. President Maithripala Sirisena is the Head of State, Head of the Executive and of the Government, a Member of the Cabinet of Ministers holding several portfolios and Head of the Cabinet of Ministers. Several other Members of Parliament elected to Parliament on the ticket of the UPFA held positions in Cabinet. All of them were collectively answerable to Parliament.

In this situation, it would have been incongruous for a member of the UPFA to be the Leader of the Opposition. It is in this context that in keeping with Parliamentary practice and convention, as recognized the world over, the second largest party in Opposition in Parliament has been able to have its parliamentary leader recognized as the Leader of the Opposition and it was for this very reason that the Hon. Speaker recognized me twice over as the Leader of the Opposition.

From the 26th of October, 2018, certain events have occurred in this country pertaining to the Prime Minister, the Cabinet of Ministers, the Government and Parliament. Some finality had been arrived at in regard to these issues in keeping with our Constitution, the rule of law and democratic values through judgments delivered by our judiciary at the highest level. It is in this background that the Hon. Speaker has made the Ruling referred to above pertaining to the office of the Leader of the Opposition.

In keeping with the judicial verdict, a Prime Minister was sworn in on Sunday 16th of December, but the Cabinet of Ministers has not yet been constituted and a Government has not yet been formed. Three Members of Parliament elected on the ticket of the UPFA crossed the Floor and occupied seats on the benches of the Government on the 18th of December. In these circumstances, when a Government has not yet been fully constituted, I submit that there was no need for another person to be recognized as the Leader of the Opposition in haste. Doing so without removing the functioning Leader of the Opposition has further complicated the issue.

It is further alleged that the Member of Parliament whom the Speaker has recognized as the Leader of the Opposition has ceased to be a member of the recognized

[ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා]

political party, UPFA or SLFP, on whose nomination paper his name appeared at the time of becoming such Member of Parliament and that his seat had consequently become vacant since one month has expired from the date of his ceasing to be a member of such recognized political party. You would observe, Sir, that the person recognized by the Speaker as the Leader of the Opposition does not even hold the position of a Member of Parliament as at the date of such recognition. This would again suggest that the Speaker's decision has been taken in haste and that his decision is in violation of our Constitution.

The events that I had outlined earlier tend to raise the question as to whether Sri Lanka is moving towards becoming a failed State which does not recognize the supremacy of its Constitution, the primary law. Sri Lankan citizens who wish to live in an undivided, indivisible Sri Lanka in unity and harmony view this as an act of majoritarianism, which has been the primary cause of the pathetic state to which the country had been brought today. This emphasizes the urgent and utmost importance of framing a new Constitution that would enable all people inclusive of the Tamil and Tamil-speaking people to live with self-respect and dignity.

I urge that early corrective action in the interest of the country as a whole be taken to preserve the sanctity of our Constitution, the primary law, and that such a step is urgently needed.

Thank you, Hon. Deputy Speaker.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I will bring your Statement to the attention of the Hon. Speaker.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Sumanthiran?

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
Thank you, Hon. Deputy Speaker.

This is on the same issue. Sir, I want to **table*** in the House three newspaper reports connected to this matter dated 12th November, 2018 which appeared in "The Island", "Ceylon Today" and "Divaina", all of which have the report and pictures of the Hon. Mahinda Rajapaksa taking membership of the Sri Lanka Podujana Peramuna on the 11th of November, 2018, two days after the purported dissolution of Parliament.

Obviously until the President purportedly dissolved Parliament, this was not done because they knew they would lose their Parliamentary seats. So, after the purported dissolution, the very next day, they ceased to be Members of the SLFP and consequently, the UPFA and had taken membership in SLPP. I am tabling those newspaper reports. We will be moving for the appointment of a Select Committee to inquire and report on this to Parliament.

Thank you.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා අද දින කරන ලද ප්‍රකාශයේ එක් තැනක සඳහන් වූ කරුණක් සම්බන්ධයෙන් සහ එයට සම්බන්ධ වෙමින් ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා විසින් මෙම ගරු සභාවේ මොහොතකට පෙර පුවත් පත් වාර්තා තුනක් ඉදිරිපත් කරමින් කරන ලද ප්‍රකාශය පිළිබඳව මට කෙටි කරුණු පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. මේ කාරණය විශේෂයෙන් මම සඳහන් කරන්න ඕනෑ. ඊයේ දිනයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99. (13) (අ) ව්‍යවස්ථාව උපුටා දක්වමින් යම්කිසි මන්ත්‍රීවරයෙකු ධුරයෙන් ඉවත් වීම සම්බන්ධව සඳහන් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ, මන්ත්‍රීවරයෙකුගේ ධුරය අහිමි වීම සම්බන්ධව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අවස්ථා තුනක සඳහන් වෙන බව. එකක් තමයි, 66. ව්‍යවස්ථාව යටතේ තිබෙන නුසුදුසුකම් අනුව මන්ත්‍රීවරයෙකුගේ ධුරය අහෝසි වෙන්න පුළුවන්.

ඊළඟට, 91.(ඉ) ව්‍යවස්ථාවේ මේ ගැන සඳහන්ව තිබෙනවා. දැනට අභියාචනාධිකරණයේ පෙත්සමක් ගොනුවෙලා තිබෙනවා, "ක්වෝ වොරන්ටෝ" ආඥාවක් ලබා ගැනීමක් සම්බන්ධයෙන්. මම ඒක මෙතැන සඳහන් කරන්නේ නැහැ; අවශ්‍ය වෙලාවට සඳහන් කරන්නම්. හැබැයි, ඉතිහාසයේ එක අවස්ථාවකදී ලබා දුන් නඩු තීන්දුවක පිටපතක් මා ළඟ තිබෙනවා. රාජිත සේනාරත්න එදිරිව ඩිලාන් පෙරේරා නඩු තීන්දුවේදී අභියාචනාධිකරණය විසින් 91.(ඉ) ව්‍යවස්ථාව යටතේ මන්ත්‍රීවරයකුගේ පාර්ලිමේන්තු ධුරය අහෝසි කළා. ඒ ඇරුණාම ඊයේ සඳහන් කළ ආකාරයට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99. (13) (අ) හි මෙසේ සඳහන් වෙනවා:

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

"යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, ඔහු එසේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ අවස්ථාවේ දී ඔහුගේ නම ඇතුළත් වූයේ යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක (මෙහි මින් මතු "අදාළ නාමයෝජනා පත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) නාමයෝජනා පත්‍රයේ ද ඒ දේශපාලන පක්ෂයේ හෝ කණ්ඩායමේ හෝ සාමාජිකයකුව සිටීම, ඉල්ලා අස්වීමෙන් හෝ පහ කිරීමෙන් හෝ අන් හේතුවක් නිසා හෝ නතර වූ අවස්ථාවක, ඔහු එසේ සාමාජිකයකුව සිටීම නතර වූ දින සිට එක් මාසයක කාල සීමාවක් ඉකුත් වූ විට ඔහුගේ අසුන හිස් වන්නේ ය: එසේ වුව ද,"

ඉංග්‍රීසියෙන් නම් "provided". මේක 70.(1) ව්‍යවස්ථාවේ තිබුණු proviso එක වාගේ. පළමුවැනි කාරණය තමයි, විපක්ෂ නායකතුමා විධියට දැනට නම් කර තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ පාර්ලිමේන්තුවට පත් වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය කියන දේශපාලන සන්ධානයෙන් හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉල්ලා අස්වීමක් සිදු වෙලා නැහැ හෝ පහ කිරීමක් කරලා නැහැ. පහ කිරීමක් කළ බවට ගරු කථානායකතුමාට හෝ මහ ලේකම්තුමාට -Secretary-Generalට- එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ලේකම්වරයා විසින් ලිඛිතව දැනුම්දීමක් කරලා නැහැ.

මේකේ තිබෙනවා, "අන් හේතුව" කියලා. "අන් හේතුව" කියලා කියන්නේ, මේ ව්‍යවස්ථාවේ 81 වගන්තිය යටතේ යම් කිසි මන්ත්‍රීවරයෙකු සම්බන්ධයෙන් තේරීම් කාරක සභාවක් පත් කරලා ප්‍රජා අශක්නුතාවට පත් කිරීමයි. එතැනදී පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක යෝජනා සම්මතයක් අනුව අවුරුදු හතකට තහනම් කරන්න පුළුවන් හෝ පාර්ලිමේන්තුවෙන් ඉවත් කරන්න පුළුවන්. මේ කියන අවස්ථා තුන හැර මන්ත්‍රීවරයෙකුගේ ධුරය පාර්ලිමේන්තුවෙන් අහෝසි වෙන්නේ නැහැ. මන්ත්‍රීවරයාව පත් කරලා තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවෙන් නොවෙයි; ඒ එක් එක් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ඡන්දයෙන්, එදා නියෝජනය කරපු දේශපාලන පක්ෂය නියෝජනය කරමින්. ඒ ජනතාව ඡන්දය දුන්නේ, මනාප ප්‍රකාශ කිරීමට මත්තෙන් දේශපාලන පක්ෂයටයි. ඒ දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් දැන්වීමකින් තොරව මන්ත්‍රීවරයාගේ ධුරය අහෝසි වෙන්නේ නැහැ. මේ ව්‍යවස්ථාව යටතේ "එසේ වුව ද," කියා සඳහන් වුවත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පක්ෂයෙන් පහ කරනු ලැබූ අවස්ථාවක ඒ මන්ත්‍රීවරයාට පුළුවන්, මාසයක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයට යන්න. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විභාග කරලා ඒකේ තීන්දුවක් දෙන්න පුළුවන්. ඒ අනුව තමයි ව්‍යවස්ථාවේ 66 වගන්තිය යටතේ ඉදිරි ක්‍රියාමාර්ග ගන්න පුළුවන් වන්නේ.

ඊළඟ කාරණය මතු වුණා, තේරීම් කාරක සභාවක් පත් කිරීම ගැන. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම පැහැදිලිවම මම මේ කාරණය කියනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ "අන්තර්කාලීන විධිවිධාන" කියන පරිච්ඡේදය -"Interim Provisions"- යටතේ, ඉතා පැහැදිලිව මෙය සඳහන් වෙලා තිබෙනවා. ව්‍යවස්ථාවේ 161 (ඇ)(ii) යටතේ, 1982 ජනවාරි 22වැනි දා එදා පාර්ලිමේන්තුවේ හිටපු කථානායකතුමා විසින් එදා පාර්ලිමේන්තුවේ හිටපු ගරු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මන්ත්‍රීවරුන් පහකට නොවැඩි සංඛ්‍යාවකින් යුක්ත විශේෂ තේරීම් කාරක සභාවක් පත් කළා. මොකද එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මන්ත්‍රීවරුන් පිරිසක් ඉවත් කළා යැයි පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට දැනුම් දීලා තිබුණා. ඒ, මෛත්‍රීපාල සේනානායක මැතිතුමා, අනුර බණ්ඩාරනායක මැතිතුමා, හලීම් ඉෂාක් මන්ත්‍රීතුමා සහ ආර්.පී. විජේසිරි මැතිතුමායි.

එම හතරදෙනාගේ ඉවත්වීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 161. (ඇ) (ii) ව්‍යවස්ථාව යටතේ කථානායකතුමා විසින් විශේෂ කාරක සභාවක් පත් කළා. හැබැයි, එම කාරක සභාව පත් කරන්න පුළුවන් වුණේ, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිසා එවකට පැවැති ජාතික රාජ්‍ය සභාව පාර්ලිමේන්තුව බවට පරිවර්තනය වුණු නිසයි. එම නිසා තමයි අන්තර්කාලීන විධිවිධානයක් හැටියට මෙය තිබෙන්නේ. දැන් සිටින කථානායකතුමාට වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඒ බලය නැහැ. ඒ වාගේම අවසාන වශයෙන් කෙටුම්පත් කර තිබෙන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග, දැන් ක්‍රියාත්මක වන පාර්ලිමේන්තු ස්ථාවර නියෝග අනුවත් ඉතා පැහැදිලි කියනවා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 74 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව, පාර්ලිමේන්තුව විසින් ස්ථාවර නියෝග සාදා ඇති බව.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
Sir, I rise to a point of Order.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
කරුණාකර මගේ submission එක ඉවර කරන්න ඉඩ දෙන්න. ඔබතුමන්ලාට ඕනෑම විධියකට කරුණු දක්වන්න පුළුවන්. මගේ අවස්ථාව මට දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කරුණු දක්වන්න. ඊට පස්සේ ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සහ පාර්ලිමේන්තු ස්ථාවර නියෝග යටතේයි මම කරුණු පෙන්නුවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කණ්ඩායම් තීන්දුව අනුව විපක්ෂ නායක ධුරය සඳහා ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නම ඊයේ දිනයේදී එම සන්ධානයේ මහ ලේකම්වරයා විසින් ගරු කථානායකතුමා වෙත ඉදිරිපත් කරනු ලැබුවා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහ ලේකම්වරයා විසින් අත්සන් කළ එම ලිපියෙන්ම පැහැදිලි වෙනවා, මහින්ද රාජපක්ෂ මැතිතුමා අදටත් එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් බව. එම නිසා ගරු කථානායකතුමා පාර්ලිමේන්තු සම්ප්‍රදාය අනුව ඉතා නිවැරදිව එතුමාගේ තීන්දුව ප්‍රකාශයට පත් කළා. පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයෙක් ගැන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොතැනකවත් කියැවෙන්නේ නැහැ; පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල කොතැනකවත් කියැවෙන්නේත් නැහැ. එහෙම නම් විපක්ෂ නායකවරයා තේරීම සම්බන්ධයෙන් අධිකරණයට යෑමේ හැකියාවකුත් නැහැ. ඒ වාගේම පාර්ලිමේන්තු ස්ථාවර නියෝග යටතේත් එම හැකියාව නැහැ.

ඒ නිසා මගේ කරුණු දැක්වීම - submission එක - මේකයි. ඊයේ ඉදිරිපත් කරපු කරුණු සහ අද ඉදිරිපත් කරපු කරුණු ව්‍යවස්ථාවට එකඟත් නැහැ; ස්ථාවර නියෝගවලට එකඟත් නැහැ. කථානායකතුමා ප්‍රකාශයට පත් කර ඉවරයි, විපක්ෂ නායකවරයා මහින්ද රාජපක්ෂ මැතිතුමා බව. එක්සත් ජනතා නිදහස් සන්ධානය නියෝජනය කරන කිසිදු මන්ත්‍රීවරයකුගේ ධුරය පිළිබඳ ප්‍රශ්නයක් මතු වන්නේත් නැහැ. මොකද, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සාමාජිකත්වය ගත් බවට කිසිදු සාක්ෂියක් නැහැ, පුවත් පත් වාර්තාවක් හැර. ඒ වාගේම එසේ කරන -[බාධා කිරීමක්]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
Sir, I rise to a point of Order.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
පොඩ්ඩක් ඉන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ව්‍යවස්ථාව අනුව වෙනත් පක්ෂයක, වෙනත් සන්ධානයක සාමාජිකත්වය ගත් පමණින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකත්වය අහෝසි වන්නේ නැහැ. අහෝසි කරනවා නම්, එය කරන්න පුළුවන් වන්නේ, පක්ෂ ව්‍යවස්ථාව අනුව විනය මණ්ඩලයක් පත් කරලා, විනය මණ්ඩලය ඉස්සරහා කරුණු ඉදිරිපත් කරලා, චෝදනා පත්‍රයක් ඉදිරිපත් කරලා, ඒ ඉවත් කිරීම කළ බවට මධ්‍යම කාරක සභාවේ තීන්දුවක් අරගෙන එය පාර්ලිමේන්තු මහ ලේකම්ට දැන්වීමෙන් පමණයි. මගේ කාරණය එච්චරයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවස්ථාවක් ඉල්ලුවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමාගෙන් පසුව ඔබතුමාට අවස්ථාව ලබා දෙන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමාගෙන් ප්‍රශ්නයක් අහන්න කැමැතියි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවස්ථාවක් ඉල්ලුවා.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
මම අවස්ථාව ඉල්ලුවා, ඊට කලින්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමාගෙන් අහන්න කැමැතියි, ප්‍රශ්නයක්. Twitter Accountsවල පළ වී තිබුණා, එක්සත් ජනතා නිදහස් සන්ධානයට අයත් 50දෙනකු පොහොට්ටුව ලකුණ පක්ෂයේ සාමාජිකත්වය ගත්තා කියා. මම අහන්න කැමැතියි, ඔබතුමා පොහොට්ටුව ලකුණ පක්ෂයේ සාමාජිකත්වය ගත්තාද කියා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මම අරගෙන නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා ගත්තේ නැද්ද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මම ගත්තේ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම නම්, 50 දෙනෙක් ගත්තේ?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඒක මට අදාළ නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මහින්ද රාජපක්ෂ ගත්තේත් නැද්ද? නාමල් රාජපක්ෂ ගත්තේ නැද්ද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මම ගත්තේ නැහැ කියලායි මා කියන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
පාක්ෂිකයන් රවටනවා. පාක්ෂිකයන් රැවටුවේ මොකටද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, Twitter Accountsවල පළ වී තිබෙනවා, පොහොට්ටුව ලකුණ පක්ෂයේ සාමාජිකත්වය 50දෙනකු අරගෙන තිබෙනවා කියා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විශේෂයෙන්ම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන මහජන නියෝජිතයෙකු හැටියට - [බාධා කිරීමක්] ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමනි, මගේ අවස්ථාව.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "DailyFT" එක "MR takes SLPP membership" කියා වාර්තා කර තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
Hon. Deputy Speaker, it is so unfortunate to hear from a very senior Member of Parliament, the Hon. R. Sampanthan, that there are two Leaders of Opposition in this Parliament and also that this country is becoming a failed State. - [*Interruption*.] The Government should take the responsibility.

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
Sir, what is the point of Order in that?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Chandima Weerakkody is not raising a point of Order. He wants to make a statement.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
Sir, I am not raising a point of Order. Let me explain my position. I was also a one-time Deputy Speaker. There is a practice and there were precedents in this Parliament. It was stated that since President Maithripala Sirisena is the Leader of the UPFA, another Hon. Member of the UPFA cannot hold the position of the Leader of the Opposition. Hon. Sampanthan, you may very well recollect the fact that from 2001 to 2004, during the Presidency of Her Excellency Chandrika Bandaranaike Kumaratunga, the Hon. Mahinda Rajapaksa was the Leader of the Opposition.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා, ඔබතුමාට අවස්ථාවක් දෙන්නම්. කරුණාකරලා ඒ වෙලාවට කථා කරන්න.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
Sir, may I continue my submission?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු මරික්කාර් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ point of Order එක මෙයයි. අප එතුමාට කියනවා, වෙල්ගම මහත්මයාගෙන් අහගෙන, ඊට පසුව ඇවිල්ලා කථා කරන්න කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්තුතියි.

ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමා.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
Do not behave like a jack-in-the-box. - [*Interruption*.]

Sir, in that Parliament, when the Hon. Mahinda Rajapaksa was the Leader of the Opposition, the current Prime Minister, the Hon. Ranil Wickremesinghe, was the

[ගරු චන්දිම වීරක්කොඩි මහතා]

Prime Minister. If you may recollect, from 08th of January to 15th of August, 2015, the Hon. Maithripala Sirisena, who was the leader of the UPFA, was the President and the Hon. Nimal Siripala De Silva, a Member of the UPFA, was the Leader of the Opposition. His Excellency the President's holding Ministerial portfolios is another issue that was raised. But, His Excellency Maithripala Sirisena held a few portfolios in that instance as well.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, I cannot give you any more time. Please make it short.

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
I will.

Sir, the other issue is regarding the Hon. Mahinda Rajapaksa obtaining the membership of the SLPP. He denies it. The General Secretary of the UPFA, as the authority, has informed the Hon. Speaker in writing to appoint the Hon. Mahinda Rajapaksa, who is the Leader of the Parliamentary Group of the UPFA, as the Leader of the Opposition. What more is expected? Parliament is not there to arbitrate or inquire into the internal issues of the UPFA or any other political party. It is so unfortunate that you are attempting to convert this Parliament, which is funded by the people's money, into a limited centre for inquiry of SLFP and the UPFA.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Thank you. I will not allow any more time. I cannot allow a debate on this. I will not allow any debate. - [*Interruption.*] Only the party leaders are allowed to make statements, not anybody else.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දිගින් දිගටම අවස්ථාව ඉල්ලා සිටියා. මට අවස්ථාවක් දෙන්න.[බාධා කිරීම්]

**ගරු චන්දිම වීරක්කොඩි මහතා**
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
Sir, I rise to a point of Order.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමනි, ඔබතුමාට කථා කරන්න අවස්ථාව දුන්නා.

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?[බාධා කිරීම්]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම රීති ප්‍රශ්න දෙකක් මතු කරනවා. පළමුවැනි රීති ප්‍රශ්නය තමයි ඊයේ- [බාධා කිරීම්]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-[බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!
ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමනි, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමාගේ point of Order එක ඉදිරිපත් කළාට පස්සේ ඔබතුමාට අවස්ථාව දෙන්නම්. [බාධා කිරීම්]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාටයි මම අමතන්නේ. ඊයේ ගරු කථානායකතුමා විපක්ෂ නායක ධුරය පිළිබඳව දෙපාර්ශ්වය විසින් මතු කරන ලද කරුණුවලට ඇහුම්කන් දීලා, ඒ පිළිබඳව ලිඛිත සැල කිරීම් කරන ලෙස පාර්ලිමේන්තුවට උපදෙස් දීලා, එතුමාගේ මතය සිකුරාදා පාර්ලිමේන්තුවට දැනුම් දෙන බව ප්‍රකාශ කළා. එවැනි පසුබිමක හිටපු විපක්ෂ නායකතුමාට හෝ සුමන්තිරන් මන්ත්‍රීතුමාට හෝ ඒ අවසන් කරන ලද ප්‍රශ්නය යළි විවෘත කරලා මේ සභාවේ අර්බුදයක් කිරීමට ඉඩ දීම ඔබතුමා විසින් කරන ලද වරදක් වියයට අපි දකිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පක්ෂ නායකයකු හැටියට එතුමාට statement එකක් කරන්න අවස්ථාව දුන්නා. එච්චරයි. දැන් මේ ගැන ආපසු දිගින් දිගට විවාද කරන්න අවශ්‍යතාවක් නැහැ.

ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**
(மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில)
(The Hon. Udaya Prabhath Gammanpila)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සමාවෙන්න. ඔබතුමාට තවත් අවස්ථාවක් දෙන්න බැහැ. [බාධා කිරීම්] ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමාගෙන් සභානායකතුමා විමසුවා, එතුමා පොහොට්ටුවේ සාමාජිකත්වය ගත්තාද කියලා. එතුමා නැහැයි කියලා කිව්වත්, ඒ සියලුදෙනාගේම ඡායාරූප තිබෙනවා, මහින්ද රාජපක්ෂ මහත්තයාගෙන් සාමාජිකත්වය ගන්නා. එම නිසා කරුණාකරලා පාක්ෂිකයෝ රවට්ටන්න එපා. මේ වැඩෙන් පොහොට්ටුවේ පාක්ෂිකයෝ රවට්ටන්න එපා. [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! I cannot allow this debate to go on, I am sorry.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

Hon. Deputy Speaker -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, Hon. Rauff Hakeem. -[*Interruption.*] I have recognized Hon. Rauff Hakeem.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

Hon. Deputy Speaker, මේ පාර්ලිමේන්තුවේ දිගින් දිගටම ව්‍යාකූල තත්ත්වයක් ඇති වී ගෙන එනවා. ප්‍රථමයෙන් අග්‍රාමාත්‍යතුමන්ලා දෙදෙනෙකු සිටියා. එවෙලේත් අපට පාර්ලිමේන්තුවේ සන්සුන්ව වාඩි වෙලා, ඡන්දය දීලා කාටද බහුතරය තිබෙන්නේ කියලා සනාථ කර ගන්න තිබුණා. ඒකට ඉඩ දුන්නේ නැති කල්ලියක් දැන් විපක්ෂයට ගිහිල්ලා වාඩි වෙලා ඉන්නවා, ඒකේ ප්‍රතිඵලයක් හැටියට.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථානායකතුමා ඊයේ නිවේදනයක් කළා. මේ පාර්ලිමේන්තුවේ දීර්ඝ ඉතිහාසයක් තිබෙන මන්ත්‍රීවරයකු වන අපේ ගරු සම්පන්දන් මැතිතුමා ඒ නිවේදනයට අභියෝගයක් එල්ල කරමින්, දැන් විපක්ෂ නායකවරු දෙදෙනෙකු සිටින බව ප්‍රකාශ කළා.

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

I have not been removed.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

You have not been removed. Our position is also the same. Let me say this. The issue is, Hon. Sampanthan, at the beginning of the year, we had Hon. Mahinda Rajapaksa as the former President of this country. This month, he became the former Prime Minister once again and now he has become a former Member of Parliament.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

Hear! Hear!

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

That is what has happened. Trust me. I know the Hon. Susil Premajayantha took a lot of pains to explain Article 99 (13) and all that. It is very clear. Your own party is the Sri Lanka Freedom Party and once you go and obtain membership of another party, your membership ceases. That issue, we will prove. -[*Interruption.*] We will prove it before a Select Committee. -[*Interruption.*]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please!

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

We will prove. Unfortunately -[*Interruption.*] We have no right. But, the House has a right. Now, you have deprived the Hon. Dinesh Gunawardena also of his position in this whole issue. So, it is a very serious matter. -[*Interruption.]* Do not get so emotional and sentimental. Hon. Keheliya Rambukwella, do not get so emotional. It is not an emotional issue. Why are you getting so upset? I am telling you, only a few Members of Parliament like -[*Interruption.*]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! Hon. Rauff Hakeem, please conclude.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹக்கீம்)
(The Hon. Rauff Hakeem)

Hon. Member, the Member sitting next to you is the only sensible Member among you. The Kalutara District Member sitting next to you is the only sensible Member and you did not have the magnanimity to listen to him. That is why you are in this position. -[*Interruption.]* One of the most popular leaders in this country has been made a political orphan. That is what you have done. It is very unfortunate. -[*Interruption.]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Thank you.

Order, please! ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක ඉදිරිපත් කරන්න.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 91. (ඊ) යටතේ- [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Hon. Member is on a point of Order. ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා, කියන්න.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 91.(ඊ) යටතේ තමයි මම මේ ප්‍රකාශය කරන්න සූදානම් වන්නේ. මේ පාර්ලිමේන්තුවේ, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය දිගින් දිගටම උල්ලංඝනය වනවා. මෙහිදී මට තව එක කාරණයක් මතු කරන්න තිබෙනවා. අපි දැක්කා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා පසුගිය දිනක ප්‍රකාශ කර තිබුණා, -[බාධා කිරීමක්] මම මේ කථා කරන්නේ, ස්ථාවර නියෝග යටතේ. මම මේක පැහැදිලි කරන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කියන්න.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග 91. (ඊ) යටතේ තිබෙන කරුණක් ගැනයි මා කථා කරන්නේ. අධිකරණයේ තිබෙන නඩුවක් සම්බන්ධයෙන් කථා කළ නොහැකි බව තමයි එයින් කියවෙන්නේ. මේ පාර්ලිමේන්තුවේ පසුගිය දවස්වල අගමැතිවරු දෙදෙනෙක් හිටියා. ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා - [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මට මේක අහන්න දෙන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා මෑත කාලයේ ප්‍රකාශ කළා, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවට එම පක්ෂයෙන් ඇමතිවරු එනවා නම් ඒ ගොල්ලන්ට අත්සන් කරන්නේ නැහැ කියලා. [බාධා කිරීම්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක point of Order එකක්.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ඒ වාගේම අපට දැන ගන්න ඕනෑ, මොකක්ද මේ double standard එක කියලා. ඒ වාගේම විපක්ෂ නායක-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හරි, බොහොම ස්තුතියි. අවසාන කරන්න. ප්‍රධාන කටයුතු ආරම්භයේ දී යෝජනා. ගරු සභානායකතුමා.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல - பாராளுமன்றச் சபை முதல்வர்)
(The Hon. Lakshman Kiriella - Leader of the House of Parliament)
I move,

"That this Parliament at its rising this day do adjourn until 10.30 a.m. on Friday 21st December, 2018."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்துரைக்கப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
2018.12.18 වන දින ඉදිරිපත් කරන ලද කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් අදාළ විවාදය තවදුරටත් පැවැත්වීම. ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා.

## විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම
## நிறைவேற்று ஜனாதிபதி பதவியை இல்லாதொழித்தல்
## ABOLITION OF THE EXECUTIVE PRESIDENCY

[අ.භා.1.34]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නිවැරැදි කිරීමේ අරමුණින් ඊයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් ආරම්භ කළ විවාදයට අද දින කරුණු දක්වන්නට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට මා ස්තුතිවන්ත වෙනවා. 1978 ශ්‍රී ලංකාව ලෝකයට විවෘත කිරීමේත්, ඒ වාගේම වෙළෙඳ පොළ ලෝකයට හඳුන්වා දීමේත් අරමුණින් එදා රටේ නායකයෝ සද්භාවයෙන් විශ්වාස කළා, එයට හරියන

විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් වෙනස් කළ යුතුයි කියලා. මේක හරියටම නිවසක් හදනවා වාගෙයි. නිවසක් හදනකොට අත්තිවාරම ශක්තිමත්ව හදන්න අවශ්‍යයි; අත්තිවාරම ශක්තිමත්ව දමන්න ඕනෑ. කල් යත්ම 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දහනව වතාවක් සංශෝධනය කරනු ලැබුවා. මේ ගැන තවදුරටත් කිව්වොත්, නිවසක් කඩා වැටෙනකොට ඒ නිවස කඩා වැටෙන එක හරිගස්සන්න නොයෙකුත් උපක්‍රම යෙදවීමක් කියලා කියන්නට පුළුවන්. නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දහනව වතාවක් සංශෝධනය කළත් අපට අවශ්‍ය වුණු ප්‍රතිඵලය ලැබී නැහැයි කියලා කියන්න සිදුවෙනවා.

එහෙම නම්, ඇත්තටම මේකට තිබෙන විසඳුම මොකක්ද? අපේ නිවස ඇත්තටම ශක්තිමත් කරන්න නම්, වහල හදලා වැඩක් නැහැ. ඒ සඳහා මුලින්ම අත්තිවාරම හදා ගන්න ඕනෑ. අපේ අවධානය අපි යොමු කළ යුත්තේ මේ අත්තිවාරම සම්මත කර ගැනීමටයි; ඒ කියන්නේ ව්‍යවස්ථාවයි. අපට දැන් වෙලා තිබෙන්නේ මේකයි. ගොඩනැඟිල්ලක් හදන්න හදනවා. නමුත් සමහරු එළියේ තෙමී-තෙමී ඉන්නවා. ඒ නිසා ගොඩනැඟිල්ල හදා ගන්න බැහැ; අනාගත පරම්පරාවට ජීවත් වෙන්න පුළුවන් ආකාරයට එය හදා ගන්න අපට බැහැ. ඒ නිසා, අපි දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය කළා වාගේ ඉක්මන් වෙලා මේ සංශෝධන කළාට හරි යන්නේ නැහැ. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අපි හදිසි කරලා ඉක්මනට සම්මත කළා නේ. ඒකේ අඩු පාඩු තිබෙනවාය කියලා ඊට පස්සේ මොනවාද කළේ? දහහත්වන සංශෝධනය ඉවත් කරලා දහඅටවන සංශෝධනය ගෙනාවා. එම සංශෝධනයෙන් මොකක්ද කළේ? විධායක ජනාධිපතිකම අහෝසි කරන්නය කියපු අය, ජීවිත කාලයක්ම තමන්ට ඒ ධුරයේ ඉන්න පුළුවන් වන විධියට තමයි දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවේ. ඊට පසුව අපි දින සියයේ ආණ්ඩුව තුළ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. පසුගිය මාස දෙකේදී තිබුණු වාද විවාදවලදී සමහර අය මේ දහනව වන සංශෝධනයේ තිබෙන අඩු පාඩුත් පෙන්වන්න පටන් ගත්තා. ඒ නිසා විසිවන සංශෝධනයක හරය සමඟ අපි එකඟ වුණාට, මුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවම පිළිවෙළකට සංශෝධනය කළ යුතුයි කියා මා හිතනවා. එය මුළු රටටම පිළිගත හැකි ව්‍යවස්ථාවක් -අත්තිවාරමක්- විය යුතුයි. අපි දැන් නිවසක් නොවෙයි හදන්න ඕනෑ. දැන් අපි හදන්න ඕනෑ ගොඩනැඟිල්ලක්. ඒ ගොඩනැඟිල්ලට අපි හොඳ අත්තිවාරමක් දමන්න ඕනෑ. In page 97 of the English version of the "Mahinda Chintana" of 2005, the former President said, I quote:

> "I expect to present a Constitution that will propose the abolition of the Executive Presidency and to provide solutions to other issues confronting the country."

That is what the Hon. Mahinda Rajapaksa, in 2005, proposed - the abolition of the Executive Presidency. He went on to state, I quote:

> "In the Interim, I propose to present a Constitutional amendment through which the Executive President will be made answerable to the Parliament by virtue of holding such office. To endorse the responsibility that the President has to the Parliament, I will attend Parliament once a month."

Those were all very good intentions, but where did those intentions actually lead? 2005 වසරේදීම, මහින්ද රාජපක්ෂ මහතා "මහින්ද චින්තනය" නමැති තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කියනවා, "මම මේ විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවා" කියා. ඒක අහෝසි කරන්න කල් යනකොට, විධායක ජනාධිපතිතුමා පාර්ලිමේන්තුවට වග කියන්න ඕනෑය කියා ඉක්මනට පාර්ලිමේන්තුවට සංශෝධනයක් ඉදිරිපත් කරනවා. එතුමා 2010 වසරේදී නැවතත් ඡන්දය ඉල්ලනකොට, "ජනාධිපති ධුරය භාරකාර ධුරයක් බවට හරවනවා" කියා මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් කරනවා. "විධායක ජනාධිපති ධුරයේ බලතල පරිහරණය කිරීමේදී මම ඉතා ප්‍රවේශම්කාරී වුයෙමි. අතීතයේදී විධායක ජනාධිපති ධුරය යොදා ගන්නා ලද්දේ මැතිවරණ කල් දැමීමට, මැතිවරණවලින් පත් වූ ආණ්ඩු පෙරළා දැමීමට, අධිකරණයට බාධා කිරීමට..." ආදී වශයෙන් කාරණා කීපයක් එහි සඳහන් කරනවා. අන්න ඒ කාරණා තමයි, මහින්ද රාජපක්ෂ මහතා 2010 වසරේදී මහින්ද චින්තන ඉදිරි දැක්මේ කියා තිබෙන්නේ. මේ විධායක ජනාධිපතිකම අධිකරණයට බාධා කළා ද. කාලය යන්න ඉස්සර වෙලා, මේ රටේ අග්‍ර විනිශ්චයකාරවරිය ලෙස කටයුතු කළ ශිරානි බණ්ඩාරනායක මහත්මිය නීත්‍යනුකූල නොවන විධියට එම ධුරයෙන් නෙරපා දැම්මා. ඔය පුටුවේ ඉඳ ගත්තාම ඔහොම තමයි වෙන්නේ. එක පුද්ගලයකුට බලය වැඩි වුණාම ඔය වාගේ දේවල් සිදු වෙනවා. ඒ වාගේම පක්ෂ තහනම් කිරීමට, උද්ඝෝෂණ මර්දනය කිරීමට, ඝාතන සංස්කෘතියකට රට ගෙන යාමට විධායක ජනාධිපති ධුරය පාවිච්චි කර තිබෙනවාය කියාත් එහි සඳහන් කර තිබෙනවා. ඝාතන සංස්කෘතිය ගැන අපි කියන්න ඕනෑ නැහැ නේ. ඒ අඳුරු යුගය, මාධ්‍යවේදීන් ඝාතනය කළ ආකාරය අපට කවදාවත් අමතක වෙන්නේ නැහැ. දකුණේ මාධ්‍යවේදීන් ඝාතනය වුණා. ඒ කාලය තුළදී උතුරේ මාධ්‍යවේදීන් ඊට වැඩි සංඛ්‍යාවක් ඝාතනය වුණා. අහිංසක මිනිසුන් ඝාතනය කළ යුගය අපට අමතක කරන්න බැහැ. අපරාධකරුවන් රැකීමට, ජාවාරම්කරුවන්ට සහන ලබා දීමට මෙන්ම රට පාවා දෙන ගිවිසුම් ඇති කර ගන්නටද මෙම විධායක ජනාධිපති ධුරය යොදාගත් බව වැඩිදුරටත් එහි සඳහන් කර තිබෙනවා.

"....අධිකරණයට වගකියන ව්‍යවස්ථා සම්පාදනය, විධායකය හා අධිකරණය එකිනෙකට ගැටෙන ඒකක ලෙසින් නොව, සහජීවනයෙන් බැඳුණු එකම රාජ්‍යයක කොටස් බව තවදුරටත් අවධාරණය කරන භාරකාර ධුරයක් බවට විධායක ජනාධිපති ධුරය පත් කරමි" කියාත් මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් කර තිබෙනවා.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! There is a point of Order being raised. Yes, Hon. Navin Dissanayake?

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

Hon. Deputy Speaker, is there an investigation going on about what happened in Parliament on the 15th of November?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Yes, there is a Committee appointed.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

One of the Hon. Members who were involved in that incident, the Member who put "*miris kudu",* just came into the Chamber. Is there a duty on the Parliament to -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

No. There is no final decision on this. So, until a decision is taken, they can come in as Members of Parliament.

**ගරු නවින් දිසානායක මහතා**
(மாண்புமிகு நவீன் திஸாநாயக்க)
(The Hon. Navin Dissanayake)

All right. Thank you.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ඉන් පසුව, 2015 ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතා "මහින්ද චින්තන - ලොව දිනන මග" නමින් තමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරමින් කියනවා, මේ ගැන ආයෙත් බලනවාය කියා. 1978 ව්‍යවස්ථාව පිළිබඳව ප්‍රශ්න කරලා, ඒක සංශෝධනය කරන්න බලනවා ලු. "පවතින විධායක ජනාධිපති ක්‍රමය, මැතිවරණ ක්‍රමය, නීතියේ ආධිපත්‍යය සහ යහ පාලනය වැනි ක්ෂේත්‍ර සියල්ලම නව ව්‍යවස්ථාවෙන් ආවරණය කරමි" කියා එම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඔහු සඳහන් කරනවා. නමුත්, 2010දී මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති ධුරයට පත් වුණාට පසුව, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් හැටියට සඳහන් කරනවා, "....in light of the extraordinary victory achieved by Mahinda Rajapaksa at Tuesday's poll, the abolition of the Executive Presidency could not be a panacea for all ills as claimed by the UNP-JVP combine. It was a mandate to continue with the existing Presidential system of governance". ඒ කියන්නේ, මහින්ද රාජපක්ෂ මහතා 2010දී විධායක ජනාධිපති වුණාට පසුව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් හැටියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කියනවා, "නැහැ, නැහැ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න බැහැ, අපට ඡන්දය දීලා තිබෙන්නේ ඒක කරගෙන යන්න" කියලා. ඇත්තටම මැතිවරණ ප්‍රකාශනයේ තිබෙන්නේ ඒකේ අනෙක් පැත්තයි. විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න ඕනෑය කියන එකයි එහි තිබෙන්නේ. මහින්ද රාජපක්ෂ මහතා විධායක ජනාධිපති හැටියට 2006 ජූලි මාසයේ 11වන දා සර්ව පාක්ෂික නියෝජිත කමිටුව -APRC, All Party Representatives Committee - පත් කරනවා. ඉන්පසුව ඒකේ විශේෂඥයන්ගේ වාර්තාව දෙනවා. එම විශේෂඥයන් 17දෙනාගෙන් 11දෙනෙක් එම වාර්තාවට අත්සන් කරනවා. That Report recommended that the executive actions of the President be subject to judicial review; that a Constitutional Court be established outside the main court system; that the emergency powers of the President over the provinces be subject to judicial and parliamentary control and that a second chamber of Parliament consisting of provincial representatives be established and so on and so forth.

මේ දේවල් තුළින් මම කියන්න හදන්නේ මොකක්ද? චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය, මහින්ද රාජපක්ෂ මැතිතුමා, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කියන සියලුදෙනාම ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙනකොට, "අපි මේ විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවා" කියන තැන තමයි හිටියේ.

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා "මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්" කියන සිය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මේ පිළිබඳව සඳහන් කර තිබෙන්නේ කොහොමද? "වසර 20ක් තිස්සේ එම අරමුණ සාක්ෂාත් කරගැනීමට නොහැකිවීම අප ලද බලවත් පරාජයකි. එය තව දුරටත් ප්‍රමාද කළ නොහැක" කියා එතුමා එහි කියනවා. මේ, මෛත්‍රීපාල සිරිසේන අපේක්ෂකතුමා කියන දේයි. මේ කටයුත්ත ප්‍රමාද කළ නොහැකියි කියා එතුමා සඳහන් කරනවා. "විධායක ජනාධිපති ධුරය වෙනස් කිරීමට ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුවේ සහයෝගය අවශ්‍ය වේ.. දැනට පවතින අත්තනෝමතික විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට, අලුතින් කැබිනට් මණ්ඩලය හරහා පාර්ලිමේන්තුව හා සම්බන්ධ වූ විධායකයක් සහිත ආණ්ඩුක්‍රම ව්‍යුහයක් හඳුන්වා දෙමි" කියා එතුමා එහි වැඩිදුරටත් කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රතිපත්ති ප්‍රකාශනයේම එතුමා කියනවා, "විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කිරීම සඳහා මා විසින් පසුබිම් කරගනු ලබන්නේ පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමි ප්‍රමුඛ සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරය විසින් ඇති කරගෙන තිබෙන විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා වූ එකඟතා...." කියලා. විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන අත්තනෝමතික බලතල වෙනස් කරන්න තමයි අපේ මාදුළුවාවේ සෝභිත ස්වාමීන් වහන්සේත් ඒ සටන ගෙන ගියේ.

අපට දැන් කරන්නට වෙලා තිබෙන්නේ මේ ගොඩනැඟිල්ල හදන්න අත්තිවාරම දමන එක. මෙක මා හිතන්නේ, විසි වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය විතරක් ගෙනැල්ලා කරන්න බැහැ කියායි. ඒ සඳහා පාර්ලිමේන්තුව දීර්ඝ වැඩ පිළිවෙළක යෙදී සිටිනවා. සෑම පක්ෂයක්ම එකතු වෙලා කොමිටි 7ක් පත් කළා. ඒවායේ වාර්තා ලැබුණා. ඒ වාගේම Steering Committee එකේ වාර්තාවත් ලැබුණා. ඊළඟ පියවර Steering Committee එකේ වාර්තාව පාර්ලිමේන්තුවේ වාද විවාද කිරීමයි. ඉන් පසුව යම්කිසි සැකසුමක් හදන්න, පනත් කෙටුම්පතක් හදන්න, ඒ පනත් කෙටුම්පත අපි වාද විවාද කරන්නට ඕනෑ.

අද හුඟක් වෙලාවට නොයෙක් කථාවල් හදනවා. රට බෙදනවා, නැත්නම් වෙන මොකක් හෝ කරනවා කියා එක එක කථා හදලා ජනතාව අතරේ ඕක පතුරුවා කොහොම හෝ හදන්න තිබෙන අත්තිවාරම විනාශ කරන වැයමක තමයි යෙදී සිටින්නේ. ඒ විතරක් නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2016 අගෝස්තු මාසයේ පළාත් සභාවල සම්මේලනයක් තිබුණු බව අපි දන්නවා. සෑම පළාත් සභාවකම ප්‍රධාන ඇමතිවරුන්, ඒ පළාත් සභාවල ලේකම්වරුන්, පළාත් සභාවල විධායක නිලධාරින්, නීති නිලධාරින්, පළාත් සභාවල සියලුම නිලධාරින් මේ සම්මේලනයට සම්බන්ධ වුණා. ඒකේදී මධ්‍යම පළාත් සභාව කිව්වා, "අපට තවත් විමධ්‍යගත බලතල අවශ්‍යයි. අපිට බදු දමන්න බලතල ඕනෑ." කියා. උතුරේ අය නොවෙයි මෙහෙම කියන්නේ. මධ්‍යම පළාත් සභාව කියන්නේ, "අපිට බදු දමන්න බලතල අවශ්‍යයි." කියා. ඒ වාගේම කිව්වා, "අපිට තීරණ ගන්න හැකියාව දෙන්න. අපිට මේ සමගාමී ලැයිස්තුව - Concurrent List එක- අයින් කර පළාත් සභාවට ලැයිස්තුවක් දෙන්න. මධ්‍යම රජය මධ්‍යම රජයේ ලැයිස්තුව තියා ගන්න. අපට වැඩ කර ගෙන යන්න අවස්ථාව දෙන්න." කියා. ඒ රපෝර්තුව දෙස බැලුවාම, දකුණු පළාත් සභාව කියනවා, "අපිටත් පනත් සෑදීමේ බලතල ඕනෑ. මෙක අපිට දෙන්න. අපි දන්නවා කොහොමද කරන්නේ. හැම දෙයක්ම ශ්‍රී ජයවර්ධනපුර පාර්ලිමේන්තුවෙන් තීරණය කරන්න ඕනෑ නැහැ." කියා. මෙක සිදු වුණේ 2016 අගෝස්තු මාසයේ පැවැති ඒ පළාත් සම්මේලනයේදියි. හැම පළාත් සභාවක්ම මෙකට සහභාගි වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන තිබෙන මූලධර්මය මෙයයි. හැම එකක්ම මධ්‍යම රජය තීරණය කරන්න ඕනෑ නැහැ

කියන එකයි. මළ ගෙයක් වුණාම මරණාධාර සමිතිය මධ්‍යම රජය පාලනය කරන්න ඕනෑ නැහැ. අද මේ රටේ මරණාධාර සමිති කොච්චර තිබෙනවාද? කොච්චර හොඳට ඒවා පාලනය වෙනවා ද? ඒවායින් කොච්චර හොඳ තීරණ ගන්නවා ද? ඒවා අපි පාලනය කරන්න ඕනෑ නැහැ. මේකට කියනවා, " Subsidiarity Principle " කියා. ඒ කියන්නේ, මිනිසුන්ට සමීපතම ආයතනය ඒ අයගේ එදිනෙදා ජීවිතයට සොයා ගන්න තිබෙන විසඳුම්, තීරණ ගන්න ඒ අයට භාර දෙන්න කියන දේශපාලන න්‍යාය තමයි මෙහි තිබෙන්නේ. මරණාධාර සමිතිය එක උදාහරණයක්. කුණු කසළ එකතු කරනවා ද? සතියේ කොයි දවසේද එකතු කරන්නේ? සතියකට කී වතාවක් කුණු කසළ එකතු කරනවා ද? මධ්‍යම රජය මොකටද ඒවා තීරණය කරන්නේ? ඒවා ඒ ඒ නගර සභා, ප්‍රාදේශීය සභා මට්ටමෙන් තීරණය කරන්න පුළුවන්. නමුත් කුණු කසළ කළමනාකරණය කිරීම, ඉවත් කිරීම මේ රටේ හැමෝටම බලපානවා. ඒක හැමෝටම බලපාන්න ඕනෑ. මොකද ඒක පරිසරය පිළිබඳ ප්‍රශ්නයක්. ඒක අපිට තියා ගන්නට පුළුවන්. අපි ඒක තියා ගන්නට අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලය බෙදීමේදී බිල්ලෝ හදා වැඩක් නැහැ. අපි මේක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට ඊළඟ පියවරට යන්නට ඕනෑ. කෙටුම්පතක් ඉදිරිපත් කර අපි ඒ කෙටුම්පත වාද විවාද කරන්නට ඕනෑ. අපි මේක හදිසියෙන් කරන්නට හොඳ නැහැ. අපිට මේක හංගලා කරන්න බැහැ. අපි මේක විවෘතව කරන්නට ඕනෑ. අපි මේ ගොඩනැඟිල්ල හදන්න ඕනෑ, ඔක්කොටම තෙමෙන්නේ නැතිව ඇතුළේ ඉන්න. අව්වේ වැස්සේ එළියේ ඉන්න නොවෙයි. සමහර අය අපි වාගේ ඇතුළේ ඉන්නේ. සමහර පුරවැසියෝ තවම එළියේ ඉන්නේ. හැමෝටම මේ ගොඩනැඟිල්ල ඇතුළට එන්නට පුළුවන් වෙන්නට ඕනෑ. එහෙම ව්‍යවස්ථාවක් හදන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබිය යුත්තේ බලය විමධ්‍යගත කිරීම විතරක් නොවෙයි. මේකට ඇතුළත් කරන්න ඕනෑ තව දේවල් තිබෙනවා. උදාහරණයක් විධියට කැබිනට් මණ්ඩල ගැන කථා කළොත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ තිබෙනවා, කැබිනට් මණ්ඩලයේ ඇමතිවරු ඉන්න ඕනෑ 30යි කියා. සභාග ආණ්ඩුවක් හදා ගත්තොත් ඇමතිවරු 45ක් හෝ කීයක් හෝ ඉන්න පුළුවන් කියා සඳහන් කරනවා. ඇත්තටම, රටට අවශ්‍ය මොනවාද කියා තමයි අප බලන්න ඕනෑ. කැබිනට් මණ්ඩලයේ සංයුතිය 30යි කියා අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ගලෙන් තනන්න ඕනෑ. 30යි කියන එක ගලෙන් තනන්න ඕනෑ. අද මම මේ කථා කරන අවස්ථාවේදීත් සාකච්ඡාවන් යනවා ඇති කැබිනට් මණ්ඩලයේ සංයුතිය වැඩි කර ගන්න, පුළුවන් නම් එම සංයුතිය 45ක් කර ගන්න.

2013දී jumbo Cabinet එකක් හැදුවා. ඒ jumbo Cabinet එකේ ඇමතිවරු 67ක් හිටියා. ජනාධිපතිතුමා හිටියා, අගමැතිතුමා - දි.මු.ජයරත්න මැතිතුමා- හිටියා. ජ්‍යෙෂ්ඨ ඇමැතිවරු 10ක් හිටියා. ඊට පසුව නියෝජ්‍ය ඇමතිවරු 28ක් දැම්මා. ඊට පසුව Project Ministersලා කියලා දෙදෙනෙක්ව නම් කළා. ඊට පසු මොනවාද කළේ? මන්ත්‍රීවරු 225න් ඇමති මණ්ඩලය 97කට වැඩි කළා. ඔය සෙල්ලම් තමයි හැමතිස්සේම පස්ස දොරෙන් යන්නේ. අපේ නායකයන්ට මේ ඉඩකඩ දෙන්නට බැහැ. අවුරුදු 30කට මේ ඉඩකඩ දීලා තිබෙනවා. අපි මෙය ගලෙන් තනන්න ඕනෑ. මේවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ තිබෙන්න ඕනෑ. අපේ රට කුඩා රටක්. රටට සුදුසු මොකක්ද කියන එක ගැන අප හිතන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවෙනි පත්වීම හැටියට මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ධුරය ලැබුණා. මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන කියන එකට ඇත්තටම විද්‍යාත්මක පදනමක් තිබෙනවාද? අනේ! විද්‍යාත්මක පදනමක් තිබෙනවා නම් මට කියන්න. මගේ ඉගෙනුම හැටියට නම් විද්‍යාවෙන් එකතු කර ගන්නම බැරි දෙයක් තමයි මෙතැන තිබෙන්නේ. මම පෙන්වා දෙන්න හදන්නේ මේකයි. වාණිජ දෙපාර්තමේන්තුව - Department of Commerce - තිබුණා. සාමාන්‍යයෙන් එමඟින් ජාත්‍යන්තර වෙළෙඳාම, multilateral agreements වාගේ ඒවා කරනවා. එම දෙපාර්තමේන්තුව ගැසට් කරද්දී දැම්මේ අභ්‍යන්තර වෙළෙඳ කටයුතු තිබෙන අමාත්‍යාංශයට. මම මේ උදාහරණ තමයි පාවිච්චි කරන්නේ. පුද්ගලයන්ගේ මුහුණ බලලා කථා කරන්න මගේ කිසිම සම්බන්ධයක් නැහැ. මම මෙතැනදී කරුණු බලලා තමයි කථා කරන්නේ. මෙහි කිසිම පදනමක් නැහැ. මේ වාගේ දේවල් හැමදාම සිදු වෙනවා. විද්‍යාත්මක පදනමක් නොමැති දේවල් හැම තිස්සේම සිදු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය රජයේ ආරක්ෂක අමාත්‍යාංශය තිබුණා. ආරක්ෂක අමාත්‍යාංශය යටතට නාගරික සංවර්ධනය - Urban Development- ගෙනාවා. මොකක්ද සම්බන්ධය? නාගරික සංවර්ධනයයි, ආරක්ෂක අමාත්‍යාංශයයි අතර සම්බන්ධය මොකක්ද? කිසිම සම්බන්ධයක් නැහැ. ඒ වාගේ දේවල් අපි කළ යුතු නැහැ. අපට මේ සම්බන්ධයෙන් බොහෝ උදාහරණ කියන්න තිබෙනවා. නමුත්, ඒ උදාහරණ සියල්ලටම යන්නේ නැහැ. මොකද, කාලය ප්‍රමාණවත් නොවන නිසා මම අවසන් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ අවස්ථාවේදී වුණත් රට ගැන හිතලා තීරණ ගන්නට ඕනෑ. මේ පැය 48 තුළදී ජනාධිපතිතුමාත් අගමැතිතුමාගේ යෝජනාවන්වලට එකතු වෙලා හොඳ ආණ්ඩුවක් පිහිටුවලා, කැබිනට් මණ්ඩලයක් පිහිටුවලා, රට ස්ථාවර කරලා රට ඉදිරියට ගෙන යන්න පුළුවන් වෙයි කියා මම බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,මේ කාරණය කියා මගේ කථාව අවසන් කරන්න කැමතියි. අද "ඩේලි මිරර්" පත්තරයේ 11 වන පිටුවේ කේ.කේ.එස්. පෙරේරා නම් වූ විද්වත් මහතා විසින් ලියන ලද ලිපියක් පළ වී තිබුණා. එහිදී ඔහු මෙවැනි දෙයක් කියනවා. එළියට යන ක්‍රමය මොකක්ද කියනවා. එම පුවත් පතේ මෙහෙම සඳහන් වෙනවා:

"It is time to join hands irrespective of race, colour, language and religion. We must get together, work together, speak and work together and write together."

තවදුරටත් මට මේක කියවන්න ලජ්ජයි. මේක මට විරුද්ධවයි, අපට විරුද්ධවයි කියන දෙයක්. මේක සිවිල් සමාජයෙන් තමයි ලියන්නේ.

"Go to the people in villages, expose the ‘criminal’ elements in politics, expose the lies of these criminals and those who support them, expose the danger of

authoritarianism,-" which mainly stems from the Executive Presidency.

"-train them to say no to politics, no to racism, no to divisions; bring back rule of the law, power back to people."

Revolutionise the political system,-"

මේ මාස දෙකේදී අපට ජනතාවගේ සහාය ලැබුණා. ජනතාවගෙන් අපට ලැබුණු එම සහාය, ජනතාවගෙන් අපට ලැබුණු එම ආධාරය අනුව එදා ගාලු මුවදොර පිටියට ලක්ෂ සංඛ්‍යාත සෙනඟක් ආවා. ඒ අයගේ බලාපොරොත්තු කඩ නොකර ඉදිරියට යන්න අපි කැප වෙනවාය කියමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. මීළඟට ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.1.56]

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණ පැත්තෙන් ඉදිරිපත් කර තිබෙන කල් තැබීමේ විවාදයේදී මමත් කරුණු කිහිපයක් දක්වන්න කැමැතියි.

මට ලැබී තිබෙන කාලය ඉතාම සීමිත නිසා, අද පාර්ලිමේන්තු රැස්වීම ආරම්භයේදී මෙතැන ඇති වුණු විවාදය පිළිබඳව මම මුලින්ම අදහසක් කියන්න අවශ්‍යයි. එකක් තමයි, විශේෂයෙන්ම පාර්ලිමේන්තුවට මිරිස් කුඩු ගෙනැල්ලා, කථානායක පුටුව උස්සාගෙන ගිහිල්ලා, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද සහ ජනතාව නියෝජනය කරන්න තිබෙන අයිතිය සහමුලින්ම උල්ලංඝනය කරලා, දේශපාලන වශයෙන් ත්‍රාඩභාවයේ පතුලටම ගිය රාජපක්ෂ- මෛත්‍රීපාල කණ්ඩායම, "විපක්ෂ නායකවරයා වෙන්නේ සම්පන්දන් මහතා නොවෙයි; රාජපක්ෂ මහතා"ය කියා කථානායකවරයා විසින් ප්‍රකාශ කළාම, කථානායකවරයාව දොහොත් මුදුනින් තබා වඳින පුදන තත්ත්වයට පත්වී තිබීම දැක්කාම අපට හිනා යනවාය කියන එක. කථානායකවරයාගේ නියෝගය පිළිබඳව අපට විවාදයක් නැහැ. අපි ඊයේත් ප්‍රකාශ කළා, "ඊ දනියෙල් දවල් මිගෙල්" නැතුව,- ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොකද ඔය රාජපක්ෂ කල්ලිය පසුගිය අවුරුදු තුනේම කළේ, මිනිසුන්ට පේන්න දවල්ට රාජපක්ෂ එක්ක ඉන්නවා, රෑට මෛත්‍රීපාල එක්ක ඉන්නවා. ඒ දෙකෙන්ම වාසි ගන්නවා. එම නිසා තමයි අපි හැමදාම කිව්වේත්, - "විපක්ෂයේ ඉන්නවා නම් විපක්ෂයේ ඉන්න, ආණ්ඩුවේ ඉන්නවා නම් ආණ්ඩුවේ ඉන්න, ඒ දෙකම කන්න බැහැ" කියලා. ජනතා විමුක්ති පෙරමුණ එක්සත් ජාතික පක්ෂයට උදව් කරනවා, අරකද, මේකද කියලා ඒ වෙලාවේ අපට තද විවේචන එල්ල කළා. අපේ පක්ෂය එක එක්කෙනාගේ දේශපාලන විවේචන මත තීන්දු ගන්නා පක්ෂයක් නොවෙයි. අපට අපේ ස්ථාවරයන් තිබෙනවා, අපි හොඳින් සාකච්ඡා කරලා තීන්දු ගන්නවා, ඒ තීන්දු අනුව අපි වැඩ කරනවා. අපි දිගින් දිගටම කිව්වා, "මේ කණ්ඩායම දවල්ට රාජපක්ෂ, රෑට මෛත්‍රීපාල" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔක්තෝබර් 26වැනි දා ඒක ඔප්පු කළා.

ඔක්තෝබර් 26 වන දින ඉතා අපූරුවට ඔප්පු කළා, රාජපක්ෂ මහත්තයාට තමන්ගේ හොර දූෂිත නඩු ටික බේරාගන්නත්,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තමන්ගේ බල තණ්හාවට නැවත ජනාධිපති වෙන්නත් -හම්බ කර ගන්න ඕනෑ කමකුත් ඇති,- දවල් මිගෙල් රෑ දනියෙල් එක දවල්ම ගෙනාව බව. විළිලජ්ජාව නැතුව එහෙම කරපු, කථානායකතුමාට ලංකා ඉතිහාසයේ කරන්න පුළුවන් නරකම වචනවලින් කථා කරපු, තුච්ඡම වචනවලින් කථා කරපු, - ඒ වචන මම කියන්න යන්නේ නැහැ.- නින්දිතම ලෙස හැසිරිච්ච, අදහා ගන්න බැරි තරම් තුච්ඡභාවයට පත්වෙච්ච කණ්ඩායමක දිනේෂ් ගුණවර්ධන මහතා ඊයේ කියනවා මම දැක්කා, "කථානායකවරයාගේ තීන්දුව අවසාන තීන්දුවයි" කියලා. මම කියන්නේ ඔය කණ්ඩායම කථානායක තනතුරට දණගහලා වඳින්න ඕනෑ. දණ ගහලා වැඳලා සමාව ගන්න ඕනෑ, තමන් කරන ලද අපරාධවලට. ඔය කණ්ඩායම පමණක් නොවෙයි, මෛත්‍රීපාල සිරිසේනත් එක්ක.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පිළිගන්නවා, ලංකාවේ වමේ ව්‍යාපාරය, - විශේෂයෙන්ම එන්.එම්. පෙරේරා මැතිතුමාගේ ඉඳලා,- ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්න විශාල කාර්ය භාරයක් කරලා තිබෙනවා කියන කාරණය. මේ පාර්ලිමේන්තුව අපි දොහොත් මුදුනින් තබා ගන්නා තැනක් නොවෙයි. මේක එක තැනක් පමණයි. මේක වංචාවෙන් දූෂණයෙන් පිරිච්ච තැනක් බව අපි දන්නවා. නමුත් අපි මේ සභාවට ආවාට පස්සේ මෙහි සදාචාරය, සම්ප්‍රදාය ගරු කරමින් වැඩ කරනවා. නමුත් ඒවා දොහොත් මුදුනින් පිළිගන්නවා කියා කියන මේ රාජපක්ෂ - මෛත්‍රීපාල කල්ලිය, - ඒකට එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුත් සමහර තත්ත්වයන් යටතේ හවුල් වුණා, පිහි අරගෙන ඇවිල්ලා. අපි එය නොසලකා හරිනවා නොවෙයි. - අවුරුදු තුනහමාරම කථානායක තනතුරට කොපමණ නම් අපහාස කරමින් ද හැසිරුණේ? අද එතැනින් මොකක් හෝ ආවාට පස්සේ ඒක උස්සා ගන්න හදනවා. ඒ කාලයේ ඒ ගොල්ලෝ වැඩිපුර හිටියේ පුටුවල නොවෙයි, මේ සභා ගර්භය මැද නේ; මේ කාපට් එකේ නේ. ඒ නිසා ඒ ගොල්ලන් කාපට් එකට ඇවිල්ලා, කථානායක පුටුවට දණ ගහලා වඳින්න ඕනෑ; වැඳලා සමාව ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජන බලය කියන්නේ හරි ප්‍රබල දෙයක්. අගමැතිකම ගන්න ගිහිල්ලා දැන් විපක්ෂ නායකකම බේරාගන්නයි, තමන්ගේ මන්ත්‍රීකම බේරාගන්නයි දඟලන හැටි දැක්කාම අපට සතුටු හිතෙනවා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කරන සටනට කොච්චර බලයක් තිබෙනවාද කියලා. අනෙක් පක්ෂ වාගේම, බොහෝ වෙලාවට අනෙක් නායකයෝ වාගේම, මේ රාජපක්ෂ කල්ලියත් හැමදාම වැඩිපුරම කටයුතු කළේ මේ ගොල්ලන්ගේ බල තණ්හාවටයි. ඒ නිසා කඩිමුඩියේ, කඩිකුලප්පුවෙන් තමයි තීන්දු ගන්නේ. පාර්ලිමේන්තුව විසුරුවා හැරලා රාජපක්ෂයි, මෛත්‍රීපාලයි හත්පොළේ ගා ගත්තා; 7: 0 වශයෙන් නන්නත්තාර වුණා. පාර්ලිමේන්තුව විසුරුවලා දවස් දෙකකට පස්සේ තකහනියේ ගිහිල්ලා පොහොට්ටුවේ සාමාජිකත්වය ගත්තා. දැන් මෙතැන බොහොම අසරණ වෙලා, බොහොම දුක හිතෙන විදියට ඥූම් පවම් ගානවා. දැන් ඉතින් බොහොම අඩවැඩියා දොඩනවා, "පොහොට්ටුවේ සාමාජිකත්වය ගත්තේ නැහැ, අරක ද මේක ද" කියලා. මේ, පල් බොරුකාරයෝ නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශපාලන වශයෙන් තමන්ට කොන්දක් තිබෙන්න ඕනෑ, "අපි සාමාජිකත්වය ගත්තා" කියලා කියන්න. මොකද, ඒවායේ ෆොටෝ ට්විටර්වල දාලා, රාජපක්ෂට කඩේ යන රාජ්‍ය මාධ්‍ය හා පෞද්ගලික මාධ්‍ය තුළින් කියලා, ඒ සියල්ලම කළා. මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාවට තිබිච්ච බලය ඔහුට කීකරු දේශපාලන මණ්ඩලයකට ගත්තාට පස්සේ තමයි ඔය රාජපක්ෂ මහත්තයලා, මහින්ද රාජපක්ෂ මහත්තයාත් එක්කම, ඊළඟ දවසේ පොහොට්ටුවේ සාමාජිකත්වය ගත්තේ. අරගෙන දැන් කියනවා, "සාමාජිකත්වය ගත්තේ නැහැ" කියලා. මේ වාගේ දේශපාලන වශයෙන් කොන්දක් නැති, පෞද්ගලික නාලිකා දෙක තුනක් තිබෙනවා, රාජපක්ෂගේ සාක්කුවේ ඉන්න. ඒවායේ තිබෙන්නේ ප්‍රවෘත්ති නොවෙයි. ඒවා රාජපක්ෂගේ වාහිනී. රාජ්‍ය නාලිකාත් එහෙම තමයි පසුගිය දවස් වෙනතුරු තිබුණේ. දැන් ඒවා යූඑන්පීයට හැරිලා තිබෙනවා. ඒවායින් පව කියලා මිනිසුන් ගොනාට අන්දන්න පුළුවන් කියලා හිතනවා. දැන් ඒ පවවාහිනීවලින්, රාජපක්ෂවාහිනීවලින් බොරු කියලා මිනිසුන්

අන්දන්න පුළුවන් කියලා හිතනවා. අපි ඔප්පු කරලා තිබෙනවා, ඒ පවවාහිනීවලට හා රාජපක්ෂවාහිනීවලට වඩා මේ රටේ social media බලවත්; මේ රටේ මිනිසුන්ගේ හෘදය සාක්ෂිය බලවත් බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනතාව ඉදිරියේ රාජපක්ෂත් එක්කම ඒ පවවාහිනීත් ඒ තත්ත්වයට පත් කර ගන්න පුළුවන් වෙච්ච එක ගැන අපි සතුටු වෙනවා.

විධායක ජනාධිපති ධුරය සම්බන්ධවත් කරුණක් දෙකක් කියන්න ඕනෑ, කෙටි වේලාවක් තිබෙන නිසා. ඒ වාගේම මේකත් කියන්න ඕනෑ. දැන් ජනාධිපතිවරයා එක්සත් ජාතික පක්ෂය යෝජනා කරන -ඒ ගොල්ලොත් දැන් මේ පැත්තෙන් සල්ලිවලට හෝ, තනතුරුවලට හෝ මන්ත්‍රීවරුන් අරගෙන රටේ තනතුරු දීලා ඇමති මණ්ඩලයක් හදාගන්න හදනවා.

ඒක අපට අදාළ ප්‍රශ්නයක් නොවෙයි. අපි කිව්වා, ඒ විකිණීම වැරැදියි කියලා. ඒ නිසා අපි දිගටම අපේ roadmap එකේ කිව්වා, පළමුව නීති මාර්ගයෙන් රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණකරුවන්ට දඬුවම් දිය යුතුයි; දෙවනුව විධායක ජනාධිපති ධුරය අහෝසි කළ යුතුයි; ඊළඟට එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුව හදන්නේත් මේ කුමන්ත්‍රණයේදී ඇමතිකම් දරපු, මේ තක්කඩි කණ්ඩායමම සල්ලිවලට හෝ තනතුරුවලට අරගෙන නිසා ඔවුන්ට දිගට මේ රට පාලනය කරන්න සදාචාර බලයක් නැති නිසා, මුල් කරුණු දෙක ඉෂ්ට කරලා මැතිවරණයකට යන්න කියලා. නමුත් දැන් පත්තරවල, මාධ්‍යවල ප්‍රචාරය වෙනවා අපට පෙනෙනවා, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා එතුමාගේ පක්ෂයේ ඉඳලා ගිය කට්ටියට ඇමතිකම් දෙන්නේ නැහැ කියලා කියනා බව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේකත් ජනාධිපති ධුරය සම්බන්ධ අලුත් තත්ත්වයක් කියලා මා හිතනවා. මේකේ තිබෙන්නේ අලුත් තත්ත්වයක් නොවෙයි; නපුරු තත්ත්වයක්. මොකක්ද, ඒ? දැන් මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ළඟට කවුරු හෝ එනවා නම්, -ඔහුගේ පැත්තට එනවා නම්, ඔහුගේ ළඟට එනවා නම්,- ඔහුට ඕනෑ කෙනෙකුට ඇමතිකම් දෙනවා. ඔහු ඕනෑ කෙනෙකුට ඇමතිකම් දෙනවා, එම පුද්ගලයා යූඑන්පී එකෙන් ආවත්, ටීඑන්ඒ එකෙන් ආවත්, ඒ ඕනෑ කෙනෙකු ඔහුගේ බලය වෙනුවෙන් නම් එන්නේ. එන්නේ ඔහුගේ බලය වෙනුවෙන් නොවෙයි නම්, ඔහු දෙන්නේ නැහැ. ඒක ගැන තමයි අපි අහන්නේ. අපට ප්‍රශ්නයක් නැහැ, කාට දුන්නත්, නැතත්. මොකද, කාට දුන්නත්, නැතත් රට වෙනස් වෙන්නේ නැහැ. නමුත් අපි අහන්නේ මේකයි. ජනාධිපතිවරයා ඔහුගේ දේශපාලනය වෙනුවෙන් තමයි ජනාධිපති තනතුර පාවිච්චි කරන්නේ. ඒක රාජපක්ෂලාත් කළා; මෛත්‍රීපාලලාත් කළා; ඊට කලින් කට්ටියත් කළා. ඒ නිසා ජනාධිපති ධුරය අහෝසි කරන්න ඕනෑ හේතු රාශියක් තිබෙනවා. ඒකයි මම අද ඒක මතු කරන්නේ. දවස් 50කට පසුව කුමන්ත්‍රණය පැරදිලා, පරද්දලා, තවම ඇමති මණ්ඩලය පත් කර ගන්න බැරුව ඉන්නවා. ඒක ජනාධිපතිගේ සහ යූඑන්පී එකේ ප්‍රශ්න තමයි. නමුත් අපි දකින ආකාරයට අනුව ජනාධිපතිවරයෙකුට තමන්ගේ තනතුර පාවිච්චි කරන්න තිබෙන්නේ ඔහුගේ පෞද්ගලික පැවැත්ම වෙනුවෙන් නොවෙයි; රට වෙනුවෙනුයි. නමුත් දැන් පවා අපට පෙනෙනවා, ඒක පාවිච්චි වෙමින් තිබෙන්නේ අනෙක් පැත්තට කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම මාතෘකාවටම අදාළව කථා කළොත් ඊළඟ කාරණය ලෙසට අපි ඔබතුමාට කියන්න කැමැතියි, මේ ජනාධිපති තනතුර අහෝසි කරන්නය කියලා අපි කියන්නේ ඇයි කියන එක. විශේෂයෙන්ම අපේ රටේ දෙමළ, මුස්ලිම් ජනතාවට මේ ජනාධිපති තනතුරෙන් තමන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරගන්න යම්කිසි විශේෂ හැකියාවක් එනවාය කියලා යම්කිසි මතයක් තිබෙනවා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ඉතිහාසය ඒකට සාක්ෂි දරන්නේ නැහැ. මට වේලාව නැති නිසා මම ඒ ගැන ඉතා සංක්ෂිප්තව කියන්නම්. ඔබතුමා දන්නවා, ජනාධිපතිවරයෙකු බලයට පත් කරන මැතිවරණයකදී දෙමළ හෝ මුස්ලිම් ජනතාවට හෝ යම් යම් ආගමික කණ්ඩායම්වලට යම් බලයක් එනවා, ඔහුට කේවල් කරන්න, "අපේ ඡන්ද ලක්ෂ දෙකක්, පහක්, දහයක් අපට තිබෙනවා, මේ ඡන්ද අපි ඔබතුමාට දෙනවා, ඔබතුමා මේ මේ දේවල් පොරොන්දු වෙන්න" කියලා. ඒ නිසා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගෙන් පසුව පත් වුණු හැම ජනාධිපතිවරයෙක්ම - ජේ.ආර්. ජයවර්ධන මහත්මයාත් වෙන්න පුළුවන්,- දිගටම දෙමළ, මුස්ලිම් ජනතාවට, විවිධ කණ්ඩායම්වලට පොරොන්දු දුන්නා. රාජපක්ෂත් දුන්නා; මෛත්‍රීපාලත් දුන්නා. ඒ ගොල්ලන් ඡන්ද කාලයේදී පොරොන්දු දුන්නා. විවිධ පොරොන්දු දෙනවා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, ජනාධිපතිවරයා බලයට පත් වුණාට පසුව මේ ලක්ෂ දෙකේ, පහේ, දහයේ කණ්ඩායම්වලට තබා තමන්ගේ පක්ෂයේ අයටවත් ඔහුට බලපෑම් කරන්න බැරි බව. මොකද, ජනාධිපතිවරයා පත් වුණාට පසුව ඔහු අවුරුදු පහකට කෙළින්ම පත් වෙලා ඉවරයි. ඉතාම දුෂ්කර ව්‍යායාමයක් තමයි, දෝෂාභියෝගය කියලා තිබෙන්නේත්. දෙමළ, මුස්ලිම් පක්ෂ හෝ වෙනත් කණ්ඩායම් හෝ -සිංහල වෙන්නත් පුළුවන්, ආගමික කණ්ඩායම් වෙන්නත් පුළුවන්,- හිතනවා නම්, තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ජනාධිපතිවරයාට බලපෑම් කරන්න පුළුවන් කියලා, ඉතිහාසයේ ඒක වෙලා නැහැ. ඒ නිසා තමයි ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයා මුස්ලිම් ජනතාවගේ විරෝධතාව මැද ජනාධිපති බලතලත්, හදිසි නීතියත් පාවිච්චි කරලා උතුර සහ නැඟෙනහිර ඈඳුවේ.

ඒ වෙලාවේ මුස්ලිම් ජනතාව විරුද්ධ වුණා. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නිර්මාණය වීමේ දේශපාලන පදනම ඒකයි. මේ රටේ ජනාධිපතිවරු ඊට පස්සේ අවුරුදු 26ක් මුස්ලිම් ජනතාව කියන දේ ඇහුවේ නැහැ. ඡන්ද කාලෙදී එක එක දේවල් පොරොන්දු වුණාට ඒවා ඉටු කළේ නැහැ. සිංහල සහ මුස්ලිම් ජනතාවගේ එකඟතාව නැතිව තමයි උතුරු සහ නැඟෙනහිර ඈඳුවේ. මොකද, ජනාධිපතිවරයාට බලපෑම් කරන්න පුළුවන් ඡන්දයකදී විතරයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතුමා බලයට පත් වුණාට පස්සේ බලපෑම් කරන්න බැහැ. දැන් බලන්න, ලංකා ඉතිහාසයේ දුර්වලම, නන්නත්තාරම ජනාධිපතිවරයා හැටියට මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ඉන්නවා. පාර්ලිමේන්තු බලයත් නැහැ, ඡන්ද පදනමත් නැහැ. පාර්ලිමේන්තුවේ බලයකුත් නැහැ, ඡන්ද පදනමකුත් නැහැ. හැබැයි ඔබතුමා බලන්න, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන බලය නිසා, ඒ බලයට ආරූඪ කරගෙන තිබෙන, තිබෙනවාය කියන බලය නිසා කොතරම් විනාශයක් ඔහුට තමන්ගේ දේශපාලන පැවැත්ම වෙනුවෙන් කරන්න පුළුවන් ද කියලා. ඒ නිසා අපි කියන්නේ, ඡන්ද කාලයකදී කරන්න පුළුවන් බලපෑම පමණයි තිබෙන්නේ; ඡන්දයෙන් පස්සේ කිසිම පොරොන්දුවක් ඉටු කරගන්න කුඩා දේශපාලන කණ්ඩායම්වලට තියා අදාළ පක්ෂයටවත් බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කියන්නේ ඒකයි.

අගමැති ක්‍රමයක් යටතේ,-අගමැතිකමේ ඉන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයා ද, වෙන කෙනෙක් ද කියන එක අපට අදාළ නැහැ- අගමැතිවරයාට මොකක්ද වෙන්නේ? අගමැතිවරයෙක් දිනපතා පාර්ලිමේන්තුවේ 113 තියාගන්න ඕනෑ. දිනපතා එතුමා 113 maintain කරන්න ඕනෑ. 1977ට කලින් නම් ඡන්ද ක්‍රමයේ වෙනස විතරක් නොවෙයි, ඒ කාලයේ ගොඩාක් දුරට තිබුණේ මේ පක්ෂ දෙකේ බලය පමණයි. මොකද, නිදහසින් පස්සේ මේ පක්ෂ දෙක තමයි අපේ රටේ පාලනය ගත්තේ. ඒ නිසා මේ පක්ෂ දෙකට රට හදන්න බැහැ කියලා තේරුම් ගන්න මිනිස්සුන්ට යම්කිසි කාලයක් ගියා. ඒ නිසා 1977 විතර වෙනකම්, ඡන්දයක් තිබ්බාම ශ්‍රී ලංකා - UNP කියන පක්ෂ දෙකෙන් එකකට සාමාන්‍යයෙන්

[ගරු බිමල් රත්නායක මහතා]

බහුතරය ආවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1994න් පස්සේ 2010 ඇරුණාම මේ පක්ෂ දෙකින් එකකටවත් බහුතර ඡන්දයක් ලැබිලා නැහැ කියලා ඔබතුමා දන්නවා. මොකද, ඡන්ද ක්‍රමය ගැන කියන්න පුළුවන්. ඇත්තටම ඡන්ද ක්‍රමයෙන් මන්ත්‍රීවරු වැඩි කරගන්න වාසියක් තිබෙන්නේ. හේතුව තමයි, මේ පක්ෂ දෙකෙන් ජනතාව ඈත් වීම. මට එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු වාගේම ඔළුවක් තිබෙන, කථා කරන්න පුළුවන් පොහොට්ටුවේ සමහර මන්ත්‍රීවරුත් කියලා තිබෙනවා, "ඉස්සර වාගේ තාත්තාගෙන් පුතාට UNP වෙන්නේ නැහැ. තාත්තාගෙන් පුතාට ශ්‍රී ලංකා වෙන්නේ නැහැ." කියලා. එහෙම නම් අද මොන ඡන්ද ක්‍රමය තිබුණත්, 1989ට කලින් වාගේ මේ පක්ෂ දෙකට බහුතරයක් එන්නේ නැහැ. ඒක ඉන්දියාවේ වාගේ දේශපාලන යථාර්ථයක්. අද ඉන්දියාවේත් ඒ පක්ෂ දෙකට බහුතර බලයක් එන්නේ නැහැ. එකතු වෙලා සන්ධානවලින් තමයි බලය හදාගෙන තිබෙන්නේ. ඒක තමයි දේශපාලනයේ අනාගතයත්, දේශපාලනයේ යථාර්ථයත්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අගමැති ක්‍රමයක් යටතේ මොන පක්ෂය බලයට පත් වුණත්, අනිවාර්ය වශයෙන්ම ඒ පක්ෂයට වෙනත් දේශපාලන කණ්ඩායම්වල සහයෝගය ගන්නම වෙනවා. අන්න ඒ නිසා ඒ අගමැතිවරයාට සිද්ධ වෙනවා, කවුරු වුණත් ඇහුම්කන් දෙන්න; තමන්ගේ පක්ෂයට ඇහුම්කන් දෙන්න. අපි හොඳටම දැක්කා නේ, රනිල් වික්‍රමසිංහ මහත්තයා පසු ගිය කාලයේ පුම්බාගෙන හිටියා. එක්සත් ජාතික පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරුන්වත් ගණන් ගත්තේ නැහැ. පසු පෙළ මන්ත්‍රීවරුන්වත් ගණන් ගන්නේ නැතුවයි හිටියේ. හැබැයි, මෛත්‍රීපාල මහත්තයා වැරැදියට හරි අගමැතිකමෙන් අයින් කළාට පස්සේ කොහොමද? අපට මේ Lobby එකේදී පෙනෙනවා, අම්මෝ! එක්සත් ජාතික පක්ෂයේ පසු පෙළ මන්ත්‍රීවරුන් එක්කත් කථා කරනවා; හිනා වෙනවා. අඩු ගණනේ ඒ experience එක දුන්නාට මෛත්‍රීපාල සිරිසේන මහත්තයාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මන්ත්‍රීවරුන් 113 නැති වුණාම හරියට පොළවට එනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම නම් කියන්නේ ව්‍යවස්ථාවට දාන්න ඕනෑ, මොන තත්ත්වය යටතේ හරි අවුරුද්දකට සැරයක් සියලු ඇමතිවරු මාසයකට මන්ත්‍රීවරු බවට පත් කරන්න ඕනෑ කියලා. Refresh කරලා ගන්න ඕනෑ. පොළවට ගෙනැල්ලා තියලා ගන්න ඕනෑ. දැන් බලන්න, මෛත්‍රීපාල සිරිසේන මහත්මයා. මම කියන්නේ ජනාධිපති තනතුරත් එහෙම කරන්න ඕනෑය කියලායි; මාසයකට මන්ත්‍රී කරන්න ඕනෑ. සාමාන්‍ය පවුල්වලින් ආපු මන්ත්‍රීවරු, බලන්නකෝ, ඇමති වුණාම. අං නොවෙයි, අං තට්ටු එනවා. ජනාධිපති වුණාම අං යායක් එනවා. සිරිසේන මහත්තයා හිතාගෙන ඉන්නේ එයා බකින්හැම් පැලස් එකේ ඉපදිච්ච කෙනෙක් කියලා. ඇත්තටම මේක ව්‍යවස්ථාවට දාන්න ඕනෑ. හැම අවුරුද්දකටම සැරයක් ඔක්කෝම තනතුරු අත් හැරලා පොළවට ගේන්න ඕනෑ. ඒ නිසා අගමැතිවරයෙකුට ඇහුම් කන් දෙන්න සිද්ධ වෙනවා. රනිල් වික්‍රමසිංහ මහත්තයා ගොඩක් උඩඟු පුද්ගලයෙක් කියලා එක්සත් ජාතික පක්ෂය අතරම මතයක් තිබෙනවා. එයාටත් 113 හදා ගන්න දේශපාලන හේතු මත උඩඟුකම වුට්ටක් අඩු කරගන්න වෙලා තිබෙනවා නම්, මොන පක්ෂයෙන් හරි කෙනෙක් අගමැතිකමට ගියොත් අනිවාර්යයෙන්ම 113 වෙනුවෙන් උඩඟුකම අඩු කර ගන්න වෙනවා. උඩඟුකමට වඩා වැදගත් වෙන්නේ මොකක්ද? ජනවරමට සියයට 20කට, 30කටවත් වග කියන්න සිද්ධ වෙනවා.

දෙමළ, මුස්ලිම් පක්ෂවල මන්ත්‍රීතුමන්ලා හිතනවා, ඡන්ද කාලයකදී ජනාධිපතිවරයකුට කරන්න පුළුවන් බලපෑමෙන් තමන්ගේ අයිතිවාසිකම් ඉටු කර ගන්න පුළුවන් කියලා. ඒක බැරි බව ඔබතුමන්ලාට පෙනෙන්න ඕනෑ, පසු ගිය කාලයේදී. පසු ගිය කාලයේ දිගටම සිද්ධ වුණේ මොකක්ද? දෙමළ ජනතාවගේ අවශ්‍යතාවන්, වුවමනාවන් කැරට් අලයක් වාගේ ජනාධිපතිවරු පාවිච්චි කළා. මුස්ලිම් ජනතාවගේ අවශ්‍යතාවන් කැරට් අලයක් වාගේ පාවිච්චි කළා. ඒ ඔක්කෝම අස්සේ බේරුවලදී මුස්ලිම් ජනතාවට ගහනවා. දිගනදී මුස්ලිම් ජනතාවට ගස්සවනවා. ඒ නිසා අපි කියන්නේ ඒකයි. දෙමළ, මුස්ලිම් පක්ෂවල සමහර මන්ත්‍රීවරුන්ට, නායකයන්ට ඇමතිකම් ගන්න නම් ජනාධිපති ක්‍රමය හොඳයි තමයි. ඇමතිකම් ගන්න හොඳයි. නමුත් ඒ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂාවේදී ඒක සිද්ධ වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඒකයි කියන්නේ ජනාධිපති ධුරය ජනතාවට වග කියන්නේ නැති එකක් කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දන්නවා, ඔබතුමා කරන්න හදන්නේ මගේ වෙලාව ඉවරයි කියන්න බව. අවසාන වශයෙන් මා කියන්නේ මේකයි. ජනාධිපති ධුරය, පක්ෂවල අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයත් විනාශ කරනවා. මට වෙලාව නැති නිසා මා සූදානම් වෙලා ආ ටික කියන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, ජේ.ආර්. ජයවර්ධනගේ සිට එක්සත් ජාතික පක්ෂය පාලනය කළේ පක්ෂයේ ව්‍යවස්ථාවෙන් නොව, රටේ ව්‍යවස්ථාවෙන් බව. "යූඑන්පී" එකේ ව්‍යවස්ථාවෙන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ව්‍යවස්ථාවෙන් නොව, ජනාධිපතිට තිබෙන බලයෙන් තමයි පක්ෂ පාලනය කළේ. ප්‍රේමදාස මහත්මයාගේ යුගයේදී එතුමා විධායක බලතල පාවිච්චි කළා පක්ෂයට. ඒ නිසා එතුමාගේ පක්ෂයේ සිටි නායකයෝ ගොඩක් කැඩී ගියා. එක්සත් ජාතික පක්ෂය අදත් දුර්වල වී තිබෙන්න එක හේතුවක් වන්නේ මොකක්ද? ඒ, විධායක බලතලයි. විධායක බලතලවලින් පක්ෂයේ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය විනාශ වුණා. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය සීසීකඩ ගියා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට දැන් මොකක්ද වෙමින් තිබෙන්නේ? එය රාජපක්ෂ එක්ක මැරෙන පක්ෂයක් බවට පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයට අද වෙලා තිබෙන්නේ මොකක්ද කියා මා ඔබතුමාට කියන්නම්. තමන්ට බලයේ ඉන්න ඕනෑකමට අවුරුදු 50කදී පාවිච්චි කරන්න තිබෙන දේශපාලන උපක්‍රම, සටකපටකම්, ප්‍රජාතන්ත්‍ර විරෝධි ක්‍රියා මාර්ග ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා අවුරුදු 6කදී පාවිච්චි කළා. එතුමා මැතිවරණ කල් දැම්මා; සිරිමාවෝ මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කළා; යාපනයේ ඡන්ද මං කොල්ල කෑවා; ජනමත විචාරණ මං කොල්ල කෑවා; තමන්ගේ බලය වෙනුවෙන්ම ව්‍යවස්ථා සංශෝධන ගෙනාවා; 1983 කළු ජූලිය ඇති කළා; අපේ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය ඇතුළු පක්ෂ තහනම් කළා. ඒවා ඔක්කෝම කළා. ඒවා ඔක්කෝම කළේ මොකටද? එතුමාට බලයේ ඉන්නයි ඒවා කළේ. අවුරුදු 50කදී පාවිච්චි කරන්න තිබූ දේශපාලන කුමන්ත්‍රණ, සටකපටකම්, උපාය උපක්‍රම එතුමා අවුරුදු 12කදී පාවිච්චි කළා. අපි එකඟ නැහැ, අවුරුදු 50කදී හෝ ඒවා පාවිච්චි කරනවාට. අදත් එක්සත් ජාතික පක්ෂයට නැඟිටින්න බැරි ඒකයි. ගෝල් ෆේස් පිටියට සෙනඟ ආවාට හිතන්න එපා, ජන මතය වෙනස් වෙලා කියා. අපි විනිශ්චයකාරවරුන් ගැන කතා කරන කොට, එක්සත් ජාතික පක්ෂය ශ්‍රේෂ්ඨාධිකරණයට සැලකුවේ කොහොමද කියන එක ගැන කියන්න ගොඩක් කරුණු තිබෙනවා. අද රාජපක්ෂලා, මෛත්‍රීපාලලා කරමින් ඉන්නේ මොකක්ද? අද මෛත්‍රීපාලට ජනාධිපතිකමේ ඉන්න, රාජපක්ෂට අගමැති වෙලා ජනාධිපති වෙන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අවුරුදු 50ක් තිස්සේ පාවිච්චි කරන්න තිබෙන උපක්‍රම ඔක්කෝම පාවිච්චි කරනවා. ඒ නිසා අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය -රාජපක්ෂ පිල- දුර්දාන්ත, ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම කිසිවක් අදාළ නැති, ජාතිවාදයයි, ගෝත්‍රවාදයයි, තිබෙන තරම් ඔක්කෝම අවුරුදු 2,000ක් විතර පරණ කුණු කන්දලුයි කර ගහගත් දූෂිත දේශපාලන තක්කඩි රැළකගේ පක්ෂයක් බවට -කලින් කී එකට සාපේක්ෂව වැඩි වශයෙන්- පත් වී තිබෙනවා. ඒ මොකටද, ගරු නියෝජ්‍ය

කථානායකතුමනි? මේ විධායක බලතල පාවිච්චි කරන්නේ, රටේ ඕනෑකමටත් නොවෙයි, පක්ෂයේ ඕනෑකමටත් නොවෙයි. පක්ෂ අභ්‍යන්තරයේ ප්‍රජාතන්ත්‍රවාදයත් විනාශ කරමින් තමන්ගේ තනතුර රැක ගැනීම වෙනුවෙන් තමයි ඒ තනතුර පාවිච්චි කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කතාව අවසාන කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි.

අපි ඒකයි කියන්නේ, විධායක ජනාධිපති ධුරයෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය හැකිළෙනවා පමණක් නොවෙයි පක්ෂවල ප්‍රජාතන්ත්‍රවාදයත් හැකිළෙනවා කියලා. දේශපාලන පක්ෂ කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ කොටසක්; දේශපාලන පක්ෂ ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයේ කොටසක්. ඒ නිසා දේශපාලන පක්ෂ හරියාකාරව තිබෙන්න ඕනෑ, ඒවායේ ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙන්න ඕනෑ. එවායේ සාකච්ඡා, සංවාදවලට ඉඩ තියෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා තමයි අපි කියන්නේ මේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම රටට පමණක් නොවෙයි, ඔබතුමන්ලාගේ පක්ෂවලටත් වැදගත් කියලා.

මේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමට ජනවරම් රාශියක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න. මම දැක්කා රනිල් වික්‍රමසිංහ මහත්මයා රැස්වීමකදී කියනවා, "අපට තුනෙන් දෙකේ බලය දෙන්න, ඉන් පසුව විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නම්" කියලා. නමුත් තුනෙන් දෙකක බලයක් එතුමන්ලාට ලැබෙන්නේ නැහැ. ඒක මතක තියාගන්න. තුනෙන් දෙකක බලයක් ලැබෙන්නේ නැහැ. අනෙක් කාරණය තමයි, මැතිවරණයකදී ඔබතුමන්ලාට තුනෙන් දෙකක බලයක් ගන්නත් බැහැ, මොන grand alliance හැදුවත්. ඒ වාගේම අපි කියන්න කැමැතියි, ඔබතුමන්ලා මැතිවරණ කරන්න හදන්නේ නැවත වතාවක් විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවා කියන ඒ බොරු පොරොන්දුව ඉදිරිපත් කරලා නම්, මතක තියා ගන්න ජන බලය ගැන. මතක තියාගන්න මේ කෙටි කාලය ඇතුළතදී රාජපක්ෂලා, මෛත්‍රීපාලලා ගෙදර යවපු ජන බලය ගැන. ඒ නිසා අපි ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා, මේ විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න කියලා. අවශ්‍ය නම් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ වෙනස්කම් කරලා, - අපට ඒ ගැන විවාදයක්, සැකයක් නැහැ- විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න. අපි කියන්නේ මෛත්‍රීපාල සිරිසේන ජනවාරි 08වෙනි දා වෙනකම් තියාගන්න ඕනෑත් නැහැ, හෙටම විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න ඕනෑ කියලායි. මොකද, මැතිවරණයක් තියන්න බැහැ නේ. මොන මැතිවරණයක් තිබ්බත්, කවුරු පත් වුණත්, මෛත්‍රීපාල කැමැති අයට තමයි ඇමතිකම් දෙන්නේ. ඒ නිසා

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දේශපාලන කැදරකම හැරෙන්න වෙන කිසිවක් නැති පාලකයෙක් එක්ක මැතිවරණ තියලා වැඩක් නැහැ. මොන මැතිවරණයක්වත් තියලා වැඩක් නැහැ, මෙයා ගෙදර යවන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හදද්දී අපි වගන්තියක් දැම්මා, මේක ක්‍රියාත්මක වෙන්න ඕනෑ ජනවාරි 08න් පසුව කියලා. දැන් අපි යෝජනා කරනවා ජනවාරි 08 නොවෙයි, ජනමත විචාරණය සම්මත වුණු දවසේම මෛත්‍රීපාලගේ ජනාධිපතිකම අහෝසි වෙන්න ඕනෑ කියලා. ඒක සම්මත වෙලා ඉතාම කෙටි කාලයකින් පාර්ලිමේන්තු මහ ඡන්දයකට යන්නට ඕනෑ. අපට අවශ්‍ය නැහැ රනිල් වික්‍රමසිංහ මහත්මයාට අගමැතිකමේ දිගටම ඉන්න අවස්ථාව දෙන්න. මෙන්න මේ ස්ථාවරය මත විධායක ජනාධිපති ක්‍රමය රටටත්, ඔබතුමන්ලාගේ පක්ෂවලටත් පිළිලයක් කියන එක පිළිගෙන කරුණාකරලා රට වෙනුවෙන් මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ කටයුත්තට ඉදිරිපත් වෙන්න කියන ඉල්ලීම මේ මුළු පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරුන්ගෙන් කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.19]

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විධායක ජනාධිපති ක්‍රමයේ අහිතකර ප්‍රතිඵල සහ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණ විසින් ඉදිරිපත් කරනු ලැබූ සභාව කල් තැබීමේ යෝජනාව ගැන මේ අවස්ථාවේදී අදහස් දැක්වීමට ලැබීම ගැන මාත් සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධායක ජනාධිපති ක්‍රමයේ හොඳ පැති වාගේම නරක පැතිත් තිබෙනවා. පසුගිය කාලයේම අපි මේ විධායක ජනාධිපති ක්‍රමයේ නරක දේවලට ගොදුරු වුණා. අපි 2001 - 2004 කාලයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට කටයුතු කරද්දී මේ විධායක ජනාධිපති ධුරය කටයුතු කළ ආකාරය අපට මතකයි. ඇන්.ඇම්. පෙරේරා මහතා මේ විධායක ජනාධිපති ක්‍රමය ඇති කරන වෙලාවේ අහලා තිබෙනවා, "මේ තනතුර පිස්සෙකුට හම්බවුණොත් මොකද වෙන්නේ?" කියලා. විධායක ජනාධිපතිතුමාගේ ඔළුව එහෙම අප්සෙට් ගියොත් මොකද වෙන්නේ? මේ ගැන සැකයක් හිතලා,"අපේ ජනාධිපතිතුමාගේත් මොළය පරීක්ෂා කරන්න ඕනෑ" කියලා පසුගිය දවස්වල උසාවියට පෙත්සමක් ඉදිරිපත් කර තිබුණා අපි දැක්කා.

2001 දෙසැම්බර් මාසයේ 19 වැනි දා සිට අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට කටයුතු කළා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය විධායක ජනාධිපතිකම අහෝසි කරන්නයි එදාත් බලයට ආවේ. ඒ වෙලාවේ එතුමිය විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කිව්වාට පස්සේ, ජනතා විමුක්ති පෙරමුණේ අපේක්ෂකතුමා ඉල්ලා අස් වුණු බව මට මතකයි. හැබැයි, එතුමිය ඒ වෙලාවේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළේ නැහැ. එතුමිය මේ රටේ තිබුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අවස්ථා ගණනාවකදී උල්ලංඝනය කළා.

එතුමිය ජනාධිපති හැටියට කටයුතු කරනකොට, 1995 අවුරුද්දේ මම උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක්. එතුමිය විධායක ජනාධිපති බලය පාවිච්චි කරලා හිටපු ගමන් තව අවුරුදු

[ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා]

දෙකකට වැඩි කාලයක් තිබුණු උතුරු මැද පළාත් සභාව විසුරුවා හැරියා. අපේ චන්දිම ගමගේ ගරු මන්ත්‍රීතුමාගේ පියතුමා වන එවකට මහ ඇමති වශයෙන් හිටපු, ජී.ඩී. මහින්දසෝම මැතිතුමා උසාවියට ගිහිල්ලා ඒකට විරුද්ධව නියෝගයක් ගත් නිසා අපි පළාත් සභාවේ නැවත වාඩි වුණා. ඒ එද්දී අපේ හිටපු මහ ඇමතිතුමා, ජී.ඩී. මහින්දසෝම මැතිතුමා අනතුරකට ලක් වෙලා දිවංගත වුණා. ඒ වෙලාවේත් චන්ද්‍රිකා මැතිනියට උපදෙස් දුන්නේ අපේ මහා ගත්කරු, ලොකු නීති විශාරද ජී.එල්. පීරිස් මැතිතුමා තමයි. එතුමා තමයි මේ වතාවේ මහින්ද රාජපක්ෂ මහත්මයාටත්, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත් උපදෙස් දුන්නේ. ජී.එල්. පීරිස් මැතිතුමා තමයි එදා චන්ද්‍රිකා මැතිනියටත් උපදෙස් දුන්නේ. නමුත්, අපි උසාවි ගිහිල්ලා නැවතත් පළාත් සභාව සක්‍රිය කරගෙන ඉදිරියට ගියා.

ඒ පළාත් සභා කාලය අවසන් වුණාට පස්සේ, පළාත් සභාව වෙනුවෙන් නාමයෝජනා භාර දුන්නාට පස්සේ චන්ද්‍රිකා මැතිනිය මේ විධායක බලතල පාවිච්චි කරමින් මැතිවරණ පවත්වන්නේ නැතිව කල් දැම්මා. මේ තමයි මේ විධායක බලතලවල තිබෙන අහිතකර පැත්ත. පළාත් සභාවට නාම යෝජනා භාර අරගෙනත් මැතිවරණය කල් දැම්මා. අපි උද්ඝෝෂණ කළාට පස්සේ එතුමිය පළාත් සභා හතරක මැතිවරණ පැවැත්වුවා. මට මතක විධියට ඒ පළාත් සභා හතරේ මැතිවරණ තිබුණේ 1999 අප්‍රේල් මාසයේ 06 වැනි දා වාගේ දවසකයි. උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් මාත් තේරී පත් වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මන්ත්‍රී ධුර 120කට වැඩි ප්‍රමාණයක් තිබියදී, ඒ විධායක ජනාධිපතිතුමිය අප මහ පාරට ඇදලා දැම්මා. පසුව අපි පාර්ලිමේන්තු ඡන්දයෙන් පාර්ලිමේන්තුවට පත්වෙලා ආවා. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැතිවරයා හැටියට අවුරුදු දෙකයි මාස තුනක් කටයුතු කරමින් ඉන්න කොට, චන්ද්‍රිකා මැතිනිය විධායක බලය පාවිච්චි කරලා, හිටපු ගමන් අමාත්‍යාංශ කිහිපයක් පවරා ගෙන , මට මතක හැටියට 2004 පෙබරවාරි මාසයේ 07වැනි දා මධ්‍යම රාත්‍රියේ පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. ඒ, විධායක ජනාධිපතිකමේ බලය පාවිච්චි කළ තවත් අවස්ථාවක්.

මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා අතට විධායක බලය ගියාට පස්සේ එතුමා විධායක ජනාධිපති බලය කොහොමද පාවිච්චි කළේ කියලා අපි දැක්කා. විමල් වීරවංශලා වාගේ අට පාස් නැති අය එදා විශේෂ කාරක සභාවකට පත් කරලා, අවුරුදු දහයකට වැඩි කාලයක් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරියක හැටියට ශ්‍රේෂ්ඨ කටයුත්තක් කළ අග්‍රවිනිශ්චයකාරතුමිය කනෙන් අල්ලා එළියට දැම්මා.

ඒකට හේතු වුණේත් විධායක ජනාධිපති ක්‍රමයයි. ඒ වෙලාවේ පාර්ලිමේන්තුවේ ඒ විශේෂ කාරක සභාවෙන් ඒ තීන්දුව ගත්තා. මේ රටේ ජනතාවගේ ඡන්දයෙන් 225 දෙනකු තේරීපත් වෙලා පාර්ලිමේන්තුවට ආවාට පස්සේ, ඒ 225දෙනාගෙන් විමසන්නේ නැතිව තනි පුද්ගලයකු කටයුතු කරනවා නම් මම හිතනවා මේ විධායක බලයේ තිබෙන යම් යම් අහිතකර දේවල් ඉවත් කළ යුතුයි කියලා. මේක මේ රටට අහිතකර තත්ත්වයක් හැටියට අපි දකිනවා. අපි පසුපෙළ මන්ත්‍රීවරු. ජාතික මට්ටමේ ඉන්න අයට මේ අමාරුව දැනෙන්නේ නැහැ. ගම්වලින් ඇවිල්ලා ඉන්න පසුපෙළ මන්ත්‍රීවරුන්ටයි මේ අමාරුව දැනෙන්නේ. ඒ අවස්ථාවේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විධායක බලය පාවිච්චි කරපු හැටි අපි නැවත වතාවක් දැක්කා. එතුමාට ඕනෑ විධියට තීන්දු ගත්තා. රජයේ දේපොළ ඕනෑ විධියට වික්කා. හිටපු ගමන් ආරක්ෂක අමාත්‍යාංශය තිබුණු ස්ථානය විකුණා දැම්මා. කැබිනට් එකට කරුණු ඉදිරිපත් නොකර සතියක් යන කොට විකුණා දැම්මා. එතුමා චීනයත් එක්ක ගිවිසුමක් අත්සන් කරලා පෝර්ට් සිටි ව්‍යාපෘතිය සින්නක්කර අයිතියට දෙන්න කටයුතු කළා. ඒ වාගේම ෂැංග්‍රි-ලා හෝටලයට ඉඩම් දුන්නා. එතුමාට හිතෙන හිතෙන දේවල් මේ රටේ කළා. අපට ඒවා අමතක නැහැ.

ඊට පස්සේ අපි අපේ ජනාධිපතිතුමා -මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා- පත් කර ගත්තා. එතුමාගේ සටන් පාඨය වුණේ මොකක්ද? එතුමා කිව්වා, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන කොට ජනාධිපති ධුරය අවුරුදු හතරකට සීමා කළ යුතුයි කියලා මම නීති විශාරදයින්ට කිව්වා. හැබැයි, අවුරුදු හයක් කියන එක අවුරුදු හතරක් නොවෙයි, අවුරුදු පහක්වත් තිබිය යුතුයි කියලා ඒ ගොල්ලන් බල කරලා කිව්වාම මම ඒකට අකැමැත්තෙන් කැමැති වුණා" කියලා. එහෙම කියපු ජනාධිපතිතුමා දිවුරුම් දීලා කිව්වා, "මම ආයේ ජනාධිපති වරණයට තරග කරන්නේ නැහැ, මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා" කියලා.

2015 අවුරුද්දේ ගෙනාපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේදී පාර්ලිමේන්තුවේ 215කට වැඩි පිරිසක් බොහොම හොඳට ඒකට සහයෝගය දුන්නා. ජනාධිපතිවරයාගේ කටින්ම කිව්වා ඒකට සහාය ගන්න එතුමා මේ පාර්ලිමේන්තුවේ හිටපු 225 දෙනා ළඟටම ගියා; කෑම කන තැනට ගියා; washroom එකට ගියා; library එකට ගියා; මන්ත්‍රීවරුන් එක ළඟට ගියා; පිටට අත තිබ්බා, කථා කළා කියලා. එහෙම කථා කරලා මේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට සහාය ගත්තා. විධායක ජනාධිපතිවරයාට තිබෙන බලය අයින් කිරීමේ කරුණු රාශියක් ගෙනාවා දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්. නමුත්, මොකද වුණේ? එතුමා එහි තිබෙන සියලු කරුණු හොඳින් දැනගෙනත්, අවසානයේ ඔක්තෝබර් මාසයේ 26 වෙනි දා අපේ අගමැතිතුමාගේ අගමැති ධුරය හොරෙන්ම ගත්තා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවාය කියපු මේ නායකයා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා මෙහි තිබෙන දේවල් හොඳින් දැනගෙන තිබියදීත්, එතුමා අමුතුම බලයක් ආරූඪ කර ගෙනයි ඉන්නේ. එතුමාට හිතෙන හිතෙන දේවල් එතුමා කළා. ගැසට් නිවේදන හතරක් ද පහක් ද නිකුත් කළා. පාර්ලිමේන්තුවේ වෙන අග්‍රාමාත්‍යවරයෙක් පත් කළා. ඇමති මණ්ඩලයක් දිවුරුම් දුන්නා. මෙන්න, පාර්ලිමේන්තුව විසුරුවන්න ගැසට් එක ලියන ගමන් ඇමතිවරු දිවුරුම් දෙනවා. මොකක්ද මේ? හැබැයි, උත්තරීතර අධිකරණයට පින් සිද්ධ වන්න මේ රටට සාධාරණය ඉෂ්ට වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දැන් ජනාධිපතිවරයා කියනවා, "මම අරයාට දෙන්නේ නැහැ, මෙයාට දෙන්නේ නැහැ, මෙයා ආවොත් දෙන්නේ නැහැ, අර පැත්තෙන් කණ්ඩායමක් ආවොත් දෙන්නේ නැහැ"යි කියලා. එහෙම කොහේද තිබෙන්නේ? ඒක තමයි අර ඇන්.ඇම්. පෙරේරා මහත්මයා කියලා තිබුණේ, "මේ විධායක ජනාධිපති ධුරය පිස්සෙක් අතට ගියොත් මොකද වෙන්නේ?" කියලා. මට හිතෙන විධියට දැන් ඒක සනාථ වෙලා තිබෙනවා.

ජනාධිපතිවරයෙකුට මේ දේවල් සම්බන්ධයෙන් එහෙම තීන්දු ගන්න බැහැ. කලින් සිටි විධායක ජනාධිපතිවරයා නොවෙයි දැන් ඉන්නේ. දැන් විධායකයේ යම් යම් දේවල් අහෝසි කරලා තිබෙන්නේ. නමුත්, තවමත් මීට පෙර තිබුණු විධායකය කියන එක මේ නායකයින් ආරූඪ කර ගන්නවා. මම ඉල්ලනවා, අපේ ශබ්ද කෝෂයෙන්ම 'විධායකය' කියන එක අහෝසි කරන්න ඕනෑය කියලා. 'විධායක ජනාධිපති' නොවෙයි, 'ජනාධිපති'. 'විධායක' කියන කෑල්ල කපලාම දමන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය වාගේ දේවල්වලින් විධායක ජනාධිපති ධුරයේ තිබුණු යම් යම් බලතල ඉවත් කළත්, විධායකය කියන එක මතක් කරන කොට මේ නායකයින්ට අමුතු දෙයක් ආරූඪ වනවා. එම නිසා මේ 'විධායක' කියන එක අහෝසි කරලා ජනාධිපති කියන එක නාම මාත්‍රික විතරක් තිබුණා නම් හොඳයි කියලා මම හිතනවා. මොකද, පසුපෙළ මන්ත්‍රීවරුන් හැටියට මෙහිදී අපි තමයි අපහසුතාවට පත් වුණේ. අපි මේ වතාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හැටියට පත් වෙලා ආවේ මේ ජනාධිපති ගැන විශ්වාසය තබාගෙනයි. අපේ ජීවිත පරිත්‍යාග කිරීමට පවා සූදානම්ව සියලු කැපවීම් කරලායි අපි මේ ජනාධිපතිවරයා බලයට පත් කළේ . අපට මතකයි, වෙන මැතිවරණවලදී වාගේ නොවෙයි, පසුගිය ජනාධිපතිවරණය පැවැත් වුණු කාලයේදී අපේ නායකතුමා දිනපතා අපට දුරකථන ඇමතුම් දීලා අපෙන් අහනවා, "අද මොකද කරන්නේ? අද සංවිධාන කටයුතු කොහොමද? රැස්වීම් කීයක් තිබුණාද?" කියලා. මේ විධියට තමයි මේ ජනාධිපතිවරයා මේ පුටුවේ වාඩි කරවන්න අපි කටයුතු කළේ.

අද එතුමාට බොරු ලණු දෙන මහින්ද රාජපක්ෂ මහත්මයා ප්‍රමුඛ ඒ කණ්ඩායම එදා හිටියේ නැහැ. එදා එතුමා බේරා ගන්න සිටියේ අපි. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවාය කියපු ජනාධිපතිවරයා, එදා ඇන්.ඇම්. පෙරේරා මැතිතුමා කියපු විධියට තමයි අද හැසිරෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපේ හුඟක් අය පසු පෙළ මන්ත්‍රීවරු. පාර්ලිමේන්තුවේ කොච්චර මන්ත්‍රී ධුර තිබුණත් වැඩක් නැහැ. මේ රටේ 113කට වැඩි බහුතරයක් තිබියදී තමයි එතුමා අපව තවත් අපහසුතාවට පත් කළේ. අපේ බහුතරය පැත්තකට දැම්මා; අපේ මතය පැත්තකට දැම්මා; කථානායකතුමාගේ තීන්දු තීරණ පැත්තකට දැම්මා. උත්තරීතර අධිකරණයට පින්සිද්ධ වෙන්න තමයි අද අපි මෙතැන කථා කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අවසාන කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා**
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ජනතා විමුක්ති පෙරමුණ මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් මම එතුමන්ලාට ස්තුතිවන්ත වනවා. මේ තනතුර මේ රටේ තිබෙන මහා කරුමක්කාර තනතුරක් කියන එක මම ඇත්තටම විශ්වාස කරනවා. මේකේ හොඳ පැති තිබෙනවා. අපි යුද්ධ කරන කාලයේ දී මේ විධායක ජනාධිපති ක්‍රමයෙන් මේ රටට යහපතක් වුණා. ඒ නායකයන් ඍජු තීන්දු තීරණ ගත්තා. හැබැයි, මේ රටේ සිටින නායකයන් බුද්ධිමත් විධියට මේ විධායක ජනාධිපති ක්‍රමය පාවිච්චි කළොත් පමණයි එයින් යහපතක් වන්නේ. හැබැයි, ඒ නායකයාට පිස්සු හැදුණොත් එහෙම රටම ඉවරයි.

මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරලා, මේ යෝජනාව ගැන අපට අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමන්ලාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Gnanamuthu Srineshan. You have ten minutes.

[பி.ப. 2.32]

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
சபைக்குத் தலைமைதாங்குகின்ற கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நேற்றைய தினம் ஜே.வி.பீ. கட்சியைச் சேர்ந்த பாராளுமன்ற உறுப்பினர் கௌரவ டாக்டர் நளிந்த ஜயதிஸ்ஸ அவர்களால் இங்கு கொண்டுவரப்பட்ட நிறைவேற்று ஜனாதிபதித்துவ முறையினை ஒழிக்கவேண்டும் என்கின்ற பிரேரணையைத் தமிழ்த் தேசியக் கூட்டமைப்புப் பாராளுமன்ற உறுப்பினர்கள் ஏற்றுக்கொள்கின்றார்கள். இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசின் 1978ஆம் ஆண்டின் 2ஆம் குடியரசு யாப்பின் மூலமாக இந்த நிறைவேற்று ஜனாதிபதித்துவ முறைமை கொண்டுவரப் பட்டது. இந்த முறைமை கொண்டுவரப்பட்டதன் பின்னர் ஜனாதிபதிகளாக இருந்தவர்கள் எவ்வாறு செயற்பட்டார்கள்? அவர்கள் சட்டத்துறை, நிர்வாகத்துறை, நீதித்துறை மற்றும் பாதுகாப்புத்துறை என்பவற்றின்மீது எவ்வாறு அதிகாரங் களைப் பிரயோகித்தார்கள்? நிறைவேற்று ஜனாதிபதி தவறாக நடந்துகொள்ளுகின்றபோது, அவரை அகற்றுகின்ற வழிமுறை எவ்வாறு இருந்தது? ஜனாதிபதி அவர்கள் கடந்த காலங்களில் எவ்வாறு நடந்திருக்கின்றார் என்பவற்றையெல்லாம் நாங்கள் மதிப்பீடு செய்து பார்க்கின்றபோது, இந்த நிறைவேற்று ஜனாதிபதித்துவ முறைமை இலங்கைக்குப் பொருத்தமானதாக அமையவில்லை என்பதைத்தான் எங்களால் அவதானிக்க முடிகின்றது. எனவே, நிறைவேற்று ஜனாதிபதித்துவ முறைமையினை ஒழிக்கவேண்டுமென்று ஜே.வி.பீ. கட்சியினர் கொண்டு வந்த இந்த முற்போக்கான பிரேரணையை நாங்கள் ஆதரிக்கின்றோம்.

இந்த நாட்டில் உள்ள நிறைவேற்று அதிகார ஜனாதிபதித்துவ முறைமையை எடுத்துக்கொண்டால், ஜனாதிபதியாகத் தெரிவுசெய்யப்பட்ட ஒருவர் ஜனாதிபதிக் குரிய அதிகாரங்களைப் பிரயோகிக்கின்ற சந்தர்ப்பத்தில், எதிர்க்கட்சியில் இருக்கின்றவர்களும் ஆளும் கட்சிக்கு வாக்களிக்காத மக்களும் மிகவும் மோசமாகப் பாதிக்கப் படுகின்ற ஒரு நிலைமைதான் கடந்த காலங்களில் இருந்து வந்த நிதர்சனமான உண்மையாக இருக்கின்றது. ஜே.ஆர். ஜயவர்தன அவர்கள், அதற்கடுத்ததாக பிரேமதாச அவர்கள், அடுத்ததாக டிங்கிரி பண்டா விஜயதுங்க அவர்கள், அதற்கடுத்ததாக சந்திரிகா அம்மையார் அவர்கள், அடுத்ததாக மஹிந்த ராஜபக்ஷ அவர்கள் எல்லோருமே இந்த அதிகாரங்களைப் பிரயோகித்து வந்தார்கள். தற்போது மாண்புமிகு மைத்திரிபால சிறிசேன அவர்கள் இந்த அதிகாரங்களைப் பிரயோகித்துக் கொண்டிருக்கின்றார். இந்த அதிகாரங்கள் எந்தளவு பாதிப்பை ஏற்படுத்தியிருக்கின்றன என்பதைப் பற்றி நாங்கள் சிந்தித்தாக வேண்டும்.

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

அரசியலமைப்புக்கான 19வது திருத்தம் கொண்டு வரப்படுவதற்கு முன்பு, ஜனாதிபதி நினைத்தால் குறித்த பாராளுமன்றத்தின் பதவிக்காலம் ஆரம்பித்து ஓராண்டுக்குப் பின்னர் அந்தப் பாராளுமன்றத்தைக் கலைத்துவிடலாம். அவ்வாறான ஓர் அதிகாரத்தையே அன்று நிறைவேற்று ஜனாதிபதி அவர்கள் பெற்றிருந்தார். இந்த அதிகாரத்தினைச் சந்திரிகா அம்மையார் இரண்டு தடவைகள் பிரயோகித்திருக் கின்றார். அதாவது, 2000ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்ட பாராளுமன்றம் 2001ஆம் ஆண்டு கலைக்கப்பட்டது; 2001ஆம் ஆண்டு ஆரம்பிக்கப்பட்ட பாராளுமன்றம் 2004ஆம் ஆண்டு கலைக்கப்பட்டது. இவ்வாறாக அன்று இந்த நிறைவேற்று அதிகாரத்தினைப் பயன்படுத்தி பாராளுமன்றத்தினை விரும்பியவாறு கலைக்கின்ற ஒரு தன்மை காணப்பட்டது.

ஆனால், சந்திரிகா அம்மையார் அவர்கள் ஆட்சியிலிருந்து விலகிய பின்னர், சாதாரண பிரஜையாக இருக்கும்போது சிந்தித்து வெளியிட்ட ஓர் உண்மை இருக்கின்றது. அதாவது, அவர் "நான் ஒரு தவறு செய்துவிட்டேன்" என்ற கருத்தினைச் சொல்லியிருந்தார். அதாவது, 2001ஆம் ஆண்டு அமைக்கப் பட்ட பாராளுமன்றத்தினை 2 ஆண்டுகளுக்குப் பின்னர் இடைநடுவில் கலைத்தமை தவறு என்பதை, அவர் அந்தப் பதவியைவிட்டு அகன்றதன் பின்னர்தான் உணர்ந்து கொண்டார். அதாவது, ஜனாதிபதி சட்டத்துறைமீது அதிகாரத்தைச் செலுத்தி ஓராண்டுக்குப் பின்னர் பாராளுமன்றத்தைக் கலைத்திருக்கின்றார். ஓர் உறுப்பினர் எந்தக் கட்சியிலிருந்து பாராளுமன்றத்துக்குத் தெரிவு செய்யப்படுகின்றாரோ, அந்தந்தக் கட்சியிலிருந்து மக்களுக்குப் பணியாற்ற வேண்டுமென்ற அடிப்படையில்தான் மக்கள் 225 பாராளுமன்ற உறுப்பினர்களுக்கும் 5 ஆண்டுகளுக்கு ஆணை கொடுக்கின்றார்கள். பாராளுமன்றத்தின் பதவிக்காலம் முன்பு ஆறு ஆண்டுகளாக இருந்தது. 19வது திருத்தத்திற்கு முற்பட்ட காலத்தில் அவ்வாறு 225 பாராளுமன்ற உறுப்பினருக்கும் கொடுக்கப்பட்ட மக்கள் ஆணைக்கு மதிப்பளிக்காது தனி மனிதனான ஜனாதிபதி ஓராண்டுக்குப் பின்னர் பாராளுமன்றத்தைக் கலைத்தார். இந்த நாட்டிலுள்ள வாக்காளர்களால் தெரிவு செய்யப்பட்ட, மக்கள் ஆணையினைப் பெற்ற அந்தத் தலைவர்களைத் தனியொருவராக இருந்து ஜனாதிபதி அவர்கள் பதவி நீக்கம் செய்கின்றார் என்று சொன்னால், நிச்சயமாக அதுவொரு சர்வதிகாரத்தன்மையான ஆட்சி முறையாகத்தான் இருக்க முடியும். இதில் சர்வதிகாரம்தான் வெளிப்படுகின்றதே ஒழிய, ஜனநாயக சிந்தனைகள் வெளிப்படவில்லை என்பது எங்களுக்கு கண்கூடாகத் தெரிகின்றது. இவ்வாறு ஒரு தனி மனிதன் 225 பாராளுமன்ற உறுப்பினர்களின் தலைவிதியைத் தீர்மானிப்பதென்பது மக்கள் ஆணையாக இருக்க முடியாது. அது மன்னன் ஆணையாக அல்லது சர்வதிகார ஆணையாகத்தான் இருக்குமென்பது ஏற்றுக்கொள்ளக்கூடிய ஒரு முடிவாக இருக்கின்றது. இவ்வாறு பாராளுமன்றத்தின் இறைமையை, மக்கள் ஆணையைக் கேலிக்குள்ளாக்குகின்ற தலைவர் யாராக இருந்தாலும் சரி, அவர்களை அந்த ஜனாதிபதித்துவ முறைதான் அவ்வாறு செய்யத் தூண்டுகின்றது. ஆகவே, இந்த ஜனாதிபதித்துவ முறைமை எங்களுக்குக் கடந்த காலத்தில் தந்த படிப்பினை என்னவென்றால் அந்த முறைமை சர்வதிகாரத்தை நோக்கிச் செல்லுகின்றது என்பதுதான்.

ஜே.ஆர். ஜயவர்தன அவர்களுடைய இரண்டாம் குடியரசு அரசியல் யாப்பானது, பிரித்தானிய அரசியல் யாப்பு, அமெரிக்காவின் அரசியல் யாப்பு, பிரான்ஸ் அரசியல் யாப்பு போன்ற அரசியல் யாப்புக்களில் இருக்கக்கூடிய உச்சமான அதிகாரங்களை அப்படியே பிழிந்தெடுத்து வரையப்பட்ட அரசியல் யாப்புப் போன்றுதான் காணப்பட்டது. "ஆணைப் பெண்ணாக்க முடியாது; பெண்ணை ஆணாக்க முடியாது; வேறு அனைத்தையும் செய்யக்கூடிய அதிகாரங்கள் இந்த அரசியல் யாப்பு மூலம் ஜனாதிபதிக்கு இருக்கின்றது" என்று அந்த அரசியல் யாப்புக் கொண்டுவரப்பட்ட காலத்தில் விமர்சனம் செய்யப்பட்டது. மஹிந்த ராஜபக்ஷ அவர்கள் ஜனாதிபதியாக இருந்தபோது அரசியலமைப்புக்கான 18வது திருத்தம் கொண்டுவரப்பட்டது. அந்த வேளையில் அது சம்பந்தமாக விமர்சனம் செய்யப்பட்டது. அதனை விமர்சித்தது ஜே.வி.பீ. பாராளுமன்ற உறுப்பினரான விஜித ஹேரத் அவர்கள் என்று நான் நினைக்கின்றேன். 18வது அரசியலமைப்புத் திருத்தத்திற்குப் பின்னரும் ஜனாதிபதி நினைத்தால் ஆணைப் பெண்ணாகவும் பெண்ணை ஆணாகவும் மாற்றலாம் என்ற அடிப்படையில் அந்த விமர்சனம் அமைந்திருந்தது. இந்த ஜனநாயக நாட்டுக்குச் சர்வாதிகாரமிக்க ஜனாதிபதி முறைமையைக் கொண்டுவந்து 40 ஆண்டுகளாகின்ற நிலையில் அதன் விளைவுகளை நாங்கள் அனுபவித்திருக்கின்றோம்; அந்த விளைவுகளால் பாதிக்கப்பட்டுமிருக்கின்றோம்.

1983ஆம் ஆண்டு இந்த நாட்டில் 'ஜூலைக் கலவரம்' ஏற்படுத்தப்பட்டது. அதன் பின்னரான விளைவுகளை எடுத்துப் பாருங்கள்! அந்த ஜூலைக் கலவரத்துக்குப் பின்புலத்தில் இருந்தவர்கள் யார் என்பது மக்களுக்குத் தெரியாமல் இருந்தது. ஆனால், ஜூலைக் கலவரத்துக்குக் காரணகர்த்தாக்கள் இடதுசாரிக் கட்சிகள் என்ற அடிப்படையில், அந்தக் காலத்தில் இடதுசாரிக் கட்சித் தலைவர்கள் கைது செய்யப்பட்டார்கள்; சிறையில் அடைக்கப்பட்டார்கள். அதன் பின்னர்தான் ஜனநாயக அரசியலுக்குள் இருந்த ஜே.வி.பீ.யினர் தலைமறைவான அரசியலுக்குள் தள்ளப்படக்கூடிய சூழ்நிலை ஏற்பட்டது. அந்த வகையில், இந்த ஜனாதிபதித்துவ முறைமை அங்கும் ஒரு பாதிப்பை ஏற்படுத்தியிருப்பதை நாங்கள் உணர்ந்தாக வேண்டும்.

அரசியலமைப்புக்கான 19வது திருத்தத்தில் ஜனாதிபதியின் அதிகாரங்களைக் குறைப்பதற்குரிய விதிமுறைகள் புகுத்தப் பட்டிருந்தன. அது வரவேற்கத்தக்கதாக அமைந்திருந்தது. அந்த வேளையில் இப்போதிருக்கின்ற ஜனாதிபதியை எல்லோரும் பாராட்டினார்கள். ஆட்சி அதிகாரத்தில் இருக்கின்றபோது தனது அதிகாரத்தைத் தானாகவே குறைத்துக்கொண்ட ஜனாதிபதிதான் மேதகு மைத்திரிபால சிறிசேன அவர்களென்று அவருக்கு மிகவும் அதிகமான பாராட்டுக்கள் தெரிவிக்கப்பட்டிருந்தன. தேசிய இனப் பிரச்சினையைத் தீர்த்து இலங்கையில் ஒரு சமாதான யுகத்தைப் படைக்கப் போகின்றார்; இந்த நாட்டில் சமாதான யுகத்தைப் படைப்பதன் மூலமாக சகல இன மக்களும் வாழக்கூடிய ஒரு புரிந்துணர்வான சூழ்நிலையைக்கொண்டு வரப்போகின்றார் என்றெல்லாம் அதிகமாக அவர் பாராட்டப்பட்டார்.

அதற்கும் மேலாக, சமாதானத்திற்கான நோபல் பரிசினை அவர் பெறப்போகின்றார் என்ற கருத்துக்கூடச் சொல்லப்பட்டது. அவர் பதவி ஏற்கின்றபோது எளிமையாகத் தனது பதவிப் பிரமாணத்தைச் செய்துகொண்டார்; வெறும் ஐந்தாயிரம் ரூபாய் செலவில் அந்தப் பதவிப் பிரமாணத்தைச் செய்து கொண்டார் என்றெல்லாம் நாங்கள் வாய் கிழியப் பாராட்டினோம். அவரது எளிமையான தன்மையைப் பற்றி நாங்கள் மேம்படுத்திப் பேசினோம். அப்படியெல்லாம் பாராட்டப்பட்ட, உயர்ந்த நிலையில் வைத்துப் பார்க்கப்பட்ட அதிமேதகு ஜனாதிபதி அவர்கள் திடுதிப்பெனக் கடந்த

ஒக்ரோபர் மாதம் 26ஆம் திகதி யாருக்கும் தெரியாமல் புதிய பிரதமரைத் தெரிவு செய்து விட்டார். அவர் இப்படியான ஒரு செயலைச் செய்வதற்கு இந்த நிறைவேற்று ஜனாதிபதித்துவ முறைதான் அவரைத் தூண்டியிருக்கின்றது. எனவே, பதவிகள், அதிகாரங்கள் கிடைக்கின்றபோது, நல்ல மனிதர்கள்கூட எப்படி மாறுகின்றார்கள், இந்தப் பதவி எவ்வளவு மோசமானது என்பதைப் பார்ப்பதற்கு இது ஒரு சிறந்த உதாரணமாக அமைந்திருக்கின்றது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have one more minute.

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
பிரதமரின் பதவி நீக்கமும் அந்தப் பதவிக்குப் புதிய பிரதமரை நியமித்த நிலைமையும் காணப்பட்டது. இந்த நிலைமை நிச்சயமாக எங்களால் ஏற்றுக்கொள்ள முடியாத ஒரு நிலைமையாகக் காணப்பட்டது. ஜனநாயகமா? பண நாயகமா? மக்கள் ஆணையா? மன்னன் ஆணையா? என்கின்ற போட்டியொன்று காணப்பட்டது. அந்தப் போட்டியில் மக்கள் ஆணை வென்றிருக்கின்றது; ஜனநாயகம் வென்றிருக்கின்றது. இவ்வாறு வெல்வதற்கு நீதித்துறை எங்களுக்கு பக்கபலமாக இருந்து நீதியை வழங்கியிருக்கின்றது. அந்த வகையில், நீதித்துறையின் சுயாதீனத் தன்மை வரவேற்கத்தக்கதாகவும் பாராட்டத்தக்கதாகவும் அமைந்திருக்கின்றது. நீதித்துறையும் சுயாதீனத்தை இழக்கக்கூடிய ஒரு நிலைமை இருந்திருந்தால், இந்த நாட்டில் என்ன நிலைமை ஏற்பட்டிருக்கும் என்பதை சொல்லில் அடங்க முடியாதளவுக்கு வர்ணிக்க வேண்டியேற் பட்டிருக்கும்.

அதேவேளை, இன்னுமொரு விடயத்தையும் நான் சொல்ல வேண்டும். ஜனாதிபதியைப் பதவியிலிருந்து நீக்குகின்ற முறையை நீங்கள் எடுத்துப் பாருங்கள்! ஜனாதிபதியைப் பதவியிலிருந்து நீக்க வேண்டுமாக இருந்தால், பாராளுமன்றத்தில் குற்றப் பிரேரணையைக் கொண்டுவர வேண்டும். அவ்வாறு பாராளுமன்றத்தில் குற்றப் பிரேரணையைக் கொண்டுவந்த பின்னர் அது மூன்றிலிரண்டு பெரும்பான்மையுடன் நிறைவேற்றப்பட வேண்டும். அவ்வாறு நிறைவேற்றப்பட்ட பிரேரணை உயர் நீதிமன்றத்திற்குக் கொண்டு செல்லப்பட வேண்டும். ஜனாதிபதி குற்றமிழைத்திருக்கின்றார் என்பது உயர் நீதிமன்றத்திலும் நிரூபிக்கப்படவேண்டும். அதற்கடுத்ததாக, மீண்டும் அப்பிரேரணை பாராளுமன்றத்திற்குக் கொண்டுவரப்பட்டு, மூன்றிலிரண்டு பெரும்பான்மையுடன் நிறைவேற்றப் பட்டால்தான் ஜனாதிபதியைப் பதவியிலிருந்து விலக்கலாம் என்கின்ற தன்மை காணப்படுகின்றது. கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நிலையில் ஜனாதிபதியைப் பதவியிலிருந்து விலக்குவது என்பது கல்லிலிருந்து நார் உரிப்பது போன்றும், உரித்த நாரினைத் திரித்து மலையைக் கட்டியிழுப்பது போன்றும் காணப்படுகின்றது. எனவே, குற்றமிழைக்கின்ற, தவறிழைக்கின்ற ஜனாதிபதிகளைக்கூட அவர்களது நிலையிலிருந்து அகற்றுவது கடினமாக இருக்கின்றது. ஆனால், ஜனாதிபதி நினைத்தால் பாராளுமன்றத்தை இலகுவாகக் கலைக்கக்கூடிய ஒரு தன்மை 19வது அரசியலமைப்புத் திருத்தத்திற்கு முன்பு இருந்தது. இவற்றையெல்லாம் நாங்கள் ஒட்டுமொத்தமாகப் பார்க்கின்ற போது, இந்த நிறைவேற்று ஜனாதிபதித்துவ முறை எங்களுக்குத் தக்க பாடத்தைப் புகட்டியிருக்கின்றது.

எதிர்க்கட்சியாக இருக்கின்றபோது நிறைவேற்று ஜனாதிபதித்துவ முறையை வெறுக்கின்றவர்கள், ஆளுங்கட்சியாக வந்ததன் பின்னர் அந்த முறையை ஆதரிக்கின்ற ஒரு போக்கும் காணப்படுகின்றது. அதாவது எதிர்க்கட்சியில் இருக்கின்றபோது கசக்கின்ற அந்த நிறைவேற்று ஜனாதிபதித்துவ முறைமை ஆளுங்கட்சியாக வருகின்றபோது இனிக்கின்ற தன்மை காணப்படுகின்றது. சாதாரண மனிதர்களைக்கூடச் சர்வாதிகாரத்தை நோக்கிச் செல்வதற்கு அது வழிகோலுகின்றது. எனவே, எமது நாட்டில் நாங்கள் பெற்றுக்கொண்ட படிப்பினையின் அடிப்படையில் தொகுத்தும் பகுத்தும் பார்க்கின்றபோது, இந்த ஜனாதிபதித்துவ முறை இலங்கையில் சமாதான யுகத்தை ஏற்படுத்தவில்லை; நாட்டை அபிவிருத்தி செய்யவில்லை; பொருளாதார ரீதியாக, சமூக ரீதியாக, நீதி ரீதியாக நாட்டை வெற்றிகொள்ளவில்லை என்பது புலனாகின்றது, கடந்த 40 ஆண்டுகளும் இந்த ஜனாதிபதித்துவ முறைமையானது எமக்கு நன்மை செய்ததைவிட, தீமைகளைத்தான் அதிகமாகச் செய்திருக்கின்றது. இந்த ஜனாதிபதித்துவ முறைமையினை ஒழித்துக் கட்டவேண்டும் அல்லது நீக்க வேண்டும் என்பதுதான் சாதாரண மக்கள் மத்தியில் காணப்படும் கருத்தாகவும் அந்த மக்களால் தெரிவு செய்யப்பட்ட பிரதிநிதிகளின் நிலைப்பாடாகவும் இருக்கின்றது.

நான் இன்னுமொரு விடயத்தைச் சொல்லவேண்டும். இந்த அசாதாரணமான நிலை 50 நாட்கள் நிலைத்தது. அந்தக் காலகட்டத்தில் நடக்கக்கூடாத சில செயற்பாடுகள்கூட நடைபெற்றன. மட்டக்களப்பில் வவுணதீவு என்கின்ற இடத்தில் 2 பொலிஸ் உத்தியோகத்தர்கள் சுட்டுக் கொலை செய்யப்பட்டார்கள். உண்மையில் அது கண்டிக்கத்தக்க ஒரு விடயமாகும். கடமையில் ஈடுபட்டுக்கொண்டிருந்த ஒரு தமிழ்ப் பொலிஸ் உத்தியோகத்தரும் ஒரு சிங்களப் பொலிஸ் உத்தியோகத்தரும் சுட்டுக் கொல்லப்பட்டிருந்தார்கள். இதனை நாங்கள் வன்மையாகக் கண்டிக்கின்றோம். இப்படியான செயற்பாடுகள் நடக்கக்கூடாது. இந்த அசாதாரண காலத்தின்போதுதான் அந்த நிலைமை ஏற்பட்டது. அதற்கு முன்னர் அங்கு சுமுகமான ஒரு நிலைமை காணப்பட்டது. இந்தச் சம்பவத்தையடுத்து 2 முன்னாள் போராளிகளான சர்வானந்தன் என்பவரும் ராஜகுமாரன் என்பவரும் கைது செய்யப்பட்டிருக்கின்றார்கள். இவ்விருவரும் தலா 5 பிள்ளைகளின் தந்தைகளாகவும் இருக்கின்றார்கள். அவர்கள் கைதுசெய்யப்பட்டு இன்று 20 நாட்கள் கடந்துவிட்டன. ஆனால், யார் குற்றவாளிகள் என்பது கண்டுபிடிக்கப் படவில்லை. குற்றமிழைத்தவர்கள் நிச்சயமாகக் கைது செய்யப்பட வேண்டும்; அவர்களுக்குரிய தண்டனை வழங்கப்பட வேண்டும் என்பதில் நாங்கள் உறுதியாக இருக்கின்றோம். இந்த நாட்டைக் குழப்புவதற்காக அப்பாவிகளான அந்த 2 பொலிசாரும் பலிகொள்ளப் பட்டிருக்கின்றார்கள். இறுதியாக, இந்த நிறைவேற்று ஜனாதிபதித்துவ முறைமையினை எவ்வளவு குறுகிய காலத்தில் ஒழிக்க முடியுமோ, அவ்வளவு குறுகிய காலத்தில் அதனைச் செய்ய வேண்டும் என்று கூறி, எனது உரையினை நிறைவுசெய்கின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Thank you.

ඊළඟට, ගරු එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

[අ.භා.2.46]

**ගරු එඩ්වඩ් ගුණසේකර මහතා**
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)

මේ විවාදයේදී මට අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේ ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ඊයේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් අපට කථා කරන්න සුදුසු අවස්ථාව මෙය බව අපට තේරෙනවා. ඒ යෝජනාව මේ අවස්ථාවේ ගෙනාවේ හිතා-මතාමයි. ඒ කියන්නේ, මීට කලින් කථා කළ බොහෝ දෙනා කිව්වා වාගේ, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ රටේ ජනාධිපති හැටියට පත් වෙද්දී එතුමා කියපු දේවල් සහ එතුමා සෝභිත හාමුදුරුවන්ගේ ආදාහන පූජෝත්සවයේදී කථා කරපු පරිදි හැසිරුණා නම්, මම හිතන්නේ නැහැ ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාට මේ ගරු සභාවට මෙහෙම යෝජනාවක් ගෙනෙන්න සිදු වෙයි කියා. එහෙම හැසිරුණේ නැති නිසා තමයි, මන්ත්‍රීතුමාට මේ යෝජනාව ගෙනෙන්න සිදු වුණේ.

ඇත්තටම මම දන්න හැටියට මීට අවුරුදු 40කට කලින් 1978 ව්‍යවස්ථාවේදී තමයි විධායක ජනාධිපති ක්‍රමය මේ රටේ ආරම්භ වුණේ. එදා මෙදාතුර සිදුවීම් දෙස බලද්දි -මා ඉස්සරහ ඉන්නවා හිටපු ඇමතිවරයෙක් වන ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා.-අපි කවුරුත් දන්නවා ඒ කාලයට ගැළපෙන දෙයක් මන්ත්‍රීතුමා ගෙනා බව. 1977 මේ රටේ දේශපාලනික වශයෙන් ලොකු පෙරළියක් සිද්ධ කරන්න සිදු වුණා. හැබැයි මෙම යෝජනාව ආරම්භයේදී කිව්වා, "එදා සිටම විධායක ජනාධිපති ක්‍රමය නිසා මේ රටට කිසි දෙයක් වුණේ නැහැ." කියා. මම ඒක පිළිගන්නේ නැහැ. මේ රටට විධායක ජනාධිපතිවරයෙක් අවශ්‍ය කාලයක් සහ ඊට සුදුසු පුද්ගලයෙක් එතැන වාඩි වෙලා සිටියා. ඒ කාල සීමාව තුළ මේ රට තිබුණු තත්ත්වයෙන් උඩට ගන්න විශාල සංවර්ධන ක්‍රියාවලියක් කළ යුතුව තිබුණා. නැතුව කිසිවකු පාලනය කරන්නවත්, කාගේවත් බෙලි කපන්නවත් නොවෙයි. එදා එම සංවර්ධන ක්‍රියාවලියට විධායක ජනාධිපති ක්‍රමය කෙතරම් දායක වුණාද කියන එක දේශපාලනය දන්න, ඉතිහාසය දන්න, මැදහත්ව හිතන ඕනෑම කෙනෙකුට තේරෙනවා.

එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මොනවා ගෙනාවත් වාමාංශික යැයි කියා ගත්ත අය ඒකට විරුද්ධ වුණා. මොන හොඳ දේ කළත් එය විවේචනය කරන අය හිටියා. ඒ නිසා ඒකට විවිධ කථා කිව්වා. අපි දන්නවා 1994 ජනාධිපතිවරණයේදී චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජනතා විමුක්ති පෙරමුණට පොරොන්දුවක් දුන්නා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවාය කියා. අපේක්ෂකයකුගේ ඡන්ද ඉල්ලීම නවත්වන්න පවා එය හේතු වුණා. නමුත් ඒක සිද්ධ වුණේ නැහැ. ඒ ගැන මා දන්නේ නැහැ. ඒ පිළිබඳව වැඩිදුර කථා කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම ගලාගෙන ආපු කාල සීමාව තුළදී, විශේෂයෙන් 2015 ජනවාරි 08 වන දා වෙද්දී නැවත වතාවක් මේ රටට අවශ්‍යතාවක් ඇති වුණා, ජනාධිපතිවරකුගේ හැසිරීම නිසා මේ රටට ඇතිවෙලා තිබෙන විපත්තිවලින් ගලවා ගැනීම සඳහා ජනාධිපති ක්‍රමය වෙනස් කරන්න. ඒ නිසා තමයි අපි කවුරුත් එකතුවෙලා, අපි ඉස්සෙල්ලා මතක් කළ ජනාධිපතිවරයාගේ නම පොදු අපේක්ෂකයකු හැටියට නම් කරලා එතුමා මේ රටට පත් කර ගත්තේ. එසේ පත් කර ගැනීම නිසා බොහෝ අය සැනසුම් සුසුම් හෙළුවා, "නැවත වරක් මේ රට ඉතාම වැදගත්, ලෝකය පිළිගන්නා උසස් රටක් බවට පත් වුණා. එවැනි ජනාධිපතිවරයකු අපට ලැබුණා"යි කියා. මට පෙර කථා කළ අපේ ටීඑන්ඒ එකේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි කවුරුත් ඒ පිළිබඳව ඉතා සතුටු වුණා. "මා මීට පස්සේ ජනාධිපතිවරයකු වන්නේ නැහැ. මට තිබෙන්නේ ජනාධිපතිකම ලබා ගැනීම නොවෙයි, මේ රට හදන එකයි. මේ අවුරුදු 5ට පස්සේ මා පරාක්‍රම සමුද්‍රය ළඟට ගිහින් ඒ පැත්ත බලාගෙන වාඩිවෙලා සුළං වැදි-වැදී ඉන්නවා මිසක් මා වෙන දෙයකට යන්නේ නැහැ"යි කියන එතුමාගේ ප්‍රකාශය සමහර පත්‍රවල පළවෙලා තිබෙනවා අපි දැක්කා. ඒක ඉතා වැදගත් දෙයක්. මොකද, තමන් බලාපොරොත්තුවක් වන්නේ නැත්නම්, තමන් රජකම කියන එක ලොකුවට ඔළුවට ගන්නේ නැත්නම් ඒකෙන් රටට පාඩුවක් වන්නේ නැහැ. මේ ගරු සභාවේ කථා කළ මන්ත්‍රීවරයකුත් විග්‍රහ කළා, බලය මොන තරම් භයානකද කියා. බලය භයානක නොවන තත්ත්වයට තමයි ජනාධිපතිවරයා එදා හැසිරුණේ. පියවරෙන්-පියවර එහෙම ආවා. මා කියන්නේ, මේ රටේ අවාසනාවට තමයි, මේ රටේ එක්සත් ජාතික පාක්ෂිකයෝ විතරක් නොවෙයි, දේශපාලනය ගැන දන්නා ඡන්ද දායකයන් විශාල පිරිසක් එකතුවෙලා ජනවාරි 08 වන දා ජනාධිපතිවරයකු පත් කර ගත්තේ කියලායි. ඒ බලාපොරොත්තුවල කිසිම තැනක ව්‍යාජ දේවල් තිබුණේ නැහැ. හැම කෙනෙක්ම අව්‍යාජව තමයි කටයුතු කළේ. හැමදෙනාම එකට එකතු වුණේ ඒ නිසායි. එදා කවුරුත් විශ්වාස කළේ නැහැ, එදා හිටපු ජනාධිපතිවරයා පරද්දන්නට පොළොන්නරුවට පමණක් සීමා වුණු මන්ත්‍රීවරයකුට පුළුවන් වෙයි කියා. නමුත් මිනිසුන්ට වුවමනාවක් තිබුණා, මේක වෙනස් කරන්න. ඒ වුවමනාව තමයි කළේ. එහෙම නැතුව ඒ ඉදිරිපත් වුණු කෙනාගේ දක්ෂකම, උගත්කම, බුද්ධිය, දේශපාලන හැකියාව නොවෙයි සැලකුවේ. එතැනදී පොදු අපේක්ෂකයකු හැටියට ඉදිරිපත් වුණු කෙනා වෙනුවෙන් තමයි කටයුතු කළේ. එතුමාගේ නමට නොවෙයි කළේ. ඒ කටයුත්ත කර එතුමා එතැන වාඩි කෙරෙව්වා. ඒ සඳහා මැදිහත් වුණු අයගෙන් මාදුළුවාවේ සෝභිත ස්වාමීන් වහන්සේ විශාල කැපවීමක් කළාය කියා අපි කවුරුත් දන්නවා; ඔබතුමාත් දන්නවා.

ඒ හා සමානව මේ රටේ මධ්‍යස්ථ මතධාරීන් විශාල පිරිසක් ඒ කටයුත්තට එකතු වුණා. වර්තමාන අගමැතිතුමා එදා විපක්ෂ නායකතුමා හැටියට අපේ පක්ෂයේ සියලුම දෙනා එකතු කරගෙන, සියයට සියයක් නොව, සියයට දාහකින් සහයෝගය ලබා දීලා තමයි අපි ජනාධිපති පුටුවේ වාඩි කර ගත්තේ. මීට ඉස්සෙල්ලාත් ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ 1994 අවුරුද්දෙන් පස්සේ මේ විධායක ජනාධිපති ක්‍රමයෙන් ගොඩක් හානි සිදු වුණා. 2000 අවුරුද්දේ මම පත් වුණු පාර්ලිමේන්තුවේ - මම මේ කාරණය මීට කලිනුත් මේ පාර්ලිමේන්තුවේදී කිව්වා.- මම හිතන්නේ ඔබතුමාත් මේ ගරු සභාවේ හිටියා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 2000 අවුරුද්ද අවසන් වෙන්න කලින් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. එක් පුද්ගලයෙකුගේ අදහසින් ඕනෑම වේලාවක 225ක් පත් කිරීම වෙනස් කරන්න පුළුවන් කියන කාරණය එදා විනාශ වුණා. 2001 අවුරුද්දේ නැවත වතාවක් අපි මේ පාර්ලිමේන්තුවට ආවා. 2004 අවුරුද්දේ ආපසු පාර්ලිමේන්තුව විසුරුවා හැරපු බව මේ කවුරුත් දන්නවා. ඒ, මේ විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන අයුතු ශක්තිය පාවිච්චි කිරීම නිසයි. එහෙම නැතිව ඒකේ එහෙම එකක් තිබුණේ නැහැ. එලෙස සිදු වුණේ අයුතු ශක්තිය පාවිච්චි කිරීම නිසයි. ඒ ආකාරයට මේ රටේ ජනතාවගේ බලාපොරොත්තු එදා බිඳ දැම්මා. එඩ්වඩ් ගුණසේකරගේ හෝ තවත් කෙනෙකුගේ මන්ත්‍රීකම අහෝසි වෙච්ච එක ගැන නොවෙයි මම මේ කියන්නේ. රටේ ජනතාවගේ බලාපොරොත්තු එදා බිඳ දැම්මා. නමුත් අපි ආපසු පත් වෙලා ආවාම නැවත වතාවක් 2015 අවුරුද්දේ අපිට ඒ දෙයම සිදු කළා. ඒ තුළින් රටේ ජනතාවට දුන්නු පොරොන්දු වාගේම රටේ ජනතාවගේ බලාපොරොත්තු සියල්ලම කඩ කළා. එලෙස ජනතාවගේ බලාපොරොත්තු කඩ කිරීම රටක නායකයෙකුට ඒ තරම් සුදුසු දෙයක් නොවන බව මේ රටේ හැම කෙනෙකුම පිළිගන්න ඕනෑ. යම් යම් සීමාවන්ට කොටුවෙලා ඒ අයට හිතන්න පුළුවන්, "ඒ අයට හොඳ වැඩේ වුණේ. ඒ අය

නවත්වන්න ඕනෑ. ආණ්ඩුව විසුරුවන්න ඕනෑ." කියලා. මේක ඒ අයගේ ගමේ භාෂාවෙන් කියනවා ඇති. නමුත් රට ඉදිරියට අරගෙන යන්න එහෙම ක්‍රමයක් තිබෙනවා නම් හොඳයි. නමුත් එහෙම ක්‍රමයක් නැහැ. නැවක් දියත් කළාම ඒක දියත් වෙලා යද්දි තමයි ඒ නැව ක්‍රියාත්මක වෙමින් යන්නේ. මේ නැව අතරමඟදී ගිල්ලුවාම ඒ නැවට හානි සිදු වනවා. ඒ අනුව අද මේ රටට සිදු වෙච්ච හානිය පිළිබඳව ඔබතුමා විතරක් නොව මුළුමහත් රටේ හැම කෙනෙකුම දන්නවා. ඒ නිසා ඒක විශාල පාඩුවක්. එදා හොඳට පවත්වාගෙන ආපු විධායක ජනාධිපති ක්‍රමය ඇන්.ඇම්. පෙරේරා මැතිතුමන්ලා, කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමන්ලා විග්‍රහ කරපු ආකාරයට නුසුදුසු තැනකට ගෙන ගිහින් තිබෙන නිසා තමයි අද මේ රට විනාශ වෙලා තිබෙන්නේ.

ඔබතුමාට මම මේ කාරණයත් කියන්න අවශ්‍යයි. ඒ තුළින් මේ රටේ අශිෂ්ට භාවය සහ ශිෂ්ට භාවය දෙපැත්තක් හැටියට දැක්කාද? එදා ඉතාම අශිෂ්ට විධියට පාර්ලිමේන්තුවේ කටයුතු සිදු වුණා. එතැනින් ගලාගෙන ආපු පහත් දිය දහරාව තමයි මේ හැම තැනටම ගියේ. මිරිස් කුඩු ඉසීම, ඔබතුමා වාඩිවෙලා ඉන්න මේ රටේ ඉතාම උසස් ලෙස සලකන කථානායක අසුන සහ මේ සෙංකෝලය තිබෙන ස්ථානවල සිට කලබල ඇති කිරීම, ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා වාගේ පාර්ලිමේන්තුවේ ඉන්න ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ට මිරිස් කුඩු ගැහීම, බයිබලය විසි කිරීම, සභා ගැබේ තිබෙන උපකරණ කඩා බිඳ දැමීම, -මේ හැම එකක්ම- අර පහත් ක්‍රියාවල අශිෂ්ට ලකුණු. ඒ අශිෂ්ට ලකුණු මේ රටට පෙන්නුවා.

එතකොට අද රට දකිනවා, ශිෂ්ට සහ අශිෂ්ට කියන පැති දෙකක්. එතැනින් එහාට තමයි අද අපට යන්න වෙන්නේ. ඒ ශිෂ්ට-අශිෂ්ටභාවය මත අධිකරණයෙන් අපට පෙන්වා දුන්නා, කොතැනටද අපි යන්න ඕනෑ කියලා; මේ රටේ නිවැරදි, නිදහස් අධිකරණයකින් අපට පෙන්වා දුන්නා. ඒ හැම දෙයක්ම විධායක ජනාධිපති ක්‍රමයේ බලතල නිසා ඇති වුණු දේවල්වල වැරදි ප්‍රතිඵල. ඒ ප්‍රතිඵල තමයි අපි එදා දැක්කේ. ඔබතුමා දන්නවා, පසුගිය දා ගෝල්ෆේස් පිටියට ආපු ජනගහනය කොපමණද කියලා. ඒ ජනතාව අපි එක්කගෙන ආවා තමයි. හැබැයි අපි ඒ මිනිස්සු එක්කගෙන එන තැනට පෙලඹුණා. අපට කලින් එහෙම එක්කගෙන එන්න බැහැ. ඒ, එකම මිනිස්සු කොටස. එදා එන්න බැහැ කියපු මිනිස්සු ඇයි අද ආවේ? අපි ගෙන්වන්න හිටපු ප්‍රමාණයට වඩා ආවේ ඇයි? එදා කොල්ලුපිටියේ ලිප්ටන් වට රවුමට ආපු ජනගහනයයි, ඊට කලින් මෙතුමන්ලාගේ ඔය පොහොට්ටුව පක්ෂයෙන් කොළඹට ආපු ජනගහනයයි අතර වෙනස දැක්කාද? මේ රටේ වැඩිම බේබදු -බීමත්- මිනිසුන් සංඛ්‍යාවක් සහභාගි වුණු රැස්වීමක් තමයි එදා තිබුණේ. ඔබතුමන්ලා දැක්කා, කිරි බීලා බඩඑළිය ගිය මිනිස්සු හිටියා. නමුත් එදා ඔවුන් කොල්ලුපිටියට ආවේ බස්වල; අපි කවුරුවත් ගෙනාවේ නැහැ. විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ ආවේ. මේ රටේ මධ්‍යස්ථ මතධාරින් ඇවිල්ලා මේ අපරාධයට, මේ අසාධාරණයට එරෙහිව කෙළින් හිටියා. එතැනින් තමයි අද මේ රට මෙතැනට යන්න තරම් හයියක් ඇති වුණේ. ඒ නිසා අද ශිෂ්ට, අශිෂ්ට කියලා වර්ග දෙකකට මේ රටේ මිනිස්සු වෙන් වුණා. ඒ නිසා ඔබතුමා මාර්ගයෙන් මේ රටේ ජනතාවට මම විශේෂයෙන් මතක් කරනවා, මේ ශිෂ්ට-අශිෂ්ටභාවය හොඳට දැනගෙන ඉදිරියේදීත් ඔබතුමන්ලා බුද්ධිමත්ව කටයුතු කරන්න කියලා. එහෙම කටයුතු කිරීමට අපි අපේ පක්ෂ නායකයන්ට බල කරනවා. මේ පක්ෂ තුළ එවැනි වැරදි සංවිධායකයන් පත් කරන්න බැහැ. මේ පක්ෂ තුළ වැරදි තීරණ ගන්න බැහැ. අපි මෙතෙක් අරගෙනත් නැහැ. ගත්තාය කියනවා නම්, ඒ ගත්ත වැරදි තීරණ නිවැරදි කරගෙන ඉස්සරහට යන්න ඕනෑ. මොකද, මේ රටේ ජනතාව අද ඉතාම ඉහළ බුද්ධි මට්ටමකට, ඉතාම ශිෂ්ට සම්පන්න මට්ටමකට නැවත පත් වුණා. අපි ආර්ථිකයෙන් මොන තරම් වැටුණත්, මොන දේ නොලැබුණත්, ඩොලරය කොච්චර ඉහළට ගියත් ලෝකයේ තිබෙන නීතිගරුක රටක් බවට අද අපේ රට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක අපට සියල්ලටම වඩා වැදගත්. අපේ උපදින්න ඉන්න දරුවාට, පැල්පතේ ඉඳලා මහා මන්දිරය දක්වා ඉන්න හැම කෙනෙකුටම නිදහසේ මේ ලංකාවේ ඉන්න පුළුවන්; අද නීතිය හරියට ක්‍රියාත්මක වෙනවා කියන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා විධායක ජනාධිපති ක්‍රමය නිසා ඒ සිදු වුණු හානියෙන් අපට ලැබුණු වාසිදායක තැන්වලින් ප්‍රයෝජන ගන්න කියන පණිවුඩයත් මම විශේෂයෙන්ම මේ රටේ ජනතාවට මතක් කරනවා.

මම මීට වඩා කථා කරන්නේ නැහැ. මේ වෙලාවේ මේ යෝජනාව ගෙනාවේ ඇයි කියන එක මේ රටේ හැම කෙනෙක්ම දන්නවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන කිසි දෙයක් නොහිතන ජනතාවක් මේ රටේ හිටියා. අපට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කන්නද කියලා මිනිස්සු හිතුවා. නමුත් පසුගිය දවස්වල හැම කෙනෙක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විවිධ තැන් කියවන්න පටන් ගත්තා, ආණ්ඩුව විසුරුවන්න පුළුවන්ද, අමාත්‍යවරු පත් කරන්න පුළුවන්ද, අගමැතිවරු පත් කරන්න පුළුවන්ද කියන එක ගැන. දැන් යම් මට්ටමකට ඇවිත් තිබෙනවා. අපි දන්නා හැටියට විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක්වත් දේශපාලනය ගැන වැඩි උනන්දුවක් දැක්වූවේ නැහැ. දැන් හැම කෙනෙක්ම ඒ පිළිබඳව උනන්දුවක් දක්වන තැනට ඇවිත් තිබෙනවා. ඒක තමයි රටකට වෙන්න ඕනෑ. නිකම් හුදෙකලා වෙලා, ජයවර්ධනපුර පාර්ලිමේන්තුව තුළ 225ක් කොටු වෙලා, ගහ මරා ගන්නා එක නොවෙයි සිදු වෙන්න ඕනෑ. රටේ ඉන්න හැම කෙනෙක්ම දේශපාලනය ගැන දැන ගන්න ඕනෑ. අද ඒ තැනට මේ රට පත් වුණා, පසුගිය දවස්වල වුණු දෙයින්. ඒ නිසා ඒක ඉතාම වැදගත් දෙයක්. මම කියන්නේ මේ රටේ ඉන්න හැම කෙනෙක්ම මේ තත්ත්වය ඉදිරියට අරගෙන යන්න කටයුතු කරන්න ඕනෑ කියලායි. එහෙම නැත්නම් මේ රට හොඳ තැනකට, දියුණු තැනකට, ශිෂ්ට සම්පන්න තැනකට ගෙන යන්න හම්බ වෙන්නේ නැහැ. ඒ තත්ත්වයට අද ඇවිත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ ලැබුණු අවස්ථාවේදී මම මේ රටට විශේෂයෙන්ම මේ දෙය මතක් කරනවා. විධායක ජනාධිපති ධුරය නිවැරදි කෙනෙකුට නොලැබුණු නිසා අද අපි මේ තත්ත්වයට පත් වුණත්, එන්.එම්. පෙරේරා මැතිතුමා, කොල්වින් ආර්. ද සිල්වා මැතිතුමන්ලා කිව්වා වාගේ ඉදිරියේදීත් එහෙම වෙන්න පුළුවන් නිසා මමත් අනුමත කරනවා, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා ගෙනාපු යෝජනාව. මේක මෙතැන තිබෙන්න ඕනෑ නැහැ. අද ඉඳලා හෙට අපට මන්ත්‍රීකම් නැතුව යන්න පුළුවන්. හැබැයි මේ පාර්ලිමේන්තුවේ ඉඳලා, මේ ක්‍රමය අනුමත නොකරන කෙනෙක් හැටියට මමත් මේ යෝජනාවට එක් වෙනවාය කියමින්, මාගේ වචන ස්වල්පය නිමා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා. ඔබතුමාගේ කථාව ආරම්භ කිරීමට පෙර ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

[අ.භා.2.59]

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ගෙනෙන ලද විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් අපේ පක්ෂයේ ස්ථාවරය පිළිබඳව යම් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න මා කැමැතියි. මට කලින් කථා කළ අපේ එඩ්වඩ් ගුණසේකර මන්ත්‍රීතුමා කිව්වා, මේ විධායක ජනාධිපති ක්‍රමය ජේ.ආර්. ජයවර්ධන මහත්මයා ගෙනාපු අවස්ථාවේ වාමාංශික අය මේකට විරුද්ධව වුණාය; කෝකටත් විරුද්ධ වන වාමාංශික අය මේකට විරුද්ධ වුණාය කියලා.

අපි කියනවා ඒක ඇත්ත කියලා. අපේ නායකයෝ මේ ව්‍යවස්ථාවේ තිබෙන අහිතකර තත්ත්වය දුර දක්නා නුවණින් දැක්කා. එම නිසා මේ ව්‍යවස්ථාව සම්මත කරන අවස්ථාවේ වමේ පක්ෂ එකතු වෙලා මහා දැවැන්ත විරෝධතාවක් කොළඹ නගරයේ පවත්වපු බව තමුන්නාන්සේලා දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්ත වශයෙන් එක් පුද්ගලයෙක් අත බලතල ඒකරාශි වන ක්‍රමයක් හැටියටයි අපි මේ ක්‍රමය දැක්කේ. පාර්ලිමේන්තුව සතු බලය එක් පුද්ගලයෙක් මත පදනම් වෙනකොට, එහි තිබෙන අහිතකර ප්‍රතිවිපාක සමාජයේ දෝලනය වන ආකාරය අපේ අය දැක්කා. පසුගිය යුගය තුළ අපි කවුරුත් එහි ප්‍රතිඵල භුක්ති වින්ද බව මම කියන්න කැමතියි. අපට නිදහස ලැබී වසර 70ක් ගතවන මේ මොහොතේ විධායක ජනාධිපති ක්‍රමය තමයි ක්‍රියාත්මක වෙන්නේ. මේ වසර හැත්තෑව ඇතුළත සමාජය කොයි තරම් අර්බුදවලින් ගහන වුණාද? ඇත්ත වශයෙන් එක්සත් ජාතික පක්ෂයට ඕනෑ වුණේ විධායක ජනාධිපති ක්‍රමය, මේ ව්‍යවස්ථාව සම්මත කර ඒ ගොල්ලන්ට ගැළපෙන නව ආර්ථික ප්‍රතිපත්තියක් ඉදිරියට ගෙන යන්නයි. ඒ, නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය. මේ ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ වගන්තිවලත්, විශේෂ විධිවිධානවලත්, පොදු විධිවිධානවලත් මේ ආර්ථික ක්‍රමය පිළිබඳ ස්වභාවය අනාවරණය කරන බව තමුන්නාන්සේලා දන්නවා. එම නිසා විදේශීය මූලධන ආධිපත්‍යයට මේ රට යටත් කිරීම සංවර්ධනය මුවාවෙන් ඉදිරියට අරගෙන ගියා. ජාත්‍යන්තර ගජමිතුරු සංකල්පය ශක්තිමත් කිරීම තමයි එහි පදනම වුණේ. මේ පදනම ඇති වෙනකොට අපි තේරුම් ගත්තා, සමාජ ප්‍රතිවිරෝධයන් මතු වෙනවා; එක පන්තියක් අත ධනය ඒකරාශි වෙනවා; විදේශ ප්‍රාග්ධනයේ ස්වභාවයෙන් බහුජාතික සමාගම්, වෙනත් සමාගම් අපේ රටේ ආර්ථිකය සූරාගෙන කනවා. ඒ තුළ දිළිඳුභාවය වැඩි වෙනවා; විරැකියාව වර්ධනය වෙනවා; සමාජ ප්‍රතිවිරෝධය වැඩෙනවා කියා. එම නිසා ඒ තුළින් අපි දැක්කා, මේ විධායක බල සහිත ජනාධිපති ධුරය ලෝකයේ කොහේවත් නැති ජාතියේ එකක්, ඒක අපේ රටට නොගැළපෙන එකක් බව. එම නිසා එදා ගෙන ගිය සටන කොයි තරම් ප්‍රායෝගිකද කියලා න්‍යායාත්මකව සහ භාවිතයෙන් අද අපට පෙනෙනවා.

අපේ මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කළ දවසේ සිට අද වන විට සංශෝධන 19ක් සිදු කර ඇති බව ඔබතුමන්ලාට කියන්න කැමැතියි. මේ වකවානුව තුළ වසර 30කට ආසන්න කාලයක් යුද්ධය පැවතුණා. වසර දෙකක කාලයක් තුළ ත්‍රස්තවාදය පැවතුණා. ඒකත් එක්ක පදනම් වූ හදිසි තත්ත්වයන් තිබුණා; දෝෂාභියෝග ඇති වුණා; ජනපති-අගමැති ගැටුම් ඇති වුණා; ජනපති-කථානායක ගැටුම් ඇති වුණා; අධිකරණය-ජනපති ගැටුම් ඇති වුණා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ එක අවස්ථාවක නෙවිල් සමරකෝන් අග්‍ර විනිශ්චයකාරතුමා සමඟ ගැටුමක් ඇති වුණා. මහින්ද රාජපක්ෂ මහතා හා ශිරාණි බණ්ඩාරනායක අතර ප්‍රශ්නයක් ඇති වුණා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය හා සරත් එන්. සිල්වා අතර ගැටුමක් ඇති වුණා. අනුර බණ්ඩාරනායක කථානායකතුමා සහ අග විනිසුරුතුමා අතර ගැටුමක් ඇති වුණා. මේවා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අතුරු ඵල. මේ ව්‍යවස්ථාව තුළ සමාජ අර්බුද ගණනාවක් නිර්මාණය කළා.

ඒවා තමයි, මූල්‍ය අර්බුදය, ආර්ථික අර්බුදය, සංස්කෘතික අර්බුද, සමාජ අර්බුද. අවුරුදු හතළිහකට පස්සේ තමයි එක්සත් ජාතික පක්ෂයට විධායක ජනාධිපති ධුරය ගැන අලුත් අදහසක් ඇති වෙලා තිබෙන්නේ. අපේ නායකයෝ මේ ගැන දීර්ඝ කාලයක් රටට කරුණු අනාවරණය කරලා, ඒ වෙනුවෙන් පෙනී සිටිමින් ඒ වෙනුවෙන් අරගළ කළ ඉතිහාසයක් අපට තිබෙන්නේ. කමක් නැහැ. මේ විධායක ජනාධිපති ක්‍රමය තුළ ගොඩනැඟෙන අසීමිත බලය, එක් පුද්ගලයෙක් වටා ඒකරාශි වන බලය ඇත්තවශයෙන්ම ව්‍යවස්ථාදායකයට පැවරෙන්නට ඕනෑ. ඒකයි අපි කල්පනා කරන්නේ. රාජ්‍ය නායකයාට තිබෙන පරමාධිපත්‍ය බලය පැවරිය යුත්තේ පාර්ලිමේන්තුව හරහායි. අපේ පක්ෂයේ දැනට අදහසත් ඒක. එදා වමේ ව්‍යාපාරයේ බොහෝ දෙනාගේ මතය වී තිබුණේත් ඒක. මොකද, ඒකට හේතුවක් තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ විපක්ෂයක් ඉන්නවා; විවිධ පක්ෂ ඉන්නවා. පරමාධිපත්‍යය හසුරුවාලීමට, පාලනය කරන්නට, තුලනය කරන්නට මේ බහු පක්ෂ ක්‍රමයට පුළුවන්කමක් තිබෙනවා. එම නිසා පාර්ලිමේන්තුව ඒකාධිපති වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විධායක ජනාධිපති ධුරය ගත්තාම, විධායක ජනාධිපතිවරු හැසිරුණු හැටි අපි දන්නවා. විධායක ජනාධිපතිවරු හය දෙනෙකුගේ අත්දැකීම් අපට තිබෙනවා. විධායක ජනාධිපතිවරයා පක්ෂයේ නායකයා, ආණ්ඩුවේ නායකයා, සන්නද්ධ හමුදාවේ නායකයා, අණ දෙන නිලධාරිවරයා, අමාත්‍ය මණ්ඩලයේ නායකයා, රාජ්‍ය නායකයා. මේ වාගේ බලයක් ඒකරාශී වෙනකොට පාර්ලිමේන්තුව බාල්දු වෙනවා. ඇත්තවශයෙන්ම මේ හේතු මත වත්මන් දේශපාලන සංස්කෘතියට බලපෑමක් ඇති වෙනවා. අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනව වන සංශෝධනයට ඡන්දය පාවිච්චි කරනකොට අපිට කිව්වේ, "මේකත් එක්ක විසි වන සංශෝධනය එනවා" කියායි. "මැතිවරණ ක්‍රමය වෙනස් කරනවා" කියායි කිව්වේ. "යම් බලතල සීමා කිරීමක් අවශ්‍යයි" කියායි කිව්වේ. නමුත් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ විසි වන සංශෝධනය සාක්කුවේ දා ගත්තා. ඒ මැතිවරණ ක්‍රමය ජේ.ආර්.ජයවර්ධන මහත්මයා ගෙනාවේ එක පක්ෂයකට බහුතර බලයක් ගන්න බැරි විධියට විධායකය ඉස්සරහින් තියන්න; ව්‍යවස්ථාදායකය දුර්වල කරන්න. හෙටත් මේ මැතිවරණ ක්‍රමය තුළ ඒකයි තත්ත්වය. කාටවත් තුනෙන් දෙකක බහුතර බලයක් ගන්න බැහැ. සිතා මතාම සැලසුම් සහගතව අවශ්‍ය වූ නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තිය ඉස්සරහට ගෙනයන්න, බටහිර ගැති ආර්ථික ක්‍රියාවලියට මේ රට ගොදුරු කරන්න ගෙන ගිය ක්‍රියාදාමයේ, මූලෝපායයේ එක අරමුණක් තමයි දිස්ත්‍රික් නියෝජනය සහිත මැතිවරණ ක්‍රමය. අපි එදාත් ඒකට විරුද්ධ වුණා. අපි කිව්වා, "මේ දිස්ත්‍රික් සමානුපාතික ඡන්ද ක්‍රමය වෙනස් කරන්න" කියා. අදටත් ඒ ගැන සංවාදයක් නැහැ. අපේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවේත් ඇත්තවශයෙන්ම ඒ පිළිබඳව සඳහනක් නැහැ. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මේවාට තර්ක තිබෙනවා. දැන් සමහරු කියනවා, ජනවාර්ගික ගැටුම් එනකොට ඒවා පලානය කරන්නත් විධායක බලය අවශ්‍යයි කියා. ජනවාර්ගික අර්බුදය ගැටුමක් බවට පත් වුණේ කාගේ කාලයේද? ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ කාලයේ. ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා 1977 මැතිවරණයට එනකොට එම මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් කළා, "අපි මේ රටේ සියලුම

ජනවර්ග කොටස්වලට සමානව ජීවත් විය හැකි, මේ අර්බුදයට ස්ථිරසාර සාමයක් ගෙන එන වැඩ පිළිවෙළක් ක්‍රියාවට නඟනවාය කියා. එහෙම එකක් වුණාද?

බලයට එනකොට එහෙම තමයි කියන්නේ. ඒ, මේකේ නිර්මාතෘවරයා. නමුත්, ඔහු ඇවිල්ලා වසර දෙකක් තුනක් යනකොට රටේ ජාතිවාදී අරගළ මතු වුණා. භයානකම අරගළය 1983 අරගළයයි. එක රාත්‍රියක කොළඹ නගරයේ දමිළ ජනතාව 400ක් මැරුවා. එහෙම තමයි මේවාට උත්තර සැපයුවේ. මැතිවරණ ප්‍රකාශනවලින් කියපු ඒවා රටේ ක්‍රියාත්මක වෙනවා නම් අපට මෙවැනි සමාජ අර්බුද ඇති වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන අහිතකර ප්‍රතිවිපාක නිසා අද ව්‍යවස්ථා අර්බුද, පාර්ලිමේන්තු අර්බුද, අධිකරණයත් එක්ක නොහොඳතාවන් ආදී මේවා ඔක්කෝම වර්ධනය වෙලා තිබෙනවා. අපේ නායකයෝ එදා ගෙන ගිය ක්‍රියාවලියට විරුද්ධ වෙන්න අපට පුළුවන්කමක් නැහැ. එහෙම කළොත්, අපි මේ විධායක ජනාධිපති ක්‍රමයට පක්ෂ වෙනවා නම් ඒක ආත්ම වංචනයක්; ඒක දේශපාලන අවස්ථාවාදයක්; ප්‍රතිපත්ති විරහිතභාවයක්; ඒ වාගේම නව ලිබරල්වාදයට පක්ෂවීමක්. ඒ නිසා අපට කිසිසේත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න කියන යෝජනාවට විරුද්ධ වෙන්න පුළුවන්කමක් නැහැ. නමුත් මේ තිබෙන සියලු තත්ත්වයන් සලකා බලන විට රටට ගැළපෙන නව ව්‍යවස්ථාවක අවශ්‍යතාව තිබෙනවා. කෑලි කෑලි පුට්ටු කරපු එකක් නොවෙයි. නව ව්‍යවස්ථාවක අවශ්‍යතාව තිබෙනවා. වත්මන් දේශපාලන සංස්කෘතිය තුළ සහ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ, ඒ වාගේම අද මේ රටේ ජීවත්වන ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණ හා මානව හිමිකම් සුරැකීමේ අරමුණ ඇතිව, පරිසර සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීම ආදී මේ සමස්ත කරුණු පදනම් කර ගත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක අවශ්‍යතාව කාලීන වශයෙන් මතුවෙලා තිබෙනවා. එහෙම එකක් එනවාද කියන එක අපට පෙනෙන්නේ නැහැ. ඒ ව්‍යවස්ථා කෙටුම්පත දැන් හෙට අනිද්දා අධ්‍යයනය කරලා පාර්ලිමේන්තුවට එනවා, අවසාන විග්‍රහය කියලා. ඒකට විවිධ මත තිබෙනවා. එය මෙහෙම ආවොත් බෙදුම්වාදයට රට යයි කියලා සමහර අය කියනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා ගන්නා කාලය මට ඔබතුමා ලබා දෙන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු මන්ත්‍රීතුමා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මෙහෙයුම් කමිටුවේ ඉන්න නිසා මම එක දෙයක් කියන්න ඕනෑ. නව ව්‍යවස්ථාවක් එන්න තව ගොඩක් කල් තිබෙනවා. මොකද, ව්‍යවස්ථා කෙටුම්පතක් දැනට නිර්මාණය වෙලා නැහැ. ව්‍යවස්ථාව සම්බන්ධව විවිධ යෝජනා තිබුණා. ඔබතුමන්ලාගේ පක්ෂයේ නියෝජිතයන් ඇතුළුව සියලුම අය දුන් යෝජනා ඔක්කෝම එකතු කරලා අපි ලේඛනයක් හදලා තිබෙනවා. ඒ ලේඛනය තමයි එන්න තිබෙන්නේ. ඒක පාර්ලිමේන්තුවට ආවාට පසුව අපි සාකච්ඡා කරනවා. තුනෙන් දෙකේ බලයෙන් එය සම්මත විය යුතුයි. ඔබතුමා මට වැඩිය ඒ ගැන දන්නවා. ඒ වාගේම ජනමත විචාරණයකට යන්න ඕනෑ. හදිසියේ ගෙනෙන්න බැහැ. දෙමළ ජාතික සන්ධානයේ නායක සම්පන්දන් මැතිතුමා ඒ අවස්ථාවේදී පැහැදිලිව කියලා තිබෙනවා, සිංහල ජනතාවට -බහුතර ජනතාවට- හංගලා හොරෙන් තීන්දු ගන්න එපා කියලා. හරිනේ ඒක. ඒක හොඳයි. ඒ ස්ථාවරය අපි ඔක්කෝම පිළිගනිමු. දේශපාලන මතභේද තිබෙන්න පුළුවන්. ඔබතුමා වාමාංශික නායකයෙක් බව මම දන්නවා. දේශපාලනය පැත්තකට දමා අපි ජාතික ප්‍රශ්න පිළිබඳව විසඳුම් හොයා ගනිමු. සම්පන්දන් මහත්තයා එතුමාගේ ස්ථාවරය කියලා තිබෙනවා, සිංහල ජනතාවට හොරෙන් හංගලා කරන්න එපා කියා. එය මට වගකීමකින් කියන්න පුළුවන්. එහෙම කරලා වැඩකුත් නැහැනේ. එපමණයි. බොහොම ස්තුතියි.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
බොහොම ස්තුතියි. මේ රටේ හුඟාක් සිද්ධ වුණේ හංගලා ගහපු ඒවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මනෝ ගනේසන් මන්ත්‍රීතුමා මගේ වෙලාව ගත් නිසා මට විනාඩියක කාලයක් ලබා දෙන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙය ඇත්තවශයෙන්ම ජනතාවගේ කැමැත්ත මත ඉදිරිපත් විය යුතු ලියවිල්ලක්. ඒ නිසා සාකච්ඡා සංවාදයන් අවශ්‍යයි. ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. සමහර අයගේ අදහසක් තිබෙනවා එහෙම ව්‍යවස්ථාවක් ආවොත්, විධායක බලය අහෝසි වුණොත් බෙදුම්වාදයට ඉඩක් ලැබෙනවා කියලා.

මම ඒක පිළිගන්න කෙනෙක් නොවෙයි. මම ඒක පිළිගන්නේ නැහැ. නමුත් අපි,- [බාධා කිරීමක්] ඒක දැන් කථා කරන්න පුළුවන් වෙලාවක් නොවෙයි. ඉදිරි කාලයේදී ඒ ගැන අපේ අදහස් කියන්න පුළුවන්. නමුත් අපට අවශ්‍යයි,-

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඔබතුමාගේ මතය බහුතරයේ මතය නොවෙයිනේ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
බහුතර මතය ගැන කථා කරන්නේ නැතුව ඔබතුමා දැන් මගේ මතයට කන් දෙන්නකෝ. මම දරන්නේ මා නියෝජනය කරන දේශපාලන පක්ෂයේ අදහස. මම ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ, ලෝකයේ ආර්ථික ක්‍රියාදාමවල ඇති වන වෙනස්කම්, ගෝලීය තත්ත්වය, පරිසර තත්ත්වය, සමාජ සංස්කෘතික තත්ත්වය පදනම් කරගත් සහ සුළු ජාතික අයිතිවාසිකම් ලබා දෙන ක්‍රමවේදයක් මේ තුළ අන්තර්ගත වෙන්න ඕනෑ බව.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලබා දුන් කාලය දැන් අවසන්.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මොකද, විධායක ජනාධිපති ක්‍රමය ස්ථාපිත වුණාට පසුව තමයි යුද්ධය ඇති වුණේ. මම කලිනුත් කිව්වා වාගේ, ජේ.ආර්. ජයවර්ධන මහත්මයා විධායක ජනාධිපති වශයෙන් බලයට ඇවිල්ලා මාස ගණනකින් පස්සේ තමයි වාර්ගික ගැටුම් ඇති වුණේ. ජූලි කලබල සිද්ධිය අපි දන්නවා. එදා අපේ පක්ෂයේ නායකයෝ අත්අඩංගුවට ගත්තා. මොකද, සෝවියට් දේශයයි, වාම ව්‍යාපාරයයි සම්බන්ධ කරලා මේක වෙනත් අරමුණකට ගෙනයන්න ඔවුන් බැලුවා. ඒක තමයි එක්සත් ජාතික පක්ෂයට ඕනෑ වුණේ. ඒවා අපි ප්‍රතික්ෂේප කරනවා. අපි කියනවා, රට වෙනුවෙන් සාධාරණ හා යුක්ති සහගත විසඳුමක් එනවා නම්, ඊට සහාය දෙන බව. හැබැයි, එය රට නොබෙදෙන විසඳුමක් විය යුතුයි. කවුරුත් ඒ ගැන එකඟත්වය පළ කරලා තිබෙනවා. ගරු මනෝ ගනේසන් මැතිතුමා කිව්වා වාගේ,- ඔබතුමා දැන් ඇමති කෙනෙක්ද?

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
මා දන්නේ නැහැ.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඔබතුමාට ඇමතිකමක් ලැබේවා කියලා මා ප්‍රාර්ථනා කරනවා. පුවත් පත්වල නම් තිබුණා, ඔබතුමා ඇමතිකමක් ඉල්ලන්නේ නැහැ කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එවැනි සාධාරණ විසඳුමකට අපි කිසි ලෙසකින් විරුද්ධ නොවන බවත්, බාධා නොකරන බවත් ප්‍රකාශ කරමින් මට ලබා දුන් කෙටි අවස්ථාව පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
මීළඟට ගරු අජිත් පී. පෙරේරා මහතා.

[අ.භා.3.17]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම වටිනා කල් තැබීමේ විවාදයේදී කථා කිරීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මා ඉතාම සතුටු වෙනවා.

අපි පසුගිය මාස දෙකක කාලය තුළ -ඔක්තෝබර් මාසයේ 26වැනි දා සිට මේ දක්වා කාලය තුළ- විධායක ජනාධිපති ධුරය පිළිබඳව, විධායක ජනාධිපති ධුරයට කරන්න පුළුවන්, කරන්න බැරි දේවල් පිළිබඳව, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය සතු හැකියා සහ නොහැකියා පිළිබඳව විශේෂ අත්දැකීමක් ලැබුවා. එක පැත්තකින්, බරපතළ දේශපාලන සහ සාපරාධී, රාජ්‍ය විරෝධී, දේශද්‍රෝහී කුමන්ත්‍රණයක් ක්‍රියාත්මක වුණා. අනෙක් පැත්තෙන්, අපේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් සහතික කර තිබෙන සංවරණ සහ තුලන ක්‍රියාත්මක වෙලා, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය හරහා එම කුමන්ත්‍රණය පරාජයට පත් කරන්න අපට හැකියාවක් ලැබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම හැකියාවක් ලැබීම එක පැත්තකින් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයේ පරිණතකම පෙන්නුම් කරන්නක්. අනෙක් අතට, ඒ මඟින් මේ රටේ පුරවැසියන් ලබා තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී ජයග්‍රහණවල වටිනාකම පෙන්නුම් කරනවා. ඒත් එක්කම, එම ප්‍රජාතන්ත්‍රවාදී ජයග්‍රහණ ලබා ගන්න දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් විධායකය මත බරපතළ සංවරණ සහ තුලන හඳුන්වා දීලා, ඒ හරහා මේ රටේ පුරවැසියන් ශක්තිමත් කිරීමට අවශ්‍ය කරන පියවර ගැනීමට හැකිවීම පිළිබඳව මා ඉතාම සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පිළිබඳ සාකච්ඡාව ආරම්භ කිරීමට කලින්, මෙම අරගළය පුරා අපට සහාය දුන් මේ රටේ සාමාන්‍ය පුරවැසියන්ට, ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන්ට, විනිශ්චයකාරතුමන්ලා ඇතුළු අධිකරණ ක්‍රියාදාමයට, ඒ වාගේම විවිධාකාරයෙන් අපට සහාය දුන් ජනමාධ්‍යට -ඒ සියලුදෙනාටම- අපි ස්තුතිවන්ත වෙන්නට ඕනෑ, දුෂ්කර හා අඳුරු අවස්ථාවෙන් එළියට ඒමට අපට අවකාශ සලසා දීම ගැන.

මේ ජයග්‍රහණ හරහා අපේ රටට අලුත් අවධියක් එළඹෙනවා. ඒ අවස්ථාවේ තමයි මේ වටිනා වූ විවාදය අපට ලැබෙන්නේ. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාවලිය ඇත්තවශයෙන්ම සම්පූර්ණයෙන්ම අතහැර දමා තිබූ ක්‍රියාදාමයක්. මනෝ ගනේසන් මන්ත්‍රීතුමා මීට පෙර කතා කළා. ඒ වාගේම චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමාත් කථා කළා. එතුමන්ලා දන්නවා, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ක්‍රියාදාමය සෑහෙන දුරක් ගිය නමුත්, ධෛර්යසම්පන්නභාවයක් නොමැතිකම නිසා අතහැර දමා තිබූ ක්‍රියාදාමයක් බව. මේ අලුත් අත්දැකීම හරහා අපට අවකාශයක් සලසනවා මේ සමස්ත ක්‍රියාදාමය දෙස නැවත හිතා බලන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වාර්තාගත කර තැබීම සඳහා පෞද්ගලිකව මා දරන ප්‍රතිපත්ති දෙකක් සඳහන් කරනවා. පළමුවන කරුණ මේකයි. මොනම හේතුවක් නිසාවත් මේ රටේ රාජ්‍ය ව්‍යුහයේ ඇති ඒකීයභාවය -unitary nature- වෙනස් කරන ආකාරයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයකට මගේ ඡන්දය, අනුමැතිය, සහාය ලැබෙන්නේ නැහැ. හුදු වචනයට පමණක් නොව, ඒකීය යන වචනයට පමණක් නොව, ඒකීය රාජ්‍ය ව්‍යුහයකට නීතියේ අර්ථයෙන් තිබිය යුතු වන්නා වූ සෑම අංගයක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත විය යුතුව තිබෙනවා. දෙවන කරුණ මේකයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බුදු දහමට ප්‍රමුඛතාව සහ අනෙකුත් ආගම්වලට සාධාරණත්වය සහතික කර ඇති නව වන ව්‍යවස්ථාව වෙනස් කිරීම අවශ්‍ය වන්නේ නැහැ. එහි ඇති වචන මීට වඩා හොඳට යොදන්න පුළුවන් ද නැද්ද කියන එක ගැන වාදයක් තිබෙනවා. නමුත් ආගමික සමගිය සඳහාත්, ඒ වාගේම, වඩාත් බරපතළ ව්‍යවස්ථාමය සංශෝධනවලට එරෙහි වන කණ්ඩායම්වලට ආයුධ සැපයීම නතර කිරීම සඳහාත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන ව්‍යවස්ථාවේ ඇති බුදු දහමට ඇති ප්‍රමුඛතාව සහ අනෙකුත් ආගම්වලට සාධාරණත්වය පිළිබඳ වූ වගන්තිය ඒ ආකාරයෙන්ම තිබිය යුතුයි කියා මා විශ්වාස කරනවා. මොකද, නව වන ව්‍යවස්ථාව බුදු දහම පිළිබඳ පමණක් ඇති

ව්‍යවස්ථාවක් නොවෙයි, අනෙකුත් ආගම්වලටත් ඒ මඟින් ඒ ආරක්ෂාව ලැබිලා තිබෙන නිසා. අපේ රටේ ඇති ආගමික අසමගිය පිළිබඳ කාරණා මේ නව වන ව්‍යවස්ථාවේ තිබෙන ප්‍රශ්නයක් නොවෙයි, රටේ පුරවැසියන්ගේ හැසිරීම පිළිබඳව සහ නීතිය සාමය පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා රටේ ඒකීයභාවය පිළිබඳ කාරණයත්, බුද්ධ දහමට ඇති ප්‍රමුඛතාව පිළිබඳ කාරණයත් අනාගත ව්‍යවස්ථා සංශෝධනයකදී කිසිදු වෙනසකට ලක් නොවිය යුතුයි කියලා මා මූලිකව කියන්න කැමැතියි. ඊට යටත්ව, මේ රටේ විධායක ආණ්ඩු ක්‍රමය වෙනස් කිරීම පිළිබඳ මගේත්, මගේ පක්ෂයේත් ඇති කැපවීම මා ප්‍රකාශ කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි 2015දී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ජනාධිපති අපේක්ෂක වශයෙන් ඉදිරිපත් කරලා "මෛත්‍රී පාලනයක්- ස්ථාවර රටක්" පිළිබඳ අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරපු අවස්ථාවේ අපි විධායක ජනාධිපති ධුරය ඉවත් කිරීම පිළිබඳ ස්ථිරසාර කැපවීමක් කළේ නැහැ යි කියලා ඇතැම් දැනුවත් කථිකයන් පවා බොහෝ විට ප්‍රකාශ කරනවා. මම කැමැතියි, එම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 14 වන පිටුව උපුටා දක්වන්න. එහි බොහොම පැහැදිලිව දැක්වෙනවා, "දැනට පවතින අත්තනෝමතික විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට කැබිනට් මණ්ඩලය හරහා පාර්ලිමේන්තුව හා සම්බන්ධ වූ විධායකයක් සහිත ආණ්ඩුක්‍රම ව්‍යුහයක් වනු ඇත." කියලා. ඒ කියන්නේ, විධායක ජනාධිපති ක්‍රමය වෙනස් වෙනවා; පාර්ලිමේන්තුවට විධායක බලය පැවරෙනවා; ඒ හරහා පාර්ලිමේන්තුව ශක්තිමත් වෙනවා කියන එක. මෙම ක්‍රියාදාමය පිළිබඳව අපේ ඇති ඒ කැපවීම රටේ ජනතාව අනුමත කර තිබෙනවා. ඒ මූලධර්මයෙන් ඔබ්බට යන්න අපට හැකියාවක් නැහැ.

ඒ වාගේම, නැවත වරක් අපි 2015 අගෝස්තු මාසයේ දී "මාස 60කින් අලුත් රටක් හදන පංච විධ ක්‍රියාවලිය" කියන එක්සත් ජාතික පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 12 වන පිටුවේ සඳහන් කරලා තිබෙනවා, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තැනීම පිණිස අපි කටයුතු කරනවාය කියන කාරණය. ඒ වාගේම, ඒකීය රාජ්‍යයක් යටතේ සියලුදෙනාගේ සම්මුතියෙන් සිදු කළ හැකි උපරිමාකාරයෙන් බලය බෙදීමට පියවර ගැනීමට අපි පොරොන්දු වෙලා තිබෙනවා. ඒ වාගේම, පාර්ලිමේන්තුවට වග කියන, අගමැති සහ කැබිනට් මණ්ඩලයේ උපදෙස් අනුව ජනාධිපතිවරයා ස්වකීය බලතල ක්‍රියාත්මක කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්න පොරොන්දු වෙලා තිබෙනවා.

පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය ආරක්ෂා කරන්නත් අපි පොරොන්දු වෙලා තිබෙනවා. ඒ අනුව අපිට ආපසු හැරෙන්නට බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මෙතැන තිබෙන ගැටලුව මේකයි. විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවා නම්, රටේ සම්පූර්ණ ජනතාවගේ ඡන්දයෙන් තෝරා ගන්නා ජනාධිපතිවරයෙක් අවශ්‍ය වන්නේ නැහැ. එහෙම බලතල නැති ජනාධිපතිවරයෙක් වෙනුවෙන් රට පුරාම ඡන්දයක් පවත්වන්න අවශ්‍යත් නැහැ; ගැළපෙන්නේත් නැහැ. එහෙම නම් පාර්ලිමේන්තුව තුළ ස්ථාවරභාවයක් ඇතිවීම සඳහා ව්‍යවස්ථාමය වශයෙන් අපි ගන්නා වූ ආරක්ෂිත පියවර මොනවාද? ඒ සඳහා අපි ඡන්ද ක්‍රමය වෙනස් කරනවාද, ඒ සඳහා අපි වෙනත් උපක්‍රම පාවිච්චි කරනවාද කියන කාරණයට අපි යන්න ඕනෑ.

අපි උදාහරණයක් විධියට ගත්තොත්, දහනව වන ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා හඳුන්වා දුන්, 70. (1) ව්‍යවස්ථාවේ අවුරුදු හතරහමාරක කාලයක් යනතුරු පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සඳහා කිසිදු අවකාශයක් නොමැති බවට වූ ප්‍රතිපාදනයේ ස්ථාවරභාවය පෙන්නුම් කරනවා. ඒ වාගේම ඇමෙරිකා එක්සත් ජනපදය ගත්තොත්, එහි සෙනෙට් සභාවත්, කොංග්‍රසයත් fixed-term ක්‍රමයට තමයි තිබෙන්නේ. එහි ස්ථිරසාර, නිශ්චිත දිනවල තමයි මැතිවරණ පවත්වන්නේ. අතරතුර කාලය තුළ අනිවාර්යයෙන්ම පක්ෂවලට සිද්ධ වෙනවා, එකඟතාව මත ඉස්සරහට යන්න. ඒක තමයි සංස්කෘතිය; ඒක තමයි සම්ප්‍රදාය. එහෙම කටයුතු කිරීම තමයි පුරවැසියන් අපේක්ෂා කරන්නේ. ඒ අනුව එකඟතාවෙන් යුතුව රටකට ඉස්සරහට යන්න පුළුවන්කම ලැබෙනවා. බ්‍රිතාන්‍යයේත් fixed-term පාර්ලිමේන්තු ක්‍රමය හඳුන්වා දුන්නා. ලෝකයේ ප්‍රවණතාවක් තිබෙනවා, ස්ථාවර පාර්ලිමේන්තු කරා යොමුවීමේ අවශ්‍යතාව පිළිබඳව. ඒ නිසා මම හිතන විධියට මේ වේලාව වෙනකොට, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම ගැට ගැසෙනවා, ස්ථාවර පාර්ලිමේන්තුවක් සඳහා වූ ප්‍රතිපාදන සමඟ. හුදෙකලාව විධායක ජනාධිපති ක්‍රමය සම්පූර්ණයෙන් අහෝසි කොට නාමික පාර්ලිමේන්තුවෙන් පත් වන්නා වූ, නැත්නම් නම් කරන්නා වූ ජනාධිපතිවරයෙක් හඳුන්වා දීම තුළින් පමණක් රටක පාලනය පිළිබඳ අවශ්‍ය වන ස්ථාවරභාවය සහ පැහැදිලි බව ගොඩනැඟෙන්නේ නැහැ.

අපි දැක්ක තව දෙයක් තමයි, ව්‍යවස්ථාවේ අද තිබෙන තත්ත්වය, -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මට තව විනාඩියක් පමණක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද තිබෙන තත්ත්වය අනුව බල කේන්ද්‍ර දෙකක් තිබෙනවා. ඒ තමයි ජනාධිපතිවරයා සහ අග්‍රාමාත්‍යවරයා. ඇත්ත වශයෙන්ම මේ තත්ත්වයෙන් රට ඉදිරියට ගෙන යාම ඉතා අසීරුයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා බල කේන්ද්‍ර දෙකක් වෙනුවට පාර්ලිමේන්තුව බල කේන්ද්‍රය බවට පත් වන, පාර්ලිමේන්තුවට වග කියන, පාර්ලිමේන්තුවෙන් තේරී පත්වන, පාර්ලිමේන්තුවේ බහුතර මතය අනුව තේරී පත් වන්නා වූ අගමැතිවරයෙක් සහ අමාත්‍ය මණ්ඩලයක් විසින් රට පාලනය කරන පාලන ක්‍රමයක් වෙනුවෙන් අප කැප විය යුතුයි. ජනාධිපතිවරයෙක් අවශ්‍යයි. සීමිත බලතල සහිත ඒ ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතුයි. සත්‍ය වශයෙන්ම ඒ සඳහා ප්‍රතිපාදන අපි සැකසිය යුතුයි. එපමණක් තමයි අපට කළ හැකි වන්නේ. එසේ නොකළහොත්, මේ ආකාරයෙන් ඉදිරියට ගියහොත්, රටේ සංවර්ධනය අඩාල වෙනවා; ජාතික සමඟිය, බල බෙදීම සහ අනෙක් අවශ්‍යතා අපට ඉෂ්ට කර ගන්න සිද්ධ වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා එක්සත් ජාතික පක්ෂයට ආපසු හැරෙන්න බැහැ; එක්සත් ජාතික පෙරමුණට ආපසු හැරෙන්න බැහැ. මේ රටේ ජනතාව අවස්ථා කිහිපයකදීම අනුමැතිය ලබා දීලා තිබෙනවා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට. ස්ථාවර පාර්ලිමේන්තුවක් ඇති කරන ක්‍රමවේද සමඟ මේ ක්‍රියාවලිය කළ යුතුයි කියන යෝජනාව මම කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා.

[අ.භා.3.28]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ඊයේ දිනයේ දී ඉදිරිපත් කරන ලද සභාව කල්තබන අවස්ථාවේ යෝජනාවට අදාළව සිදු කරන මෙම විවාදය මේ මොහොතේ ඉතාම කාලෝචිත විවාදයක් විධියට අප දකිනවා. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් කථා කරන්නට ලැබීම ගැනත් සන්තෝෂ වෙනවා.

අද අපි කථා කරන්නේ, රටේ තිබෙන ප්‍රධාන ප්‍රශ්නයට මූලික වූ රටේ මුල් පුරවැසියා ගැනයි. විධායක ජනාධිපති ක්‍රමය කියන්නේ මේ රටේ තිබුණු සියලුම ජනාධිපතිවරණ කාලවලදී කරළියට ආපු කාරණයක්. අපවත් වී වදාළ මාදුළුවාවේ සෝභිත හිමිපාණන් වහන්සේව මම මේ මොහොතේ සිහිපත් කරනවා. උන්වහන්සේ සාධාරණ සමාජයක් ප්‍රාර්ථනා කළා. සාධාරණ සමාජයක් නිර්මාණය කරන්න මූලික වෙලා කටයුතු කළා. එසේ මූලික වෙමින් ප්‍රධානම කාරණය හැටියට උන්වහන්සේ හැම දාම ඉල්ලුවේ මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතුයි කියන දෙයයි. ඒ වාගේම මේ රටේ තිබුණු ජනාධිපතිවරණ පහක් ගැන මම කියන්න කැමැතියි. ඒ තමයි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ජනාධිපති හැටියට පත්වුණු ජනාධිපතිවරණ දෙක, මහින්ද රාජපක්ෂ මහත්මයා ඉදිරිපත් වී ජනාධිපති හැටියට පත් වුණු ජනාධිපතිවරණ දෙක සහ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති හැටියට පත් වුණු 2015 පැවැති ජනාධිපතිවරණය.

පසුගිය ජනාධිපතිවරණ පහේදීම ප්‍රධාන පාඨය වුණේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කියන එකයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ ජනතාව විධායක ජනාධිපති ක්‍රමය කෙතරම් පිළිකුල් කළා ද කියන එක ඒකෙන්ම පැහැදිලියි. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවට ජනතා විමුක්ති පෙරමුණත් එක්ක එකඟ වුණු ආකාරය අපට මතකයි. ඒ අවස්ථාවේ දී එතුමිය ජනතාවත් රැවැට්ටුවා; ජනතා විමුක්ති පෙරමුණත් රැවැට්ටුවා. ඒ වාගේම, මහින්ද රාජපක්ෂ මහත්මයාත් එතුමාගේ ජනාධිපතිවරණ ප්‍රචාරක අවස්ථා දෙකේදීම විවිධ කණ්ඩායම් එකතු කර ගත්තා. ඒ වෙලාවේ එතුමාත් ඒ සියලුම කණ්ඩායම් රැවැට්ටුවා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කියලා. 2015දී මෛත්‍රීපාල සිරිසේන මහත්මයා බලයට ආවේ දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නයි. එතුමා සියයට සියයක් විධායක ජනාධිපති ක්‍රමයේ බලතල අහෝසි නොකළාට, යම් බලතල ප්‍රමාණයක් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා අඩු කළා; ඉවත් කළා. මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරණවල සියලුම ප්‍රචාරක කටයුතුවලදී දුන්නු පොරොන්දු අපට මතකයි. හැබැයි, අද වෙනකම් පසුගිය ජනාධිපතිවරණ පහ තුළදී පත් වුණු ජනාධිපතිවරු තුන්දෙනාම මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණු දේ ඉටු නොකරපු ජනාධිපතිවරු බවට පත් වෙලා තිබෙනවා. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා යම් කොටසක් කළත්, සම්පූර්ණ කොටස කරගන්න බැරි වුණා. ඒ නිසා විධායක ජනාධිපති ක්‍රමය මේ රටට අවශ්‍යද, නැද්ද කියන කාරණය පිළිබඳව ඉතාම සරල තර්කයකින් කථා කළොත්, එය මේ රටට අවශ්‍ය නැහැ කියන එක පිළිබඳව වැඩිම ජන මතයක් තිබෙනවා. විධායක ජනාධිපති ක්‍රමය රටට අවශ්‍යද, නැද්ද කියන එක සම්බන්ධයෙන් අපි ජනමත විචාරණයකට ගියොත්, අනිවාර්යෙන්ම රටේ බහුතර මතය විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතුයි කියන තැන ඉන්නවා.

මේ විධායක ජනාධිපති ක්‍රමය තුළ තිබුණු බරපතළකම අපි දැක්කා. පසුගිය කාලයේ රටේ මාධ්‍ය සියල්ලම ජනාධිපති මාධ්‍ය අංශය විසින් පාලනය කරනු ලැබුවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලයේ දී මාධ්‍ය සියල්ලම සම්පූර්ණයෙන්ම ජනාධිපති මාධ්‍ය අංශයෙන් තමයි පාලනය වුණේ. මාධ්‍ය හැසිරුණේ කොහොමද කියන එකත් අපි දැක්කා. අනෙකුත් රාජ්‍ය ආයතන බහුතරයක්, සමහර වෙලාවට අධිකරණය පවා එවැනි තත්ත්වයට තල්ලු වුණා. කුප්‍රකට අග්‍රවිනිශ්චයකාරවරයකු වූ සරත් එන්. ද සිල්වා මහත්මයා තුන්, හතර වතාවක් මේ ගැන පාපෝච්චාරණය කළා අපට මතකයි. සුනාමි නඩුවේ දී දුන්නු තීන්දුවෙන් පස්සේ, ඒ ලබා දුන් තීන්දුව ගැන පාපෝච්චාරණය කළා. මේ සියලුම කාරණා බලපෑවේ මේ රටට නොගැළපෙන විධායක ජනාධිපති ක්‍රමය නිසායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මම මතක් කරලා දෙන්න ඕනෑ තව කාරණයක් තිබෙනවා. මේ විධායක ජනාධිපති ක්‍රමය ගැන සාකච්ඡා කරනකොට, හදිසියේවත් මේ විධායක ජනාධිපති ක්‍රමය උන්මත්තකයෙකුට, නැත්නම් පිස්සෙකුට ගියොත් මොකද වෙන්නේ කියන කාරණය පිළිබඳව යම් යම් මන්ත්‍රීතුමන්ලා පළ කළ අදහස් මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ්ගත වෙලා තිබෙනවා. මෙහි බරපතළකම මේ පාර්ලිමේන්තුව එදාත් දැක්කා. මේ බරපතළකම එදාට වඩා ඉතාමත් දැඩිව අදට ගැළපෙනවා. විධායක ජනාධිපති ක්‍රමය යම් යම් අර්බුදවලට හේතු වෙලා තිබෙනවා. අත්තනෝමතික පාලන ක්‍රමයන්වල තිබෙන වරදවල් තමයි මේ හේතු වෙලා තිබෙන්නේ. උදාහරණයකට මේ දවස්වල අපි කථා කරන විපක්ෂ නායක ධුරය ගැනත්, පසුගිය දවස්වල ඇතිවුණු අර්බුදයත්, මේ සියලු දේවල් උද්ගත වෙලා තිබෙන්නේ විධායකයේ තිබෙන දැඩිභාවය නිසයි. මේ අර්බුද ඇති වෙලා තිබෙන්නේ පැහැදිලි තීන්දු, සාධාරණ තීන්දු ගන්නේ නැති නිසයි. අද අපට ප්‍රශ්නයක් පැන නඟිනවා. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා හැටියට එතුමා කියනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරු එක්සත් ජාතික පක්ෂයත් එක්ක ආණ්ඩුවට ගිහිල්ලා ඇමති ධුර බලාපොරොත්තු වෙනවා නම්, එතුමා ඒ ඇමති ධුරවලට අත්සන් කරන්නේ නැහැ කියලා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා හැටියට එතුමා බොහොම හොඳයි. එහෙම නම්, එතුමා ඍජු තීන්දුවක් අරගෙන තිබෙනවාය කියා හිතන්න පුළුවන්. ඒ එක්කම, විපක්ෂ නායක හැටියට මහින්ද රාජපක්ෂ මහත්මයාගේ නම යෝජනා වෙනවා. නමුත් මහින්ද රාජපක්ෂ මහත්මයා ඇතුළු කණ්ඩායම "පොහොට්ටුවේ" සාමාජිකත්වය ගන්න හැටි අපි පැහැදිලිවම දැක්කා. මහින්ද රාජපක්ෂ මහත්මයා මුලින්ම පොහොට්ටුවේ සභාපතිවරයා වන ජී.එල්. පීරිස් මහත්මයාගෙන් සාමාජිකත්වය අරගෙන, ඊට පස්සේ එතුමාම තමයි අනික් අයට පොහොට්ටුවේ සාමාජිකත්වය ප්‍රදානය කරන්නේ. එතකොට double standards සම්බන්ධයෙන් අපට මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා එක වෙලාවක කියනවා, "ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් cross over කරලා ඇමති ධුරවලට එනවා නම් මම ඒවාට අත්සන් කරන්නේ නැහැ" කියා. නමුත් මහින්ද රාජපක්ෂ මහත්මයා පොහොට්ටුවේ සාමාජිකත්වය ගත්තාට එතුමාට ඒක අදාළ වෙන්නේ නැහැ. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කණ්ඩායම, එතුමා විපක්ෂ නායකවරයා විධියට ගන්න පුළුවන්ය කියන තර්කය හදාගෙන ඉන්නවා. මේක පැහැදිලි ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නයටත් බලපාන්නේ

විධායකයේ තිබෙන මේ ගැටලුයි; අර්බුදකාරී තත්ත්වයයි. අපි මෙහෙම හිතමු. දෙවරක් ජනාධිපති ධුරයේ ඉඳලා, අගමැතිවරයෙක් හැටියට ඉඳලා, කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විධියට ඉඳලා, නැවත

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

අගමැති වෙලා, නැවත විපක්ෂ නායකවරයා වෙන්න තිබෙනවා නම් කියලා මහින්ද රාජපක්ෂ මහත්මයාට හිතෙනවා නම්, එතුමාට පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියන්න පුළුවන් හොඳම දෙය මේකයි. "මම මේ පොඩි විගඩමක්, නැත්නම් පොඩි තොවිලයක් නැටුවේ, මම බැලුවා, මේ ආණ්ඩුව බලෙන් අල්ලාගෙන ඡන්දයකට යන්න පුළුවන්ද කියා, ඉතින් ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව විසුරුවා හැරියා, ඡන්දයකට යයි කියා හිතුවා, ඒ ගමන තමයි අපි 'ටක්' ගාලා 'පොහොට්ටුවේ' සාමාජිකත්වය ගත්තේ, ඒකත් හරි ගියේ නැහැ, ඒ නිසා මම ජනතාවට කියනවා, අපි දැන් පොහොට්ටුවේ නොවන බව" යනුවෙන් එතුමාට කියන්න වෙනවා; මේ පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ධුරයේ ඉන්න නම් එතුමාට එවැනි ප්‍රකාශයක් කරන්න වෙනවා. එහෙම නැත්නම් මේ double standards සඳහා එතුමා පිළිතුරු ලබා දිය යුතු වෙනවා.

"ඔබතුමන්ලා වෙන තැනකට ගියොත් ඔබතුමන්ලාට ලැබෙන ඇමති ධුර සඳහා අත්සන් කරන්නේ නැහැ" කියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා තව කොට්ඨාසයකට කියනවා නම්, මහින්ද රාජපක්ෂ මහත්මයාටත් ඒ තර්කයම බලපානවා. මේ ප්‍රශ්න මතු වෙලා තිබෙන්නේ, විධායකයේ මේ අත්තනෝමතික ක්‍රියා කලාපය නිසායි. මේ රටේ උද්ගත වෙලා තිබෙන සියලුම ප්‍රශ්නවලට මූලික වෙලා තිබෙන්නේ මේ විධායක ජනාධිපති ක්‍රමයයි. ප්‍රජාතන්ත්‍රවාදය සුරකින, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය සුරකින පාර්ලිමේන්තුවක් තුළ පත් කර ගත් ජනාධිපතිවරයෙක් රටට අවශ්‍ය වෙන්නේ ඒ නිසායි. ඒ ක්‍රමවේදය තුළ, වැඩි බලය පාර්ලිමේන්තුවේ ඉන්න අගමැතිවරයාට යන්න ඕනෑ. තවදුරටත් හිතනවා නම්, අපට විධායක අගමැතිවරයෙක් නිර්මාණය කරන්නත් පුළුවන්; ඒ එක්කම පාර්ලිමේන්තුව හරහා පත් කර ගන්නා ජනාධිපතිවරයෙක් හදන්නත් පුළුවන්. අපේ නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉතා හොඳ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා.

මේ හරහා කථා කරන කාරණා තවදුරටත් මේ සමාජයේ සාකච්ඡාවට භාජන වෙලා, විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හැටියට ඒ දේවල් අපි මේ පාර්ලිමේන්තුවේදී සාකච්ඡා කරමු. අවශ්‍ය නම්, තුනෙන් දෙකක ඡන්ද බලයක් ලබාගෙන විධායක ජනාධිපති ධුරය අහෝසි කළ යුතුයි කියන තැන අපි ඉන්නවා. ඒ වාගේම ජනමත විචාරණයකට යා යුතු නම්, සංශෝධනත් එක්ක යා යුත්තේ කොහොමද කියන එක ගැන අපට සාකච්ඡා කළ හැකියි. මේ රටට ගැළපෙන, රටේ අනාගතය ගැන හිතන, රටේ ප්‍රජාතන්ත්‍රවාදය සුරකින පාර්ලිමේන්තුවක් නිර්මාණය වීම තුළ විතරයි මේ රටේ දැවෙන ප්‍රශ්නවලට විසඳුම් සොයා ගත හැකි වන්නේ.

බොහොම ස්තුතියි.

[අ.භා. 3.38]

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම විවාදයට සම්බන්ධ වෙන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න ඕනෑය කියා ජනතා විමුක්ති පෙරමුණ කීප වතාවක්ම මැතිවරණවලදීත් කිව්වා. චන්ද්‍රිකා මැතිනිය ජනාධිපතිවරණයට යන කොටත් ඒ අය මේ යෝජනාව ගෙනැල්ලා ඒ මැතිවරණයෙන් අයින් වුණා. එතුමන්ලා හැම දාම කාට හෝ උදව් කරනවා. එහෙම උදව් කරලා, ඒ අය ඊළඟට ඒ පැත්තෙන් අයින් වෙලා වෙනත් පැත්තකට යනවා. එතුමන්ලා පසුගිය ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට වක්‍රව උදව් කරලා, ඊට පසුව ආපසු විපක්ෂයට වෙලා මෙවැනි යෝජනා ගෙන එනවා. එහෙම නම්, ආණ්ඩුවේම ඉඳලා එතුමන්ලාට විධායක ජනාධිපති ක්‍රමය ඉවත් කර ගන්න පුළුවන් නේ. එතුමන්ලා ආණ්ඩුවටම වෙලා ඉඳලා ඒ කටයුත්ත කරන්න ඕනෑ. නමුත් එහෙම කළේ නැහැ.

විධායක ජනාධිපති ධුරය පැවැති සෑම වෙලේම මේ රටේ ඝාතන සිදු වුණා; රටට වැඩදායී නොවන ගිවිසුම් අත්සන් කළාය කියා අද එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් කීපදෙනෙකුම කථා කරද්දී කිව්වා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කළා. රට තුළ ඇඳිරි නීතිය දමාගෙන, හදිසි නීතිය දමාගෙන ගිවිසුම් අත්සන් කළ හැටි එදා අපි දැක්කා. එදා අගමැතිතුමා හැටියට සිටියේ ආර්. ප්‍රේමදාස මැතිතුමායි. එතුමන්ලාවත් ඒ ගැන දැනගෙන සිටියේ නැහැ. එහෙම තමයි 1978 වර්ෂයේ ඉඳලා විධායක ජනාධිපති ධුරයේ කාර්ය භාරය ඉෂ්ට සිද්ධ කළේ. ඒ වාගේම, 1989 භීෂණ කාලයේත් ඒ විධියටම ඇඳිරි නීතියත්, හදිසි නීතියත් දමලා, පක්ෂ තහනම් කරලා කටයුතු කළ හැටි ජනතා විමුක්ති පෙරමුණට අද මතකද දන්නේ නැහැ. විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න අවශ්‍යයි කියා මෙතුමන්ලා ගෙන ආ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට ගිය විට, එහි සඳහන් යෝජනාවලින් එකයි පිළිගත්තේ. අනෙක් ඔක්කෝම පාර්ලිමේන්තුවේ සම්මත වුණත් ජනමත විචාරණයකින් සම්මත වෙන්න ඕනෑ. පසුගිය මාස දෙකක කාලයේ ඉඳලා මේ පාර්ලිමේන්තුව තුළ සිටින මන්ත්‍රීවරුන් එහාට මෙහාට පනින හැටි අපි දකිනවා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Nihal Galappaththi?

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කථා කරන අපේ මන්ත්‍රීතුමා 1989 කාලයේ මාත් එක්කම බූස්ස රැඳවුම් කඳවුරේ සිටියා. ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ බූස්ස රැඳවුම් කඳවුරේ රැඳවුම්ගත වෙලා සිටියේ හොර පොල් කඩලාද, එහෙම නැත්නම් වෙනත් මොනවා හෝ හොරකමක් කරලාද කියා මම අහනවා. ඔබතුමා උගුරට හොරා බෙහෙත් කන්න එපා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ගරු මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේගේ ප්‍රශ්නයට මීට ඉස්සර වෙලාත් -2010 වර්ෂයේදී මා මේ පාර්ලිමේන්තුවට ආ වෙලාවේත්-

[ගරු ජානක වක්කුඹුර මහතා]

උත්තරයක් දී තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා එදා ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වෙලා වැඩ කරලා නොවෙයි, බුස්ස කඳවුරේ සිටියේ කියා මම එදාත් කිව්වා. මා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට සිටින විට, මෙතුමන්ලා එදා කරපු ඒවා නිසා එක්සත් ජාතික පක්ෂය මාවත් රැගෙන ගිහින් බුස්ස කඳවුරේ අවුරුද්දක් තැබුවාය කියා 2010 වර්ෂයේදී මගේ පළමුවන කථාවේදී මම කිව්වා. මම කවදාවත් ජනතා විමුක්ති පෙරමුණත් එක්ක සම්බන්ධ වෙලාත් නැහැ; ඒ අයගේ ප්‍රතිපත්තියක ඉඳලාත් නැහැ. මම 1987 වර්ෂයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයකු වෙලා වැඩ කළා. 1989 වර්ෂයේදීයි මාව එසේ අරගෙන ගියේ. එදා මා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකයකු හැටියට සිටින විට තමයි එය සිදු වුණේ. ඒ අය කරපු වැඩවලට එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයගෙනුත් පළිගත්තා. මා එතුමාත් එක්ක එහේ සිටි බව ඇත්තයි. එතුමන්ලා එහේදීත් මට පන්ති කරන්න ආවා. මා ඒ ගැනත් කියන්නම්. හැබැයි, එදාත් මම එය ප්‍රතික්ෂේප කළා. බලහත්කාරයෙන් පන්ති කරවන්න හැදුවා. මම කිව්වා, "බැහැ" කියා. එදා බුස්ස කඳවුරේ තමන්ගේ බලය පාවිච්චි කරගෙන වැඩ කරන්න හැදුවා. එදා Commission එකක් පත් කළා. එදා ඒ Commission එකට සාක්ෂි දෙන්න ගිය අයට ගැහුවා. මම බය නැතිව ඒ Commission එකට ගිහිල්ලා සාක්ෂි දුන්නා, "අපි 'ජේවීපී' එකේ වැඩ කළේ නැහැ" කියා. ඒ නිසා එහේ සිටි කාලයේ ඉඳලාම මම එතුමන්ලා පිළිබඳව දන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විධායක ජනාධිපති ක්‍රමය රටට හොඳ නැහැ කියන මතයේ අපි ඉන්නවා.

මේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න ඕනෑය කියා අපි 2015 ජනාධිපතිවරණයේදීත් කිව්වා. හැබැයි, ඒ ක්‍රමවේදයට අනුව ඒක කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ බහුතර මන්ත්‍රී සංඛ්‍යාවකගේ කැමැත්තෙන් ජනාධිපතිවරයෙක් පත් කරන්න ගියොත් -විධායක නොවන වුණත්- එය වෙන්නේ කොහොමද කියා ඕනෑම කෙනෙකුට බලාගන්න පුළුවන්. සල්ලි තිබෙන ඕනෑම කෙනෙක් මේ පාර්ලිමේන්තුවට ආවොත්, එයාට මේ රටේ ජනාධිපති වෙන්න පුළුවන්කමක් තිබෙනවා. ඒකට අපි විරුද්ධයි. එදා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා පළාත් සභාවලට දුන් බලය තවම ඒ අයට නොදී තිබෙන්නේ මේ විධායක ජනාධිපති ධුරයේ බලය නිසායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කියන්නේ මේ රට කෑලි කෑලිවලට කඩන්නේ නැතිව කටයුතු කරන්න කියන එකයි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේනකොට මොකක්ද කිව්වේ? "මේ රටට ගැළපෙන හොඳම එක ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තමයි" කිව්වා. ඒකට පක්ෂව ඡන්දය දීපු කෙනෙක් හැටියට මමත් අද ඒ ගැන දුක් වෙනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරන්නට අත උස්සපු එක ගැන මම දුක් වෙනවාය කියා මම මේ ළඟදීත් කිව්වා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේනකොට මෙතුමන්ලා කිව්වා, "මේ මල් වට්ටියට අත ගහන්න" කියලා. ඒ මල් වට්ටියට අත ගහපු නිසා තමයි අද මේ රටේ ලොකු ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙන්නේ.

මේ රටට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගේනවා නම් එය කරන්න ඕනෑ එක පක්ෂයකට ඕනෑ විධියට නොවෙයි. සියලුදෙනාම එකතුවෙලා රටට ගැළපෙන විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදලා, ඉන් පසුව විධායක ජනාධිපති ධුරය අහෝසි කරන කටයුත්තට යන්න ඕනෑ. වර්තමාන ජනාධිපතිතුමා ගත්ත ක්‍රියාමාර්ග ගැන කියලා අද එතුමාට බණිනවා. හැබැයි, පසුගිය කාලයේ එතුමාගේ ගුණ ගායනා කළා. දැන් තමන්ට එතුමා හොඳ නැති වෙනකොට විධායක ජනාධිපති ධුරයත් හොඳ නැහැ; ජනාධිපතිතුමාත් හොඳ නැහැ. එක එක්කෙනාගේ රූපය දිහා බලන්නේ නැතිව, සියලුදෙනාම එකතුවෙලා වැඩ කරන්න ඕනෑය කියන කාරණයයි අපි කියන්නේ.

රටට හොඳ වැඩක් කරනවා නම් අපි කැමැතියි. අපි කවුරුවත් මෙහි හැමදාම ඉන්න ඇවිල්ලා නැහැ. ජනතාව තීන්දු කරනවා, කාවද ජයග්‍රහණය කරවන්න ඕනෑ කියා. මේ ගරු සභාවේ කෑ ගහන බොහෝ අයට එක ප්‍රාදේශීය සභාවක් දිනාගන්න බැහැ, ප්‍රාදේශීය සභාවක කොට්ඨාසයක් දිනාගන්න බැහැ. රට එක මැතිවරණ කොට්ඨාසයක් බවට පත් වුණාම සියයට පනහයි, එක ඡන්දයක් ගන්න එහෙම අයට පුළුවන්කමක් නැහැ. විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්නය කියන්න එක හේතුවක් තිබෙනවා. ඒ තමයි, ඉතා ඉක්මනින් ජනාධිපතිවරණය ආවොත් ඒකට මුහුණ දෙන්නේ කොහොමද කියන කාරණය. ඒක නිසා, මොන මැතිවරණය පැවැත්වුවත්, ඒ ඕනෑම මැතිවරණයකට භය නැතිව යන්න අපි කැමැත්තෙන් ඉන්නවා. පසුගිය දා පාර්ලිමේන්තුව විසුරුවලා ඡන්දයකට යන්න ගියා. නමුත්, ඒ ඡන්දයට යන්න බැරි වුණා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

හොඳයි.

අපි බලාපොරොත්තු වෙනවා අඩු ගණනේ පළාත් සභා ඡන්දයවත් ඉතා ඉක්මනින් පවත්වයි කියා. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන මහා ලොකුවට කථා කරපු අය ප්‍රජාතන්ත්‍රවාදී විධියට ඒ කටයුතු කරයි කියා හිතනවා. ජනාධිපති ධුරයේ තිබෙන අඩුපාඩු සකස් කරන එක අපි කාගේත් වගකීමක්. හැබැයි, පාර්ලිමේන්තුවේ 113 දෙනෙකුගෙන් ජනාධිපතිවරයෙක් තේරීම සම්බන්ධව පෞද්ගලිකව මම විරුද්ධයි. ඒකට හේතුවක් තිබෙනවා. දැන් ජනාධිපති අපේක්ෂකයෙක් කියා ගොඩක් තැන්වල සල්ලි තිබෙන අය යනවා. එතකොට මේ රටේ තිබෙන ණය බර එක දවසෙන් ගෙවන්න පුළුවන් ලු. එහෙම එක්කෙනෙක් පාර්ලිමේන්තුවට ආවොත්, අද තිබෙන ක්‍රමවේදය අනුව මේ පාර්ලිමේන්තුවට තනිවම ආවත්, 113ක් හදාගෙන ජනාධිපති වෙයි. මේකේ තිබෙනවා, "රහස් ඡන්දයකින් ඒ ජනාධිපතිවරයා පත් කරගන්න ඕනෑ." කියලා. ඒක නිසා, එය රටේ ජනතාව තීන්දු කරන්න ඕනෑය කියායි අපි කියන්නේ. ජනතාව විසින් පාර්ලිමේන්තුවට එවන අය රටේ ජනාධිපතිවරයා තීන්දු කරන්න ගියොත්, අර වාගේ හයියක් තිබෙන ඕනෑම කෙනෙකුට දැන් මේ තිබෙන විධියට එහාට-මෙහාට ගිහිල්ලා ජනාධිපති වෙන්න පුළුවන් වෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රටේ ජනතාවට තිබෙන අයිතිය තමයි, විධායක ජනාධිපතිවරයා තේරීම ඔවුන්ට ලබා දීම. එහෙම නැත්නම්, එහෙම පිටින්ම ඒ ක්‍රමය අහෝසි කර දමා පාර්ලිමේන්තුවට වග කියන, ඉස්සර කාලයේ තිබුණු විධියට කොට්ඨාස ක්‍රමයට මන්ත්‍රීවරු පත් කරන වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. ඒ එක්කම, පහළ සිට මෙය හැදෙන්න ඕනෑ. පළාත් සභාව තියාගෙන, මහ ආණ්ඩුව තියා ගෙන, එක එක විධියට මෙය හදන්න ගියොත් අවුලෙන් අවුලට පත් වෙනවා. ඒක නිසා, අඩුම ගණනේ අනාගතයේ මේ රටේ උපදින දරුවන්ටවත් මෙවන් ප්‍රශ්නයක් ඇති නොවෙන්න කටයුතු කරන්න ඕනෑ.

එදා, 1978 අපි කුඩා කාලයේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විධායක ජනාධිපති බවට පත් වෙලා මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනැල්ලා කිව්වේ, "මට කරන්න බැරි ගැහැනියක් පිරිමියෙක් කරන එක විතරයි." කියලා. අද ජනාධිපතිතුමාට එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. එතුමා පාර්ලිමේන්තුව විසුරුවමින් ගැසූ ගැසට් එක ශ්‍රේෂ්ඨාධිකරණයෙන් බල රහිත කළා. ඒ වාගේම, දැන් කියනවා, "අගමැතිවරයෙක් පත් කරන්න බැහැ." කියා. "කැබිනට් මණ්ඩලය පත් කරන්න එතුමාට අයිතියක් නැහැ." කියනවා. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව විධායක ජනාධිපතිතුමාට තුන්මසකට වැඩි කාලයක් පාර්ලිමේන්තුවට එන්නේ නැතිව ඉන්න බැහැ. තුන්මාසයකට වතාවක් හෝ පාර්ලිමේන්තුවට එන්න ඕනෑ. අපි එහෙම කොන්දේසි මාලාවක් හදා තිබෙනවා. ඒ නිසා අපි හිතනවා, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා එම ධුරයේ ඉන්නවාට විරුද්ධව කවුරු හෝ මේ යෝජනාව ගෙනෙනවාද කියා. ඒක නිසා අපි කියන්නේ, රටටම ගැළපෙන, වැඩි බහුතරයකගේ කැමැත්තට මෙය කළ යුතුයි කියායි. මේ රටේ ජනමත විචාරණයක් තියන්නේ නැතිව කිසි දෙයක් කරන්න බැහැ. ජනතාව ඉස්සරහට ගියාම ජනතාව කියයි, ඒක හරිද, වැරදිද කියා.

මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිය පුද කරමින් මම නිහඬ වනවා.

[අ.භා. 3.50]

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙම වැදගත් කල් තැබීමේ විවාදය පැවැත්වෙන අවස්ථාවේ කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි බොහොම කුඩා කාලයේ අපට මතකයි, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වලා දෙද්දී, එදා ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිවරයා තරම්, එදා පැවති එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තරම් විවේචනයට ලක් වුණු, පහර කෑමට ලක් වුණු දේශපාලන ව්‍යාපාරයක් හෝ නායකයෙක් නැහැ කියා.

මට මතකයි එදා ඉඳලා සෑම ජාතික මැතිවරණයකදීම, විශේෂයෙන් අපේ ප්‍රතිවිරුද්ධ කණ්ඩායම්වල මාතෘකාව වුණේ මොකක්ද කියන එක. 1988දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ, 1989 පැවැත්වුණු මහ මැතිවරණයේදී, 1994 පැවැති ජනාධිපතිවරණය ඇතුළුව පැවැත්වුණු සෑම ජාතික මැතිවරණයකදීමත් අපේ විරුද්ධ කණ්ඩායම්වල ප්‍රධාන මාතෘකාව වුණේ මොකක්ද? අද මම පුදුම වෙනවා, ජානක වක්කුඹුර මන්ත්‍රීතුමාගේ කථාවේදී ඉදිරිපත් වුණු සමහර කාරණා ගැන. එදා මේ කණ්ඩායම් ඉදිරියට ගෙනා ප්‍රධානම තර්කය සහ යෝජනාව තමයි විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න ඕනෑය කියන එක. දැන් අද සමසමාජ, කොමියුනිස්ට් පක්ෂවල මන්ත්‍රීවරු නියෝජනය කරනවා අපේ විපක්ෂය. එදා ඒ පක්ෂ නියෝජනය කළ මන්ත්‍රීවරු අද ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු විධියට මෙතැන සිටිනවා. ඒ අය තරුණ කාලයේ පාරක් පාරක් ගානේ ගිහිල්ලා මේ වෙනුවෙන් උද්ඝෝෂණ කළා. විශේෂයෙන් මැයි දින පෙළ පාළිවලදී, විරෝධතා පෙළ පාළිවලදී රතු ෂර්ට් ඇඳගෙන පාරවල් දිගේ ගිහිල්ලා උද්ඝෝෂණ කළා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න කියා. විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන අවැඩ ගැන මුළු ලෝකයට හඬ ගා කිව්වා. හැබැයි, මේ අයට තුනෙන් දෙකක බලයක් තිබුණු වෙලාවේ මොනවාද කළේ? පසුගිය ආණ්ඩුවට තුනෙන් දෙකක බලයක් තිබෙන වෙලාවේ ඒ අය ක්‍රියා කළේ, මේ රටට අවැඩදායකයි කියාපු, ඒකාධිපති ගමනක් යනවායි කියාපු, අර කිව්ව විධියට "ගැහැනියෙක් පිරිමියෙක් කරන්නත්, පිරිමියෙක් ගැහැනියෙක් කරන්නත් විතරයි බැරි" කියා එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කරපු ප්‍රකාශයේ එල්ලිලා පහර ගහපු, මේ විධායක ජනාධිපති ක්‍රමයේ යම්කිසි සීමාවක් තිබුණා නම් ඒ සීමාවනුත් ඉවත්කරගෙන කටයුතු කිරීමටයි. දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා, දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පිහිටුවා තිබුණු ස්වාධීන කොමිෂන් සභා අහෝසි කරලා, එදා විධායක ජනාධිපති ක්‍රමයේ බලතල පුළුල් කරගෙන, දෙවරක් ජනාධිපතිකම කරලා ගෙදර යන්න තිබුණු එක වෙනුවට, තමන්ට ජීවිත කාලය පුරාම ජනාධිපතිකම කරන්න පුළුවන් වන විධියට, තමන්ගේ පවුලේ උදවියටත් එය රජ උරුමයක් හැටියට පාවිච්චි කරන්න පුළුවන් වන විධියට පාර කපා ගත්ත එකයි එදා කළේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය දවස් 50ක් තුළ පැවැති මිරිස් කුඩු ආණ්ඩුව මේ රටට කියා දුන්නා, ප්‍රජාතන්ත්‍රවාදයේ වටිනාකම. ඒ දවස් 50 තුළ කළේ ඒකයි. මේ සභාවේ සිදු වුණු හුඟක් දේවල් මොන්ටිසෝරියකවත් සිදු නොවිය යුතු දේවල්. අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන, නිදහස ගැන කථා කරන, මේ අයට ආවඩන උදවිය එදා පාර්ලිමේන්තුවේ හැසිරුණු විධිය ගැන නවක මන්ත්‍රීවරයකු විධියට මා කනගාටු වෙනවා. මේ කටයුතුවලට කවුරුන් හෝ ආශිර්වාද කළා නම් ඒ අයගේ චින්තනය තුළ, දැක්ම තුළ ප්‍රජාතන්ත්‍රවාදය ගැන අබමල් රේණුවක තරම්වත් හැඟීමක් තිබෙනවායි කියා මා විශ්වාස කරන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමුන්නාන්සේත් දන්නවා ඇති, පාර්ලිමේන්තුවේ අපේ කණ්ඩායමේ මම ඇතුළු කී දෙනෙකුට වරදාන, වරප්‍රසාද දෙන්න මේ අය කථා කළාද කියන එක. ජනාධිපතිවරයාගේ සමහර ගෝල බාලයින්ගේ දුරකථන ඇමතුම් මගේ දුරකථනයේ පටිගත වෙලා තිබෙනවා. මා වගකීමකිනුයි කියන්නේ. එදා ඒ කරන්න හැදුවේ මොකක්ද? මිල මුදලට, තනතුරුවලට එහෙම නැත්නම් තාන්න මාන්නවලට මන්ත්‍රීවරු බිලී බාගෙන මේ රටේ මහජන මතය යටපත් කරන්නයි. මම විශ්වාස කරන්නේ නැහැ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමෙන් පමණක් මේ ප්‍රශ්නයට විසඳුම් ලැබෙනවා කියා. ගෙවුණු දින 50ක කාලය තුළ පැවැති මිරිස් කුඩු ආණ්ඩුව, ප්‍රජාතන්ත්‍ර විරෝධී ආණ්ඩුව අපට කියා දුන්නා මේ රටේ නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වෙන්න ඕනෑ කොහොමද කියා. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය හෝ මා නියෝජනය කරන කණ්ඩායමේ මතය කුමක් වුවත්, පෞද්ගලිකව මා විශ්වාස කරනවා අහෝසි විය යුත්තේ විධායක ජනාධිපති ක්‍රමය පමණක් නොව මන්ත්‍රීවරයකු මේ පාර්ලිමේන්තු සභා ගැබේදී පක්ෂය මාරු කළොත්, ඒ මන්ත්‍රීවරයාගේ මන්ත්‍රී ධුරය අහෝසි වන නීති පවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු විය යුතුයි කියා.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, point of Order එකක්ද?

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)

ගරු මන්ත්‍රීතුමාගෙන් කාරණයක් අහන්න කැමැතියි.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
කියන්න, කියන්න.

**ගරු ඩී. වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා, මන්ත්‍රීවරුන් පක්ෂ මාරු කරන්නේ මිල මුදල්වලටයි කියා. මේ දවස්වල මන්ත්‍රීවරුන් ඔබතුමන්ලාට එකතු වෙනවානේ? මම දැන ගන්න කැමැතියි, එතුමන්ලා එන්නේ රටට ආදරේ නිසාද, මිල මුදල්වලටද, තනතුරුවලටද එහෙම නැත්නම් කුමන කාරණයක් නිසාද කියලා.

**ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා**
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේවා ගැන කථා කරනකොට සමහරුන්ට රිදෙනවා. ඒකට මට කරන්න දෙයක් නැහැ. මුළු රටම දැක්කා හොර රහසේ ගිහිල්ලා, හඳ පානේ ගිහිල්ලා අගමැතිකමේ දිවුරුම් දීලා, තමන්ට බහුතරයක් නැතිකම නිසා පාර්ලිමේන්තුව කල් තිබ්බා කියන එක. ඒ විතරක් නොවෙයි. පාර්ලිමේන්තුව ඉස්සරහට ඇවිල්ලා රැලියක් තියලා රැලියේදී කිව්වා, "මට දැන් 113ක් ඉන්නවා." කියා. ඒ වාගේම 113ක් ඉන්නවායි කියාපු ජනාධිපතිවරයා පාර්ලිමේන්තුව විසුරුවා හැරියා විතරක් නොවෙයි, ඒ සඳහා ගැසට් එක ගහන දවසේත් මහ රෑ මන්ත්‍රීවරුන් කැබිනට් ඇමතිවරු විධියට දිවුරුම් දුන්නා. නමුත්, ඒ දිවුරුම් දෙන්න සුළු මොහොතකට කලිනුත් අපට වරප්‍රසාද, වරදාන දෙන්න කථා කරපු එක ගැනයි මම දැන් කිව්වේ. දැන් අපි ආණ්ඩුව පිහිටුවා අවසන්. අපට වරදාන, වරප්‍රසාදවලට ගන්න වුවමනාවක් නැහැ. අපට මේ ආණ්ඩුව අද ඉතා ශක්තිමත්ව ගෙන යන්න පුළුවන්.

තනතුරු, වරදාන, මුදල් හෝ කිසිම වරප්‍රසාදයක් දී කවුරුත් ගන්න ඕනෑත් නැහැ; ඒ වෙනුවෙන් කවුරුත් එන්නේත් නැහැ. අපි මෙතැනදී පැහැදිලිව ප්‍රකාශ කරන්න කැමැතියි, මේ කණ්ඩායම එදා ක්‍රියා කළේ විධායක ජනාධිපති ධුරයේ බලතලවලට මුවාවෙලා මහ ජනයාගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය උදුරා ගන්න, ජන මතය යටපත් කරන්න උත්සාහ කරමින් බව.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට පුදුම, කවුරු හෝ පුද්ගලයෙකු මේ තනතුරේ වාඩි වුණාම ඔවුන්ට මොකක්දෝ අමුතු ආශාවක් ඇතිවනවා, තනතුර දමා යන්න බැරි විධියේ. ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමායි, ඩී.බී. විජේතුංග හිටපු ජනාධිපතිතුමායි හැරුණාම ඊට පසුව මේ ආසනයේ වාඩි වුණු බොහෝ ජනාධිපතිවරුන්ට මේ ප්‍රශ්නය ඇති වුණා. ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා හදිසියේ ජීවිතක්ෂයට පත් වුණා. හැබැයි, මේ තනතුරට පත් වූ බොහෝ ජනාධිපතිවරුන්ට දොළ දුකක් වාගේ එකක් හැදෙනවා. ඒ, මේ තනතුර දමා යන්න බැරි ප්‍රශ්නයක්. එම නිසා මම කියන්න කැමැතියි, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොතැනක හෝ විධායක ජනාධිපති ධුරයේ තිබෙන බලතලවල යම් කිසි ප්‍රශ්නයක් තිබෙන බව. එම නිසා මෙය සාකච්ඡාවට අරගෙන මුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවම අලුතෙන් ගෙනෙන අවස්ථාවකට පත් වෙන්න ඕනෑ. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලියැවී තිබුණාට පමණක් මදි, අපේ රටේ සෑම පුරවැසියෙකුටම සමාන අයිතිවාසිකම් ලැබෙන සාධාරණ යුගයක් අපි බිහි කරන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක අද යුගයේ අපට පැවරී තිබෙන බැරෑරුම් වගකීමක්ය කියලා මම හිතනවා.

අද සමහර උදවිය කියනවා, "බුදු දහමට තිබෙන තැන නැති කරන්න යනවා", එහෙම නැත්නම්, "රට බෙදන්න යනවා; රට කඩන්න යනවා" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙලෙස කරන එක ප්‍රකාශයක් වුවත්, මේ රටේම සිටින තවත් පුරවැසියන් පිරිසකට කරන බරපතළ අසාධාරණයක්; ඒ අය වෙනස් කොට සලකමින් කරන කථාවක්. මේ රටේ උතුරේ හෝ වේවා නැඟෙනහිර හෝ වේවා දකුණේ හෝ වේවා අපි සියලුදෙනාම ශ්‍රී ලාංකීය පුරවැසියෝ. ඒ පුරවැසියෝ සියලුදෙනාටම මේ රටේ ආණ්ඩුවේ හෝ විපක්ෂයේ හෝ කවර හෝ ආයතනයක හෝ මේ පාර්ලිමේන්තුවේ සමානව කටයුතු කිරීමේ අයිතිවාසිකමක් තිබෙනවා. අද උතුරේ මන්ත්‍රීවරයෙකු ආණ්ඩුවට එකතු වුණොත් කියනවා, "රට කඩන්න යනවා, රට බෙදන්න යනවා, බුද්ධාගමට තිබෙන තැන නැති කරන්න යනවා" කියලා. මේක එක්තරා විධියකින් ජාතිවාදය ඇවිස්සීමක්. "බෙදුම්වාදය" කියලා කියන්නේ වෙන මොකකටවත් නොවෙයි, මෙන්න මේ කාරණයටයි. මේක තමයි බෙදුම්වාදය! බෙදුම්වාදය දේශනා කරන්නේ මේ ඊනියා දේශ ප්‍රේමීන්. මේ අය රටට කියන්නේ උතුර වෙන් කරලා කටයුතු කරන හැටියට; ඒ අය වෙනස් කොට සලකන හැටියට; නැඟෙනහිර වෙන් කරලා කටයුතු කරන හැටියට; ඒ අය වෙනස් කොට කටයුතු කරන හැටියටයි. අපට අවශ්‍ය කරන්නේ එක රටක් තුළ, ඒකීය රාජ්‍යයක් තුළ සියලුදෙනාගේ අයිතිවාසිකම් රැකෙන, බුදු දහමට ප්‍රමුඛතාව ලැබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 09වන ව්‍යවස්ථාවෙන් බුද්ධාගමට දැනට ලබා දී තිබෙන ස්ථානය රැකෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගේනකොට සමහර සමාජවාදීන්ට, යුක්තිය සාධාරණය ගැන කථා කරපු සමහරුන්ට එදා මේ පාර්ලිමේන්තුවේ නැඟිටලා කථා කරන්න කොන්දක් තිබුණේ නැති බව මම පැහැදිලිව කියන්න කැමැතියි. නමුත්, ඒ අය දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අත ඉස්සුවා. එදා එලෙස අත උස්සපු අය අද කියන්නේ මොකක්ද? විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න කථා කරපු අය; සාධාරණය කථා කරපු අය; යුක්තිය කථා කරපු අය ගිහිල්ලා සමහර තැන්වල මාධ්‍ය සාකච්ඡා පවත්වා කියනවා, "දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රශ්නයක්" කියලා. මම ඊයේත් දැක්කා, මාතර පැත්තේ මන්ත්‍රීවරයෙකු සඳහන් කරනවා, "දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රශ්නයක්, එම නිසා දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන එක ගැනත් අපි සලකා බලන්න ඕනෑ"ය කියලා. දහනවය අහෝසි කරලා දහඅටෙන් දුන් බලතලත් එක්ක ඒ විධායක ජනාධිපතිවරයාට අත්තනෝමතිකව කටයුතු කරන්න පුළුවන් ස්ථානයකට යන්න තමයි දැන් ඒ අය නැවත යෝජනා කරන්නේ. එම නිසා මේ සම්බන්ධයෙන් අපට අද වගකීමක් පැවරී තිබෙන බව මම කියන්න කැමැතියි. මේ ආණ්ඩුවේ පසුපෙළ නියෝජනය කරන මන්ත්‍රීවරු හැටියට කිසිම විධියකින් මොනම වරප්‍රසාදයකටවත්, වරදානයකටවත් නැවෙන්නේ නැතිව ක්‍රියා කරපු සහ ක්‍රියා කරන්න බලාපොරොත්තු වන පිරිසක් හැටියට අපි කියන්න කැමැතියි, අපි මේ රට බෙදන්න සූදානම් නැහැ; මේ රට කඩන්න සූදානම් නැහැ; ඒ වාගේම බුදු දහමට තිබෙන තැන නැති කරන්න සූදානම් නැහැයි කියලා. එවැනි අවස්ථාවක් ආවොත් අපට මේ තනතුරු පැත්තක තබා ඒකට එරෙහිව ක්‍රියා කරන්න සිද්ධවනවා. එම නිසා එවැනි තත්ත්වයකට අපි කිසිසේත්ම සූදානම් නැහැ. හැබැයි, ඒකීය රටක් තුළ මේ ඇති වෙලා තිබෙන සමඟිය, ඇති වෙලා තිබෙන සංහිඳියාව, සියලුදෙනාටම එකට කටයුතු කරන්න තිබෙන වුවමනාව සහ ඒ බැඳීම ඉස්සරහට අරගෙන යන්න අපට අවශ්‍යයි. ඒ සඳහා ශ්‍රී ලාංකිකයෝ හැටියට සිතා කටයුතු කරන්න පුළුවන් වාතාවරණයක් අපට අවශ්‍යයි. බොහොම ස්තූතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

[අ.භා. 4.01]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මා ප්‍රථමයෙන්ම ඔබතුමාට අතිශයින්ම ස්තුතිවන්ත වනවා.

ජනතා විමුක්ති පෙරමුණේ ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීවරයා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳවයි අද අප මෙම ගරු සභාවේ සාකච්ඡා කරන්නේ. මා මුලින්ම මේ කාරණය කියන්නට ඕනෑ. මම විපක්ෂයේ සිටියත්, ආණ්ඩුවේ සිටියත්, ආණ්ඩුවේ වැරදිවලට විරුද්ධව මම කථා කළා; කථා කරනවා. 2004 වර්ෂයේදී මන්ත්‍රී ආසන 09ක් සහිතව මේ පාර්ලිමේන්තුවට පත්ව ඇවිත් අපි එදා විපක්ෂයේ වාඩි වුණා. එදා පැවැති ආණ්ඩුවට බහුතර බලයක් තිබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ජනතා විමුක්ති පෙරමුණද ඇතුළුව මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවට ලබාගත හැකි වුයේ පාර්ලිමේන්තු ආසන 104ක් පමණයි. එසේ වුවත් අපි එදා පාර්ලිමේන්තුවේ තීරක බලය වෙමින්, ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා ආණ්ඩුව එදා ගත්ත තීරණයේදී අපි ඉතා තීරණාත්මකව කටයුතු කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2008 අය වැය ඉදිරිපත් කළ අවස්ථාව ඉතාම තීරණාත්මක අවස්ථාවක්. ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා ගෙන ගිය තීරණාත්මක අය වැයක් හැටියට තමයි එදා අය වැය ඉදිරිපත් කළේ. එදා එක ඡන්දයකින් තමයි ඒ අය වැය ජයග්‍රහණය කරන්න පුළුවන්කම ලැබුණේ. එදා ජනතා විමුක්ති පෙරමුණත්, අනෙක් බොහෝ පක්ෂත්, සුළු පක්ෂත් අය වැය පරාජය කිරීම සඳහා කටයුතු කරද්දී අපේ තීරණාත්මක මැදිහත් වීම නිසා, එක ඡන්දයකින් එදා අය වැය ජයග්‍රහණය කළා. 2008 අය වැය පරාජය වුණා නම් වේලුපිල්ලේ ප්‍රභාකරන් ඇතුළු ඒ ත්‍රස්තවාදී කණ්ඩායම් අදත් ජීවත් වනවා. එදා ඒ එක ඡන්දය තමයි, දේශපාලන ඡන්දය. එදා ඒ එක ඡන්දයෙන් අය වැය පරාජය වුණා නම්, එදා ත්‍රස්තවාදය පරාජය කිරීමේ අරගළය සම්පූර්ණයෙන් ආපස්සට ගිහිල්ලා, අද දක්වා වේලුපිල්ලේ ප්‍රභාකරන් සිටින ශ්‍රී ලංකාවක් අපට දකින්න ඉඩකඩ තිබුණා. ඒ නිසා, අපි විපක්ෂයේ සිටියත්, ඒ වෙලාවේ ආණ්ඩුවට සහාය ලබා දුන්නා. ඉන් පසුව අපි අමාත්‍ය ධුරයක් ලබාගෙන ආණ්ඩුවට එකතු වුණා. නමුත්, ඒ ආණ්ඩුවේ ක්‍රියාදාම සම්බන්ධයෙන් විරුද්ධ විය යුතු අවස්ථාවල අපි විරුද්ධව ඡන්දය දුන්නා. කැසිනෝ පනත ගෙනාපු වෙලාවේ අපි අපේ විරුද්ධත්වය පළ කළා. විශේෂයෙන්ම මම පෞද්ගලිකව ඊට විරුද්ධව ආණ්ඩුවේ සිටිමින්, ඒ කාරණයේදී ආණ්ඩුවට විරුද්ධව ඡන්දය පාවිච්චි කළා. ඒ වාගේම අද ස්වාධීන මන්ත්‍රීවරයෙක් හැටියට පාර්ලිමේන්තුවේ කටයුතු කළත්, ආණ්ඩුව යම්කිසි යහපත් දෙයක් කරනවා නම්, ආණ්ඩුවේ අය වැය රටට හිතකර නම් අපට ඡන්දය දෙන්න පුළුවන්. ඒ වාගේම ආණ්ඩුව යම්කිසි සාධනීය යෝජනාවක් ගෙනෙනවා නම්, රටට හිතකර යෝජනාවක් ගෙනෙනවා නම් ඒකට අපට සහාය පළ කරන්න පුළුවන්කම තිබෙනවා.

දැනට පත් වුණ ආණ්ඩුව ඔවුන් පූර්ණ කාලීන ආණ්ඩුවක් විධියට උදම් අනනවා ඇති. ඔවුන් මොනවා කිව්වත්, ඔවුන්ට අද බහුතරය නැහැ. බහුතරයක් නැති ආණ්ඩුවක් තමයි එහා පැත්තේ ඉන්නේ. ජනතා විමුක්ති පෙරමුණත්, දෙමළ ජාතික සන්ධානයත් අද ආණ්ඩුව සමඟ නැහැ. ඒ නිසා ඔවුන් මොනවා කථා කළත් අද මේ පවතින්නේ බහුතරයක් නැති ආණ්ඩුවක්. නමුත්, මේ ආණ්ඩුව කඩා දමන්න අපට අවශ්‍ය නැහැ. මේ ආණ්ඩුව කළ යුත්තේ, භාරකාර ආණ්ඩුවක් හැටියට කටයුතු කිරීමයි. භාරකාර ආණ්ඩුවක කටයුත්ත හැටියට මම දකින්නේ, බරපතළ විවාදයකට තුඩු දෙන, රටේ ජනතාවගේ විරෝධයට ලක් වන විසංවාදි, සංකීර්ණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැඟීමෙන් වැළකී සිටීම. මේ ආණ්ඩුව එසේ කටයුතු කරයි කියා අපි බලාපොරොත්තු වනවා.

අපි කලබලයෙන් දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර ගත්තා. මොකද, රටේ ජනතාවට පොරොන්දු වූ පරිදි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා රටේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට යම්කිසි දෙයක් කරලා එය ජනතාවට ඔප්පු කරන්න අපට විශාල වුවමනාවක් තිබුණා. හැබැයි, අපි ඒක කලබලයෙන් කිරීම නිසා විශාල ව්‍යවස්ථා වියවුලක් අද පැන නැඟී තිබෙන බව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා දන්නවා. මේ ව්‍යවස්ථා වියවුලෙන් නිදහස් වීම සඳහා දෙපාර්ශ්වයේම එකඟතාවෙන් හා ඉක්මනින් කළ යුතු දේවල් තිබෙනවා. ඒ නිසා මා හිතනවා, අපි පළමුවෙන්ම අවධානය යොමු කළ යුත්තේ ඒ ගැනයි. මේ ව්‍යවස්ථාවේ ප්‍රශ්න ගණනාවක් අද පැන නැඟී තිබෙනවා. අධිකරණයේ ඒවා සාකච්ඡා කර තිබෙනවා. ජනමත විචාරණයකට තුඩු දෙන ව්‍යවස්ථා සංශෝධනයක් අපි කළේ නැහැ. අපට එසේ කරන්න බැරි ව්‍යවස්ථාත් එහි තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70වන පිටුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ජනමත විචාරණයට අදාළ ව්‍යවස්ථා මා මේ අවස්ථාවේදී හැන්සාඩ්ගත කිරීම සඳහා **සභාගත*** කරනවා. ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 82.(6), (7) සහ 84 කියන ව්‍යවස්ථා -කෙටි වාක්‍ය කිහිපයක්- මා මේ අවස්ථාවේදී හැන්සාඩ්ගත කිරීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.

ඒ විතරක් නොවෙයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30වන ව්‍යවස්ථාව මේ සභාවට ඉදිරිපත් කරන්න මා කැමැතියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30. (1) සහ 30. (2) කියන අනුව්‍යවස්ථා මා ඉදිරිපත් කරනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30. (2) අනුව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වනවා:

> "ජනරජයේ ජනාධිපතිවරයා ජනතාව විසින් තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර පස් අවුරුදු කාලයක් ධුරය දරන්නේ ය."

ඇත්ත වශයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව අවුරුදු 6ක් වූ ධුර කාලය අවුරුදු 5ක් දක්වා අඩු කර තිබෙනවා. ඒ සඳහාත් ජනමත විචාරණයක් අවශ්‍යයි කියලා මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන්වෙලා තිබෙනවා. එසේ වුණත්, අවුරුදු 6ක්ව තිබුණු ධුර කාලය අද අවුරුදු 5ක් වශයෙන් සංශෝධනය කරලා තිබෙනවා. ඒ වාගේම ජනාධිපතිවරයා සතු ජනතා පරමාධිපත්‍ය බලය එනම්, මේ පාර්ලිමේන්තුවේ යම්කිසි ගැටලුකාරී තත්ත්වයක් තිබෙනවා නම් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලයක් එතුමාට තිබුණා. ඒ බලය ජනමත විචාරණයකින් පමණක් වෙනස් කළ හැකියි කියලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන්වෙලා තිබෙනවා. මේ අවස්ථාවේදී එකී කොටස ඇතුළත් ඒ පිටු දෙකම **සභාගත*** කරනවා.

දැන් අපට තිබෙන ප්‍රශ්නය මෙයයි. දැන් අධිකරණයෙන් තීන්දුවක් දීලා තිබෙනවා. අධිකරණයෙන් දුන් තීන්දුව කුමක් වුණත්, අද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වියවුලක් තිබෙන බව මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කියවන ඕනෑම කෙනකුට පැහැදිලි වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යෝජනාවක් හැටියට විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න ඕනෑය කියා කියන අයට මේ වගන්තිය මා මේ අවස්ථාවේදී ඉදිරිපත් කරන්න කැමැතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ජනාධිපතිවරයා සතුයි. පාර්ලිමේන්තුව විසුරුවා හැරීම ජනමත විචාරණයකින් කළ හැකියි. එදා රනිල් වික්‍රමසිංහ මැතිතුමා බලයට පත් වුණු 2002 - 2004 ආණ්ඩුව මොකක්ද කිව්වේ? ජයම්පති වික්‍රමරත්න මැතිතුමා අද මන්ත්‍රීවරයෙක්; එදා ජනාධිපති නීතිඥවරයෙක්. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය -හිටපු ජනාධිපතිනිය- වෙනුවෙන් එදා එතුමා උසාවියට ගියා. ජයම්පති වික්‍රමරත්න මැතිතුමා මොකක්ද කිව්වේ? ජනාධිපතිනියට ජනමත විචාරණයකින් හැර පාර්ලිමේන්තුව විසුරුවා හැරිය නොහැකියි කියලා එදා පාර්ලිමේන්තුවේදී කියා සිටියා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවම වශයෙන් විනාඩි හතරක කාලයක් ලබාදෙන ලෙස මා ඉල්ලා සිටිනවා. බොහොම කෙටි කාලයක් තමයි මට තිබෙන්නේ. විපක්ෂයෙන් විනාඩි 4ක කාලයක් ලබා දෙන ලෙස ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මා ඊට වඩා වැඩි කාලයක් ගන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
හොඳයි. ඔබ වහන්සේ කථා කරන්න.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ඒ අනුව ඉතා වැදගත් කාරණය මොකක්ද? එදා 2002දී ශ්‍රේෂ්ඨාධිකරණය කුමන තීන්දුවක් දුන්නත්, "ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරීම ජනමත විචාරණයකින් පමණක් කළ හැකියි" කියලා කිව්වා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාවෙන් මා එය අවධාරණය කරන්න කැමැතියි.

අද විවාදය පවත්වන්නේ ජනාධිපති ධුරය සම්බන්ධයෙනුයි. ජනාධිපති ධුරය අහෝසි කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා 2015දී තීන්දුවක් දුන්නාය කියලා කියනවා. එවැනි ප්‍රතිපත්තිමය තීන්දුවක් දුන්නේ නැහැ. එදා ජාතික හෙළ උරුමය පක්ෂයේ එකඟතාව ලබා දෙනකොට කරුණු 10කින් යුක්ත ගිවිසුමක් අත්සන් කළා. ඒ ගිවිසුමේ තිබෙනවා, ජනාධිපතිතුමා කිසි විටක ජනමත විචාරණයකට තුඩු දෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කරන්නේ නැහැයි කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එදා ජනාධිපතිතුමා මෙන්න මෙහෙම කිව්වා. මොකක්ද කිව්වේ? "මම ජනමත විචාරණයකට තුඩු දෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් නොකරන බව 'මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්' කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් ප්‍රකාශ කරලා තිබෙනවා" කියා කිව්වා. එතුමාගේ ධුර කාලය තුළ එතුමා පෞද්ගලිකව මළ ගෙවල්වල ගිහින්, උත්සවවලට ගිහින් ජනාධිපති ධුරය අහෝසි කරන්න කියලා කථා කරන්න පුළුවන්. එතුමාට ඕනෑ හැටියට ධුරය අහෝසි කරනවාද, නැද්ද කියලා කියන්න බැහැ. එතුමා "මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ එය පැහැදිලිව සටහන් කර තිබෙනවා. එදා දෙමළ ජාතික සන්ධානයේ සුමන්තිරන් මැතිතුමා සමඟ පැවති සාකච්ඡාවට මා පෞද්ගලිකව මැදිහත් වුණා. එතුමන්ලා එකඟ වුණා, "ජනමත විචාරණයකට තුඩු දෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් නොකළ යුතුයි" කියන වගන්තිය "මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්" කියන පොතට ඇතුළත් කරන්න. එය දෙමළ භාෂාවෙන් පළවූ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් තිබෙනවා; ඉංග්‍රීසි භාෂාවෙන් පළවූ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් තිබෙනවා. දෙමළ භාෂාවෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් පළවූ ප්‍රතිපත්ති ප්‍රකාශනවල ඒ කොටස් දෙකම මා මේ අවස්ථාවේදී හැන්සාඩගත කිරීම සඳහා **සභාගත*** කරනවා.

දැන් යම් කිසි කෙනෙකුට විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න ඕනෑ නම්, එය අහෝසි කිරීමට ප්‍රථම රටේ ස්ථාවරභාවය සැලකිල්ලට ගත යුතුයි. අද යම් කිසි කෙනෙක් මේ පවත්නා මැතිවරණ ක්‍රමය යටතේ විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න කියා කියනවා නම්, ඒක රටට කරන බලවත් ද්‍රෝහිකමක් හැටියට මා සඳහන් කරන්න කැමැතියි. ඇයි, මම එහෙම කියන්නේ? බලන්න, එදා 2002-2004 කාලය තුළ නෝර්වේජියානු ආණ්ඩුවේ මැදිහත් වීමෙනුත්, ඒ වාගේම යුරෝපීය රටවල මැදිහත්වීමෙනුත් අපි සාම ගිවිසුමක් අත්සන් කළා. සාම ගිවිසුම දසදහස්වාරයක් කැඩුවා. කවුද, කැඩුවේ? කොටි සංවිධානය. නමුත් ජනාධිපතිවරයාට බැරි වුණා, එදා 2002-2004 කාලයේ ඒ ආණ්ඩුවට බැරි වුණා, තීරණයක් ගන්න. ඒ වෙලාවේ තමයි හිටපු ජනාධිපතිනිය පාර්ලිමේන්තුව විසුරුවා හැරියේ. එදා පාර්ලිමේන්තුව විසුරුවා හැරියේ නැත්නම්, අද අපට ත්‍රස්තවාදය පරාජය කිරීමේ අරගළය කරා ගමන් කරන්න බැහැ. විධායක ජනාධිපති ධුරයේ දුර්වල ලක්ෂණ තිබෙනවා. අපි සැහෙන සංශෝධනයකුත් කරලා තිබෙනවා. අද මේකේ ව්‍යවස්ථා වියවුලකුත් තිබෙනවා. අද පළමුවෙන් මේ භාරකාර ආණ්ඩුව කරන්න ඕනෑ, මේ ව්‍යවස්ථා වියවුලේ තිබෙන වගන්ති ටික ගැන විධිමත් සාකච්ඡාවකින් දෙපාර්ශ්වයේම එකඟතාවකට පැමිණීමයි.

දෙවන කාරණය, මේ ඡන්ද ක්‍රමය. හැන්සාඩගත කිරීම සඳහා මා එම කොටස **සභාගත*** කරනවා.

ඕනෑම පක්ෂයකට, දෙමළ ජාතික සන්ධානය, ජනතා විමුක්ති පෙරමුණ -අප කාටත්- මේ මනාප ඡන්ද ක්‍රමය යටතේ දිස්ත්‍රික්කයේ ඡන්ද ගන්න පුළුවන්. පිරිහිච්ච මිනිස්සු, හැබැයි ඔවුන් ප්‍රසිද්ධ නිසා, ඔවුන්ට සල්ලි තිබෙන නිසා හැමදාම පක්ෂවල ඉන්නේ එකම මිනිස්සු; වෙනස් කරන්න බැහැ. ඒ නිසා මේ ඡන්ද ක්‍රමය වෙනස් කළ යුතුයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඡන්ද ක්‍රමය වෙනස් කිරීමේදී දිස්ත්‍රික් මට්ටමෙන් අනුපාත ඡන්ද ක්‍රමයේ තිබුණු සාධනීය ලක්ෂණ, සුළු පක්ෂවලට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ලැබීම කියන කාරණය, මනාප ක්‍රමයේ තිබෙන අවලක්ෂණ, කොට්ඨාසයට පමණක් ඡන්දය ඉල්ලන මන්ත්‍රීවරයෙක් කොට්ඨාසය තුළ ඡන්දය ඉල්ලීමට යොමු කිරීම තුළින් ඒ කොට්ඨාසයේ ජනමතයක් තිබෙන, ජනතාවට වග කියන මන්ත්‍රීවරයෙක් පත් කර ගන්න පුළුවන් වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අන්න ඒ නිසා අපි මේ ඡන්ද ක්‍රමය වෙනස් කළොත්, වෙනස් කරන්න පුළුවන් නම්, අන්න එතකොට අපට සාකච්ඡා කරන්න පුළුවන්, විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්න කියලා. අද විධායක ජනාධිපති ධුරය අහෝසි කළොත් කුමක්ද වෙන්නේ? මේ පාර්ලිමේන්තුවේ සිටින සමහර අයගේ ප්‍රකාශ බැලුවාම, ඔවුන් මේ රට ගැන හිතන්නේ නැහැ. මේ රටට මොනවා වුණත් ඔවුන්ට කමක් නැහැ. ඔවුන් කථා කරන්නේ දෙමළ ජනයාගේ ප්‍රශ්නය විතරයි. සමහර මැති ඇමතිවරු මැති

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඇමතිකම් දරන්නේ, රටටම. නමුත් ඔවුන් කථා කරන්නේ, ඔවුන් ක්‍රියා කරන්නේ, රට පිළිබඳ වග කීමකින් නොවෙයි. පටු ජාතිවාදී, දේශපාලන ස්ථාවරයක ඉඳගෙන තමයි ඔවුන් කටයුතු කරන්නේ. අන්තිමට වෙන්නේ මොකක්ද? මේ පටු ජාතිවාදී ස්ථාවරයක් තිබෙන පක්ෂ අර ප්‍රධාන පක්ෂ නටවන තත්ත්වයට පත් වෙනවා. ඒ නිසා යම් කිසි කෙනෙක් විධායක ජනාධිපති ධුරය අහෝසි කරනවාය කියන්නේ, මේ රට සම්පූර්ණ අස්ථාවර තත්ත්වයකට පත් වන එකයි. පසුගිය වකවානුව පුරාම ව්‍යවස්ථා හැදීමේ මුවාවෙන් විවිධ රාජ්‍ය නොවන සංවිධාන හා විවිධ බලගතු රටවල් මැදිහත් වීමෙන් නේපාලය තුළ විශාල වියවුලක් ඇති කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද මේ විධායක ජනාධිපති ධුරය අහෝසි කරමින් මේ රට අස්ථාවර කිරීම සඳහා යන ගමන ද්‍රෝහී ගමනක්, මේ විධියට කරනවා නම්. හරි විධියට සාකච්ඡාවෙන්, ස්ථාවර පාර්ලිමේන්තුවක් ලැබෙන විධියට ඡන්ද ක්‍රමය වෙනස් කරලා ව්‍යවස්ථා සංශෝධනයක් කරලා ජනාධිපති ධුරය අහෝසි කරනවා නම්, අපේ කිසි විරුද්ධත්වයක් නැහැ. හැබැයි මේ තිබෙන ක්‍රමය යටතේ විධායක ජනාධිපති ධුරය අහෝසි-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේට නියමිත කාලය අවසානයි.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මම කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කලබල අස්සේත් මොකක්ද, මේක කරන්න තිබෙන හදිස්සිය? තමන්ට ජනාධිපතිවරණයට එන්න බැහැයි කියලා මේක අහෝසි කරන්න කියනවා. විධායක ජනාධිපති ධුරය ගෙනාපු පක්ෂය යූඑන්පී එක. අපි නොවෙයි ගෙනාවේ. යූඑන්පී එකෙන්ම කියනවා, දැන් මේක අහෝසි කරන්න ඕනෑ කියලා. ඇයි? තමන්ට එන්න බැරි නිසා. රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරන්න කලින් කරුණාකරලා තමන්ගේ පක්ෂය තුළ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක වාක්‍යයකින් මේ කාරණය කියා මම මගේ කථාව අවසන් කරනවා. ඒ වාක්‍යය තමයි "ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂවල ව්‍යවස්ථාව ප්‍රජාතන්ත්‍රවාදී නැහැ." කියන එක. ඒ නිසා ඒ පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය ලබා දෙන විධියට ඒ පක්ෂයේ ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතුයි. ඒ නිසා පක්ෂවලට මැතිවරණ කොමිසමේ සභාපතිවරයා විසින් අවම ප්‍රජාතන්ත්‍රවාදය තිබෙන සංශෝධනය කළ යුතුයි. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

[பி.ப. 4.16]

**ගරු වේලු කුමාර් මහතා**
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய ஒத்திவைப்புப் பிரேரணை தொடர்பான விவாதத்திலே உரையாற்றுவதற்குச் சந்தர்ப்பத்தைத் தந்தமைக் காகத் தங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். கௌரவ உறுப்பினர் நளிந்த ஜயதிஸ்ஸ அவர்களினால் முன்வைக்கப்பட்டிருக்கின்ற பிரேரணையான நிறைவேற்று அதிகார ஜனாதிபதி முறைமையை அகற்றுதல் தொடர்பான விடயம் என்பது இந்தக் காலகட்டத்திலே அனைவராலும் பேசப்பட்டுக்கொண்டிருக்கின்ற ஒரு முக்கிய தலைப்பாக இருக்கின்றது. ஆனாலும்கூட, நாங்கள் ஒரு விடயத்தை ஞாபகப்படுத்த வேண்டும். அதாவது, இந்த நாடு சுதந்திரமடைந்ததிலிருந்து இந்த நாட்டில் இடம்பெற்றுவந்த விடயங்களை நாங்கள் எடுத்துப் பார்ப்போமாக இருந்தால், இந்த நாட்டினுடைய ஆட்சியதிகாரத்தைத் தக்கவைத்துக் கொள்வதற்காக, அதிகார பலத்தைத் தக்கவைத்துக் கொள்வதற்காகக் காலத்துக்குக் காலம் இந்த நாட்டிலிருந்த தலைவர்கள் எடுத்த தவறான முடிவுகளானவை இன்றைய நாள் வரைக்கும் எங்களுக்கு ஒரு நிலையான - ஸ்திரமான அரசைக் கட்டியெழுப்ப முடியாத நிலைக்குள் நாட்டைத் தள்ளிவிட்டிருக்கின்றன. 1948ஆம் ஆண்டு நாடு சுதந்திர மடைந்த உடனேயே துர்ப்பாக்கிய நிலைக்குத் தள்ளப்பட்ட ஒரு சமூகத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற ஒரு பாராளு மன்ற உறுப்பினர் நான் என்பது உங்களுக்குத் தெரியும். சுதந்திரத்தின் பின் இங்கு முதலாவதாக நிறைவேற்றப்பட்ட பிரேரணையினாலேயே எங்களது மலையக இந்திய வம்சாவளிச் சமூகத்தினது குடியுரிமை - வாக்குரிமை பறிக்கப்பட்டது. அதனுடைய பின்னணி என்ன என்பது இந்த நாட்டிலிருக்கின்ற சகலருக்கும் தெரியும். அதாவது, அரசியலதிகாரத்தை, அந்தப் பதவியைத் தங்கள் வசம் வைத்துக் கொள்வதுதான் அவர்களது நோக்கமாக இருந்ததே ஒழிய, நாட்டின் நலனோ, நாட்டினது எதிர்கால ஸ்திரத் தன்மையோ, எந்தவித நல்லெண்ணமோ அதன் பின்னணியில் காணப்படவில்லை. இதனைத் தொடர்ந்து மேற்கொள்ளப்பட்ட அரசியலமைப்பு மாற்றமாக இருக்கலாம் அல்லது தற்போதைய அரசியலமைப்பிலே கொண்டுவரப்பட்டிருக்கின்ற 19வது திருத்தம் வரையான திருத்தங்களாக இருக்கலாம், இவை யனைத்தும் இதய சுத்தியோடு, நாட்டினது தேவை கருதி, நாட்டிலுள்ள பிரச்சினையைத் தீர்ப்பதற்காக எடுக்கப்பட்ட நடவடிக்கைகளென வெளிப்படையாகக் கூறமுடியாது, வெட்கித் தலை குனிய வேண்டிய நிலையிலேதான் இங்கே யிருக்கின்ற தலைமைகள் இருக்கின்றன என்பதுதான் உண்மையாகும்.

கடந்த 30 வருடகாலக் கொடூர யுத்தமானது முடிவுக்குக் கொண்டுவரப்பட்டதன் பின்னர் இந்த நாட்டிலே ஓர் அரசியல் தீர்வு அவசியம் என்கின்ற விடயம் நாடளாவிய ரீதியிலே, சர்வதேச ரீதியிலே பேசப்படுகின்ற முக்கிய தலைப்பாக இருப்பதை இந்தக் காலகட்டத்திலே நாங்கள் பார்க்கின்றோம். அந்த முக்கிய தீர்வினை நாங்கள் பெறுவதற்குரிய அடித்தளமாக - அத்திவாரமாகத் தற்போதிருக்கின்ற அரசியலமைப்பை மாற்றியமைக்கவேண்டிய தேவை, ஒரு புதிய அரசியலமைப்பை நோக்கி நகர வேண்டிய தேவை காணப்படுகின்றது. அந்த அரசியல் அமைப்பில், நிறைவேற் றதிகார ஜனாதிபதி முறைமையை எவ்வாறு மாற்றியமைப்பது, இலங்கையினுடைய தேர்தல் முறையிலே எவ்வாறான மாற்றங்களைக் கொண்டுவருவது, அதிகாரப்பகிர்வு அல்லது அதிகாரப் பரவலாக்கத்தை எவ்வாறு மேற்கொள்வது ஆகிய ஒன்றோடொன்று இணைந்ததாகக் காணப்படுகின்ற பிரதான அடிப்படைக் காரணிகள் மூன்றும் பிரதானமாகக் கவனத்திற் கொள்ளவேண்டியிருப்பது குறிப்பிடத்தக்கதாகும்.

இந்த நாட்டில் ஸ்திரத்தன்மையை ஏற்படுத்தக்கூடிய ஒரு தீர்வை நோக்கிய நகர்வாக அல்லாது தங்களது தேவை கருதி அந்த 3 காரணிகளையும் வேறு பிரித்து, இதய சுத்தியற்ற தன்மையுடன் அரசியல் ரீதியான சூழ்ச்சியாகவும் அரசியல் ரீதியான தந்திரோபாயமாகவும் காலத்திற்குக் காலம் இதனை மேற்கொள்கின்ற தன்மையை அவதானிக்க முடிகின்றது. அத்துடன் இவற்றை வேறுபிரித்து, தேர்தல் முறைமையினை மாற்றுவதற்கான முயற்சிகளை ஒருபக்கமாக மேற்கொள்கின்ற

[ගරු වේලු කුමාර් මහතා]

அதேவேளை, மறுபக்கமாக ஜனாதிபதி முறைமையை மாற்றுவதற்குரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்படுவதும், இவை இரண்டுக்கும் அப்பால் சென்று அதிகாரப் பகிர்வு அல்லது அதிகாரப் பரவலாக்கத்தைப் பற்றிப் பேசுவதுமான நிலைமை காணப்படுகின்றது. அந்த வகையில், பிரச்சினைகளுக்கு ஒரு நிரந்தரத் தீர்வை என்றுமே எங்களால் பெற்றுக்கொள்ள முடியாத துர்ப்பாக்கிய நிலைக்குத் தள்ளப் படக்கூடிய ஒரு சூழ்நிலையைத்தான் இது சுட்டிக்காட்டுவதாக அமைந்திருக்கின்றது. ஒருபுறத்திலே, தேர்தல் முறையினால் தான் இந்த நாடு நாசமாகிக்கொண்டிருக்கின்றதென எல்லோரும் ஓலமிடுகின்றார்கள். இன்னொருபுறத்திலே, கடந்த 50 நாட்களில் இடம்பெற்ற சூழ்ச்சியிலான அரசியல் மாற்றத்திற்குக் காரணமான இந்த நிறைவேற்று ஜனாதிபதி முறைமையால்தான் இந்த நாடு நாசமாகி இவ்வாறு இருக்கின்றதென ஓலமிடுவதற்கு ஆரம்பித்திருக்கின்றார்கள். இது தங்களுடைய அதிகாரத்தை, தங்களுடைய பதவி நிலைகளை, தங்களுடைய கட்சி சார்ந்த நலன்களை அடிப்படையாகக் கொண்ட சந்தர்ப்பவாத அரசியல் போக்கினை எடுத்துக்காட்டுவதாக அமைந்திருக்கின்றது. ஆகவே, இதிலிருந்து அப்பால் சென்று நாட்டினது நலன்கருதி, எதிர்காலத்தைத் தூரநோக்கோடு அவதானித்து மேற்கொள்ள வேண்டிய ஒன்றாக இருப்பது என்னவெனில், நிறைவேற்று அதிகார சனாதிபதி முறைமை, நாட்டில் இருக்கக்கூடிய தேர்தல் முறைமை மற்றும் அதிகாரப் பகிர்வு அல்லது அதிகாரப் பரவலாக்கம் ஆகிய மூன்றும் ஒன்றோடொன்று இணைந்த வகையில் புதியதோர் அரசியலமைப்பை மிக விரைவாக முன்வைப்பதாகும். இதனூடாகத்தான் நாங்கள் இந்த நாட்டிலுள்ள பிரச்சினைகளுக்கான ஒரு தீர்வை நோக்கிச் செல்லக்கூடியதாக இருக்கும். அதனைவிடுத்து, தனித்து நிறைவேற்று அதிகார சனாதிபதி முறைமையை எடுத்து, அதில் சில மாற்றங்களைச் செய்வதாலும் தேர்தல் முறையை எடுத்து அதிலே சில மாற்றங்களைச் செய்வதாலும் அதிகாரப் பகிர்வு தொடர்பில் ஒரு சில நடவடிக்கைகளை எடுப்பதாலும் சிறந்ததொரு தீர்வுக்கு வர முடியாது.

இந்த நாட்டிலே இருக்கக்கூடிய சிறுபான்மை மக்களான மலையக இந்திய வம்சாவளி மக்களும் வடக்கு, கிழக்கிலே இருக்கக்கூடிய தமிழ் மக்களும் நாடு முழுவதும் இருக்கக்கூடிய முஸ்லிம் மக்களும் ஒருமித்து இந்த நாட்டினுடைய ஆட்சி தொடர்பாக ஓர் அபிப்பிராயத்தை ஒரே நேரத்தில் தெரிவிக்கக் கூடிய ஒரு முறைமை இந்த சனாதிபதி முறைமையிலே காணப்படுகின்றது. அதற்காக இந்த சனாதிபதி முறைமையை முழுமையாக ஏற்று, அதனை அவ்வாறே வைத்திருக்க வேண்டும் என்பது எங்களது கூற்றல்ல. இந்த சனாதிபதி முறைமையிலே இருக்கக்கூடிய குறைகள் இனம் காணப்பட்டு, அதிலே இருக்கக்கூடிய தேவையற்ற அதிகாரங்களை அகற்றி அல்லது அந்த அதிகாரங்களைக் குறைத்து அவசியமான கட்டுப்பாடுகளோடு இந்த சனாதிபதி முறைமையை நாங்கள் முன்னெடுக்க வேண்டும். அத்தோடு, எங்களது தேர்தல் முறையும் அதற்கு ஒத்ததாக, அது சார்ந்ததாக, இந்த நாட்டிலே ஸ்திர நிலைமையை ஏற்படுத்தக்கூடிய வகையில் மாற்றத்துக்குட்படுத்தப்பட வேண்டும். அதனைவிடுத்து, சிறுபான்மையினருக்கு இன்று இருக்கக்கூடிய சனநாயக ரீதியான பிரதிநிதித்துவத்தை, அவர்களுக்கு இருக்கக்கூடிய சனநாயக ரீதியான அரசியல் அந்தஸ்தைக் குறைக்கக்கூடிய வகையில் அல்லது சிதைக்கக்கூடிய வகையிலான முடிவுகளை நோக்கி நகர்வோமாக இருந்தால், பிரச்சினைகளுக்கான தீர்வை எங்களுடைய கண்ணுக்கு எட்டக்கூடிய தூரத்திலே எங்களால் அடைய முடியாதிருக்கும். ஐக்கிய தேசிய முன்னணியில் இருக்கின்ற தலைவர்களாக இருக்கலாம், ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியினுடைய தலைவர்களாக இருக்கலாம், மக்கள் விடுதலை முன்னணியினது தலைவர்களாக இருக்கலாம், ஏனைய கட்சிகளைப் பிரதிநிதித்துவம் செய்கின்ற தலைவர்களாக இருக்கலாம், இவர்கள் இதய சுத்தியோடும் அர்ப்பணிப்போடும் செயற்பட்டு, இந்த நாட்டிலே ஒரு நிலையான தீர்வை ஏற்படுத்துவதற்காக இந்த சனாதிபதி முறையிலே மாற்றம் கொண்டுவர வேண்டும், இந்தத் தேர்தல் முறையிலே மாற்றம் கொண்டுவர வேண்டும், அதிகாரப் பகிர்விற்கு அல்லது அதிகாரப் பரவலாக்கலுக்கு முன்வர வேண்டும் என்பது காலத்தின் தேவையாக இருக்கின்றது என்பதைக் கூறிவைக்க விரும்புகின்றேன். அதைவிடுத்து ஒவ்வொரு காலகட்டத்திலும் ஏற்படுகின்ற தமது தேவைக்கு ஏற்ப இதனை நகர்த்திக்கொண்டு செல்வது பொருத்தமற்ற தென நான் கருதுகின்றேன். அந்த நிலைப்பாட்டிலேயே நாங்கள் இருக்கின்றோம். ஆகவே, ஒவ்வொன்றாக வேறுபிரித்து அரசியல் நாடகம் நடத்தாது, நாட்டிற்கு ஒரு ஸ்திரமான தீர்வைத் தரக்கூடிய வகையில் பூரணமான ஓர் அரசியலமைப்பை முன்வைக்கவேண்டிய செயற்பாட்டினை முன்னெடுக்குமாறு நாங்கள் கேட்டுக்கொள்கின்றோம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, எங்களுடைய மலையகப் பிரதேசத்திலே தோட்டத் தொழிலாளர்கள் எதிர்நோக்குகின்ற சம்பளப் பிரச்சினை யானது, இன்று கொழுந்துவிட்டு எரிகின்ற ஒரு பிரச்சினையாக மாறியிருக்கின்றது. இந்தச் சம்பள உயர்வு தொடர்பான போராட்டம் பல்வேறுவிதமான பரிமாணங்களைத் தாண்டி, இன்று ஒரு புதிய கட்டத்தை அடைந்திருக்கின்றது. இன்று இளைஞர்கள் புறக்கோட்டை புகையிரத நிலையம் முன்பாக இந்தப் போராட்டத்தை சுயேட்சையாக விரிவுபடுத்தி இருக்கின்றார்கள். 50 நாட்களுக்குப் பிறகும் ஸ்திரமான ஓர் அரசு இன்னும் இந்த நாட்டிலே நிலைபெறவில்லை. ஆகவே, இந்த அரசின் - மூன்றாம் தரப்பின் பங்களிப்பு இதற்கு அவசியம். அந்தத் தருணம்வரை காத்திருக்கவேண்டிய தேவை எங்களுக்கு இருக்கின்றது. நாங்கள் எங்களுடைய இளைஞர் களிடம் அன்பாக ஒரு விடயத்தைக் கூறிக்கொள்ள விரும்புகின்றோம். இந்த நாட்டிலே ஸ்திரமான ஓர் அரசு இன்னும் ஓரிரு நாட்களில் அமையப்பெறும். அதற்குப் பிறகு, இந்தச் சம்பளம் தொடர்பான பிரச்சினையிலே அந்த அரசை உள்வாங்குவதற்குரிய முன்னெடுப்புக்களை இந்தச் சமூகத்தி னுடைய பாராளுமன்ற உறுப்பினர்களாக நாங்கள் மேற்கொள்வோம். அது எங்களுடைய முதன்மையான பணியாக இருக்குமென்பதை இந்த இடத்திலே பதிவுசெய்து, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා.4.26]

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාගේ යෝජනාව පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට විනාඩි 10ක් වැනි කාලයක් මට වෙන් කර දීම පිළිබඳව මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. වඩාත් හොඳ විධායක ජනාධිපති ක්‍රමයද, එහෙම නැත්නම් පාර්ලිමේන්තු ක්‍රමයද කියා සාකච්ඡා කථා කරන මේ වේලාවේ මගේ මතය නම් මේ දෙකේ එච්චරම ලොකු වෙනසක් නැහැ කියන එකයි. අපි පොඩි කාලයේ මොකක් හෝ හොඳ මෝටර් බයිසිකලයක් දැක්කාම කට්ටිය කියනවා නේ, "මේ හොණ්ඩා මෝටර් බයිසිකලය හොඳයි" කියලා. තව කට්ටියක් කියනවා, "යමහා

මෝටර් බයිසිකලය හොඳයි" කියලා. මේකත් අන්න ඒ වාගේ දෙයක්. අපි ඉතිහාසය දිහා බැලුවොත්, ලෝකයේ සමහර රටවල් විධායක ජනාධිපති ක්‍රමයත් එක්ක ඉදිරියට ගිහින් තිබෙන බව ඉතා පැහැදිලිව පෙනෙනවා. ඒ වාගේම සමහර රටවල් අසාර්ථක වෙලා තිබෙනවා. ඒ වාගේම අපි පාර්ලිමේන්තු ක්‍රමය දිහා බැලුවොත් සමහර රටවල් පාර්ලිමේන්තු ක්‍රමයත් එක්ක ඉදිරියට ගිහින් තිබෙන බව දකින්න පුළුවන්. නමුත් සමහර රටවල් අසාර්ථක වෙලා තිබෙනවා. ග්‍රීක දර්ශනවාදීන්ගේ සංකල්පයක් තිබුණා, රටක් පාලනය කිරීමට හොඳම ක්‍රමවේදය “one, few, or many” කියලා. එම සංකල්පය පාවිච්චි කරලා තමයි රටක් පාලනය කරන්න ඕනෑ වුණේ. එහෙම නැතිව තනි පුද්ගලයෙක් රටක් පාලනය කරන එක එච්චරම හොඳ නැහැ කියලා ඒ අයගේ විශ්වාසයක් තිබුණා. ඒ වාගේම කිහිපදෙනෙක් රට පාලනය කරන එකත් හොඳ නැහැ; බහුතරයක් රට පාලනය කළත්, ඒකත් හොඳ නැහැ කියලා. විශේෂයෙන්ම සොක්‍රටීස් වැනි දර්ශනවාදීන් ප්‍රජාතන්ත්‍රවාදය ගැන ලොකු විරෝධයක් පළ කළා. ප්ලේටෝගේ “Republic” නැමැති පොතේ තිබෙනවා සොක්‍රටීස්, ඇඩිමන්ටිස් එක්ක කථා කරනකොට විශේෂයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදයට විරුද්ධව කථා කරපු පුද්ගලයෙක් හැටියට. ඇමෙරිකාවේ හිටපු දෙවැනි ජනාධිපතිතුමා වන ජෝන් ඇඩම්ස් එහි ව්‍යවස්ථාව හදනකොට මේ සංකල්පය පාවිච්චි කරලා තමයි විධායක ජනාධිපති ක්‍රමයක් ගෙනාවේ.

විධායක ජනාධිපති ක්‍රමවේදයේ තිබෙන ලක්ෂණ; empirical evidence බැලුවොත්, එහෙම නැත්නම් විධායක ජනාධිපති ක්‍රමය පාවිච්චි කරපු රටවල් දිහා බැලුවොත්, ආර්ථික වර්ධනයට විධායක ජනාධිපති ක්‍රමය හොඳයි කියන එක අපට කියන්න පුළුවන්. ඒක යම් කිසි විධියකට ඔප්පු වෙලා තිබෙනවා. නමුත් එතැනත් ප්‍රශ්නයක් තිබෙනවා. පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයක් තිබුණොත් දුප්පත්, පොහොසත් වෙනස එච්චරම ඇති වෙන්නේ නැහැ කියලා කියනවා. එහෙම නැත්නම් "Gini coefficient" කියා එකක් තිබෙනවා. ඒකෙන් තමයි දුප්පත්, පොහොසත් පරතරය බලන්නේ. විධායක ජනාධිපති ක්‍රමයක ආර්ථික වර්ධනයක් තිබුණත්, "Gini coefficient" එක අනුව දුප්පත්, පොහොසත් පරතරය වැඩි මට්ටමින් තිබෙනවා කියන එක තමයි දේශපාලන විද්‍යාඥයෝ කියන්නේ. අපි පාර්ලිමේන්තු ක්‍රමයක් දිහා බැලුවොත්, හුඟක් කට්ටිය කියන්නේ ඒක ප්‍රජාතන්ත්‍රවාදයට හොඳයි කියලායි. ලෝකයේ පැරණිම ප්‍රජාතන්ත්‍රවාදී රටවල් 22 දිහා බැලුවොත්, එයින් 20ක්ම පාර්ලිමේන්තු ක්‍රමයක් පාවිච්චි කරපු, පාර්ලිමේන්තු මැතිවරණයක් තිබෙන රටවල් හැටියට තමයි අපට හඳුනා ගන්න පුළුවන් වන්නේ.

හැබැයි, මට කලින් කථා කරපු අපේ වේලු කුමාර් මන්ත්‍රීතුමා සමඟ මම සම්පූර්ණයෙන් එකඟ වෙනවා. මෙතැනදී චේතනාව තමයි වැදගත් වන්නේ. මොන ක්‍රමයද තිබෙන්නේ කියන එක නොවෙයි මෙතැනදී වැදගත් වන්නේ. ඇත්ත වශයෙන්ම චේතනාවයි වැදගත් වන්නේ. එතුමා කිව්වා දැන් තිබෙන ව්‍යවස්ථාවට සංශෝධන 19ක් ගෙනාවා කියලා. මේ සංශෝධන දේශපාලන අරමුණු වෙනුවෙන් ගෙනාවා මිස, මේ රටේ අනාගතය ගැන කල්පනා කර ගෙනාවේ නැහැ කියන මතය තමයි එතුමා ඉදිරිපත් කළේ. එතුමා කියපු කරුණ පිළිබඳව මමත් යම් කිසි විධියකට එකඟ වෙනවා.

ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා එතුමාගේ අදහස් දැක්වීමේ දී ප්‍රකාශ කළා, විධායක ජනාධිපති ක්‍රමය තමයි මේ සියලුම ප්‍රශ්නවලට හේතුව කියලා. ඒක අමූලික බොරුවක්. ඉන්දිරා ගාන්ධිගේ කාලයේ දී ඉන්දියාවේ අගමැති ක්‍රමයක් තිබුණා කියලා අපි දන්නවා. තවම තිබෙන්නේ අගමැති ක්‍රමයක්. නමුත් අගමැති හැටියට එතුමිය සැහෙන බලයක් ලබා ගත්තා. එම නිසා මොන ක්‍රමයක්ද අවශ්‍ය වන්නේ කියන එක ගැන කථා කිරීමේ දී මීට වඩා යම්කිසි විධියක විද්‍යාත්මක පදනමකින් යුතුව කල්පනා කර බැලිය යුතුයි කියන එක තමයි මම විශ්වාස කරන්නේ. ඒ වාගේම මෙතැන තවත් ප්‍රශ්නයක් තිබෙනවා. අපි පාර්ලිමේන්තු ක්‍රමයක් ගැන කථා කරනකොට පාර්ලිමේන්තු ක්‍රමයේ "fixed-term" කියා ක්‍රමයක් තිබෙනවා. අපේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාත් කිව්වා, බටහිර රටවල "fixed-terms" තිබෙනවා කියලා. එහෙම නැත්නම් මැතිවරණය අවුරුදු 4කට හෝ 5කට වෙන් කරලා තිබෙනවා කියලා.

ඒක බටහිර රටවලට ගැළපුණාට, මගේ මතය නම් ලංකාව වාගේ රටකට ගැලපෙන්නේ නැහැ කියන එකයි. අපේ ගරු අජිත් පී පෙරේරා මන්ත්‍රීතුමාත් දන්නවා ඇති, බටහිර රටවල් ගත්තොත් බෙල්ජියමේ දින පන්සිය ගණනක් ආණ්ඩුවක් නැතිව තිබුණා. ජර්මනියේ දින තුන්සිය ගණනක් ආණ්ඩුවක් නැතිව තිබුණා. නෙදර්ලන්තයේ දින දෙසිය ගණනක් හෝ තුන්සිය ගණනක් ආණ්ඩුවක් නැතිව තිබුණා. ලංකාව වාගේ රටක විධායක ජනාධිපති ක්‍රමය ඉවත් කර එහෙම තත්ත්වයක් ඇති වුණොත්, බොහෝදුරට අරාජික රටක් බවට මෙය පරිවර්තනය වෙන්නට පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි විධායක ජනාධිපති ක්‍රමය ගැන කථා කරනවා නම්, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැනත් කථා කරන්නට අවශ්‍යයයි. මොකද, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයයි, විධායක ජනාධිපති ක්‍රමයයි බද්ධ වෙලා තිබෙන්නේ. ජනාධිපති ක්‍රමය වෙනස් කර, අපි දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන කථා කරන්නේ නැත්නම් රටේ අස්ථාවරභාවයට එයත් හේතු වෙනවාය කියන එක මම විශ්වාස කරනවා. ඉතාම සරල විධියට අපි මේ ගැන බැලුවොත්, විධායක ජනාධිපති ක්‍රමය සංවර්ධනයට හොඳයි නම්, පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයට හොඳයි නම්, අදට වැඩියෙන්ම අවශ්‍ය වන්නේ මොකක්ද කියන එකයි අපි මෙහිදී අහන්න ඕනෑ ප්‍රශ්නය. මේ වෙලාවේ අපි තරුපහේ ප්‍රජාතන්ත්‍රවාදයක් ලබා ගෙන, ඉන්පසු අපි ඒකෙන් සංවර්ධනය යම් කිසි විධියකට අඩු කර ගන්නවාද කියන ප්‍රශ්නය තමයි අපි අහන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම අද සැලකිල්ලට ගත යුතු කාරණාවක් තිබෙනවා, භූගෝලීය දේශපාලනයෙන් අද වෙන්නේ මොකක් ද කියන එක ගැන. අද ආසියාවේ භූගෝලීය දේශපාලනය දෙස බැලුවොත්, ඒ රටවල් දෙකක් තුළ අරගලයක් තිබෙනවා. චීනය දැවැන්ත සංවර්ධනයක් කරා ඉදිරියට යනවා. ඒ වාගේම ඒ අයගේ යම් කිසි සැලැස්මක් තිබෙනවා, 2049 වෙනකොට ලෝකයේ තිබෙන ප්‍රධාන රට වෙන්න. ඒ වාගේම ඇමෙරිකාව ප්‍රමුඛ අනෙක් රටවල් යම් කිසි විධියකට මේ වර්ධනය අඩු කරන්නට කරන උත්සාහයක් අපි දකිනවා. මෙහි ප්‍රතිඵලයක් හැටියට එක එක රටවල් මේ රටවල් දෙකේ ග්‍රහණයට ගන්නට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන් අපි අද දැකපු දෙයක් තමයි, ආසියාවේ හුඟක් රටවල් ජන වාර්ගික ෆෙඩරල් විසඳුම් - ethnic federalism - දීලා අද ඒ රටවල් අසාර්ථක වෙලා තිබෙනවා. ඉරාකයේ ෆෙඩරල් විසඳුමක් දීලා තිබෙනවා; යේමනයේ ෆෙඩරල් විසඳුමක් දීලා තිබෙනවා; නේපාලයේ ෆෙඩරල් විසඳුමක් දීලා තිබෙනවා; ඒ වාගේම ඇෆ්ගනිස්ථානයේ ෆෙඩරල් විසඳුමක් දීලා තිබෙනවා. මේ රටවල් එකක්වත් ස්ථාවරභාවයට පත් වෙලා නැහැ. පූජ්‍ය අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ පැවසූ අන්දමට අද ලංකාවට වැදගත්ම වන්නේ ස්ථාවරභාවය ඇති කිරීම වාගේම ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමයි. එම නිසා ස්ථාවරභාවයත්, ආර්ථික සංවර්ධනයත් තහවුරු කර ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා.

ජනාධිපති තනතුරේ කටයුතු කරන ආකාරය තමයි වැදගත් වෙන්නේ. මෙහිදී මට පෙර කථා කළ සමහර ගරු මන්ත්‍රීවරුන්

[ගරු තාරක බාලසූරිය මහතා]

ඇන්.ඇම්. පෙරේරා මැතිතුමා පැවසූ අදහසක් ගැන සඳහන් කළා. "පිස්සෙක් ජනාධිපති පුටුවට ආවොත් එහෙම මොකද වෙන්නේ?" කියලා එතුමා ප්‍රකාශ කර තිබෙන බව කිව්වා. ජනාධිපති පුටුවට විතරක් නොවෙයි, අගමැති පුටුවට පිස්සෙක් ආවොත් මොකද වෙන්නේ? එහෙම නැත්නම්, පිස්සෙක් ඇමති පුටුවකට ආවොත් මොකද වෙන්නේ? එතකොට ඒකට මොකක්ද තිබෙන පිළිතුර? එහෙම නම්, පිස්සෝ පාර්ලිමේන්තුවට එවන්නේ නැතිව, පිස්සෝ ජනාධිපති පුටුවට පත් කරගන්නේ නැතිව, අගමැති පුටුවට පත් කරගන්නේ නැතිව, ඇමති පුටුවට පත් කරගන්නේ නැතිව, හරියාකාරව වැඩ කරන්න පුළුවන් කට්ටිය ඒ පුටුවලට පත් කරගත යුතු බව අපි මෙතැනදී සැලකිල්ලට ගන්නට ඕනෑ. අන්න ඒ බුද්ධිය අපට අනිවාර්යයෙන්ම තියෙන්නට ඕනෑය කියන එක මම විශ්වාස කරනවා. 1

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණ ගෙනාපු විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව යෝජනාව ගැන කථා කළොත්, යම් කිසි විධියකට හිතාමතාම අස්ථාවරභාවයක් ඇති වෙන විධියට තමයි මේ විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැවිත් තිබෙන්නේ. එහි කියනවා, කවුරු හෝ ජනාධිපතිවරයෙක් පාර්ලිමේන්තුවෙන් තෝරනවා නම්, ඒ ජනාධිපතිට අනිවාර්යෙන්ම ඡන්ද 113ක් තිබෙන්නට ඕනෑය කියලා. අපි හිතමු, පක්ෂ හතරක් පහක් පාර්ලිමේන්තුව නියෝජනය කරනවා කියලා. එහෙම නම් හැම පක්ෂයකින්ම අපේක්ෂකයෙක් ඉදිරිපත් කළොත්, එක පක්ෂයක අපේක්ෂකයෙකුට බහුතරයක් ගන්න බැරි වුණොත් මොකද වෙන්නේ? එතකොට සිදු වන්නේ ඒ සිටින ජනාධිපති දිගටම කටයුතු කරන එකයි. ඒ වාගේ තත්ත්වයක් ඇති වුණොත් එහෙම මොකද වෙන්නේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? සාමාන්‍යයෙන් අනෙක් රටවල කරනවා වාගේ "knock off system" - එහෙම නැත්නම් බහුතරයක් ගන්නා අපේක්ෂකයන් දෙන්නා අතර තරගයක් පවත්වන්නට සිදු වනවා. නමුත් ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරයන් හිතා මතාම මේ ක්‍රමවේදය මේකට ඇතුළත් කරලා නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුත් අද විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්නට ඕනෑය කියා හිතනවා.

ලබන අවුරුද්දේ අවසානය වනවිට අපි ජනාධිපතිවරණයක් පවත්වන්න ඕනෑ. බැරි වෙලාවත් අපේ රනිල් වික්‍රමසිංහ මහත්මයා ඒ ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කළොත්, එතුමා ඒ ස්ථාවරයේ ඉන්නවාද කියන එකත් ප්‍රශ්න කරන්න ඕනෑ. එහෙම නැත්නම්, "අපි ජනාධිපතිවරණය පරාජය වෙයි, ඒ නිසා මේ විධායක ජනාධිපති ක්‍රමය ඉවත් කරන්න ඕනෑ" කියන ස්ථාවරයේද එතුමන්ලා ඉන්නේ කියන එකත් අපි දැනගන්න ඕනෑ. විධායක ජනාධිපති ක්‍රමයද, විධායක අගමැති ක්‍රමයද තිබෙන්න ඕනෑ, කුමන ව්‍යවස්ථාවක්ද මේ රටට ගෙනෙන්න ඕනෑ කියන එක පිළිබඳව අද යෝජනාවක් ගෙනැත් හෙට සම්මත කර ගන්න බැහැ. ඒ පිළිබඳව පුළුල් විවාදයක් පවත්වන්න ඕනෑ. මට පෞද්ගලිකව හැඟෙන විධියට නම් මෙතැන නොවෙයි ප්‍රශ්නය තිබෙන්නේ. ප්‍රශ්නය තිබෙන්නේ, බලය වෙන් කිරීම - separation of powers - පිළිබඳවයි. අපි දන්නවා, සමහර රටවල් විධායක බලය සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තුවෙන් ඉවත් කර තිබෙන බව. ඒ කියන්නේ ඇමතිවරු ඒ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් නොවෙයි. මෑතකදී වුණු සිද්ධියේදී අපි දැක්කා, කිසිදු ඇමතිවරයෙක් නැතිව ඒ දින 51ක තුළදීත් රට ඉදිරියට ගිය ආකාරය. එහෙම නම් අපි ප්‍රශ්න කරන්න ඕනෑ, මෙහෙම ඇමති මණ්ඩලයක් -50ක නොවෙයි, 30කවත් ඇමති මණ්ඩලයක්- අවශ්‍ය වන්නේ ඇයි කියන එක. වෙනත් රටවල් කර තිබෙනවා වාගේ, ඇමති මණ්ඩලය පාර්ලිමේන්තුවට පිටතින් පත් කළොත් ඒක ඉතාම හොඳ කටයුත්තක් වෙයි කියා මම විශ්වාස කරනවා. අපට ඇමති මණ්ඩලය 15දෙනෙකුට වාගේ සීමා කරන්න පුළුවන්. ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට වඩා යම්කිසි දැනුමක් තිබෙන කට්ටියක් ඒ ඇමති මණ්ඩලයට පත් කරගන්න අපට පුළුවන්. තොරතුරු තාක්ෂණය අද ලෝකයේ වැදගත්ම අංශයක්. අද අපේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනෙකු ඉන්නවා. හැබැයි, ඒ 225දෙනාටම මේ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳව ලොකු අවබෝධයක් නැහැ. ඒ විධායක බලතල - executive responsibilities - පිට කෙනෙකුට දීලා හෝ ඒ ක්ෂේත්‍රයට සම්බන්ධ කෙනෙක් ඇමතිවරයෙක් විධියට පත් කර ගන්න පුළුවන් නම් ගොඩාක් හොඳයි.

මේ රට ඉදිරියට ගෙන යන්න නම්, බලය වෙන් කිරීම - separation of powers - තමයි මූලිකවම අප කළ යුත්තේ. ඒක මගේ පෞද්ගලික මතයයි. මම ඒ පදනමේ ඉන්නවා. ස්තුතියි.

[பி.ப. 4.39]

**ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා**
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நிறைவேற்று அதிகார சனாதிபதி முறையை ஒழிப்பது தொடர்பாக மக்கள் விடுதலை முன்னணியினர் முன்வைத் திருக்கும் இந்தச் சபை ஒத்திவைப்புவேளைப் பிரேரணைமீது உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்காக முதலில் உங்களுக்கு நன்றி தெரிவிக்கின்றேன். உண்மையில் இந்த வாய்ப்பு என்பது, இரண்டு நாட்களாகக் காத்திருந்து கிடைத்தது என்பதை இந்த உயரிய சபையிலே பதிவுசெய்யவேண்டி இருக்கின்றது. நேற்று ஆற்றவேண்டிய உரையை இன்றுவரை காத்திருந்து ஆற்றவேண்டி இருக்கிறது. இந்த விவாதத்தின் இறுதியிலே வாக்கெடுப்பு இல்லை; இது நிறைவேற்றப்படப் போவதில்லை. ஆனால், இத்தகைய விவாதத்தின் பேசுபொருளாகக்கூடிய மிக முக்கிய தலைப்பான நிறைவேற்று அதிகார சனாதிபதி முறையை ஒழிப்பது தொடர்பாக மக்களால் தெரிவுசெய்யப்பட்ட பிரதிநிதிகள் என்ற வகையிலே எங்களுக்கு இருக்கக்கூடிய பொறுப்புக்கள் என்ன? எங்களது வகிபாகம் என்ன? என்பதை இந்த உயரிய சபையிலே தமிழ் முற்போக்குக் கூட்டணியின் உறுப்பினராக, தொழிலாளர் தேசிய முன்னணியின் பொதுச் செயலாளராக, தொழிலாளர் தேசிய சங்கத்தின் பிரதிப் பொதுச் செயலாளராக, மக்களின் பிரதிநிதியாகப் பதிவுசெய்யலாமென நினைக்கிறேன். எங்கள் மக்களின் வாக்குகளினால் தெரிவுசெய்யப்பட்டவர்களால் இத்தகைய விவாதத்தில் கலந்து கொள்ள முடியவில்லை. இந்தச் சூழ்நிலையில், தங்களிடம் இருக்கக்கூடிய இரண்டு சேவல்களை எந்தப் பக்கம் விடுவதென அங்கே விவாதம் நடத்திக் கொண்டிருக் கின்றார்கள். அத்தகைய சேவல் சண்டைக்குள் அகப்படாதவர் களாக ஓரணியாக நின்று, நிறைவேற்று அதிகார சனாதிபதி முறைமையினூடாக எங்களது மக்களுக்கு எத்தகையதோர் ஆட்சி முறை தேவை? அதற்கு நாங்கள் எவ்வாறு பங்களிப்பது? என்பது சம்பந்தமாக எனது கருத்துக்களை இந்த விவாதத்தினூடாக முன்வைக்கலாம் என நினைக்கிறேன்.

இன்று பாராளுமன்ற அமர்வு தொடங்கியவுடன், எதிர்க்கட்சித் தலைவராக இருந்த இரா. சம்பந்தன் அவர்கள் ஒரு விளக்கவுரையை ஆற்றியிருந்தார். அதில், தான் இன்னும் எதிர்க்கட்சித் தலைவர் பதவியிலிருந்து விலக்கப்படவில்லை

என்ற கருத்தை அவர் முன்வைத்திருந்தார். எனவே, நாங்கள் ஒரு வித்தியாசமான பாராளுமன்றக் காலத்திலே உரையாற்றிக் கொண்டிருக்கின்றோம். ஆளும் கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களாக இருந்தோம்; எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களாக மாறினோம்; முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களானோம். பிறகு, neutral என்று சொல்லப் படுகின்ற ஆளும் அல்லது எதிர்க்கட்சிப் பாராளுமன்ற உறுப்பினராக அல்லாது இருந்தோம். இப்போது, மீண்டும் ஆளும் கட்சிப் பாராளுமன்ற உறுப்பினர்களாக வந்திருக் கிறோம். கடந்த மாதம் 2 பிரதமர்களைக் கொண்டிருந்த பாராளுமன்றமாக இது இருந்தது. இன்று முதல் இரண்டு எதிர்க்கட்சித் தலைவர்களைக் கொண்ட பாராளுமன்றமாக இது இருக்கின்றது. அதேநேரத்தில், அமைச்சரவை இல்லாது பிரதம மந்திரியை மாத்திரம் கொண்ட ஓர் அரசாங்கம் இருக்கின்ற காலகட்டமாகவும் இது இருக்கின்றது. அமைச்சரவையை நியமிக்க வேண்டிய ஜனாதிபதி அவர்கள், யாரை அமைச்சராக நியமிப்பது? என்ன நிபந்தனைகளில் நியமிப்பது? என்பது சம்பந்தமாகக் கடந்த 2 - 3 நாட்களாக அடம்பிடித்துக் கொண்டிருக்கின்றார். அதேநேரம், எதிர்கட்சித் தலைவரை நியமிப்பது சம்பந்தமாக அவரது அனுசரணை கிடைத்திருப்பதாகவே நாங்கள் அறிக்கின்றோம். என்னைப் பொறுத்தவரைக்கும் இரண்டு எதிர்க்கட்சித் தலைவர்கள் இந்தப் பாராளுமன்றத்தில் இருக்கின்ற ஒரு சூழ்நிலையில், இந்த இரண்டு எதிர்க்கட்சித் தலைவர்களுக்கும் மேலாக எதிர்க்கட்சித் தலைவரின் வகிபாகத்தை ஜனாதிபதி அவர்கள் ஆற்றிக்கொண்டிருக்கின்றார் என்றுதான் நான் நினைக் கின்றேன். இத்தகைய ஒரு கால சூழ்நிலையில் ஜனாதிபதி முறைமை மாற்றப்பட வேண்டுமென்ற பிரேரணை இன்று இந்தச் சபையிலே முன்வைக்கப்பட்டிருக்கின்றது.

இதற்கு முன்பதாகவே இந்த நிறைவேற்று அதிகார ஜனாதிபதி முறையை மாற்றுவது தொடர்பாக மக்கள் விடுதலை முன்னணியினர் ஒரு தனிநபர் சட்டமூலமொன்றை இந்தச் சபையில் சமர்ப்பித்திருந்தனர். அது உச்ச நீதிமன்றத்தினால் கேள்விக்குட்படுத்தப்பட்டது. சர்வஜன வாக்கெடுப்புக்குச் செல்லவேண்டுமென உச்ச நீதிமன்றம் தீர்ப்பளித்ததன் பேரில், அது கைவிடப்பட்டது. நிறை வேற்றதிகார ஜனாதிபதியான மைத்திரிபால சிறிசேன அவர்களின் அரசியலமைப்பை மீறிய செயற்பாடுகள் காரணமாகக் கடந்த 50 நாட்களாக இந்த நாட்டில் அசாதாரண சூழ்நிலை ஏற்பட்டிருந்தது. அவர்மீது பல்வேறு விமர்சனங்கள் முன்வைக்கப்பட்டிருக்கின்ற நிலையில், அந்த விமர்சனத்தின் அடிப்படையில் அதனைப் பேசுபொருளாக்குவதற்காக இன்றைய விவாதம் முன்கொண்டு செல்லப்படுகின்றது. என்னைப்பொறுத்தவரைக்கும், அந்த நிலையில் நிற்காமல், ஒரு தனிப்பட்ட நபரின் செயற்பாடுகள் பற்றிப் பேசாமல், காலங்காலமாக இந்த நாட்டின் ஜனாதிபதியாகவோ, பிரதமராகவோ இருந்த தலைவர்கள் எந்தளவுக்குப் பொறுப்புமிக்க ஆட்சியைக் கொண்டு நடாத்தியிருக்கிறார்கள், எந்தளவுக்கு இந்த நாட்டின் மக்களைச் சமத்துவமாக நடத்தியிருக்கிறார்கள் என்பதன் அடிப்படையில் எனது உரையை ஆற்றலாமென நான் நினைக்கின்றேன்.

இதற்கு முன்பதான ஒரு காலகட்டத்தை எமது கூட்டணியின் கண்டி மாவட்ட பாராளுமன்ற உறுப்பினர் வேலு குமார் அவர்கள் நினைவுபடுத்திச் சென்றார். 1948ஆம் ஆண்டு இலங்கை சுதந்திரமடைந்ததோடு, இந்த நாட்டின் ஒரு தொகுதி மக்களாகிய இந்திய வம்சாவளி மலையகத் தமிழ் மக்களுக்கு ஓர் அநீதி இழைக்கப்பட்டது. ஒட்டுமொத்தமாக இந்த நாட்டின் பாராளுமன்றம் அவர்களின் வாக்களிக்கும் உரிமையை மறுத்தது. அது இந்தப் பாராளுமன்றம் ஒன்றுகூடிச் செய்த வேலை! அப்போது நிறைவேற்று அதிகார ஜனாதிபதி முறை இந்த நாட்டிலே நடைமுறையில் இருக்கவில்லை. 1964ஆம் ஆண்டு இந்தப் பாராளுமன்றத்தில் அங்கம் வகித்த பிரதமரான சிறிமாவோ பண்டாரநாயக்க அவர்கள் அப்போதிருந்த மேலவையான செனட் சபைக்கு ஓர் அறிக்கை சமர்ப்பித்துத்தான் சிறிமா - சாஸ்திரி ஒப்பந்தம் செய்யப்பட்டது. அந்த ஒப்பந்தத்தைச் செய்வதற்காக செனட் சபைக்கு அப்போதைய பிரதமர் சிறிமாவோ பண்டாரநாயக்க அவர்கள் வழங்கிய அறிக்கையின் சில பகுதிகளை இந்தச் சந்தர்ப்பத்திலே வாசித்துக் காட்டலாமென நான் நினைக்கின்றேன்.

Hon. Deputy Chairman of Committees, I wish to quote some extracts from the "Statement on the Indo-Ceylon Agreement of October 30,1964 made by the Hon. (Mrs.) Sirimavo Bandaranaike, Prime Minister, in the Senate on 10th November, 1964."

> "It will be relevant to give a brief account of the history of this problem which started with the opening up of estates in the Kandyan areas in the 1830s."

> "Today, we find in the Kandyan Districts an alien population of South Indian workers who follow the social traditions of South India while the Kandyans who occupy the valleys observe their ancient customs. There has been hardly any intermingling between these two sections of the population with their differences in religion, language, social customs and occupations."

> "....Ceylon has always been most cautious in making concession which would place Indian on par with the indigenous population in sofaras political and citizenship rights were concerned."

இதனூடாகச் சொல்லப்படுவது என்ன? ஒரு தொகுதி மக்களை இந்த நாட்டின் பிரஜைகளாக ஏற்றுக்கொள்வதா, இல்லையா? என்பது தொடர்பான எச்சரிக்கை உணர்வைத் தாங்கள் கொண்டிருப்பதாக ஒரு நாட்டின் பிரதமர் மேலவைக்கு அறிக்கை சமர்ப்பித்திருக்கிறார். அவர்களை இந்த நாட்டின் உள்நாட்டு நிருவாகத்தில் சேர்த்துக்கொள்வது சம்பந்தமாக இலங்கை எப்போதும் எச்சரிக்கை உணர்வுடன் இருந்திருக்கிறது. அப்போது பிரதமர் மிகவும் நல்லவராக, எல்லோரையும் சமமாக ஏற்றுக்கொண்டவராக இந்த நாட்டிலே சேவையாற்றியதாக எங்களுக்குக் காணக் கிடைக்கவில்லை. இதனை ஒரு பிரச்சினை - "a Problem" - ஆக அவர் சொல்கிறார்.

It states, I quote;

> "The Indian problem in Ceylon right from the very beginning resolved itself into the question of how many of the Indians resident in this country can be said to have become permanently settled here to the extent that they could be absorbed as citizens and a guarantee of full political and civil rights as are available to the indigenous population granted to them without damaging the interests of the country."

இவர்களுக்கு வாக்குரிமை கொடுப்பது, இவர்களை உள்நாட்டு நிருவாகத்தில் ஏற்றுக்கொள்வது என்பது ஒரு பிரச்சினையாகவே பார்க்கப்பட்ட ஒரு காலம் பிரதமர் ஆட்சிக் காலத்திலும் இருந்திருக்கிறது. 1932ஆம் ஆண்டு சர்வஜன வாக்குரிமையின் கீழாக, பிரித்தானியர் எங்களுக்கு வாக்குரிமை கொடுத்தபோதும் சுதேச அரசாங்கம் எனச் சொல்லிக்கொண்டு ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியும் ஐக்கிய தேசியக் கட்சியும் ஒன்று சேர்ந்திருந்த அந்த நாட்களில் எங்களுடைய குடியுரிமை பறிக்கப்பட்டது. எந்த ஆட்சியாளர் மீதும் எங்களுக்கு நம்பிக்கை வைப்பதற்கில்லை; வரலாறு அதைத்தான் சொல்கின்றது.

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

அப்போது உள்நாட்டு நிருவாகத்தில் எங்களை அனுமதிக்காத இலங்கை அரசு, தொடர்ச்சியாக 'கம் சபா' முறையிலும் அனுமதிக்காமல் இருந்தது. 1987ஆம் ஆண்டு 'கம் சபா' முறை மாற்றப்பட்டு, பிரதேச சபை முறை அல்லது உள்ளூராட்சி முறை கொண்டுவரப்பட்டபோதும் பெருந்தோட்டப் பகுதிகளை அதிலும் உள்வாங்கவில்லை. தமிழ் முற்போக்குக் கூட்டணியின் சார்பில் புதிய உறுப்பினர்களாக நாங்கள் பாராளுமன்றத்துக்கு வந்தோம். 2015ஆம் ஆண்டு நவம்பர் மாதம் 1987ஆம் ஆண்டின் பிரதேச சபைகள் சட்டத்தைத் திருத்துவதற்கான ஒரு பிரேரணை என்னால் முன்வைக்கப்பட்டது. பின்னர் 2018ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 19ஆம் திகதி அதுபோன்ற ஒரு பிரேரணையை எங்களால் நிறைவேற்றிக் கொள்ள முடிந்ததென்பதை நான் நினைவுபடுத்த விரும்புகின்றேன். இத்தகைய வேறுபாடுகள் ஒவ்வோர் ஆட்சிக் காலத்திலும் இருந்திருக்கிறது.

எங்களைப் பொறுத்தவரை, நாங்கள் இந்த நிறைவேற்று அதிகார ஜனாதிபதி முறைமையை வேறு விதமாக நோக்குகிறோம். பாராளுமன்றத்தைப் பிரதிநிதித்துவம் செய்வதற்காக உருவாக்கப்பட்ட தொகுதி முறையானது இந்த நாட்டில் சமத்துவமான முறையில் ஏற்படுத்தப் படவில்லை. இங்கே சமத்துவமான முறைமையொன்று காணப்படவில்லை. 160 தொகுதிகளை அடிப்படையாக வைத்துக்கொண்டு 225 பாராளுமன்ற உறுப்பினர்கள் தெரிவு செய்யப்படுகின்றார்கள். இந்த 160 தொகுதிகளிலும் மக்கள் சமமான பிரதிநிதித்துவத்தைக் கொண்டிருக்க வில்லை. சில தொகுதிகளில் 25,000 சனத்தொகைக்கு ஓர் உறுப்பினர் என்று காணப்படுகின்ற அதேநிலை வேறு சில தொகுதிகளில் இரண்டு இலட்சம் சனத்தொகைக்கு ஒரு பிரதிநிதி வகையில் காணப்படுகின்றது. குறிப்பாக, நாங்கள் பிரதிநிதித்துவப்படுத்துகின்ற தொகுதி அவ்வாறானதாகத் தான் காணப்படுகின்றது. சமத்துவமில்லாத தொகுதி யிலிருந்து தெரிவுசெய்யப்படுகின்ற பாராளுமன்றப் பிரதிநிதித்துவம் என்பது மக்களின் சமத்துவமான எண்ணத்தைப் பிரதிபலிக்கும் என்கின்ற நம்பிக்கை எங்களுக்கு இல்லை. அதற்கு மாறாக, சமத்துவமில்லாத சூழ்நிலையில் எங்களது சனத்தொகை அளவுக்கு ஒப்பீட்டளவில் சரிவராத ஒரு தொகுதியில் கிடைக்கின்ற வாய்ப்புக்களைப் பயன்படுத்தித்தான் நாங்கள் இந்தப் பாராளுமன்றத்திற்கு வந்து எங்களது உரிமைகளை நிலைநாட்டிக்கொள்ளவேண்டிய தேவை இருக்கிறது. ஆயினும், இந்த நாடு ஒரு முழுத் தொகுதியாக இருந்து வாக்களித்து ஒருவரைத் தெரிவு செய்வதற்கான வாய்ப்பை இந்த நாட்டில் மலையக மக்கள் மாத்திரமல்ல, முஸ்லிம் மக்களுட்படச் சகல சிறுபான்மை இனங்களும் சரியாகப் பயன்படுத்தி தங்களின் உரிமைகளை நிலைநாட்டிக் கொள்வதற்கான ஒரு சூழலை நிறைவேற்றதிகார ஜனாதிபதி முறைமையின்கீழ் அவ்வப்போது நாங்கள் பெற்றுக்கொள்கிறோம். இருந்தபோதும், இந்த நிறைவேற்றதிகார ஜனாதிபதி முறைமையிலுள்ள குறைபாடுகளையும் நாங்கள் உணர்கிறோம். நிறைவேற்றதிகார ஜனாதிபதி முறையை நீக்குவதென்றால் அதற்கும் உடன்படத் தயாராக இருக்கின்றோம். அமையப்போகின்ற பாராளுமன்றத்தினூடாக எங்களது உரிமைகளை நிலைநாட்டுவதற்கான வாய்ப்புக் கிடைக்கும்வகையில் அத்தகைய பாராளுமன்றப் பிரதிநிதித்துத்துவத்தைத் தெரிவு செய்கின்ற முறைமை சரியானதாக இருக்க வேண்டும் என்ற நிபந்தனையின் அடிப்படையில் உடன்படத் தயாராக இருக்கின்றோம். முறைமையாக அந்தத் தொகுதிகள் உருவாக்கப்பட வேண்டும்; எல்லாச் சமூகங்களும் பங்குகொள்ளக்கூடிய வகையிலே பிரதிநிதிகளின் எண்ணிக்கை சமமாக உருவாக்கப்பட வேண்டும் அல்லது 'செனட்' சபை போன்ற சிறுபான்மைச் சமூகத்திற்கு அதிகாரமளிக்கின்ற ஓர் அதிகாரசபை உருவாக்கப்பட வேண்டும். இவற்றை ஓர் அரசியல் அமைப்பின் ஊடாகத்தான் செய்ய முடியும். அத்தகையதோர் அரசியலமைப்பில் எங்களது நியாயங்கள் உறுதிப்படுத்தப்பட்டதன் பின்னர் நிறைவேற்ற திகாரமுடைய ஜனாதிபதி முறையை மாற்றுவதற்கு நாங்கள் எப்போதும் தயாராக இருக்கிறோம். இந்த நாட்டின் சமத்துவமான மக்கள் என்கின்ற வகையில் எங்களின் உரிமையை நிலைநாட்டுவதற்கு அல்லது எங்களது உரிமையை அவ்வப்போது பேரம்பேசிப் பெற்றுக் கொள்வதற்கானதொரு சந்தர்ப்பமாக இருக்கின்றதென்ற அடிப்படையில்தான் இப்போதைக்கு இந்த முறைமைக்கு நாம் ஆதரவாக இருக்கிறோம். தற்போது புதிய அரசியலமைப்பு நியாயமானதாக அமைய வேண்டும் என்கின்ற கோரிக்கை பல்வேறு தரப்பினராலும் முன்வைக்கப்படுகின்ற இந்த நிலையில், எங்களது கோரிக்கை தொடர்பாக ஆராய முடியும் என்பதையும் எடுத்துக்கூறி, வாய்ப்புக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

[பி.ப. 4.51]

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, கௌரவமிக்க சபையின் கௌரவ உறுப்பினர்களே, பெரும் அரசியல் நெருக்கடி ஒன்றின் பின்னர் இந்தச் சபையில் கூடியிருக்கின்றோம். "மழைவிட்டும் தூவானம் விடவில்லை" என்பதைப்போல "பிரதமர் யார்?" என்கின்ற சர்ச்சையிலிருந்து இப்போது "எதிர்க்கட்சித் தலைவர் யார்?" என்கின்ற சர்ச்சைக்கு நகர்ந்திருக்கின்றோம். கௌரவ உறுப்பினர் மஹிந்த ராஜபக்ஷ அவர்கள், நிறைவேற்று அதிகாரம்கொண்ட ஜனாதிபதியாக இருந்த தனக்குப் பதவி ஆசை இல்லை என்று பிரதமர் பதவிக்கான அடிதடியின்போது இந்தச் சபையிலே கூறியிருந்தார். ஆனால், இப்போது எதிர்க் கட்சித் தலைவர் பதவிக்கு அவர் மீண்டும் போட்டியிடுவதைப் பார்க்கும்போது பதவி ஆசை யாரைத்தான் விட்டு வைத்ததென்று எண்ணத் தோன்றுகின்றது. அத்தகைய ஆசையின் காரணத்தால்தான் இன்று இந்த விவாதத்திலும் நாம் கலந்துகொள்ளும் தேவை ஏற்பட்டுள்ளது. இல்லையேல், 2015ஆம் ஆண்டு ஜனாதிபதித் தேர்தலின்போது "நிறைவேற்று அதிகாரம்கொண்ட ஜனாதிபதிப் பதவியை முற்றாக ஒழிப்பேன்" என்று வாக்குறுதி வழங்கிய இன்றைய ஜனாதிபதி கௌரவ மைத்திரிபால சிறிசேன அவர்கள், இன்று அந்த வாக்குறுதியிலிருந்து வழுவுவதன் காரணமாகவே அவர் பதவியிலிருக்கும்போதே நிறைவேற்று அதிகாரத்தை முற்றுமுழுதாக ஒழிக்க வேண்டுமென்கின்ற கோரிக்கையை நாம் வலியுறுத்த வேண்டியதாக உள்ளது.

அதிமேதகு ஜனாதிபதி அவர்கள் தன்னுடைய தேர்தல் விஞ்ஞாபனத்தில், "இன்று நாட்டை நிர்வகிப்பது அமைச்சரவையல்ல; நாடாளுமன்றமல்ல. ஒரு குடும்பமே

ஆட்சி செய்கின்றது. அதனூடாக நாடு உறுதித் தன்மையை இழந்துள்ளது. இந்த நிலை நீடித்தால் நாட்டில் பாரதூரமான நிலைமை ஏற்படும். ஆகையால், நாட்டில் அரசியல் உறுதிப்பாட்டை வலுப்படுத்தி நாட்டை முன்னோக்கிக் கொண்டு செல்வதற்கு இந்த நாட்டில் சட்டவாட்சியை நாடாளுமன்றத்தினூடாக உறுதிப்படுத்தி, அனைத்தையும் பாதுகாத்து, அரசியல் உறுதிப்பாட்டை உறுதிப்படுத்தும் முக்கியமான பொறுப்பை ஏற்றுள்ளேன். நிறைவேற்றதிகார முடைய ஜனாதிபதி முறைமையை 100 நாட்களுக்குள் பாராளுமன்றத்தின் ஒத்துழைப்போடு இரத்துச் செய்து, அமைச்சரவை ஊடாகப் பாராளுமன்றத்துடன் இணைந்து நிறைவேற்றதிகாரம் கொண்ட அரசமைப்பொன்றை உருவாக்குவதே இந்தத் தேர்தல் விஞ்ஞாபனத்தின் முக்கிய இலக்காகும்" என்று குறிப்பிட்டுள்ளார்.

1978ஆம் ஆண்டில் அறிமுகப்படுத்தப்பட்ட இந்த ஜனாதிபதி முறைமையால் நாட்டு மக்கள் சொல்லொணாத் துயரத்தை அனுபவித்த பின்னர் காட்டுத்தனமான சர்வாதிகாரப் போக்குடைய ஒருவரின் கையில் இந்த அதிகாரங்கள் சென்றதன் விளைவாகவே இந்த நாடே அவரது குடும்பச் சொத்தாக மாற்றப்பட்டதன் விளைவை வெறுத்ததன் பின்னர், நிறைவேற்று அதிகார ஜனாதிபதி முறைமை வேண்டாம் என்று இந்த நாட்டு மக்கள் கொந்தளித்துக் கிடந்தபோதுதான் கௌரவ மைத்திரிபால சிறிசேன அவர்கள் நிறைவேற்ற திகாரத்தை 100 நாட்களுக்குள் முற்றாக ஒழிப்பேன் என்று கூறினார். அவரது அந்த வாக்குறுதியையும் நம்பித்தான் மக்கள் அவருக்கு வாக்களித்தார்கள். குறிப்பாக, தமிழ், முஸ்லிம் மக்களும் முற்போக்குச் சிங்கள மக்களும் அவருக்கு வாக்களித்தார்கள். ஆனால், 19ஆவது திருத்தச் சட்டத்தினூடாக நிறைவேற்று சனாதிபதிப் பதவியின் அதிகாரங்கள் வெட்டிக் குறைக்கப்பட்டன. எனினும், முற்றாக அப்பதவி ஒழிக்கப்படவில்லை. இரண்டாவது தடவையாக நிறைவேற்று சனாதிபதியாகும் எண்ணம் தமக்கு இல்லை என்று கௌரவ மைத்திரிபால சிறிசேன ஏற்கெனவே கூறியிருந்ததன் அடிப்படையில், நிறைவேற்று அதிகார முறைமையை முற்றிலும் ஒழிப்பதற்கு அவர் ஒருபோதும் எதிராக இருக்கமாட்டார் என்கிற நம்பிக்கையிலேயே பெரும்பான்மையான மக்கள் அவருக்கு வாக்களித்தார்கள். ஆனால், ஆணைப் பெண்ணாகவும் பெண்ணை ஆணாகவும் மாற்றுவதற்கான அதிகாரத்தைத் தவிர, மிகுதி அனைத்து அதிகாரங்களையும் வழங்கும் சனாதிபதிப் பதவியில் இருந்த பின்னர், மீண்டும் அந்தப் பதவியில் அமர்வதற்கும் அதிகாரத்தைக் கையிலெடுத்து கோலோச்சுவதற்கும் அவர் தயாராகிவிட்டார் என்பது கவலைக்குரியது. அவரது இந்த உள்நோக்கத்தை நிறைவேற்றிக் கொள்வதற்காகவே அண்மைய அரசியல் நெருக்கடியையும் குழப்பங்களையும் ஏற்படுத்தினார் என்றுங்கூட விமர்சிக்கப்படுகின்றது என்பதை யாரும் மறந்துவிடக்கூடாது.

"கடந்த மூன்றரை வருடங்களுக்கு மேலாக இலங்கையின் அரச தலைவராகச் செயற்பட்டுவரும் என்னால், நாடும் அரசும் அடைந்திருக்கும் முன்னேற்றத்தைப் பற்றி மிகவும் மகிழ்ச்சியடையக் கூடியதாக உள்ளது. 2015ஆம் ஆண்டு சனவரி மாதம் 08ஆம் திகதி மக்களின் வாக்குகளால் தெரிவுசெய்யப்பட்டு, இலங்கையின் அரச தலைவராகப் பொறுப்பேற்றபோது, நாட்டில் தற்போது நான் வகிக்கும் பதவிக்காக வழங்கப்பட்டிருந்த எல்லையற்ற நிறைவேற்று அதிகாரங்களை அதாவது, ஓர் அரசனுக்கும் அப்பால், பேரரசனுக்கான அதிகாரங்களுக்குச் சமமாக இருந்த எல்லயைற்ற அதிகாரங்களை, இந்தக் காலகட்டத்தில் அந்தப் பதவியை ஏற்றிருக்கின்ற ஓர் அரச தலைவன் என்ற வகையிலும் ஒரு மனிதன் என்ற வகையிலும் முன்னெடுக்க வேண்டிய மிக முக்கியமான வரலாற்றுக் கடமையாக இருந்த எனக்குக் கிடைத்திருந்த அந்த எல்லையற்ற அதிகாரங்களைக் குறைத்து, அவற்றை இலங்கை நாடாளுமன்றத்துக்குக் கையளிப்பதற்கான நடவடிக்கைகளை மேற்கொண்டேன் என்பதை இங்கே தெரிவிப்பதில் மகிழ்ச்சியடைகின்றேன்" - இவ்வாறு கடந்த செப்ரம்பர் மாதம் 28ஆந் திகதி ஐக்கிய நாடுகள் பொதுச் சபையில் உரையாற்றும்போதுகூட, கௌரவ ஜனாதிபதி தெரிவித்திருந்தார். ஆனால், அந்த உரையாற்றப்பட்டு ஒருமாத காலம் முடிவதற்குள்ளாகவே எந்த அதிகாரத்தைத் தான் இழந்ததைப் பெருமைப்படும் விடயம் என்று கூறியிருந்தாரோ, அதேபோன்று எஞ்சிய அதிகாரங்களையும் முடிவுக்குக் கொண்டுவருவதற்கு அவர் முன்வந்து செயற்பட்டிருக்க வேண்டும். ஆனால் அது நடக்கவில்லை. அத்துடன், ஜனாதிபதி இந்த உரையை ஆற்றுவதற்கு ஒரு வருடம் முன்னதாக 2017ஆம் ஆண்டு ஐக்கிய நாடுகள் பொதுச் சபையில் ஆற்றிய உரையையும் இங்கு குறிப்பிட்டுக் கூறவேண்டியது எமது கடமையாகும்.

"2015 ஜனவரியில் இலங்கை ஜனாதிபதியாகத் தெரிவுசெய்யப்பட்டிருந்தேன். அவ்வாறு தெரிவு செய்யப்பட முன்னர் எனது அன்புக்குரிய நாட்டு மக்களுக்குப் பல வாக்குறுதிகளைக் கொடுத்திருந்தேன். அதில் நான் விசேடமாகக் குறிப்பிட்ட விடயம் உலகில் எந்தவொரு நாட்டு தலைவருக்கும் இல்லாத அதிகாரங்கள் இலங்கையின் அரச தலைவருக்கு இருப்பதனால் நான் ஆட்சிக்கு வந்தவுடன் அந்த அதிகாரங்களை ஜனாதிபதி பதவியிலிருந்து விலக்கி நாட்டை நாடாளுமன்றத்திடம் ஒப்படைப்பதான வாக்குறுதியாகும். ஆட்சிக்கு வந்த தலைவர் அரசியலமைப்புக்கு அமைய அளவற்ற அதிகாரங்களுடன் ஆட்சியில் இருக்கும்போது, அந்த அதிகாரங்களை மீள ஒப்படைத்த அரச தலைவர் என்ற ரீதியில் எனது நாட்டிற்கும் சர்வதேசத்திற்கும் அதிகாரத்தைக் கைவிடுவது தொடர்பான முன்மாதிரியை நான் வழங்கி யுள்ளேன்" எனக் கூறியிருந்தார்.

நிறைவேற்றதிகார ஜனாதிபதி முறைமையை ஒழிப்பதானது, பெரும்பான்மையில் மட்டும் தங்கியிருக்கும் நாடாளுமன்றத்தின் அதிகாரத்தைச் சமநிலைப்படுத்து வதற்கான பொறிமுறையைச் சிதைக்கும் நடவடிக்கை என்கின்ற கவலையும் கரிசனையும் தமிழ், முஸ்லிம், மலையகச் சமூகங்களுக்குக்கு இருக்கின்றது என்பதை நான் மறக்கவில்லை. "நாட்டின் அதிகார மையங்களைத் தீர்மானிப்பதில் தமிழ், முஸ்லிம், மலையகச் சமூகங்களின் வகிபாகத்தை அல்லது பலத்தை நிலைநாட்டக்கூடிய வாய்ப்பை நிறைவேற்றதிகார ஜனாதிபதி முறைமை தருகின்றது" என்ற கருத்தை அண்மையில் இந்த விவகாரம் பேசுபொருளானபோது பல கட்சிகளைச் சேர்ந்த கௌரவ தலைவர்கள், உறுப்பினர்கள் சுட்டிக்காட்டியிந்தார்கள். எனினும் அவர்களின் கருத்துக்கள்கூட நிறைவேற்று அதிகார முறைமையை முற்றிலும் ஒழிப்பதற்கு எதிரானதாக இருக்கவில்லை. தமிழ், முஸ்லிம், மலையக சமூகங்களின் உரிமைகள் அரசமைப்பினூடாக முழுமையாக உறுதிப்படுத்தப் பட்டு எல்லாச் சமூக மக்களும் இலங்கை நாட்டில் சமத்துவமாக வாழமுடியும் என்ற ஒரு சூழல் ஒன்று ஏற்படுத்தப்படுவதற்கு முன்னர் நிறைவேற்றதிகார ஜனாதிபதி முறைமை ஒழிக்கப்படுவது ஆபத்தானது என்கின்ற கரிசனை காரணமாகவே அவர்கள் இந்த எதிர்ப்பை முன்வைத்திருந் தார்கள். அது முற்றிலும் உண்மையுங்கூட. மூன்றிலிரண்டுக்கு அதிகமான பெரும்பான்மை உறுப்பினர்களைச் சிங்களவர் களாகக் கொண்ட இந்தச் சபையில் தமிழ், முஸ்லிம், மலையகச் சமூகங்களின் உரிமைகள் முறைப்படி உறுதிப்படுத்தப்படாத நிலையில் நிறைவேற்றதிகார முறைமையையும் ஒழித்து விடுவதென்பது கரிசனைக்குரிய விடயம்தான்.

[ගරු ඊ. සරවනපවන් මහතා]

மலையகத்திலிருந்து தமிழர்கள் இந்தியாவுக்குத் திருப்பி அனுப்பப்பட்டமைக்கு நாடாளுமன்றத்தில் சிங்களவர்கள் பெரும்பான்மையாக இருந்ததே முக்கிய காரணம் என்பதை மறந்துவிட முடியாது. அதுபோன்ற ஆபத்துக்கள் பற்றி அந்த மக்கள் சிந்திக்காமல் இருக்கும் அளவுக்கு இந்தச் சபையில் உள்ள கௌரவ உறுப்பினர்கள் புனிதர்களோ, பகுத்தறிவாளர்களோ இல்லை என்பதைக் கடந்த சில வாரங்களில் நிரூபித்திருக்கின்றார்கள். எனவே, நாடாளு மன்றப் பெரும்பான்மை அதிகாரத்தைச் சமநிலைப்படுத்தி தமிழ், முஸ்லிம், மலையக மக்களுக்கு ஓரளவுக்கு பாதுகாப்பு வழங்கக்கூடிய சமநிலைத்தன்மையை நிறைவேற்று ஜனாதிபதி முறைமை கொண்டிருக்கின்றது என்பது உண்மைதான். ஆனால், ஜனாதிபதியாக ஒரு கட்சியைச் சேர்ந்தவர் இருக்கும்போது, நாடாளுமன்றத்தின் கட்டுப்பாட்டை மற்றொரு கட்சியைச் சேர்ந்தவர்கள் வைத்திருக்கும்போதுதான் அத்தகையதொரு சமநிலைத்தன்மை இருக்க முடியும். இரு அதிகாரங்களும் ஒரே கட்சியைச் சேர்ந்தவர்களிடம் இருக்கும்போது, இதே தமிழ், முஸ்லிம், மலையகச் சமூகம் இரு குழல் பீரங்கித்தாக்குதலுக்கு முகங்கொடுக்க வேண்டிய நிலை ஏற்படும் என்பதை மறந்துவிட முடியாது. முன்னாள் ஜனாதிபதி கௌரவ மஹிந்த ராஜபக்ஷவின் ஆட்சிக்காலத்திலே அதுதான் நடந்தது என்பதை மறந்துவிட முடியாது. எப்படிப் பார்த்தாலும் நிறைவேற்று அதிகார ஜனாதிபதி முறைமையினால், நாட்டின் அனைத்துத் தரப்பு மக்களுக்குமே சிக்கல்களும், பிரச்சனைகளும் அதிகமாகவே இருக்கின்றன. எனவே, அதனை நீக்கிவிட்டு மாற்றுவழிகளைச் சிந்திக்க வேண்டியது அவசியம். அதனைப் பொறுமையோடும் புதிய அரசமைப் பொன்றினூடாகவும் செய்வதுதான் புத்திசாலித்தனமும் கூட. அதனைவிடுத்து கடந்த சில மாதங்களாக நடந்த சம்பவங்களின் அடிப்படையில், உணர்ச்சிவசப்பட்டுப் பழிவாங்கும் வகையில் அவை நடந்தேறிவிடக்கூடாது.

கௌரவ குழுக்களின் பிரதித்தவிசாளர் அவர்களே! இவ்வளவு நேரமும் எனக்கு உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்கு நன்றி. இந்த அவையில் நாங்கள் முக்கியமாகக் கருத்தில் எடுக்கவேண்டிய விடயம் 'ஜனாதிபதி முறைமை ஒழிக்கப்பட வேண்டும்' என்பதாகும். ஆனால், இங்கே முன்னர் பேசிய கௌரவ மலையக உறுப்பினர் அவர்கள் ஒரு விடயத்தைக் குறிப்பிட்டிருந்தார். அவர் கூறியது நூற்றுக்கு நூறு வீதம் உண்மை. எனவே, இந்த விடயத்தில் நாங்கள் புத்திசாலித்தனமாக நடக்க வேண்டும்; எங்களுடைய இருப்பைச் சரியான முறையில் நாங்கள் நிலைநாட்ட புதிய அரசியலமைப்பினூடாக எங்களுடைய சகல உரிமைகளையும் பெற்றால்தான் நாங்கள் இந்த நிறைவேற்று ஜனாதிபதி முறையை ஒழிப்பதற்கு எங்களுடைய ஆதரவை வழங்கக்கூடியதாக இருக்கும். இல்லாவிட்டால் எங்களுக்கும் முன்னர் எது நடந்ததோ, சிங்களப் பெரும்பான்மையினர் கூடுதலாக இருக்கும்போது எவ்வாறு மலையக மக்களுடைய வாக்குரிமை பறிக்கப்பட்டதோ அதேமாதிரியான நிலைமை மீண்டும் மீண்டும் தொடரும். ஏனெனில் இன்றும்கூட தொடர்ச்சியாகத் தமிழர்களுடைய அல்லது சிறுபான்மையினருடைய எந்தவிதமான கோரிக்கைகளும் சரியான முறையில் நிறைவேற்றப்படவில்லை. ஒவ்வோர் அரசாங்கமும் ஏதாவது காரணங்களைச் சொல்லி அதைக் கடத்திக்கொண்டே போகின்றது. இவ்வாறு 70 வருஷங்களைக் கடத்திவிட்டார்கள். எனவே நாங்கள் நிதானமாகச் சிந்தித்து செயற்பட வேண்டிய தருணம் இதுவென்று கூறிக் கொண்டு அமைகின்றேன். நன்றி. வணக்கம்.

[අ.භා.5.03]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා වන ක්‍රියාවලිය ගැන මේ ගරු සභාවට ඉදිරිපත් කළ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ගැන වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

'විධායක ජනාධිපති ක්‍රමය' අපේ සමාජය තුළ පසුගිය කාලය පුරාම විශාල වාද විවාදයකට තුඩු දුන්නු මාතෘකාවක්.

මේ පිළිබඳව රට තුළ විශාල විරෝධතාවක් ඇති වී තිබෙනවා. ඒ වාගේම විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන අසීමිත විධායක බලතල එක් පුද්ගලයෙකු අතේ රැඳී තිබීම පිළිබඳව මේ සමාජයේ, නොයෙකුත් සමාජ තරාතිරම්වල උදවියගේ සාකච්ඡාවට බඳුන් වී තිබෙනවා. ඒ නිසා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න ඕනෑය කියන මතයට මේ රටේ බහුතරයක් වූ ජනතාව අද ඇවිල්ලා තිබෙනවා. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ යුතුයි කියන කාරණය 1994 සිට සෑම ජනාධිපති මැතිවරණයකදීම නොයෙකුත් දේශපාලන වේදිකාවල සියලුම දේශපාලන පක්ෂ නායකයන් කථා කළ මාතෘකාවක්. විධායක ජනාධිපති ක්‍රමයත් එක්ක තව දුරටත් ඉදිරියට යනවාද, එහෙම නැත්නම් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරමින් පාර්ලිමේන්තුවට වග කියන්න පුළුවන් ජනාධිපතිවරයෙක් පත් කරනවාද කියන කාරණය, පසුගිය සති කිහිපය තුළ මේ රටේ සිදු වුණු සිදුවීම් එක්ක, ඉස්සරහට ඇවිත් තිබෙනවා. මොකද, විධායක ජනාධිපති විධියට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පසුගිය සති කිහිපය තුළ ක්‍රියා කළ ආකාරය සහ එතුමා කළ ප්‍රකාශත් සමඟ මේ වගේ රටකට, රටේ ප්‍රජාතන්ත්‍රවාදයට සිදු වන හානිය සහ මේ රටේ ඉදිරි ගමන පිළිබඳව අද වන විට අපි සියලුදෙනාම නොයෙකුත් කාරණා කථා කරමිනුයි සිටින්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2015 ජනවාරි 8වැනිදා අප ලැබූ ජයග්‍රහණයත් එක්ක අපි අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්න කථා කළා. අපට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් අවශ්‍ය වන කාරණාව වුණේ, එක පැත්තකින් ප්‍රජාතන්ත්‍රවාදී කර්තව්‍යයක් වෙන්න පුළුවන්. ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ කරමින් තව දුරටත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරමින් ඉදිරියට යන්න අවශ්‍යයි. අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ගැන කථා කරන්න ඊළඟ ප්‍රධානම කාරණාව වුණේ, මේ රටේ පවතින ජනවාර්ගික අර්බුදයයි. උතුර සහ නැඟෙනහිර පවතින ජනවාර්ගික අර්බුදයට දේශපාලන විසඳුමක් ලැබෙන කරුණු කාරණා අපි ඉදිරිපත් කරන අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළට ඇතුළත් කරන්න ඕනෑය කියන මතය ඒ ප්‍රදේශ නියෝජනය කරන සමහර දේශපාලන පක්ෂ ඉදිරිපත් කරන යෝජනාවක් වෙනවා.

අපට තිබෙන ප්‍රධානම ගැටලුව තමයි, රටක් හැටියට මේ ප්‍රශ්න දෙකටම මුහුණ දෙන්න සිදු වීම. එකක් තමයි, මේ රටේ ජාතික ප්‍රශ්නයක්ව තිබෙන ජනවාර්ගික ගැටලුව. නිදහස ලබා ගෙවී ගිය අවුරුදුරු 70 තුළ මේ ජාතික ප්‍රශ්නයට, එම ගැටලුවට ස්ථාවර දේශපාලන විසඳුමක් ඉදිරිපත් කරගන්න බැරුව අපි කාලයෙන් කාලයට ඒ සඳහා පැලැස්තර දමමින් ඇවිල්ලා තිබෙනවා. ඉතිහාසය බැලුවොත් පෙනෙනවා, හැමදාම, හැම ආණ්ඩුවක්ම ඒ සඳහා යෝජනා ගේනවා; විරුද්ධ පක්ෂයේ ඉන්නකොට ඒවාට විරුද්ධ වෙනවා, ඒ විරුද්ධ පක්ෂය නැවත ආණ්ඩුවට ගියාම නැවතත් යෝජනා ගේනවා, එතකොට විරුද්ධ පක්ෂයේ ඉන්න

උදවිය ඒකට විරුද්ධ වෙනවා කියන එක. මේ ගැටලුව පිළිබඳව එවැනි ඉතිහාසයක් තමයි අපට තිබෙන්නේ. එසේ තිබෙන නිසාම තමයි රටක් හැටියට අපි අවුරුදු 30ක ඉතාම භයානක යුද්ධයකට මුහුණ දීලා මේ රටේ මානව සම්පතද අහිමි කරගන්න සිදු වුණේ.

මේ රටේ ධනය, මේ රටේ තිබෙන සම්පත්, ඒ සියලු දේවල් යුද්ධය හරහා විනාශ වෙලා තිබෙනවා. ඒ සිදු වුණු විනාශයෙන් ගොඩ එන්න අපට තව කොයි තරම් අවුරුදු ප්‍රමාණයක් ගතවෙයිද කියන කාරණය තවම කියන්නට බැහැ. මොකද, උතුර සහ නැඟෙනහිර පවතින තත්ත්වය දෙස බැලුවාම යුද්ධය නිසා සිදු වුණු විනාශයෙන් සම්පූර්ණයෙන් ගොඩ එන්නට තවමත් අපට බැරිවෙලා තිබෙනවා. ඒක ප්‍රදේශයේ සංවර්ධනය වෙන්න පුළුවන්, ඒ වාගේම යුද්ධය නිසා සාමාජිකයින් අහිමි වුණු පවුල්වල උදවිය මුහුණ දුන් ඉරණම වෙන්න පුළුවන්, එහෙමත් නැත්නම් අනෙකුත් භෞතික සම්පත් වෙන්න පුළුවන්, ඒ සිදු වුණු හානිය පියවා ගන්න, ආර්ථිකය දියුණු කර ගන්න අපට තව මොන තරම් කාලයක් බලාගෙන ඉන්න වෙයිද කියන ගැටලුව අප ඉදිරියේ තිබෙනවා. ඒ වාගේම තමයි, යුද්ධය නිසා පීඩාවට පත් වුණු දුවා දරුවන් සිටින පවුල් විශාල ප්‍රමාණයක් දකුණේත් ඉන්නවා. හමුදාවට බැඳිලා යුද්ධයට ගිය දූ දරුවන් අහිමි වුණු අම්මලා තාත්තලා ඉන්නවා; ඒ වාගේම ස්වාමි පුරුෂයන් අහිමි වුණු බිරින්දෑවරු ඉන්නවා. ඒ වාගේ පවුල් දහස් ගණනක් දකුණේ ඉන්නවා.

තමන්ගේ පවුල්වල හිටපු උදවිය ඒ යුද්ධයට පූජා කරලා, අද ඒ පවුල් හුඟක් අමාරුවෙන් ගත කරන කාලයක් තිබෙන බව අපි දන්නවා. අපි මේ සියල්ල බලා තමයි මේ රටට අලුත් ව්‍යවස්ථාවක් අවශ්‍ය බව ප්‍රකාශ කළේ. මොකද, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන ගමන් මේ රටේ ජනවාර්ගික ගැටලුවට, තිබෙන ව්‍යවස්ථාව තුළ අපට යම් විසඳුමක් හොයා ගන්න පුළුවන්ද බැරිද කියන ප්‍රශ්නය තිබෙනවා. අපි රජයක් හැටියට පත් වුණාට පස්සේ ඒ ගැන සාකච්ඡා කළා. අපි මේ පාර්ලිමේන්තුව ව්‍යවස්ථාපිත මණ්ඩලයකට පරිවර්තනය කරලා හැම පක්ෂයක්ම නියෝජනය වන ආකාරයේ මණ්ඩලයක් පත් කරගෙන, කෙටුම්පතක් හදාගෙන ඉස්සරහට ඇවිල්ලා තිබෙනවා. ඒක අපි ඉස්සරහට ගෙනියනවාද, එහෙම නැත්නම් ඒක ආපස්සට කරකවාගෙන ගිහිල්ලා අර ඉතිහාසයේ වුණා වාගේ නැවත ඒකත් කුණු බක්කියට දානවාද කියන එක තමයි තීරණය කරන්න ඕනෑ.

අපට මතකයි, මේ ලෝකයේ මේ වාගේ ගැටුම් තිබෙන රටවල් -විශේෂයෙන්ම දකුණු අප්‍රිකාව වාගේ රටවල්- තිබුණු බව. අපි දැක්කා, දකුණු අප්‍රිකාව විශේෂයෙන්ම සුදු කළු භේදය හරහා විශාල විනාශයක් වෙච්ච රටක් බව. ව්‍යවස්ථා පිළිබඳ විශේෂඥයන් කියන ආකාරයට ලෝකයේ තිබෙන හොඳම ව්‍යවස්ථාව තිබෙන්නේ දකුණු අප්‍රිකාවේ කියන මට්ටමට අද දකුණු අප්‍රිකාවට එන්න පුළුවන් වෙලා තිබෙනවා. සුදු කළු භේදය අවම කරගෙන සුද්දන්ට කල්ලන්ට එකට ජීවත් වෙන්න පුළුවන් රටක් ගොඩනගාගත් තත්ත්වයකට අද දකුණු අප්‍රිකාව ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම තමයි මැලේසියාව. මැලේසියාව ජාතීන් කිහිපයක් ජීවත් වෙන රටක්. ඒ වාගේමයි සිංගප්පූරුව. ඒ වාගේමයි ඉන්දියාව. අද ඔවුන් සියලු දෙනාටම පුළුවන් වෙලා තිබෙනවා, තමන්ගේ රටට නිදහස ලැබෙනකොට තමන්ගේ රටේ තිබුණු මූලික ජාතික ගැටලුව විසඳාගෙන ඉදිරියට යන්න. සියලු ජන කොටස්වලට එක හා සමානව සලකන්න පුළුවන් ව්‍යවස්ථාවක් හඳුන්වා දීලා, ඒ ප්‍රශ්නය විසඳාගෙන ඉස්සරහට යන්න පුළුවන් තත්ත්වයක් ඒ රටවල ඇති කරගෙන ඒ රටවල් මේ ලෝකයේ දියුණු රටවල් බවට අද පරිවර්තනය වෙලා තිබෙනවා. නමුත් අපට ඒ තත්ත්වයට යන්න බැරිවෙලා තිබෙනවා. අපි අවුරුදු 70ක් තිස්සේ කථා කරන්නේ එකම දේ. අපි ශ්‍රී ලාංකික ජාතිය හදන්නේ කොහොමද, අපි මේ ජාතික ගැටලුව විසඳන්නේ කොහොමද, අපි මේ බලය බෙදා ගන්නේ කොහොමද, සියලු දෙනාටම සමානව සලකන්න පුළුවන් ව්‍යවස්ථාවක් හදන්නේ කොහොමද කියන එක, මේ පාර්ලිමේන්තුවේ ඉතිහාසය අරගෙන බැලුවොත් 1947 ඉඳන් හැම එක්කෙනාම කථා කරලා තිබෙනවා. අපි අපේ කාලයෙත් මේ ප්‍රශ්නය ගැන කථා කරනවා. පාර්ලිමේන්තුවේ හිටපු අපට වඩා හොඳ බුද්ධිමත්, උගත් මන්ත්‍රීවරුත් මේ ගැන කථා කළා; වාද විවාද කළා. අවාසනාවකට අපි කාටවත් විසඳුමක් හොයා ගන්න බැරි වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහිදී මේ රටට වෙච්ච අවාසනාවන්තම දේ හැටියට මම දැක්ක දේ තමයි, අපට ඉන්න නායකයන් හුඟක් දුරට හැඟීම්වලට කථා කරන නායකයන් වීම. මේ ප්‍රශ්නවලට උත්තර හොයා ගන්න පුළුවන් නායකයන් අපට හමු වෙලා නැහැ. අපට හැමදාම හමු වුණේ ජනතාවගේ හැඟීම්වලට කථා කරලා, ඡන්ද ටික ගන්නේ කොහොමද කියා හිතන නායකයන් තමයි. ඉතිහාසය පුරාම අපට ඇවිල්ලා තිබෙන්නේ එවැනි අයයි. එහෙම නැතුව මේ ප්‍රශ්නය විසඳන්න ඕනෑ, මේ ප්‍රශ්නයට විසඳුමක් හොයා ගන්නේ කොහොමද, මේ ප්‍රශ්නය විසඳුවාම තමයි අපට රටක් හැටියට ඉස්සරහට යන්න පුළුවන් වෙන්නේ කියන ඒ කාරණා වෙනුවෙන් කථා කරලා ඒකට හරියාකාර උත්තරයක් හොයා ගන්න පුළුවන් නායකයන් දශක ගණනාවක් තුළ අපට බිහිවෙලා තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. මොකද, මම පෞද්ගලිකව ඒ අදහසේ ඉන්නේ. මම විශ්වාස කරනවා, මේක අපට විසඳාගන්න පුළුවන් ප්‍රශ්නයක් කියලා. ඒකයි මම කියන්නේ. ඒක බැරි දෙයක් නොවෙයි. දකුණු අප්‍රිකාවේ සුදු මිනිසුන්ට සහ කළු මිනිසුන්ට එකට ඉන්න පුළුවන් නම්, ඒ දෙගොල්ලන්ට එකට ඉන්න පුළුවන් ව්‍යවස්ථාවක් හදා ගන්න පුළුවන් නම්, ඊට වඩා අවුරුදු දහස් ගණනක ඉතිහාසයක් තිබෙන, සංස්කෘතික සම්බන්ධකම් තිබෙන, නොයෙකුත් ආකාරයේ සම්බන්ධකම් තිබෙන, නොයෙකුත් ශිෂ්ටාචාරයන් එක්ක ඇවිල්ලා එකට ජීවත් වෙච්ච අපට ඇයි මේකට විසඳුම සොයා ගන්න බැරි කියන ප්‍රශ්නය තමයි මට තිබෙන්නේ. විසඳුමක් සොයා ගන්න බැරිකමක් නොවෙයි, සොයා ගන්න වුවමනාකමක් නැහැ; සොයා ගන්න ඕනෑකමක් නැහැ; සොයා ගන්න කැමැති නැහැ; එකට ඉන්නවාට අකමැතියි. එහෙම පිරිසක් මේ රටේ ඉන්නවා. එවැනි අය උතුරේත් ඉන්නවා; දකුණේත් ඉන්නවා. ඔවුන් මේක තමන්ගේ දේශපාලන ප්‍රශ්නයක් කරගෙන, ඔවුන්ට බලය ලබාගැනීම සඳහා මේ කාරණය පාවිච්චි කරනවා. ඒ කනගාටුදායක තත්ත්වය උඩ ඒකට වන්දි ගෙවන්නේ මේ රටේ මිනිසුන්; මේ රටේ පහළ සාමාන්‍ය ජනතාව.

ඒකට වන්දි ගෙවන්නේ තමුන්නාන්සේලාගේ, අපේ දූවා දරුවන්. ඒ නිසා මම බලාපොරොත්තු වෙන්නේ මගේ දරුවන්ට ජීවත් වෙන්න මීට වඩා හොඳ රටක් තිබෙන්න ඕනෑය කියලායි. මීට වඩා හොඳ තත්ත්වයක් තිබෙන්න ඕනෑ, මගේ දරුවන්ට ජීවත් වෙන්න. මීට වඩා ජාතික සමඟිය, සංහිඳියාව තිබෙන, සියලු දෙනාටම එකට ජීවත් වෙන්න පුළුවන්, සමානව සලකන්න පුළුවන් ව්‍යවස්ථාවක් හදා ගන්න ඕනෑය කියලා තමයි මම විශ්වාස කරන්නේ. මොකද, මම ලැහැස්ති නැහැ, මේ තත්ත්වයම මගේ දරුවන්ට තබා යන්න. ඒකට තමයි මම දේශපාලනය කරන්නේ. ඒ වෙනුවෙන් තමයි මම දේශපාලනයට ඇවිල්ලාත් තිබෙන්නේ. නමුත් අපි එහෙම කල්පනා කළාට, හැම එක්කෙනාම එහෙම කල්පනා කරන්නේ නැහැ කියලා මා හිතනවා. හැමෝම එහෙම හිතන්නේ නැහැ; එහෙම වැඩ කරන්නේ නැහැ. ඒ නිසා අද මේ දේශපාලනික බලය ලබා ගැනීමේ බලලෝභීත්වය උඩ අප සියලු දෙනාම විනාශය කරා ගමන් කරනවා. ඒක තමයි යථාර්ථය. මොකද, අපට ඒක පෙනෙනවා. අපි මේ පැත්තෙන් සියලු දෙනාටම පිළිගන්න පුළුවන් ව්‍යවස්ථාවක් හදාගෙන ඉස්සරහට ගෙනෙනකොට, ඒකට නොයෙක් චෝදනා නඟනවා.

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

මැතකදී නඟපු චෝදනාව මොකක්ද? අගමැතිතුමාට විශ්වාසය පළ කරලා TNA සංවිධානය අපට සහයෝගය දුන්නාම, ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් අපට කිව්වා, අපි කොටි එක්ක එකතු වෙලා ඉන්නවා කියලා. නමුත් අපි දැක්කා, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා හිර ගෙදරට ගිහිල්ලා එල්ටීටීඊ සිරකරුවන් එක්ක සාකච්ඡා කරලා තමන්ට TNA එකේ සහයෝගය ගන්න උත්සාහ කළ ආකාරය. නමුත් ඒක කරගන්න බැරි වුණා. ඒ වුණත් අපි දැක්කා, TNA සංවිධානයේ වියාලේන්දිරන් මන්ත්‍රීතුමාව ඒ අයගේ පැත්තට ගත්ත හැටි. ඒවා ගැන කථා නැහැ. තමන්ට වාසි වෙනකොට කොටිත් නැහැ; සිංහයෝත් නැහැ; පූසොත් නැහැ. එහෙම තමයි ඒවා සිද්ධ වෙන්නේ. අද මේ බෙදීම් දේශපාලනය උඩ, තමන්ගේ බලය සඳහා තමන්ට අවශ්‍ය දේ සඳහා කෙටි මාර්ගවලින් බලය ලබා ගැනීම සඳහා ජාතිවාදය, ආගම්වාදය ඇවිස්සීම උඩ, ඉතා විශාල අර්බුදයකට මේ රට නැවත පත් වෙනවා. ඒ නිසා මම විශ්වාස කරන්නේ, අපි 2015 ජනවාරි 08වැනි දා ලබාගත් ඒ ජයග්‍රහණය මත සිටිමින් මේ තත්ත්වයට ඉදිරියේදී මුහුණ දෙන්න ඕනෑය කියන එකයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මම අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. විධායක ජනාධිපති ක්‍රමය ගැන කථා කරනකොට, විශේෂයෙන්ම ඒ ජනාධිපති ක්‍රමය මත හිඳිමින් ජනාධිපතිතුමන්ලා ක්‍රියාත්මක වුණු ආකාරය, මෑත ඉතිහාසයේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ක්‍රියාත්මක වුණු ආකාරය අපි දැක්කා. ඒ තුළින් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය විතරක් නොවෙයි, මේ රටේ ඉදිරි ගමන, ඉදිරි පැවැත්ම කොයි තරම් අවදානමකට ලක් වුණාද කියන එකත් අපි දැක්කා. ඒ නිසා විධායක ජනාධිපති ක්‍රමය මේ රට තුළ තවදුරටත් තිබිය යුතුද, නැද්ද කියන එක පසුගිය මාසය තුළ ජනාධිපතිතුමා ක්‍රියාත්මක වුණු ආකාරය දිහා බැලුවාම අපට පැහැදිලි වුණා. අද වෙනකොට අපිට මේකට හොඳ නිදසුන් ලැබී තිබෙනවා; උදාහරණ තිබෙනවා. ඒ නිසා අපි අවසානයකට යන්න ඕනෑ. අපි අලුත් ව්‍යවස්ථාවක් හදන්න ඕනෑ. ඒ අලුත් ව්‍යවස්ථාව තුළ සියලු දෙනාටම එක හා සමානව සලකන්න පුළුවන් ආකාරයට බලය විමධ්‍යගත කරලා, ඒකීය රටක් යටතේ ඒ සියලු දේවල් අඩංගු කරලා, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරමින් ඉදිරියට යන්න පුළුවන් අලුත් රටක් අපි ගොඩනඟන්න ඕනෑ; අලුත් ගමනක් යන්න ඕනෑ. ලෝකයත් එක්ක -අලුත් පැතුම්, අලුත් සිතුවිලි, අලුත් අදහස් එක්ක- එකට යන්න පුළුවන් ගමනක් යන්න නම්, අනිවාර්යයෙන්ම අපි අලුත් ව්‍යවස්ථාවක් හදාගෙන ඉදිරියට යා යුතුයි. මම හිතන විධියට එහි ආරම්භය අපි 2015දී ලබා ගත්තා. ඒ නිසා ඒ ගමන නොනවත්වා, ජාතිවාදය, ආගම්වාදය ඉදිරියේ පසු බසින්නේ නැතුව, මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් සියලු දෙනාටම එකට ජීවත් වෙන්න පුළුවන් ආකාරයේ අලුත් ව්‍යවස්ථාවකට අපි යා යුතුයි කියන එකයි මගේ අදහස. බොහොම ස්තුතියි.

[අ.භා.5.17]

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අලුත් ව්‍යවස්ථාව හදා ගන්න ජනතා විමුක්ති පෙරමුණේ ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා ඊයේ දිනයේදී ඉදිරිපත් කරපු සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධව මට කථා කරන්න ලැබීම ගැන මා සතුටු වෙනවා. ඒකට හේතුවක් තිබෙනවා. අපේ ලංකාවට 1948දී නිදහස ලැබුණා. එතැනින් පසුව ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා 1978 ව්‍යවස්ථාව මඟින් විධායක ජනාධිපති ක්‍රමය හැදුවා. එතැන් සිට අවුරුදු 40ක කාලයක් තුළ ජනාධිපතිවරුන් හය දෙනෙකු මේ රට පාලනය කළ බව ලංකාවේ දැනට ඉන්නා සියලු දෙනාම දන්නවා. මා දන්නා තරමට විතරක් නොවෙයි, මුළු ලෝකයම දන්නා තරමට පසුගිය දවස් 51ක කාලය තුළදී මේ ලංකාවට වෙච්ච නාස්තියෙයි, විනාශයෙයි ප්‍රමාණය, දෙකෝටි විසිලක්ෂයක් පමණ වන ජනතාවගේ බදුවලට බරක් වෙලා තිබෙනවා.

බිලියන දහස් ගණනක් නැත්තටම නැති කරලා ඉවරයි. අපේ 225දෙනාත් එක්ක ජනාධිපතිතුමාත් එකතු වුණාම, ඒ පාලකයෝ 226දෙනා තමයි ලංකාවට මෙවැනි බරක් හදලා දුන්නේ. බිලියන දහස් ගණනක් නැත්තටම නැති කරලා තමයි අද මේ ලංකාව තිබෙන්නේ. ඒ නිසා ලංකාව ආර්ථික වශයෙන් විනාශයි; සමාජ වශයෙන් විනාශයි; සාමයත් විනාශයි.

අද අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගැන කථා කරනවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය එදා සම්මත කරගන්න පුළුවන් වුණු නිසා අපේ උසාවිය ලෝකයටම හොඳ තීන්දුවක් දුන්නා. අපි හැම එක්කෙනාටම සමාන විධියට ඒ උත්තරය ලබා දුන්නා. ඒ වාගේම, ජනාධිපතිතුමාගේ බලතල දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් අඩු කරපු එක ඔප්පු කරලාම පෙන්නුවා. හැබැයි, එහෙම විතරක් මදි. අපි ශක්තිමත් උසාවියක් ඇති කරන්න ඕනෑ. අපි පාකිස්තානය කියන රට ගැන කල්පනා කරමු. මෙතැනින් පස්සේ විධායක ජනාධිපති ක්‍රමය අපි අයින් කරන්න ඕනෑ. මෙතැනින් පස්සේ අපි පාර්ලිමේන්තුවට ශක්තිමත් අග්‍රාමාත්‍ය කෙනෙක් පත් කරනවා. උදාහරණයකට මම පාකිස්තානයේ අගමැතිතුමා ගැන කියන්නම්. නවාස් ෂරීෆ් මහතා අගමැති ධුරයේ සිටියදී තමයි කනෙන් අල්ලලා ජම්පර් එක අන්දලා හිර ගෙදර දැම්මේ. ඒ වාගේම, අපේ රටේත් ඉදිරියේදී එන ඕනෑම අගමැති කෙනෙක් වෙන්න පුළුවන්, වැරැදි වැඩ කරනවා නම් දඬුවම් දෙන්න ඕනෑ. දැන් අපට ලජ්ජයි. මන්ත්‍රීවරු 225දෙනාටම මිනිස්සු බණිනවා. එක්කෝ, හොරෙක් කියනවා. එහෙම නැත්නම්, මිනීමරුවෙක් කියනවා. එහෙම නැත්නම්, පාතාලයත් එක්ක සම්බන්ධයි කියනවා. එහෙමත් නැත්නම්, මිරිස් කුඩු කාරයොත් එක්ක සම්බන්ධයි කියනවා. මේ වාගේ ජරා ඉතිහාසයක් තමයි මේ 225දෙනා ගැන තිබෙන්නේ.

ජනතා විමුක්ති පෙරමුණේ අපේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා දැන් මෙතැන නැහැ. පට්ටපල් හොරු ටික පළමුවෙන්ම කුඩු කරන්න පුළුවන් විධියට ව්‍යවස්ථාව හැදුවොත් අපි පක්ෂව අත උස්සනවා කියලා ඔබතුමාට කියන්නම්. ඒකට උසාවිය ශක්තිමත් කරන්න ඕනෑ. පාකිස්තානයේ වාගේ අපේ උසාවියත් ශක්තිමත් කරන්න ඕනෑ. බලයේ සිටියදී තමයි නවාස් ෂරීෆ් අග්‍රාමාත්‍යතුමාගේ කනෙන් අල්ලලා ජම්පර් අන්දලා තිබෙන්නේ. අග්‍රාමාත්‍යතුමා වෙන්න පුළුවන්, ආණ්ඩුවේ ඉන්න මැති ඇමතිවරු වෙන්න පුළුවන්, දඬුවම් දෙන්න පුළුවන් වෙන්න ඕනෑ. මෙතැනින් පස්සේ අපේ උසාවියත් ඒ වාගේ ශක්තිමත් කරන්න ඕනෑ විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හදන්න ඕනෑ. හැබැයි, දැන් අපේ රටේ එහෙම නැහැ. අපේ රටේ හොරකම් කරපු හොරුන්ට දඬුවම් දෙන්නේ ආණ්ඩුව ඉවර වුණාට පස්සේ. ආණ්ඩුව ඉවර වෙලා විපක්ෂයට ගියාට පස්සේ, ඊළඟට එන ආණ්ඩුව තමයි ඔවුන් පස්සේ එළවන්නේ. එහෙම එළවනකොට මොනවාද කරන්නේ? ඒ අය නැවත ආණ්ඩු පක්ෂයට එනවා. ඔවුන් ආණ්ඩු පක්ෂයට ඇවිල්ලා වාඩි වෙනවා. අනේ! ඊට පස්සේ හොරු අල්ලන්න බැහැ. ඇයි, හොරු අල්ලන්න බැරි? උදාහරණයකට අපි

දැන් යහ පාලන ආණ්ඩුව ගනිමු. ඉදිරියේදී මේ ආණ්ඩුව වෙනස් වුණොත් මේ අයියලා මොනවාද කරන්නේ? ඊළඟ පාර්ලිමේන්තු මැතිවරණයේදී ඡන්දය ඉල්ලලා දිනලා පාර්ලිමේන්තුවට එනවා. දිනන්න බැරි නම්, පරණ ජොෂ්ඨයෝ කියලා බෝනස් එකෙන් පාර්ලිමේන්තුවට එනවා. ඒ අය මොනවාද කරන්නේ? අනිත් පැත්තට ගිහිල්ලා වාඩි වෙනවා. එහෙම වාඩි වුණාට පස්සේ නිකම්ම නිදහස් වෙනවා. ඒ වාගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හදනවා නම් වැඩක් නැහැ. එහෙම ව්‍යවස්ථාවකට වඩා තිබෙන ව්‍යවස්ථාව හොඳයි. පට්ටපල් හොරු ටික ගාල් කරන්න, ජම්පර් අන්දන්න පුළුවන් හොඳ ශක්තිමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හදන්න.

අපට හරිම ලජ්ජයි. අපට ගමේ යන්න බැහැ. අපි ගමේ ඇවිදින කොට, "අන්න, මිරිස් කුඩු මාමා එනවා" කියනවා. "අන්න, පොලිස්කාරයන්ගේ කනට පහර දීපු මාමා එනවා" කියනවා. ඒ දවස්වල අපි ගම්වලට ගියා. "අන්න, මිරිස් කුඩු මාමා එනවා" කියනවා. "අන්න, පොලීසියට ගහපු මාමා එනවා" කියනවා. ඔන්න අපට අත්වෙලා තිබෙන ඉරණම. ඒවා අපි වෙනස් කරන්න ඕනෑ.

ලංකාවේ ඉන්න කෝටි දෙකයි විසිලක්ෂයක් වන ආදරණීය ජනතාවනි, එදා 1948දී ඩී.එස්. සේනානායක මහත්තයා, අරුණාචලම් පොන්නම්බලම් මහත්තයා, සර් රාසික් ෆරීඩ් මහත්මයා වාගේ හැම ජාතියකටම අයිති අය එකතු වෙලා තමයි ලංකාවට නිදහස ගත්තේ. ඒ විධියට නිදහස ගත්ත රටේ ඇයි අපට එකට ඉන්න බැරි? ජාතිවාදී, ආගම්වාදී, අන්තවාදී විධියට තමන්ට බලය ගන්න මොනවා හරි වැඩ පිළිවෙළක් යොදවනවා. එහෙම කරලා ලංකාවේ ආර්ථිකය විනාශ කරනවා. ඒ ගැන අපි ලජ්ජා වෙන්න ඕනෑ. අපේ රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යතුමා හැම දාම කියනවා, ලංකාව සිංගප්පූරුව විධියට හදන්න ඕනෑ කියලා. අද ලෝකයේ තිබෙන දියුණු රටවල් තමයි, මැලේසියාව; දකුණු අප්‍රිකාව. ඒ වාගේ රටක් හදන්න නම් මෙතැන ඉඳලා හරි අපට තිබෙන්නේ පොඩි කාලයක්. ඔබතුමා හරියට වැඩ කරන්න ඕනෑ. වැඩ කරන්න පුළුවන් ඇමති මණ්ඩලයක් පත් කරන්න. එහෙම නැති වුණොත් ගරු අග්‍රාමාත්‍යතුමනි, සිංගප්පූරුව නොවෙයි, ලංකාවත් ඉතියෝපියාව, සෝමාලියාව, ටැන්සානියාව වාගේ රටක් වෙනවාය කියන එක අපි කාටවත් නැහැ කියන්න බැහැ.

අපි 225දෙනා පාර්ලිමේන්තුවට ආවේ අපේ බඩ පුරවා ගන්නද? කෝටි, ප්‍රකෝටි ගණනක් හම්බ කරන්නද? නැහැ. අපි හැම එක්කෙනාටම මුදල් ඕනෑ. නමුත් අපි ආවේ මහජනතාව වෙනුවෙන්, මහජනතාවට වැඩ කරන්න. මාත් පාර්ලිමේන්තුවට එන්න කලින් ව්‍යාපාරිකයෙක්. මම පාර්ලිමේන්තුවට ආවාට පස්සේ සම්පූර්ණයෙන්ම මගේ ව්‍යාපාරවලින් අයින් වෙලා, මහජනතාවට වැඩ කරන්න මගේ කාලය වෙන් කරලා තිබෙනවා. මම පඩි ගන්නේ නැතුව අවුරුදු තුනයි, මාස තුනක් වැඩ කරලා තිබෙනවා. ඒ ගැන මම සතුටු වෙනවා. මීටත් එහා දෙයක් කරන්න මම බලාපොරොත්තු වෙනවා. මගේ ආදරණීය අනුරාධපුර දිස්ත්‍රික් ජනතාවට එදා ඡන්දය වෙලාවේ දීපු පොරොන්දුව බොහොම පැහැදිලිව මා ආරක්ෂා කරනවා. මන්ත්‍රී ධූරය මුදල්වලට පාවාදීලා දීපු යුගයක් තිබුණා. තනතුරුවලට පාවලා දීපු යුගයක් තිබුණා. හැබැයි, මට ඡන්දය දුන්නු මගේ ආදරණීය අනුරාධපුර දිස්ත්‍රික් ජනතාව මුදල්වලට පාවලා දෙන්න බැහැ; තනතුරුවලට පාවලා දෙන්නේත් නැහැ. ඒ දේවල් මගෙන් වෙන්නේ නැහැ කියලා මම කියනවා.

මගේ ආදරණීය රටේ ඉන්න කෝටි දෙකයි විසිලක්ෂයක් වන ජනතාවට මම කියනවා, තමුන්නාන්සේලා පත් කරලා එවන පාලකයන් පිළිබඳව කල්පනා කරලා බලන්න කියලා. ඒ අය පාර්ලිමේන්තුවට යන්නේ හොරකම් කරලා, අල්ලස් අරගෙන, කොමිස් අරගෙන, මිනීමරුවන් වෙලා ඒ අය හැදෙන්නද, එහෙම නැත්නම් තමුන්නාන්සේලා හීන දකින සිංගප්පූරුවක්, තමුන්නාන්සේලා බලාගෙන ඉන්න මැලේසියාවක්, තමුන්නාන්සේලා බලාගෙන ඉන්න ජපන් රටක් ඇති කරන්නද කියලා බලන්න. ඒ සඳහා පක්ෂ වැඩක් නැහැ; පාට වැඩක් නැහැ. කුලමල භේදයක් නැතුව රට ගැන හිතන්න පුළුවන්, රටේ ජනතාව ගැන හිතන්න පුළුවන්, මහ පොළොවේ පයින් යන්න පුළුවන්, ගමේ ජනතාවගේ දුක, ජනතාවගේ සැප, ජනතාවගේ ප්‍රශ්නවලදී ඒ ජනතාවත් එක්ක ඉන්න පුළුවන් මහජන නියෝජිතයෙක් පත් කරන්න. එහෙම නැති වුණොත් ලංකාවේ ඉන්න කෝටි දෙකයි විසිලක්ෂයක් වන ජනතාවනි, ඔබලාට හැම දාම හම්බ වෙන්නේ සමෘද්ධි කූපන් එක විතරයි. එහෙමත් නැත්නම් ඡන්ද කාලයට පොඩි දෙයක් හම්බ වෙයි. එතැනින් පස්සේ ඔබලා අමතක කරයි.තමුන්නාන්සේලා ඒක තේරුම් ගන්න ඕනෑ. ලංකාවේ ඉන්න ආදරණීය ජනතාවනි, ඔබලා වෙනුවෙන් ඔබලා ගැන කථා කරන්න පුළුවන්, ඔබලා ගැන හිතන්න පුළුවන් පාලකයෝ පත් කරන්න. එහෙම නැත්නම් ඔබලාගේ ලංකාව තව අවුරුදු කීපයක් ඇතුළේ ලෝකයේ දියුණු වෙච්ච රටක් විධියට පත් කරන්න අපට බැහැ. මේ ලංකාවට මොනවාද අඩු - පාඩු තිබෙන්නේ? ලංකාව ලෝකයේ හොඳම සම්පත් තිබෙන රටක්. පිට රටකට ගිහිල්ලා බලන්න. ලංකාව වාගේ සම්පත් ඇති රටක් ලෝකයේ නැහැ. හැබැයි, ආපු පාලකයන්ගේ ගැහිලි නිසා මේ ලංකාව විනාශ වෙලා ඉවරයි. මම ආණ්ඩු පක්ෂයේ ඉඳලාත් කථා කරනවා. විපක්ෂයේ ඉඳලාත් කථා කරනවා. මගේ කථාව එදත් ඒ විධියමයි; අදත් ඒ විධියමයි. මෙතැනින් එහාටත් මම කථා කරනවා. විපක්ෂයේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

-ඉන්නවා කියලා තමයි අපි කිව්වේ.

හැබැයි ඒ අය අපටත් ඇඟිල්ල දිගු කරනවා, "උඹලාගේ පක්ෂයේත් එවැනි අය ඉන්නවා" කියලා. අපේ වුණත් ඔවුන්ගේ වුණත් කමක් නැහැ, වැරදි කරපු දෙගොල්ලන්ටම ජම්පර් අන්දවන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ඒ අයට ජම්පර් අන්දවලා, හිර ගෙදරට දාලා ඉදිරියේදී හොඳ සුන්දර රටක් විධියට ලංකාව ඉදිරියට ගෙන යන්න ඕනෑ, හොඳ ලංකාවක් ඇති කරන්න ඕනෑ කියලා මම කියනවා. මට කාලය දීපු අපේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාට ස්තුතියි.

[පි.ව. 5.29]

**ගරු සෙය්යිඩ් අලි සාහිර් මවුලානා මහතා**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா)
(The Hon. Seyed Ali Zahir Moulana)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நிறைவேற்று அதிகாரங்கொண்ட ஜனாதிபதி முறைமையை ஒழிக்கும் பொருட்டு மக்கள் விடுதலை முன்னணியினர் நேற்று பாராளுமன்றத்தில் முன்வைத்துள்ள ஒத்திவைப்புவேளைப்

[ගරු සෙයියිඩ් අලි සාහිර් මවුලානා මහතා]

பிரேரணை தொடர்பில் இன்று எனது கருத்துக்களையும் இந்தச் சபையிலே சொல்வதற்கு நேரம் தந்தமைக்கு எனது நன்றியினைத் தெரிவித்துக்கொள்கின்றேன்.

1947ஆம் ஆண்டின் சோல்பரி அரசியலமைப்பு எமது நாட்டின் முத்துறைகளுக்கிடையிலான தடையும் சமநிலையும், நீதித்துறைச் சுதந்திரம், சிறுபான்மையினக் காப்பீடுகள் மற்றும் உரிமைகள் போன்ற விடயத்தில் இலங்கையை உதாரணமாக்கும் ஓர் அரசியலமைப்பாகப் பார்க்கப்பட்டது. 1972ஆம் ஆண்டு முதலாம் குடியரசு அரசியலமைப்பு என்று சொல்லப்படுகின்ற, அதாவது ஸ்ரீலங்கா சுதந்திரக்கட்சி ஆட்சிக் காலத்திலே இடதுசாரிக் கட்சிகளினால் உருவாக்கப்பட்ட அந்த அரசியலமைப்பு, பிரித்தானிய சாயலை மீறிச்சென்று உருவாக்கப்பட வேண்டும் என்று எதிர்பார்க்கப்பட்டாலும் பாராளுமன்ற மீயுயர் தன்மை எனும் கோட்பாட்டில், ஜனநாயகத்தினையும் அடிப்படை உரிமைகளையும் சமநிலையையும் கேள்விக்குறியாக்கியது. இத்தகைய காரணங்களினாலேயே அந்த அரசியல் அமைப்பு 6 ஆண்டுகளே நடைமுறையிலிருந்தது.

தற்போது நடைமுறையிலுள்ள 1978ஆம் ஆண்டு அரசியலமைப்பு 19 திருத்தங்கள் மற்றும் அதிகமான சிக்கல்கள், பிரச்சினைகள், நெருக்கடிகள் கொண்ட ஓர் அரசியல் அமைப்பாகக் காணப்படுகின்றது. இது பாராளுமன்றத்தில் 5/6 பெரும்பான்மையைப் பெற்ற ஜே.ஆர். ஜயவர்தன தலைமையிலான ஐக்கிய தேசியக் கட்சி அரசினால் உருவாக்கப்பட்டது. இது இலங்கையில் காணப்பட்ட பல அரசியல் சீர்திருத்தங்கள், அரசியல் அமைப்புக்களின் விடயங்கள், சர்வதேச சமவாயங்கள் என்பவற்றின்மீது அவதானம் செலுத்தி, ஐக்கிய அமெரிக்கா, பிரான்ஸ், ஐக்கிய இராச்சிய அரசியல் முறைமை மற்றும் அரசியல் அமைப்புக்களை மையமாகக்கொண்டு வரையப்பட்ட ஓர் அரசியலமைப்பாகும். நிறைவேற்று அதிகாரம் கொண்ட ஜனாதிபதிகளுள், பிரான்ஸ் மற்றும் ஐக்கிய அமெரிக்க ஜனாதிபதிகளைவிட அதிகமான அதிகாரம் கொண்ட ஜனாதிபதிகளாக இலங்கை ஜனாதிபதிகள் காணப்பட்டார்கள். இருந்தாலும் அந்த அதிகாரங்கள் சில 17ஆம் சீர்திருத்தத்தின்கீழ் மட்டுப்படுத்தப்பட்டது. பின்னர் 18ஆம் சீர்திருத்தம் மீண்டும் மட்டற்ற அதிகாரத்தினை அபரிமிதமாக வழங்கியிருந்தமையை இங்கு நான் குறிப்பிட்டேயாக வேண்டும்.

1978ஆம் ஆண்டு ஐக்கிய தேசியக் கட்சி அரசாங்கத்தால் கொண்டுவரப்பட்ட அரசியலமைப்பு ஜனாதிபதியும் பாராளுமன்றமும் ஒரே கட்சியில் உள்ளோரால் ஆளப்படும் அவ்வாறான ஒரு சூழலை மையப்படுத்தி வரையப்பட்டு அதன்படியே 1978 இலிருந்து 1994 வரை ஆளப்பட்டு வந்தாலும், அதன் பின்னர் குறிப்பாக 2001 - 2004 வரையான காலப்பகுதியில் பொதுஜன முன்னணியின் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியைச் சேர்ந்த சந்திரிகா பண்டாரநாயக்க குமாரதுங்க அம்மையார் ஜனாதிபதியாகவும் எமது ரணில் விக்கிரமசிங்க அவர்கள் தலைமையிலான ஐக்கிய தேசியக் கட்சி பாராளுமன்றப் பெரும்பான்மையுடன் காணப்பட்டதால் அவர் பிரதமராகவும் இருந்து, இரு தரப்பும் ஓர் அமைச்சரவையைக் கட்டுப்படுத்தும் அதிகாரத்தினைக் கொண்டிருந்தனர். 2000ஆம் ஆண்டு காலத்தில் இலங்கையின் இனப்பிரச்சினைத் தீர்வு தொடர்பாக இரு தலைவர்களும் இணக்கப்பாட்டுடன் இயங்கினர். பின்னர் ஐக்கிய தேசியக் கட்சி அப்போதைய ஜனாதிபதி சந்திரிகா பண்டாரநாயக்கவுக்கு எதிராக நம்பிக்கையில்லாப் பிரரேரணை ஒன்றினை சபாநாயகர் அநுர பண்டாரநாயக்க அவர்களிடம் கையளித்திருந்தது. அது தொடர்பான தகவல் ஜனாதிபதிக்குத் தெரியப்படுத்தப்பட்டதன் விளைவாக, அதன்படி ஜனாதிபதி பதவி விலக வேண்டி வரும் எனப் பயந்து, பாராளுமன்றம் உடனடியாகக் கலைக்கப்பட்டது. அதேபோன்று ஜனாதிபதி ஒரு கட்சியைச் சேர்ந்தவராகவும் பாராளுமன்றத்தில் பெரும்பான்மை கொண்ட வேறு கட்சியின் தலைவர் பிரதமராகவும் செயல்படும் நிலை 2015 முதல் இன்றுவரை காணப்படுகின்றது. இதில் முக்கிய விடயம் என்னவென்றால், இது தேசிய அரசாங்கமாக அமைந்ததுதான். அதாவது, இரு பெரும் கட்சிகளும் கூட்டாகச் சேர்ந்து ஆட்சி அமைத்த காலப்பகுதி இது. 2015 சனவரி 8ஆம் திகதி பொது ஜனாதிபதி வேட்பாளராகக் களமிறங்கிய மைத்திரிபால சிறிசேன அவர்கள் அந்தத் தேர்தலில் வெற்றிபெற்று பதவிப் பிரமாணம் செய்யும் நிகழ்வின்போது புதிய பிரதமராக ரணில் விக்கிரமசிங்க அவர்களை நியமித்தார். அரசியலமைப்பின் 47ஆம் உறுப்புரையின்படி பிரதம மந்திரியை நீக்கும் அதிகாரம் ஜனாதிபதியிடம் அன்று காணப்பட்டது. அவ்வதிகாரம் எவ்வித மாற்றமுமின்றித் தொடர்ந்தது. ஆயினும், நிறைவேற்று அதிகார முறைமையை இல்லாமலாக்கும் ஆணையை நிறைவேற்ற மக்களிடம் வாக்குகளைப்பெற்ற புதிய தேசிய அரசாங்கம் ஜனாதிபதியின் அதிகாரங்களைக் குறைக்கும் நடவடிக்கையை மேற்கொண்டது. அதன்படி 19ஆம் சீர்திருத்தின் பிரகாரம் ஜனாதிபதியின் நிறைவேற்று அதிகாரம் குறைக்கப்பட்டது.

2001ஆம் ஆண்டு காலப்பகுதியில் சந்திரிகா பண்டாரநாயக்க குமாரதுங்க ஜனாதிபதியாக இருந்தபோது, அப்போதைய பாராளுமன்றத்தில் பெரும்பான்மையைக் கொண்டிருந்த ஐக்கிய தேசியக் கட்சி அரசாங்கம், 17வது சீர்திருத்தின்கீழ் சுயாதீன ஆணைக்குழுக்களை கொண்டு வந்தது நாங்கள் அறிந்த விடயம். இது அரச சேவையில் அரசியல் தலையீட்டைக் குறைக்க உதவியது. என்றாலும், 2005 - 2015 ஆம் ஆண்டு காலப்பகுதியில் அந்நிலை மாறியது. பொதுவாக இரு பெரும் கட்சிகளும் தமது ஆட்சிக் காலங்களில் தமது கட்சிக்காரர்களுக்கு, விசுவாசிகளுக்கு பதவிகளை, வேலைவாய்ப்புக்களை வழங்கி வந்தனர் என்பது நாங்கள் நிதர்சனமாகக் கண்ட சில உண்மை.

இலங்கையின் நிறைவேற்று அதிகாரம் கொண்ட ஜனாதிபதி பதவியானது ஐக்கிய அமெரிக்கா, பிரான்ஸ் ஆகிய நாடுகளின் முறைமையில் உருவாக்கப்பட்டாலும், அந்நாட்டு ஜனாதிபதிகளைவிட அதிக அதிகாரம் கொண்டவராக இலங்கை ஜனாதிபதி காணப்படுகின்றார். இலங்கையில் 17வது சீர்திருத்தம் தொடக்கம் பின்னர் 19ஆம் சீர்திருத்தம் வரை உயரதிகாரிகளை நியமிக்கும் அதிகாரத்தில் ஜனாதிபதி பரந்த அதிகாரத்தினைக் கொண்டிருந்தார். ஐக்கிய அமெரிக்காவில் அவர் இரண்டாம் சபையின் - அதாவது செனட் சபை - அனுமதியைப்பெற வேண்டும். 17ஆவது சீர்திருத்தத்திலே அதற்கான மட்டுப்பாடு அரசியலமைப்புப் பேரவை, சுயாதீனமான ஆணைக்குழுக்கள் என்பவற்றின் ஊடாகக் கொண்டுவரப்பட்டது.

முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களின் ஆட்சிக் காலத்தில் அரசியலமைப்புப் பேரவை 18ஆவது சீர்திருத்தப் பாராளுமன்றப் பேரவையாகப் பெயர் மாற்றப்பட்டு வெறும் பொம்மையாக்கப்பட்டது. உண்மையில் ஆட்சியில் இருந்த ஜனாதிபதிகள் எல்லோரும் தாம் பதவிக்கு வரும் முன்னர் நிறைவேற்று அதிகாரம் கொண்ட ஜனாதிபதி முறைமையை நீக்குவதாகக் கூறி வெற்றி பெற்றுப் பதவிக்கு

வந்த பின், அதிகார ஆசையை உருவாக்கிக்கொண்டு, அதிகாரத்தை அதிகரித்துக்கொண்டு எதேச்சாதிகாரமாகச் செயற்பட்டு, மக்கள் ஜனநாயகத்தினையும் சுதந்திரத்தினையும் குழிதோண்டிப் புதைக்கின்றனர். இதனையே நாங்கள் இப்போது அனுபவித்துக்கொண்டிருக்கின்றோம். இதனாலேயே "ஒருவர் 2 தடவைகளுக்குமேல் ஜனாதிபதியாகப் பதவி வகிக்க முடியாது" என்ற அரசியலமைப்பு மட்டுப்பாட்டை இல்லாமலாக்கிச் சர்வாதிகார ஆட்சியைத் தொடர்ந்து நடத்த மஹிந்த ராஜபக்ஷ முனைந்திருந்தார். இதுவே அவரது ஆட்சிக் காலத்தில் அதிகார துஷ்பிரயோகம், கொலை, ஆட்கடத்தல், வெள்ளை வேன் கடத்தல், காணாமற்போதல், ஊடகத்துறைத் தணிக்கை, கருத்துச் சுதந்திரம் முடக்கம், குடும்ப ஆட்சியும் நிதி மோசடியும் என்பன இடம்பெற்று அராஜகம் தழைத்தோங்கக் காரணமாக அமைந்தது.

அரசியலமைப்பு மீயுயர் சட்டமாகக் கருதப்படுவதோடு இதனை பொருள்கோடல் செய்யும் பிரத்தியேக அதிகாரம் உயர் நீதிமன்றத்திடமே வழங்கப்பட்டுள்ளது. அரசியலமைப்பின் 19வது சீர்திருத்தத்திற்கு முன் ஜனாதிபதியின் அதிகாரங்களையும் 19ஆவது சீர்த்திருத்தத்தின் பின்னரான மட்டுப்பாடுகளையும் நாம் அறிந்தால் தற்போதைய ஜனாதிபதி கௌரவ மைத்திரிபால சிறிசேன அவர்கள் ரணில் விக்கிரமசிங்க அவர்களை நீக்கியமை, மஹிந்த ராஜபக்ஷ அவர்களைப் பிரதமாராக நியமித்தமை, பாராளுமன்றத்தைக் கலைத்தமை என்பன அரசியலமைப்புக்கு அமைவானதா? என்பதைப் புரிந்துகொள்ள முடியும். புதிய பிரதமராக மஹிந்த ராஜபக்ஷ நியமிக்கப்பட்டமை சரியென ஒரு தரப்பும் பிழையென மறுதரப்பும் வாதிட்டனர். அவையிரண்டும் உண்மையில் அரசியலமைப்பினைக் கொண்டல்லாமல், தாம் சார்ந்த கட்சி சார்பாகவும் தாம் யார் ஆட்சியிலிருப்பதை விரும்புகின்றனர் எனும் தனிப்பட்ட காரணங்களுக்காகவும் கூறப்பட்ட கருத்தாகவே காணப்படுகின்றதேயன்றி வேறு இல்லை. ஆயினும், இலங்கை மக்கள் சட்டத்தை, அரசியலமைப்பை அறிந்திருக்கின்றார்களா? ஜனநாயக விழுமியங்கள், மரபுகளின்படி சிந்தித்துச் செயற்படக் கூடியவர்களாக இருக்கின்றார்களா என்பதையெல்லாம் நாங்கள் பார்க்கவேண்டி இருக்கின்றது. அவ்வாறான அரசியல் அறிவுடைய, அரசியலில் பங்குபற்றும் பண்புடைய பிரஜைகளாக இருந்திருந்தால் கட்சித் தாவலும் ஊழலும் அரசியல் அமைப்பு மீறலும் நடக்க வாய்ப்பில்லை. இலங்கை மக்களுக்கும் மக்கள் பிரதிநிதிகளுக்கும் இடையிலான தேவையற்ற அதிகமான இடைவெளி இதற்கு இன்னுமொரு முக்கிய காரணமாகும்.

அரசியலமைப்பொன்றினைச் சாதாரணமாகப் பொருள் கோடல் செய்ய முடியாது. அரசியலமைப்பின் வகிபாகம், அரச கொள்கை, வழிகாட்டல் தத்துவங்கள், மொழி, வழக்காறுகள், மரபுகள், தனிமனித உரிமைகள், சமூக, அரசியல் தன்மை போன்றவற்றின்மீது அவதானம் செலுத்தப்பட்டு ஓர் உயிரோட்டமான மீயுயர் சட்டமாகவே அது பொருள்கோடல் செய்யப்பட வேண்டும். அரசியலமைப்பின் பொருள்கோடலின் போது சட்ட மா அதிபர்போல அல்லது இலங்கைச் சட்டத்தரணிகள் சங்கத்தின் தலைவரின் கருத்தினைப்போல் தனிப்பட்ட கொள்கை, அரசியல் கருத்து அல்லது சுய இலாபத்தினை மையமாகக் கொண்டு அரசியலமைப்பொன்று ஆராயப்படலாகாது. 1978ஆம் ஆண்டின் அரசியலமைப்பின் படி ஜனாதிபதியின் அதிகாரங்களை நோக்கும்போது, அவர் இவ்வரசியலமைப்புக் கொண்டுவரப்படுவதற்கு முன்னர், கொண்டுவரப்பட்டதன் பின்னர் இவ்வரசியலமைப்பில் அல்லது ஏனைய சட்டங்களில் குறித்தொதுக்கப்பட்ட, வழங்கப்பட்ட அதிகாரங்களையும் பின்வரும் ஏனைய அதிகாரங்களையும் கொண்டுள்ளார் எனக் கூறுகின்றது: பாராளுமன்றக் கூட்டத்தொடரின் ஆரம்பத்தில் அரசாங்கக் கொள்கைப் பிரகடன உரை நிகழ்த்துதல், சம்பிரதாயமான பாராளுமன்ற நிகழ்வுகளுக்குத் தலைமைதாங்குதல், உயர் ஸ்தானிகர், இராஜதந்திரிகளை நியமித்தல், அங்கீகரித்தல் போன்ற அதிகாரங்களை ஜனாதிபதி கொண்டுள்ளார். மேலும், ஜனாதிபதி சட்டத்தரணிகளை நியமித்தல், பொது இலச்சினையின் கீழ் பிரதமர், அமைச்சர்கள், அமைச்சரவை அந்தஸ்து இல்லாத அமைச்சர்கள், பிரதம நீதியரசர், உயர் நீதிமன்ற, மேன்முறையீட்டு நீதிமன்ற நீதியரசர்களை நியமித்தல், யுத்தம், சமாதானத்தினைப் பிரகடனம் செய்தல் மற்றும் சர்வதேச சட்டத்திலுள்ள வழக்காறு, மரபுகள்மூலம் அவரைத் தேவைப்படுத்தும் அரசியலமைப்புக்கும் ஏனைய சட்டத்திற்கும் முரணில்லாத விடயங்களையும் அதிகாரங்களையும் கொண்டுள்ளார். இவர் மன்னிப்பு வழங்கும் அதிகாரத்தினையும் வழக்கிலிருந்து விடுபாட்டுரிமை யையும் கொண்டிருக்கின்றார். அரசியலமைப்பின் கீழ் அல்லது வேறு சட்டங்களினூடாக ஜனாதிபதிக்கு வழங்கப்பட்ட அதிகாரத்தினைப் பிரயோகித்தமை, செயற்படுத்தியமை, நிறைவேற்றியமை, கடமைகள் தொடர்பில் அவர் பாராளுமன்றத்திற்குப் பொறுப்புக்கூறக் கடமைப்பட் டிருக்கின்றார். ஜனாதிபதி அரசின் தலைவராவார். இருந்தாலும்கூட, அவர் எந்தளவுக்குப் பாராளுமன்றத்திற்குப் பொறுப்புக் கூறக்கூடியவராக இருக்கின்றார் என்பதையும் இங்கு உணர வேண்டும்.

இவ்வாறான அம்சங்களைப் பார்க்கின்றபோது, 20வது அரசியலமைப்புத் திருத்தத்தைக் கொண்டுவர வேண்டிய ஒரு சூழ்நிலையில் நாங்கள் இருக்கின்றோம் என்பது தெளிவாகின்றது. எமது நாட்டின் அதிபர் - எமது நாட்டின் தலைவர் அத்தனை அதிகாராங்களையும் தன்னிடத்தில் குவித்துக்கொண்டு செயல்படுகின்ற நேரத்திலே, அதில் எல்லாச் சமூகங்களுக்கும் நீதி, நியாயம் இல்லாத ஒரு சூழ்நிலையில், நாங்கள் ஒரு கேள்விக்குறியைப் பார்க்கின்றோம். அது எமக்கு ஓர் ஐயத்தை ஏற்படுத்தி யிருக்கின்றது. இந்த அடிப்படையில்தான் 20வது அரசியலமைப்புத் திருத்தத்தைக் கொண்டுவர வேண்டும் என்று இவர்கள் சொல்கின்றார்கள். எனவே, இதை நாங்கள் நன்கு ஆராய்ந்து, சகல பாராளுமன்ற உறுப்பினர்களும் எல்லாக் கட்சித் தலைவர்களும் சேர்ந்து மக்கள் மத்தியில் அபிப்பிராயங்களைப் பெற்று, நல்ல முறையில் ஆலோசித்து, இந்த அரசியலமைப்புத் திருத்தத்தைச் செய்ய வேண்டும் என்பதுதான் எனது கருத்து என்பதைக் கூறி, சந்தர்ப்பத்திற்கு மீண்டும் நன்றி கூறி, விடைபெற்றுக்கொள்கின்றேன்.

[අ.භා.5.45]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ අපේ (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සම්බන්ධයෙන් වූ සභාව කල් තැබීමේ විවාදයේදී අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට මම ස්තුතිවන්ත වනවා. ඊයේ සිට බලාගෙන ඉඳලා අද අවසාන කථාව කරන්නට මට ලැබීම එක අතකින් භාග්‍යයක්කොට සලකනවා.

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

මම මේ කරුණ සඳහන් කරන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඔබතුමා නම් වාඩි වෙන්නේ එකම තැනක. හැබැයි, මේ වෙනකොට මේ විධායක ජනාධිපති ක්‍රමයත් එක්ක ඇති වුණු පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය කොච්චරද කිව්වොත්, මේ අවුරුදු තුනහමාරක කාලය තුළ මම හත්වැනි පේළියේ තමයි මේ පාර්ලිමේන්තුවේ වාඩි වෙන්නේ. "මේ පාර්ලිමේන්තු ක්‍රමය එක්ක මේ විධායක ජනාධිපති ක්‍රමයෙන් රට ස්ථාවර කරන්නට පුළුවන්"ය කියන අතුරලියේ රතන ගෞරවණීය ස්වාමීන් වහන්සේට මම කියනවා, මේ අවුරුදු තුනහමාර තුළ අඩු ගණනේ මගේ පුටුවවත් ස්ථාවරව තියාගන්න පුළුවන්කමක් ලැබුණේ නැති බව. ඒ නිසා මේ සම්බන්ධයෙන් අපට කථා කරන්න බොහෝ දේවල් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම සඳහන් කරන්නට ඕනෑ, එක්සත් ජාතික පක්ෂයේ ගරු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විධායක ක්‍රමය ගෙන ආවාට පසුව මේ රටේ විශාල විරෝධයක් එයට ඇති වුණු බව. අතුරලියේ රතන හාමුදුරුවෝ අද මොන ආකාරයට මෙය විග්‍රහ කළත්, බුද්ධ ශාසනයේ ඉතාමත් කීර්තිධර ස්වාමීන් වහන්සේ නමක් වූ, අපවත් වී වදාළ සෝභිත නායක හාමුදුරුවෝ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එරෙහිව පිටකොටුව බෝධිය ළඟ සත්‍යාග්‍රහයක් කරලා, මාරාන්තික උපවාසයක් කරන්න හැදුවා. එදායින් පසුව මේ රටේ ඇති වුණු කලබල සියල්ල අපි දන්නවා. ඒ වෙලාවේ ජනතා විමුක්ති පෙරමුණ පළාත් සභා ක්‍රමයට විරුද්ධව කටයුතු කළා. ඒ වෙලාවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පළාත් සභාවට තරග කළේ නැහැ. කොමියුනිස්ට් පක්ෂය, සම සමාජ පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය එදා තරග කළා.

නමුත්, දෛවෝපගතව අද ඉතාමත් පැහැදිලිව පෙනෙනවා, 2015 ජනවාරි 08 වැනිදායින් පසු අපි ඇති කළ යහ පාලන ආණ්ඩුව නිර්මාණය කළ දින සියයේ වැඩසටහන තුළින් ඊට පසුවත් අතුරු ව්‍යවස්ථාවක් සම්මත කරන්න අවශ්‍ය කෙටුම්පත අපි ඉදිරිපත් කළ බව. එහිදී මොකක්ද වුණේ? ඉදිරි ජනාධිපතිවරණය වෙන්න පුළුවන්, ඉදිරි මහ මැතිවරණය වෙන්න පුළුවන්, මේ රටේ ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයෙක් ආණ්ඩුවක බලය ගන්නකොට පට්ටපල් බොරු කියන්න ඕනෑ නැහැ. හැමදාම ජනතාවගේ ඇස්වලට වැලි ගහලා, ජනතාවට කොකා පෙන්වලා, "අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරනවා, විධායක ජනාධිපති ක්‍රමය වෙනස් කරනවා"ය කියපු බොරුව, මායාව, එහෙම නැත්නම් වංචාව තවදුරටත් කරන්නට ඉඩ දෙන්න ඕනෑ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ සියලුදෙනා එකතු වෙලා පාර්ලිමේන්තුව තුළ මේ පිළිබඳව වාද-විවාද කරලා, ලාල් විජේනායක කමිටුවේ අඩුපාඩුකම් තිබුණා නම් ඒ පිළිබඳව සකස් කරලා, අවශ්‍ය නම් තවදුරටත් මේ පිළිබඳ කතිකාවක් සකස් කරලා, මුළුමහත් රටේ ජනතාව එක්තරා මතවාදයකට එන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ද්‍රවිඩ ජනතාව හැටියට ඔබටත්, මුස්ලිම් ජනතාවටත්, මේ රටේ සුළු ජන කොටස්වලට විතරක් නොවෙයි, ජනතා විමුක්ති පෙරමුණටත්, මේ රටේ සිංහල බෞද්ධ, ක්‍රිස්තියානි, ඒ වාගේම ඉස්ලාම් කියන සියලු ආගම් අදහන, ඒ පිළිබඳ ප්‍රතිපත්තිගරුක ජනතාවටත් මෙයින් අවස්ථාව සලසා දෙන්න ඕනෑ. ඒ අවස්ථාව ගිලිහී යන්න දෙන්න නරකයි. හැමදාම මෙවැනි අවස්ථාවක තමයි මේ ගැන කථා කරන්නේ. මේ ගැන කථා කරන්න හොඳම අවස්ථාව අද එළඹිලා තිබෙනවා.

"විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා"ය කියා 2015 ජනවාරි 08 වැනිදා පොදු අපේක්ෂකයා හැටියට ජනාධිපති ධුරයට පත් වුණු,"මේ සියල්ල අත්හැරීම පිළිබඳ මට හොඳට පුරුද්දක් තිබෙනවා. රජයේ රැකියාවේ ඉඳලා සියල්ල අත්හැරියා." කියා වහසි බස් දෙඩූ ජනාධිපතිවරයා නැවත වරක් එය ඉල්ලා මේ අවස්ථාව වෙනස් කරන්නට කටයුතු කිරීම ඉතාමත් දෛවෝපගතයි කියා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1977 ඉඳලා බොහෝ දෙනෙක් කිව්වා, "යුද්ධය අවසන් කරන්නට පුළුවන්කමක් ලැබුණේ විධායක ජනාධිපති ක්‍රමය නිසා"ය කියා. මම ඒකට එකඟ වන්නේ නැහැ. යුද්ධය ඇති වෙන්න ප්‍රධාන හේතුවත් වුණේ, සමහරවිට විධායක ජනාධිපති ක්‍රමය වෙන්න පුළුවන්. අපේ රජය කාලයේ වුණත් මේ රටේ නොසංසුන් තත්ත්වයක් ඇති වෙලා, කළු ජූලියක් නිර්මාණය වෙලා, ඒ තුළින් උතුරේ සහ දකුණේ යම් කිසි ගිනි ඇවිළුණු තත්ත්වයක් ඇති වෙලා, උතුරේ ඇති වුණු ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් මර්දනය කරන්නට ආණ්ඩුවට හැකියාව නොලැබුණේ 1988-1989 කාලයේ දකුණේත් ත්‍රස්තවාදය ඇති වුණු නිසායි.

සමඟි පෙරමුණු ආණ්ඩුව තිබියදී, 1971 කැරැල්ල වෙලාවේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය තුළින් ඒක මර්දනය කරන්න පුළුවන් තත්ත්වයක් මේ රටේ ඇති කළා. මේ කාරණයේදී ඇතැම් අය ඇමෙරිකාව ගැන කථා කරනවා. නොයෙක් රටවල ආර්ථික ශක්තීන් ගැන කථා කරනවා. නමුත්, පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයත් සමඟ ආර්ථික ශක්තිය ගොඩ නහා ගත්, ඒ ක්‍රමයත් සමඟ ඉස්සරහට ගිය රටවල් ලෝකයේ ඕනෑ තරම් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එරෙහිව එදා දේශපාලන පක්ෂ, සිවිල් සංවිධාන විරෝධතා ව්‍යාපාර සංවිධානය කළා. එම ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කරනු ලැබීමත් සමඟ ආචාර්ය එන්.එම්. පෙරේරා මහත්මා "Critical Analysis of the New Constitution of the Sri Lankan Government" කියන පුංචි කෘතියෙන් පෙන්වා දුන්නා, එක් පුද්ගලයකු වටා අධික බලතල සංකේන්ද්‍රණය වීම තුළින් රටේ ප්‍රජාතන්ත්‍රවාදයට සහ මූලික මිනිස් අයිතිවාසිකම්වලට බරපතළ තර්ජනයක් වන බව. ඒ වාගේම ඔහුගේ විශ්ලේෂණය අනුව මෙය හේතුකොටගෙන යහපාලනය සහ නීතියේ ආධිපත්‍ය බිඳ වැටෙන අතර, ඒකාධිපතිත්වයට ඉඩ සැලසෙනවා. ඒ විතරක් නොවෙයි. ඒකෙන් පැහැදිලිව පෙනෙනවා, ඉකුත් වසර 40කට වැඩි කාලයක් තුළ මේ ක්‍රමය තුළින් ඇති වුණු බරපතළ හානිය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දකුණු ආසියාවේ රටවල් ගත්තත්, අපි දන්නා වෙනත් රටවල් දිහා බැලුවාමත් 1977න් පස්සේ, නැත්නම් විධායක ජනාධිපති ක්‍රමය තුළින් ඇති වුණු යම් යම් තත්ත්වයන් අපට මතකයි. "අපේ රටේ යුද්ධය අවසන් කිරීමට හැකි වුණේ විධායක ජනාධිපති ක්‍රමය නිසයි." කියලා කියන අයට අපි කියනවා, යුද්ධය නිම වීමට හේතු වුණු ඒකට වඩා ප්‍රධාන වෙනත් කාරණාවක් තිබුණු බව. ඒ මොකක්ද? ඇමෙරිකාව විසින් ත්‍රස්තවාදයට පහර දීමයි. පෙන්ටගනයට ප්‍රහාර එල්ල කිරීමත් සමඟ ඒ ත්‍රස්තවාදය මර්දනය කරන්න ලෝකයේම රටවල් එකට එකතු වුණු වෙලාවකයි ඉන්දියාව, ඇමෙරිකාව වාගේ රටවල් ලෝකයේ ත්‍රස්තවාදය තුරන් කරන්නට කටයුතු කළේ. එහි වාසියක් හැටියටයි මේ රටේ ත්‍රස්තවාදය නැති කරන්නට පුළුවන්කම ලැබුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උදාහරණයක් හැටියට සෞදි අරාබිය, සිරියාව, ඊජිප්තුව, ඉරාකය, මෙක්සිකෝව, ඉන්දියාව වාගේ රටවල් පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයෙන් දියුණු වුණු රටවල් හැටියට අපට සලකන්න පුළුවන්. අපි බලන්නට

ඕනෑ මේ විධායක ජනාධිපති ධුරයෙන් ඇති වුණු යම් යම් අහිතකර දේවල් ගැන. විධායක ජනාධිපති තනතුරට පත් වන පුද්ගලයාට හිමි වන බලය තුළින් හිතුවක්කාරී විධියට පරිපාලන කටයුතු කරන්න පුළුවන්කම ලැබෙනවා. හොඳම උදාහරණය තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා. මම එකඟ වෙන්නේ නැති නමුත්, අපේ අතුරලියේ රතන ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රකාශ කළා, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වියවුලක් බවට පත් වුණේ වෙනත් යම් යම් හේතු නිසයි කියා. නමුත්, එය වියවුලක් වුණේ අර මා කලින් සඳහන් කළ කාරණාව නිසයි. ඔක්තෝබර් 26වැනිදාට පෙර ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාමත් පැහැදිලි ක්‍රමවේදයක් තිබුණා. අපේ ආණ්ඩුවේ වැරදි තිබුණා, අඩු පාඩුකම් තිබුණා, උද්ඝෝෂණ තිබුණා, විරෝධතා තිබුණා. හැබැයි, ආණ්ඩුව ඉදිරියට ගියා. කවදාවත් ආණ්ඩුවට රජයේ සේවකයින්ට වැටුප් නොගෙවා ඉන්න හේතුවක් ඇති වුණේ නැහැ. හතළිස්පන් ලක්ෂයක් දරුවන් රැක බලා ගන්න පුළුවන්කම ලැබුණා. මේ රටේ "ගම් පෙරළිය" ඇතුළු සංවර්ධන ව්‍යාපාර මඟින් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබේ ප්‍රදේශයට පවා සංවර්ධන වැඩ කටයුතු දියත් කරන්න පුළුවන්කම ලැබුණා. මේ රටේ නීතිය සාධාරණත්වයෙන් ක්‍රියාත්මක වුණා. අධිකරණය ඉතාම හොඳ යහ පාලනයකින් ක්‍රියාත්මක වුණා. නීතියේ ආධිපත්‍ය සුරක්ෂිත වුණා. නමුත්, ඔක්තෝබර් 26වැනිදායින් පස්සේ ගෙවුණු දින 50 තුළ තමයි රට සම්පූර්ණයෙන්ම අරාජික වුණේ. එහෙම නම් ඒකට වග කියන්න ඕනෑ කවුද? මේ රටේ මේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයද? අගමැති ඇතුළු කැබිනට් එකද? ඉතිහාසයේ පළමුවැනි වතාවට මේකේ අගමැතිවරු දෙදෙනෙකු පත් වුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද ඉතිහාසයේ පළමුවැනි වතාවට ඔබේ නායක සම්පන්දන් මැතිතුමාත්, තවත් අයෙකුත් විපක්ෂ නායකවරයා හැටියට පත් වෙලා සිටිනවා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරු දෙදෙනකු බිහි වෙලා තිබෙනවා. එහෙම නම් මේ තත්ත්වයට වග කියන්න ඕනෑ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයද, එහෙම නැත්නම් විධායක ජනාධිපති ක්‍රමයේ තිබෙන අශිෂ්ට, අපි විසින් පිළි නොගත යුතු, පිළිකුලෙන් හෙළා දැකිය යුතු දේවල්ද කියා අපි අහනවා. අපේ ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ මේ අවස්ථාවේ ගරු සභාවට පැමිණියා. උන් වහන්සේ මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කළ කාරණා අපි දැක්කා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දින සියයේ වැඩ පිළිවෙළ -මාර්ග සිතියම- තුළ අපට දකින්න ලැබුණු කාරණා මොනවාද?

එහි පැහැදිලිවම ප්‍රකාශ කළේ මොකක්ද? ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ දින 100 වැඩසටහනේ සඳහන් වනුයේ අත්තනෝමතික විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට කැබිනට් මණ්ඩලය හරහා පාර්ලිමේන්තුවට සම්බන්ධ වූ විධායකයක් සහිත ආණ්ඩු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම අරඹන වගයි. මේ මාර්ග සිතියමේ ඒ කරුණු සඳහන් වනවා, දින වකවානු ඇතිව. ඉතින්, අතැන මෙතැන කොහේ සිටියත්, කඩපිල් ළඟ කිව්වත් රටේ නායකයකු ප්‍රකාශ කරන්න ඕනෑ, ක්‍රියාත්මක කරන්න පුළුවන් ඒවායි. ඒ කරුණු පැහැදිලිව ලිඛිත ලියවිල්ලක සඳහන් වුණා, අපේ හාමුදුරුවනේ. ඔබ වහන්සේ විතරක් නොවෙයි, එක්සත් ජාතික පක්ෂය හැටියට අපිත් ගිහින් වේදිකාවල කිව්වා, "මෛත්‍රී ජනපති - රනිල් අගමැති" කියලා. හැබැයි ඒත් එක්කම දින වකවානු දාලා තිබුණා. 11වන දා වන කොට රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති වෙනවා කියා සඳහන්ව තිබුණා. 10වන දා වන කොට, 11වන දා වන කොට මේ මේ දේවල් කරනවා ආදි වශයෙන් දින වකවානු සහිතව කරන දේ ගැන ලැයිස්තුවක් ඉදිරිපත් කර තිබුණා, දින 100 වෙනුවෙන්. ජනාධිපතිතුමා කිව්වා, "දින 100 ගැන මම දන්නේත් නැහැ" කියා. මට පුදුමයි! මේ රටේ හැම තැනම ගිහින්, ගෙවල්වලට ගිහින් මේ කොළය පෙන්වා, වේදිකාවේ බෙරිහන් දුන්නා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ස්වාමින් වහන්ස.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා මගේ නම කියූ හින්දා මට තත්පර කීපයක් දෙන්න. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඔය කියවූ කොළයේ -"මෛත්‍රී පාලනයක්... ස්ථාවර රටක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ- විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා කියලා නැහැ. ජාතික හෙළ උරුමයත් එක්ක ගිවිසුමක් අත්සන් කර තිබෙනවා. ඔබතුමා ඔය ප්‍රකාශනය දිගටම කියවන්න. එහෙම එකක් ඔය ප්‍රකාශනයේ නැහැ. එතුමා කියා තිබෙන්නේ විධායක ජනාධිපති ධුරයේ තිබෙන ඒකාධිපති ලක්ෂණ ඉවත් කරනවා කියලායි. ඒ වාගේම, එතුමා ඉතා පැහැදිලිව කියා තිබෙනවා, ජනමත විචාරණයකට තුඩු දෙන ව්‍යවස්ථා සංශෝධනයක් කරන්නේ නැහැ කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉන්දු-ලංකා ගිවිසුම ගෙන ආ වෙලාවේ ශ්‍රේෂ්ඨාධිකරණය නඩු තීන්දුවක් දුන්නා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළොත් රට අස්ථාවර වනවා කියා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කරුණාකර ඒ නඩු තීන්දුව කියවන්න. පළාත් සභා ක්‍රමය පවතිද්දී, මේ ඡන්ද ක්‍රමය පවතිද්දී විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළොත් මේ රට සම්පූර්ණයෙන් අස්ථාවර වෙනවා. ඒ නිසා තමයි "පිවිතුරු හෙටක් උදෙසා ජාතික සභාව" හැටියට අපි සහය දුන්නේ. ඔය ප්‍රතිපත්ති ප්‍රකාශනය සියලුදෙනාගේම අදහස් අනුව අකුරක් නෑර ලිව්වේ මමයි. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න නම් ජනමත විචාරණයක් ඕනෑ. එතුමා කියා තිබෙනවා, ජනමත විචාරණයකට තුඩු දෙන කිසිම ව්‍යවස්ථා සංශෝධනයක් කරන්නේ නැහැ කියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණා තුන දෙමළ, සිංහල, ඉංග්‍රීසි කියන භාෂා තුනෙන්ම හැන්සාඩ්ගත කරන්න කියා මම අද ඉල්ලා සිටියා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ඒ, අත්සන් කළේ ජාතික හෙළ උරුමයත් එක්ක වෙන්න ඇති කියා මා හිතනවා; හැබැයි, එක්සත් ජාතික පක්ෂයත් එක්ක එහෙම නැහැ. ඔබ වහන්සේගේ කතාව හරි වෙන්න පුළුවන්. ජාතික හෙළ උරුමයත් එක්ක එහේ ගිවිසුමක් අත්සන් කරන්න ඇති. එදා ගිවිසුම් කීපයක් අත්සන් කළා කියා ඔබ වහන්සේ දන්නවා. හොර ගිවිසුමකුත් තිබුණා, තිස්ස අත්තනායක මහත්මයා ගෙනැවිල්ලා. හොර ගිවිසුමකුත් තිබූ බව ඔබ වහන්සේ දන්නවා. ගිවිසුම් නම් තිබෙන්න ඇති. නමුත් මා මතු කරන කාරණය මේකයි. සම්පූර්ණයෙන්ම රටේ ජනතාවගේ මතය වෙලා තිබුණේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි වෙනවා කියලා. එතුමා කිව්වා, "මම මේ ජනාධිපති පුටුවේ ඉන්නේ අවසාන වතාවටයි" කියා. එහෙම කිව්වේ නැද්ද? මෛත්‍රීපාල සිරිසේන මහත්මයා කිව්වා, "මේ ජනාධිපති පුටුවේ වාඩි වෙන්නේ අවසාන වතාවටයි. මම මින්

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

ඉදිරියට වාඩි වෙන්නේ නැහැ" කියා. එතුමා එසේ කිව්වා. ඒ කිව්වේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න අවශ්‍ය වටා පිටාව ගැනයි.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ස්වාමීන් වහන්ස.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙය, සභාව නොමඟ යැවීමක්. එතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ පැහැදිලිව කියා තිබෙනවා, ජනමත විචාරණයකට තුඩු දෙන ව්‍යවස්ථා සංශෝධන නොකරන බවත්, විධායක ජනාධිපති ධුරය සම්පූර්ණයෙන්ම අහෝසි කරන්නේ නැති බවත්. ඔය ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 6වන පිටුවේ බොහොම පැහැදිලිව එසේ සඳහන්ව තිබෙනවා. අද මම එය හැන්සාඩ්ගත කළා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඔය ප්‍රකාශනවල සියල්ල තිබෙනවා, අපේ ගරු නායක ස්වාමීන්ද්‍රයන් වහන්ස. හැබැයි කියපු දේවල් නොවෙයි නේ එතුමා කරන්නේ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා එය සම්මත කරන කොට එතුමා මෙතැන ඉඳන් කතා කරමින් කියපු දේ ඔබ වහන්සේ දන්නවා. එතුමා මෙතැන ඉඳන් කිව්වා, "අවුරුදු හතරයි, මාස හයක් යන කල් මටවත් මේ පාර්ලිමේන්තුව විසුරුවා හරින්න බැහැ" කියා. එය නොකළා ද? කුමන ප්‍රතිපත්තිය තිබුණත් එය නොකළා ද? පැහැදිලිව පෙනෙනවා, එතුමා කියන කතා සහ එතුමාගේ ක්‍රියාව නිසා මේ රට කොයි ආකාරයක අර්බුදයකට මුහුණ දී තිබෙනවාද කියා. ඒ නිසා ඔබ වහන්සේ දැන් එය ශුද්ධ පවිත්‍ර කරන්න ලෑස්ති වෙන්න එපා. ඔබ වහන්සේ ගිහින් විපක්ෂයේ ඉඳගෙන කතා කරන්න. හැබැයි මේ ආණ්ඩු පක්ෂයේ සිටින මිනිසුන් ගැන එහෙම සිතන්න එපා. අප දැන් පුන්නක්කු කන ගවයන් ලිහලායි ඉන්නේ. ඒ නිසා අපි ලෑස්ති නැහැ, රැවටෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම පැහැදිලිව කියනවා, මින් ඉදිරියට, මේ පාර්ලිමේන්තුවේ පක්ෂ මාරු කරන ක්‍රමය -මේ පැත්තේ සිට එහා පැත්තට සහ එහා පැත්තේ සිට මෙහා පැත්තට cross කරන ක්‍රමය,- මේ කාලයේදීම සම්පූර්ණයෙන් නැති කරන්න ඕනෑ කියා. මේ රටේ සමහර මැති ඇමතිවරු මුදල්වලට -කෝටි ගණන්වලට,- විකිණුණා; වරප්‍රසාදවලට, වරදානවලට, ඇමතිකම්වලට, කැබිනට් ඇමතිකම්වලට, නියෝජ්‍ය ඇමතිකම්වලට පක්ෂ මාරු කළා; ලජ්ජා නැතිව මේ රටේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය බාල්දු කළා. මීට පෙර කථා කළ මුස්ලිම් මන්ත්‍රීතුමා -ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා- එතුමාට තේරෙන භාෂාවෙන් කිව්වා, "අපට අද ගමට යන්න ලජ්ජයි" කියා. මා හිතනවා, ඔබ වහන්සේත් ගමට යන්න ලජ්ජා වන්න ඕනෑ කියා. මේ පැති මාරු කරන ක්‍රමය නැති වෙන්න ඕනෑ. ඔබ වහන්සේ පත් වුණේ මොන පක්ෂයෙන්ද? ඔබ වහන්සේ එක්සත් ජාතික පක්ෂයෙන් පත් වුණේ. නමුත් අද ලජ්ජා නැතිව ගිහින් අනෙක් පැත්තේ වාඩි වෙනවා. මොකක්ද එහි තිබෙන සදාචාරය? මම බුදු රජාණන් වහන්සේගේ ධර්මය ඉගෙන ගෙන තිබෙනවා. මම දහම් පාසල් ගිහින් තිබෙනවා. ඔබ වහන්සේ ධර්මප්‍රකාශක වන්න පුළුවන්; අනුශාසනා කරන්න පුළුවන්.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ස්වාමීන් වහන්ස.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මගේ කාලය තවත් දෙන්න බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. වාදයක් නම්, වෙලාසනින් ඒ වාදයට ලෑස්ති වන්න ඕනෑ.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබවහන්සේගේ point of Order එක මොකක්ද?

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මේ ගොල්ලන් කියන විධියට යූඑන්පීය ජයග්‍රහණය කළේ නැහැ. "පිවිතුරු හෙටක් උදෙසා ජාතික සභාව" හැටියට අපි විශාල තීන්දුවක් ගත්තා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ඒක මුළු රටම දන්නවා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ඇහුම්කන් දෙන්න ඔබතුමා. ඔබතුමා කියපු එකට නේ මම මේ කියන්නේ.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මටත් කියන්න තිබෙනවා. මගේ උප්පැන්න සහතිකයේ මගේ ආගම විධියට තිබෙන්නේ බුද්ධාගම. උප්පැන්න සහතිකයේ ආගම

විධියට බුද්ධාගම තිබෙන කෙනෙකු හැටියට බුද්ධාගම ගැන කථා කරන්න මට අයිතියක් තිබෙනවා. බුදු රජාණන් වහන්සේ ඔය විධියට අනුශාසනා කරලා තිබෙනවාද?

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් මාගේ ස්ථාවරය විධියට මම කියලා තිබෙන්නේ "මෛත්‍රී පාලනයක්... ස්ථාවර රටක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙන දේයි. මගේ හෘදය සාක්ෂියට එකඟව කිසිදු මැති ඇමතිකමක් ගන්නේ නැතිව ස්වාධීනව, මේ රටේ ජාතික ආරක්ෂාව වෙනුවෙන්, මේ රටේ අනාගතය වෙනුවෙන් ආණ්ඩුව හරි දේ කරනවා නම් සහාය දෙන්නත්, ආණ්ඩුව වැරදි දෙයක් කරනවා නම් විරුද්ධ වන්නත් තමයි අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

පාර්ලිමේන්තුවට එන්නත් බැහැ, ඔබවහන්සේලාට. මට ලජ්ජයි, එක්සත් ජාතික පක්ෂයට හාමුදුරුනමක් ගැනීම ගැන. එක්සත් ජාතික පක්ෂයෙන් පෙරමුණක් හැටියට වුණත් හාමුදුරුනමක් ඡන්දය ඉල්ලන්න ආපු එක ගැන මට ලජ්ජයි. ඔබවහන්සේ තමයි කෘෂිකර්ම ව්‍යාපාරය සම්පූර්ණයෙන් කෑවේ. තේ කර්මාන්තය විනාශ කළා. ග්ලයිෆොසෙට් තහනම් කරලා තේ කර්මාන්තය විනාශ කළා. [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාවට බාධා කරනවා. ඔබවහන්සේට අවස්ථාව දුන්නා.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

අද ආණ්ඩුව තුළ යම් කිසි විරුද්ධ දෙයක් සිද්ධ වනවා නම්, ඒ දේ පරාජය කිරීම සඳහා මම පෙනී සිටින අතර, ඒ වාගේම රටට හානිකර ව්‍යවස්ථා සංශෝධනවලට එදා ආණ්ඩුව තුළ ඉඳගෙනත් ඒ විධියට මම විරුද්ධ වුණා වාගේම මේ ආණ්ඩුවේත් හරි දේට සහාය දෙමින්, වැරදි දේට මම විරුද්ධත්වය පළ කරනවා. මම අය වැය හොඳ නම්, අය වැයට සහාය දෙනවා; අය වැය වැරදි නම්, විරුද්ධ වනවා. ඒ හින්දා මේ පක්ෂ පාට මාරු කරන ඒ ප්‍රතිපත්තිය නොවෙයි, රට වෙනුවෙනුයි අපි ආවේ. එක්සත් ජාතික පක්ෂයට වැලේ වැල් නැතිව ඉන්න කොට මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හින්දායි යාන්තම් මැතිවරණය දිනාගන්න පුළුවන් වුණේ. ඒක මතක තබා ගත්තොත් හොඳයි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

බොහොම ස්තුතියි, ස්වාමීන් වහන්ස.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

චීවරධාරී ශාස්තෲන් වහන්සේ නමක වන ඔබවහන්සේ ගැන මම කනගාටු වනවා. බුදුදහම ගැන අපි ඊට වඩා දේවල් ඉගෙන ගෙන තිබෙනවා. මම දහම් පාසලේ ධර්මාචාර්ය විභාගයත් සමත් වූ කෙනෙක්. මම බුදු දහම පිළිබඳව, ත්‍රිපිටකය පිළිබඳව, අභිධර්මය පිළිබඳව දන්නා කෙනෙක්. හැබැයි, බුදුරජාණන් වහන්සේ නම් පැත්ත මාරු කරලා බොරුව රටේ ජනතාවට පෙන්වන්න උත්සාහ කළේ නැහැ. එම නිසා මම ස්වාමීන් වහන්සේගෙන් කාරුණිකව ගෞරවයෙන් නමස්කාර පූර්වකව දෙපා වැඳ ඉල්ලනවා, මේ වාගේ වැඩ කරන්න ලෑස්ති වෙන්න එපා කියලා. මේ රට අස්ථාවර වුණු වෙලාවක හොර පාරෙන් අගමැතිවරයෙක් පත් කරලා, හොර පාරෙන් ඇමති මණ්ඩලය පත් කරලා පාර්ලිමේන්තුව විසුරුවා හැරීම වැරදියි කියලා අධිකරණය පැහැදිලිවම කියා තිබෙනවා. ඒ පත් කිරීම් වැරදියි කියලා *quo warranto* ආඥාව තුළින් පැහැදිලිවම කියලා තිබෙනවා. අධිකරණය - නීතිය කියන්නේ බුදු රජාණන් වහන්සේත් ගරු කළ තැනක්ය කියලා අපි දන්නවා. ඔබවහන්සේ නිවැරදි නම්, ඔබවහන්සේට ඡන්දය ඉල්ලන්න පුළුවන්. ඔබවහන්සේට ගම්පහ දිස්ත්‍රික්කයේ ඡන්ද දායකයෝ කොහොම සලකයිද කියලා මම දන්නේ නැහැ. ඔබවහන්සේ ඡන්දය ඉල්ලන්න. ඡන්දය ඉල්ලා, ජන මතය බලන්න. ඔය විධියට පක්ෂ මාරු කරලා එක කාලයක එක ප්‍රතිපත්තියකුත්, තමන්ට වරප්‍රසාද ලැබෙන කොට තව ප්‍රතිපත්තියකුත්, වරප්‍රසාද අඩුවන කොට තව ප්‍රතිපත්තියකුත් ගෙන යන මේ කෙහෙල් මල මොකක්ද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා තමයි අපි පැහැදිලිවම කියන්නේ රට ස්ථාවර වෙන්න නම්, පක්ෂ මාරු කරලා එහා පැත්තට මාරු වන එක නවතින්න ඕනෑය කියලා. පසුපෙළ මන්ත්‍රීවරුන් හැටියට අපි වරප්‍රසාදවලට ගිහිල්ලා නැහැ. අපි වරප්‍රසාද එකක්වත් අරගෙන නැහැ. ජනාධිපතිවරයාගෙන් අපි තෙල් බිඳක්, වාහන කට්ටක් අරගෙන නැහැ. අපි පැහැදිලිව කියනවා, අපි මේ පාර්ලිමේන්තුවේ වාඩි වෙලා ඉන්නේ ඒ විධියටයි කියලා. එම නිසා අපට හයක් සැකක් නැහැ. ඉතාමත් පැහැදිලිව අපි ප්‍රතිපත්තිගරුකයි. මගේ ආගම බුද්ධාගම. මගේ උප්පැන්න සහතිකයේ ලියා තිබෙන ආගමට මම ගරු කරනවා. එම නිසා මම කියනවා, ආගම කිලිටි කරන්න එපා කියලා. මම හිතනවා, අද සෝභිත හාමුදුරුවෝ කොහේ හරි ඉඳලා බලාගෙන සිටියා නම්, ඔබවහන්සේලාට ශාප කරයි කියලා. මොකද, සෝභිත හාමුදුරුවෝ ඔය කථා කිව්වේ නැහැ. ව්‍යවස්ථාව ගේන කොට සෝභිත හාමුදුරුවෝ බෝධිය ළඟ ඉඳගෙන සත්‍යග්‍රහ කරලා උන්වහන්සේ කිව්වා, "මගේ සිරුරට ගිනි තබා ගන්නවා" කියලා. එතකොට ඔබවහන්සේලා කොහේද හිටියේ? එහෙම කරලා ජනාධිපති ධුරයට හොඳ අපේක්ෂකයෙක් ගෙනාවා. මේ රට යුද්ධයෙන් පීඩා විඳ අස්ථාවර වුණු රටක්. ප්‍රජාතන්ත්‍රවාදය තුළින් තට්ටු මාරු ක්‍රමයට යන්න පුළුවන් රටක් නිර්මාණය කරන කොට ඔබවහන්සේලා කොහේද ඉන්නේ කියලා මම දන්නේ නැහැ.

ඔබවහන්සේ අතින් වැරදීම් සිදුවන්න පුළුවන්. වී.අයි. ලෙනින්ගේ "The State and Revolution" - "රාජ්‍ය සහ විප්ලවය"- කියන පොතේ ඉතාමත් පැහැදිලිව මේ සම්බන්ධයෙන් ලියා තිබෙනවා. තමන්ට වැරදීම් සිද්ධ වන්න පුළුවන්. වැරදීම සාමාන්‍යයෙන් මනුෂ්‍ය ගතියක්. හැබැයි, ඒකට සමාව දීලා කටයුතු කිරීම දේව ගතියක් කියලා කතන්දරත් තිබෙනවා. එම නිසා අපි ඔබවහන්සේට සමාව දෙනවා. මේ ව්‍යවස්ථා විරෝධී ගමනක් යන්න ඉන්න ඒකාධිපති ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න ඔබවහන්සේගේ සහයෝගය ලබා දෙන්න කියලා අපි ආරාධනා කරනවා. නව ව්‍යවස්ථාව සම්මත කරන වෙලාවට ඒකට සංශෝධනත් ගෙනැත් ඒකට ඔබවහන්සේ අත් දෙකම ඔසවා තමන් අතින් වුණු පාඩුව මකා ගන්නත්, පවු ගෙවා ගන්න පිනක් දහමක් කර ගන්නත් රජයට එන්න, ආණ්ඩුවට එකතු වන්න කියලා ආරාධනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

මගෙන් යම් කිසි වැරැද්දක් සිදු වුණා නම්, නැවත වතාවක් නමස්කාර පූර්වකව ඔබවහන්සේගෙන් ගෞරවයෙන් සමාව අයැද සිටිනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ස්වාමීන් වහන්ස.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාවේදී මම පැහැදිලිව කිව්වා, "මේ පවත්නා මැතිවරණ ක්‍රමය යටතේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම ද්‍රෝහී ක්‍රියාවක්" බව. ඒ, පළමු කාරණය. ඊළඟ එක, මම ජනාධිපතිවරයාගෙන් ඉන්ධන දීමනා කියන වරප්‍රසාද අරගෙන නැහැ. මම ජනාධිපතිවරයාගෙන් ඉන්ධන දීමනා, අරවා මේවා අරගෙන තිබෙනවාද කියලා ඕනෑ තැනක ගිහින් හොයන්න පුළුවන්. කිසි දෙයක් අරගෙන නොවෙයි, මගේ හෘදය සාක්ෂියට එකඟවයි මම දේශපාලන තීන්දු අරගෙන තිබෙන්නේ. මම අදත් එක්සත් ජාතික පක්ෂයට ද්‍රෝහීකම් කරන්න ගියේ නැහැ. මම කළේ, භාරකාර ආණ්ඩුවක් සඳහා වැඩ පිළිවෙළක් හදලා ඉදිරිපත් කරන එක. ඒකත් මම අද කෙටුම්පත් කරලා තිබෙනවා. ඒක භාර දීලා තිබෙනවා. ඒ නිසා දේශපාලනය නොදැන කතන්දර කියන්නේ නැතුව, විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සම්බන්ධයෙන් "මෛත්‍රී පාලනයක් ... ස්ථාවර රටක්" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඇති අදාළ කොටස වගකීමෙන් කියවන හැටියට සමස්ත ජනතාවගෙන් මම ඉතාම ආදරයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු ස්වාමීන් වහන්ස, මම 1991 ප්‍රාදේශීය සභාවෙන් දේශපාලනයට ඇවිල්ලා, දෙවතාවක් ප්‍රාදේශිය සභාවේ සභාපති වෙලා, අවුරුදු 16ක් පළාත් සභාවේ ඉඳලා, පාර්ලිමේන්තුවට ආ බව මම මතක් කරන්න ඕනෑ. ඔය සියලුම විප්ලවවල හිටපු මිනිහෙක් මම. ඒ නිසා ඔබ වහන්සේට වඩා මම දේශපාලනයේ පරිණතයි. ඔබ වහන්සේ දේශපාලනයට ආවේ කොයි කාලයේද කියලා අපි දන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 6.06ට, අද දින සභා සම්මතිය අනුව, 2018 දෙසැම්බර් 21වන සිකුරාදා පූ. භා. 10.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பாராளுமன்றம், பி.ப. 6.06 மணிக்கு, அதன் இன்றைய தீர்மானத்திற்கிணங்க, 2018 டிசம்பர் 21 வெள்ளிக்கிழமை மு.ப. 10.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 6.06 p.m. until 10.30 a.m. on Friday, 21st December, 2018, pursuant to the Resolution of Parliament of this Day.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.